චින්ගීස් අයිත්මාතව්

# ජමීලා

නව කතාවකි



චින්ගීස් 
අයිත්මාතව්

# ජමීලා

නවකතාවකි

චින්ගිස්
අයිත්මාතව්

# ජමීලා

පරිවර්තනය,
ඇදිගම වී. රුද්‍රිගු

චිත්‍ර: කසිරොතොව්

පරිඝනක අක්ෂර සංයෝජනය :
සී. සී . කොම්පියුටර් සෙන්ටර් පුද්ගලික සමාගම,

ප්‍රකාශනය:
කුරුළු පොත්
594/1, නාවල පාර,
රාජගිරිය.
දු.ක. 863350

1999 ප්‍රථම (ශ්‍රී ලංකා) මුද්‍රණය.

මුද්‍රණය:
තරංජී ප්‍රින්ට්ස්,
506, හයිලෙවල් පාර,
නාවින්න,
මහරගම.

ප්‍රකාශනය
කුරුළු පොත්,
594/1, නාවල පාර,
රාජගිරිය.

## චින්ගීස් අයිත්මාතව්

අයිත්මාතව් ප්‍රථම වරට සිංහල පාඨකයාට හඳුන්වා දෙන ලද සිංහල ලේඛකයා ඇදිගම වී රුද්‍රිගු නම් වෙයි.

මෙයට දශක තුනකට පෙර ඔහු 'පළමුවන ගුරුවරයා' නමැති අයිත්මාතව් ගේ නවකතාවක් සිංහලට පරිවර්තනය කළේය.

වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වූ රුද්‍රිගු මීට වසර හත අටකට පෙර මොස්කව් හිදී මිය ගියේය.

රුසියානු සාහිත්‍ය, රුසියන් බසින්ම හදාරා, වියත් සිංහලට පරිවර්තනය කිරීමෙන් ඇදිගම වී. රුද්‍රිගු සිංහල පාඨක මතයෙහි සදා ජීවත් වෙයි.

ප්‍රකාශකයෝ

# පටුන

හැඳින්වීම . . . 7
ජමිලා . . . 12
නැතිවුණු වස්තුව . . 66

## හැඳින්වීම

සමාජවාදී සෝවියට් සමූහාණ්ඩු සංගමයේ එක් සමූහාණ්ඩුවක් වන කිර්ගිසියාව ගැන කොතෙක් කියවා හා අසා තිබුණද, එහි ගිය විට කෙනෙක් පුදුමයට පත්වෙති.

ඉස්සික්-කුල් වැනි අලංකාර වැවක් දුටු විට කවි කීමට පවා සිතේ.

ජගත් මිහිකතට ඉස්සික්-කුල් ඉඳුනිල් මිණකි...

ඉස්සික්-කුල් වැව වටේ උස් කඳුය. කඳු මුදුන් සිප ගන්නා වලාකුළු සෙමින් සෙමින් පියාඹා යන්නේ බලගතු නැව් හමුදාවක් මහා සාගරය තරණය කරන්නාක් මෙනි.

කඳු බෑවුම් දිගේ උසැති ගස්ය. අත්වැල් අල්ලාගෙන ගමන් කරන සංචාරකයින්ට ඒවා සමානය. ඉස්සික්-කුල් වැව දෙසට ගමන් කරන්නේ කිර්ගිසියාවේ වාහන පමණක් නොවේ. සෝවියට් සංගමයේ බොහෝ නගරවලින් මෙහි ජනයා පැමිණෙති.

කඳුකර ගඟක් වන නරීන් දිගේ ගමන් කරන විට සවස ඇඳිරිය පැතිර යයි. ඈත දීප්තිමත් තරු වැනි පහන් දැල්වේ. නොයෙකුත් උස් පහන් තැන්වලින් දීප්තිමත් ආලෝක පැතිර යයි. නොයෙකුත් දෙවි දේවතාවුන් රාත්‍රියෙහි මිනිසුන්ට සිය වැඩ කටයුතු කිරීමට ආධාර දෙන්නාක් මෙනි. අපි දැන් තොක්තොගුල්ස්ක් ජලවිදුලි බලස්ථානයට ළංවෙමින් සිටිමු.

මෙහි මං මාවත් කිසිවක් නොතිබිණි. නිර්මාණ ශිල්පියෝ හා කම්කරුවෝ මුකලන් කැලෑ හා කඳු කපා පාරවල් තැනූහ. ඉන් පසු විශාල ගල් හා පර්වත පිපිරවීමට ඩයිනමයිට් වෙඩි දැමීම කෙරිණ. පැරණි සුදු බිමක සිරියක් ඉසිලිය. ජලවිදුලි බලස්ථානය සෑදීමට අවශ්‍ය ඉඩකඩ ලබා ගනු වස් ගල් පුපුරා දමා ශුද්ධ කරන ලදී. මිනිසුන්ට අනතුරක් සිදු නොවන පරිදි එය කිරීමට සිදුවිය.

කිර්ගීස් සාහිත්‍යයේ සිදුවුණු, සිදුවෙමින යන දෙයට මෙය සමානය. මේ සංවර්ධන වැඩ කිර්ගීස් සාහිත්‍යයේ සංකේතයක් බඳුය.

කිර්ගීස් සාහිත්‍යයට මග මිට අවුරුදු සියයකට පමණ ඉහතදී තොක්තොගුල් පෙන්නුවේ එහෙම නොවේද? සියලු බාධා මැද ඔහු ශ්‍රේෂ්ඨ ඔක්තෝම්බර විප්ලවය දක්වා තම සාහිත්‍ය කටයුතු කරගෙන ගියේය. ``ඔහු හිස නමා ආචාර කරමින් රතු ධජය පිළිගැනීමට ඉදිරියට ආවේය.`` කිර්ගීස්

සාහිත්‍ය වර්ධනයට ඔහුගේ බලපෑම බොහෙවින්ම වැදගත් විය. වැඩිහිටි හා තරුණ පරපුරට අයත් ඉතාම හොඳ ගත්කරුවෝ ඔහු අනුව යති:

උදැල්ලත්, පොරවත්
කර ගහ ගෙන යන,
දැඩි පෙණුමක් ඇති
ඔහුගේ හදවත, පිරිසිදුය.

කිර්ගිසියාවේ ගොවීන් ගැන එසේ ලියා ඇත.

කෘෂිකාර්මික කම්කරුවෝ ශ්‍රමය... ගත්කරුවාගේ සාහිත්‍ය ශ්‍රමයට මෙය සමාන නොවන්නේද? පැරණි සමාජයේ සිරිත් විරිත්, ගති පැවතුම්, සිතුම් පැතුම් වල ඇති ප්‍රතිගාමී පැත්ත හෙළිදරව් කරමින් සාහිත්‍ය කෘතීන් කරන ගත්කරුවා ජනතාවට සාමකාමී ජීවිතයක් ගොඩ නැංවීමට උපකාර කරයි.

සුප්‍රසිද්ධ ගත්කරුවෙකු වන කිර්ගිස් ජාතික චින්ගිස් අයිත්මාතව්ගේ ``පළමුවැනි ගුරුවරයා`` නව කතාවේ දුයිෂෙන් සැබැවින්ම ``දැඩිය, ඇදිරිය``. දුයිෂෙන්ගේ චරිත නිරූපනය මෙසේ විය: ``ඔහු නිහඬව ගමන් කළේය. ඔහුගේ ඇස් බැම් රාජාලියකුගේ මෙන් දිගය. මුහුණ කළු පැහැති වාගෙන් වලින් වාත්තු කළාක් මෙනි. හේ දැඩිය.``

යුද්ධයෙන් පසු රතු හමුදා සේවයෙන් අස්වුණු දුයිෂෙන් කිර්ගිසියාවේ ඈත ගමක - අයිලයක* පළමුවැනි පාසල සංවිධාන කළේය. තම දැනීම අසම්පූර්ණ වුවද ඔහුට එය ගම්බද ළමයින්ට බෙදාදීමට සිත්විය. රටේ අයිතිකරුවන් තමන්ය යන හැඟීමෙන් වඩනා ලද සිත් ඇති ධනවත් බායිලා ඔහුට හිරිහැර කිරීමට පටන් ගත්හ.

බොහෝ දේ වලදී ඔහු ළාමක ගත පැවේය. අඩු පළපුරුද්දක් ඇති නොහොත් නොඉවසන පුද්ගලයෙක් විය. මිහයිල් පෝලනොව්ගේ ``පෝද්න්යතයා ට්සෙලිනා``** නැමැති නව කතාවේ එන කොමියුනිස්ටවාදී නගුල්නව්ට ඔහු බොහෙවින් සමානය. සියලු අඩුපාඩුකම් මැද දුයිෂෙන් උනන්දුව, නිර්භයත්වය සහ පරාත්ථකාමීත්වය ඇති පුද්ගලයෙකි. ඔහු බලගතු බියජනක සතුරන්ට එදිරිව සටන් කරයි. තම සිසුවියක් වන අල්තිනායි ඇගේ ස්වාමියා වන බායියෙකුගෙන් මුදාගත් දුයිෂෙන් මෙසේ පවසයි: ``තණ කොළ පාගා

---

*කිර්ගිස් ගම් මෙනමින් හැඳින්වේ.

**අස්වැද්දූ නැවුම් බිම.

දමන්නාක් මෙන් නුඹ ඇය පාගා දමා විනාශ කළැයි කියා හිතනවද?.. බොරු කාරයා නුඹේ කාලය ඉවරයි. දැන් ඇගේ කාලය පැමිණ ඇත...''

චින්ගිස් අයිත්මාතව්ගේ නව කතාවල එන අල්තිනායි වැනි චරිත සුප්‍රසිද්ධය. සෝවියට් ආණ්ඩු බලය පිහිටුවීමෙන් පසු මැද ආසියාවේ ඇතිවූ පරිවර්තනය ගැනද, නව අවස්ථා ගැනද, මෑතක් වන තුරු වැඩවසම් හා රදළ ක්‍රමයට අයත් වහල් සිරිත්වලට යටවී සිටි මිනිසුන් ඒවාට එදිරිව නැගී සිට පෙන්වූ අධ්‍යාත්මික බලය ගැනද ඔහුගේ චරිත කියා පායි.

''ගැහැනියගේ වාසනාව උමයින් වදා හදා වඩා ගැනීමත්, ගෙදර දොර අර පිරිමැස්මෙන් කටයුතු කිරීමත්'' යැයි මහලු නැන්දම්මා ජමිලාට උගන්වන්නිය. යුද්ධයට ගිය ජමිලාගේ සැමියා එවන ලියුම්වල ඇගේ නම සඳහන් වන්නේ ඕනෑවට එපාවට මෙනි. සතුන් රංචුවක ''බැටළු පැටවුන් මෙන් ඒවා (ලියුම්) එකිනෙකට සමානය''.

මේ හේතුන් නිසා තරුණ කතගේ අනාගතය වෙනස්වන හැටි හැඳිනගැනීම එතරම් අමාරු නොවේ. 'පළමුවැනි ගුරුවරයා' නව කතාවේ, බායි කුඩාරමේදී අල්තිනායි දුටු ගැහැනියට ජමිලා සමාන නොවේ. ''නිවී ගිය අළු මෙන් අප්‍රාණික ඇගේ ඇස් මළ එකියකගේ මෙන් විය. කුඩා කල සිටම අනෝරයන්ට මූණ පාන බල්ලෝද සිටිති.'' ජමිලාගේ අනාගතයද එදිනෙදා වැඩවලට සීමාවී ඇඳිරී වනු ඇත. උසස් හැඟීම් හා බලාපොරොත්තුවලට ඇයට අවස්ථාවක් නැත.

තරුණ ජමිලා තනිකඩ එමෙන්ම උඩඟු දනියාර් වෙත ඇදී ගියේ එබැවිනි. දනියාර් තම ගී වලින් ජමිලාගේ අධ්‍යාත්මයට හා ත්‍යාගශීලි හදවතට නව ජීවයක් ඇතුළු කළේය.

දනියාර්ට ජමිලා ආලය කළේ චපල අදහසකින් නොවේ. දෙමහල්ලෝ තම ලේලිට ජමිලාට කරුණාව දැක්වූහ. අධ්‍යාත්මික වශයෙන් පටු හා පහත් එම ජීවිතය නිසා සතුටුවීමට ඇයට සිදුවිය.

ජමිලා දනියාර් සමග පැනයාම නිසා අයිලයේ ගැනු ඇය හෙළා දුටහ. එහෙත් ඇ තම සීමාසහිත භාග්‍යයට පයින් ගසා, නියම ජීවිතයක් හා අයිතිය සඳහා එම පියවර ගත්තාය.

රියැදුරු ඉල්යාස්, අසේලිට ආලය කරයි. එය විචිධ, සංකීර්ණ, චමත්කාර ජනක ලෙස වර්ධනය වෙයි. ඉල්යාස් අසේලිට හා බයිටෙමීර්ට වරදක් කිරීම නිසා ඔහු සිතින් වේදනා විඳියි. චින්ගිස් අයිත්මාතව්ගේ ''නැතිවුණු වස්තුව'' නැමැති නවකතාවේ එන චරිතයන් වන කිර්ගීසියාවේ නව මිනිසුන් අප හඳුනාගන්නේ ඒ විධියටය.

අයිත්මාතව්ගේ නව කතා සෝවියට් රට තුළ හා විදේශවලද ප්‍රසිද්ධය. විසි හතර හැවිරිදි අයිත්මාතව් 1952 දී තම පළමු වැනි නව


කතාව ලියුවේය. ඊට අවුරුදු දහයකට පසු ''ජමිලා'' නව කතාව නිසා ඔහු ජනප්‍රිය විය. 1963 දී චින්ගිස් අයිත්මාතව්ට ලෙනින් තෑග්ග පිරිනමන ලදී.

කිර්ගිස් සාහිත්‍යයේද, සෝවියට් රටේ අනිකුත් ජාතීන්ගේ සාහිත්‍යයේද, වෙනත් කලා ශිල්පවලද උසස් තම අංගයන් චින්ගිස් අයිත්මාතව් උකහා ගත් බව ඔහුගේ නව කතාවලින් පෙනේ.

චින්ගිස් අයිත්මාතව්ගේ නිර්මාණාත්මක සාහිත්‍ය කෘතීන් ගැන ඔහු උපන් රට තුළ බොහෝ දෙනා විවාද කරති. එහෙත් ඔහුගේ නව කතා ගැන කිසිවෙක් උදාසීනත්වයක් නොදක්වති. ඔහුගේ කලාත්මක ලේඛකත්වය සමකාලීනය, මෙතෙක් කිර්ගිස් ගත්කරුවන් ආදරය කළ සීමාවන් බිඳගෙන නිර්භය ලෙස ඉදිරියට යාමෙන් අයිත්මාතව් පෙන්වූ ආදර්ශය අද විශේෂයෙන්ම තරුණ ලේඛක පරපුරේ ප්‍රසාදයට ලක්වී ඇත.

කිර්ගිස් සාහිත්‍යයේ පියා වශයෙන් ගැනෙන මහලු තොක්තොගුල්ගේ උපදෙස් අනුව සමකාලීන කිර්ගිස් ඉතිහාසය වර්ධනය වෙමින් පවතී.

ජ. තුර්කෝව්





# జమీలా

මම නැවත විශාල නොවන ඒ චිත්‍රය ඉදිරිපිට සිටගනිමි. හෙට මා නැවත අයිලයට යා යුතුය. චාම් රාමුවක් සහිත ඒ චිත්‍රය දෙස මා බොහෝ වේලාවක් බලාගෙන සිටින්නේ එයින් මගේ ගමනට සුබපැතුම් ලබා ගැනීමට මෙනි.

මේ චිත්‍රය කිසිම ප්‍රදර්ශනයකට මම නොතැබීමි. එපමණක් නොව, අයිලයේ සිට මගේ නෑයින් පැමිණි විට ඔවුන්ට නොපෙනෙන සේ එය මුලුගන්වමි. ලජ්ජාවීමට එහි කිසිවක් නැත. එය චිත්‍රකලාව අනුව වටිනා කෘතියක්ද නොවේ. එහි ඇඳ ඇති මහ පොළොව මෙන් එය චාම්ය.

හේමන්තය ළංවී ඇතැයි කියන අහස ඇඳිරීය. අළු පැහැති වලාකුළු එලවන කුණාටුව ප්‍රචණ්ඩය. ඉදිරිපස රන් පැහැගත් ස්ටෙප් තණ බිමය. වැසි නිසා පාරවල් මඩවී ඇත. පාර දෙපැත්තේ වැවී ඇති විශ පඳුරු වියළිය. පාර දිගේ දෙදෙනෙක් ගමන් කරති. ඈත යමින් සිටින ඔවුන් තව එක පියවරක් තැබුවහොත් චිත්‍රයෙන් ඉවතට යනු ඇත. ඉන් එකෙක්... වුවමනාවට වඩා ඉදිරියට ගොස් කතාව කීම සුදුසු නොවේ.

මගේ ළමා කාලයේදී සිදුවූවකි ඒ. පැසිස්ට් ජර්මනිය සෝවියට් දේශයට පහර දීමෙන් ඇරඹුණු යුද්ධය තෙවන අවුරුද්දට පා තැබිය. අපේ පියවරු සහ වැඩිමහල් සොහොයුරෝ කුර්ස්ක් හා ඔර්යොල් අසල යුද පෙරමුණුවල සටන් කළහ. ගැටවරයින් වූ අපේ වයස අවුරුදු 15 කට වැඩි නොවූයෙන්, අපි සමූහ ගොවිපලේ වැඩ කළෙමු. ගොවීන්ට අයත් අසීරු වැඩ හැමදාම කිරීමට ළපටි අපට සිදුවිය. අස්වැන්න කපා ගැනීමේ කාලයේදී අප කළ යුතු වැඩ ගොඩ තවත් වැඩිවිය. සති ගණන් තිස්සේ ගෙදර නොගිය අපි රැයත් දවාලත් ගොවි පලේම ගත කළෙමු. කමතේ වැඩ කළ අපි තිරිඟු මිටි බැඳ ඒවා දුම්රියපළට ගෙන ගියෙමු.

ගිනි කස මෙන් ක්‍රියාකාරීවුණු දැකැති කොතරම් රත්විදයත් ඒවායින් ගිනි පිටවන්නාක් මෙන් දැනිණි. මෙවැනි දවසක දුම්රියපළේ සිට ගොවිපළට එමින් සිටි මට ගෙදර යාමට සිත්වුණෙන්, හිස් කරත්තය දක්කාගෙන මම නිවෙස බලා ගියෙමි.

මග අවසන් වන කුඩා කන්දක් අසල ගෙවතු දෙකකි. ඒවා මැද ''මෝඩ'' ගඩොලින් සාදනලද ගෙවල් දෙකකි. උසැති පොප්ලර් ගස් ඒවා වටා වැවී ඇත. අවුරුදු කීපයක් තිස්සේ මේ ගෙවල්වල අපේ පවුල් වාසය කරති. මහ ගෙදර පවුලට මා අයත්ය. මගේ වැඩිමහල් සොහොයුරෝ දෙදෙනා යුද්ධ සේවය පිණිස පෙරමුණ බලා ගියහ. අවිවාහකයින්වූ ඔවුන් දෙදෙනාගෙන් අද දක්වාත් ලියුම් නැත. ඔවුන් ගැන කිසිදු තොරතුරක්වත් අපට නොලැබිණි.

පැරණි වධුවකුවූ මගේ පියා උමදන් නැගිට දෙවියන් වැඳ වඩුමඩුවට යයි. ඔහු නැවත ගෙදර එන්නේ ඇඳිරි වැටුණු පසුවය.

අම්මා සහ නංගි ගෙදර නැවතුනහ.

අපේ අසල්වැසි ගෙදර, එනම් අයිලයේ ගම්මුන් කියන පරිද කුඩා ගෙදර, අපේ ළඟම නෑයෝ වාසය කරති. අපේ සීයලා හෝ මුත්තලා හෝ සහෝදරයන් වූහයි කියති. මා ඔවුන් ළඟම නෑයන් ලෙස හඳුන්වන්නේ අප එකම පවුලක ජීවත් වූ බැවිනි. තැනින් තැන ගොස් එඬේරුන් මෙන් ජීවත්වූ කාලයේ සිටම අපේ පවුල් එක්ව එඬේරකම් කළහ, කූඩාරම් සාදා ගෙන එක තැන වාසය කළහ. මේ සිරිත අපේ පියවරු ද නොකැඩූහ. සමූහ ගොවිපළ පිහිටවූ විට මේ දෙපවුල එක්වී ළං ළංව ගෙවල් සාදා ගත්හ. අපේ නෑකම පවුල් දෙකකට පමණක් සීමා නොවිණි. අරාල්ස්ක් විදියේ පදිංචි හැම පවුලක්ම මෙසේ නෑයෝ වූහ. අපි හැම දෙනෙක්ම එකම ගෝත්‍රයකට අයත් වීමු.

සමූහ ගොවිපළ පිහිටුවීමෙන් ටික කලකට පසු කුඩා ගෙදර ස්වාමියා මිය ගියේය. ඔහුගේ බිරිඳ හා කුඩා පිරිමි දරුවෝ දෙදෙනා අසරණ වූහ. අදාත්* නම්වූ පැරණි මුස්ලිම් සිරිත අනුව පිරිමි දරුවන් වැන්දඹුවගේ පාර්ශවයට නොයැවිය යුතුය. අපේ ගෝත්‍රිකයෝ එක්ව අපේ තාත්තාට ඒ වැන්දඹුව පාවා දුන්හ. අපේ මුත්තන්ගේ අණ අකුරටම පිළිපැදීමට ඔහුට සිදුවිය. කුඩා ගෙදර මිය ගිය ස්වාමියාගේ ළඟම නෑයා වූයේද අපේ තාත්තාය.

අපේ පවුලට තවත් පවුලක් එක්වුණේ මේ ආකාරයටය. කුඩා ගෙදර ආර්ථිකය නිදහස් එකකි: ඔවුනට වෙනම ගෙයක් සහ එළු බැටළු රංචුවක් තිබුණද අපි එක්ව ජීවත් වීමු.

කුඩා ගෙදරින්ද පුත්තු දෙදෙනෙක් යුද්ධයට ගියහ. වැඩිමහල් පුත් සදික් විවාහවී දින කීපයකින් යුද්ධයට ගියේය. කුඩා ගෙදර පුතුන්ගෙන් අපට ඉඳහිට ලියුම් ලැබිණි.

කුඩා ගෙදර ඉතිරිව සිටියේ ''කිචි-අපා'' හෙවත් කුඩම්මා සහ සදික්ගේ බිරිඳ පමණකි. ඔවුහු උදේ සිට සවස් වනතුරු සමූහ ගොවිපළේ වැඩ කළහ. ''කිචි-අපා'' කරුණාවන්තියකි, අහිංසකියකි, වැඩෙහි දක්ෂ ගැහැනියකි. තරුණියන් හා කොල්ලන් සමඟ කරට කර වැඩ කළ ඇ දිය අගල් කැපුවාය, වතුර ගෙනාවාය, කෙත්මනය** ඇඩිකොට අල්ලා ගෙන

---

* අදාත් — පැරණි රදළවාදී මුස්ලිම් නොලිඛිත නීතියක් වූ මෙය සෝවියට් ආණ්ඩුව විසින් අහෝසි කරන ලදි.

** ගොවිතැන් කිරීමට භාවිතා කරන උදැල්ල වැනි උපකරණයකි.

දක්ෂ ලෙස ගොවිතැන් වැඩෙහි යෙදුණාය. ජමීලා හෙවත් සදික්ගේ බිරිඳ ඇගේ නැන්දා මෙන්ම වෙහෙස නොබලා වැඩ කළාය. චරිතය අනුව ඈ කුඩම්මාට වඩා වෙනස් වූවාය.

ජමීලාට මම බොහෝ සෙයින්ම ආලය කරමි. ඇද මට ආලය කළාය. කිට්ටු මිතුරන් මෙන් අප හැසුරුණද එතිමෙනකට නම් වලින් කතා කිරීමට අපට හැකියාවක් නොතිබිණි. අප වෙනත් පවුල්වලට අයත් විනම් ඇට ජමීලා යැයි ඇමතීමට මට පුළුවන් කමක් තිබිණි. අයියගේ බිරිඳ--නැනා හෙවත් ''ජෙනෙ'' යන නමින් මා ඇය ඇමතූ අතර ඈ ''කිචිනෙ බාලා'' හෙවත් පුංචි මල්ලි යනුවෙන් මා ඇමතුවාය. වයසින් මා එතරම් බාලයකු නොවූ අතර ජමීලා මට වඩා වැඩිමහල් වූයේ යම්තමිනි. අයිලයේ සිරිත අනුව බාල මස්සිනා හඳුන්වනු ලැබුවේ ''කිචිනෙ බාලා'' හෙවත් ''මගේ සයිනි'' නමිනි.

අපේ ගෙවල් දෙකෙහිම කෑම් බීම් ආදිය පිළියෙල කිරීම මගේ මවට භාරවිය. ඇට ආධාර කරන ලද්දේ මගේ නැගණිය විසිනි. ඈ කොතරම් ආශාවකින් හා වුවමනාවකින් වැඩ කළාද යන්න මට දැනුද අමතක නොවේ. ඒ අයිරු දවස්වලදී අප දෙපවුලටම අයත් එළුවන් හා බැටළුවන්ට තණ කැවීම, ගොම වැරටි හා දර කෝටු එකතු කොට ගිනි තැපීමට නිතර සූදානම් කර තැබීමාදිය ඈ කළාය. සිත උපදවන කුඩා නහයක් සහිත මුහුණක් ඇති මගේ නංගි යුද්ධයට ගිය වැඩිමහල් සොහොවුරන්ගෙන් ලිපියක් පවා නොලැබ දුක්වන අම්මාගේ සිත සනසාලීමට සමත් වූවාය.

අග හිඟයෙන් තොරව සාමයෙන් අප හැම දෙන විසුවේ අපේ මවගේ දක්ෂතාවය නිසාය. ගෙවල් දෙකෙහිම ආර්ථිකය පාලනය කළ ඈ පවුල ආරක්ෂා කරන්නියද වූවාය. අපේ සියා තැනින් තැන ගොස් එඬේර රැකියාව කළ කාලයේදී අපේ පවුලට පැමිණි අම්මා වයසින් බාල තරුණියක් වූවාය. එකල සිට ඈ අප පවුලට අයත් සිරිත් විරිත් අනුව සාධාරණ ලෙස සිය කටයුතු ඉටු කළාය. අපේ අයිලයේ හැම දෙනෙකම අපේ මවට ගරුකරති. අතිශයින්ම සාධාරණ ගැහැනිය හැටියට ඇය හඳුන්වති. නුවණැති පලපුරුදු ස්වාමිදුවක ලෙස සලකති. ගෙදර සියලු කටයුතු මව කරන්නිය. අපේ අයිලයේ ගම්මු, අප පවුලේ ප්‍රධානියා ලෙස අපේ පියා නොසැලකූහ. කිසි ප්‍රශ්නයක් පැන නැගි විට ගම්මුන් ඔවුනොවුන් අතර මෙසේ කතා කරන සැටි ඇසුණු වාර කීපයකි: ''නුඹ වඩුරාළ ළඟට යන්න එපා. එයා දන්නෙ එයාගෙ පොරොව ගැන විතරයි. එයාගෙ මහ ගෑනි ළඟට යනව. ඒ උන්දෑ ඕන දෙයක් කරාවි. යමු හොඳ ඈ ළඟට යාමයි...''

මා වයසින් බාලවුවද අව වගයෙන් හෝ ගෙදර වැඩවලට බලපෑ බව කිව යුතුය. මෙසේ කිරීමට ඉඩක් ලැබුණේ වැඩි මහල් සොහොවුරන

යුද්ධයට ගිය හැවින්. නිතර විහිළුවක් ලෙසද ඉඳහිට බැරෑරුම් ලෙසද, දෙපවුලම ආරක්ෂා කරන, ඔවුන්ට ආහාර සපයන තරුණියා ලෙස මම හඳුන්වන ලදිමි. මේ නිසා මා ආඩම්බර වූ අතර මා තුළ ඇති වගකීම අඩු නොවිය. මගේ ස්වාධීනත්වයට මව රැකුල් දුන්නිය. දිනපතාම ලී ඉරන, යතුගාන තාත්තා මෙන් නොව, ගෙදර දොර වැඩ කටයුතුවලදී නිර්භයව හා ස්වාධීනව මා ක්‍රියා කරනවා බැලීමට අම්මා ආශා කළාය.

කරත්තය ගෙවත්ත අසල ගසක් යට නැවැත්වූ මම ගෙවැට දෙසට ගමන් කළෙමි. වැට අසල අපේ නඩ නායක ඕරෝස්මාට් දුටිමි. ඔහු සුපුරුදු ලෙස අසු පිට වාඩිවී සිටියේය. ඔහුගේ ලී කිහිලි කරුව සැදැල පටියට බැඳ තිබිණි. අම්මා ඔහු අසල සිටගෙන සිටි අතර දෙදෙනාම කිසිවක් ගැන වාද කරන සැටියක් ඇසිණි. මා ඔවුන්ට ළංවූ විට මවගේ වචන මා කනහි වැකිණි:

“නුඹේ අදහසට මම විරුද්ධයි! දෙවියන්ට විරුද්ධ වැඩක් උඹ යෝජනා කරන්නෙ. තිරිඟු මිටි පටවපු කරත්ත දක්කන ගෑනු නුඹ දැකල තියනවද! නැහැ. මගේ ලේලි දැන් කරන විදියට වැඩ කරපුවාවෙ. උදේ හවස ගෙවි යන හැටිවත් මට පෙනෙන්නෙ නැහැ. නුඹට පුළුවන්ද ගෙවල් දෙකක වැඩ කටයුතු පාලනය කරන්න! දුව යම්තම් වැඩිලා... සුමානයක් තිස්සේ මගෙ තුනටිය ඇම්මක් හැදිලා කොන්ද දිග හරින්ට බැහැ. බඩ ඉරිඟු වලට වතුර නැහැ”යි කිපුණු හඬෙකින් පැවසුවාය. මොට්ටැක්කිලියෙ ඒ කොණක් හැට්ට කර තුළට එබීමට ඈ පටන් ගත්තේ කිපුණු විටය.

“ඔහෙ පුදුම කෙනෙක් නොවැ!” යැයි ඕරෝස්මාට් උස් හඬින් කෑගැසීය. “මට මේ ලී කකුල වෙනුවට මගේ හැබෑ කකුල තිබුණානම්, මම ඔහෙගෙන් ඉල්ලා හිටිනවද? මමම තිරිඟු මිටි කරත්තයට පටවල අසු දක්කාගෙන යාම හොඳ තමා!.. ඒ වැඩේ ගෑනුන්ට අයිති වැඩක් නොවන බව ඇත්ත. ඒ වුණාට පිරිමි කොහෙන් සොයා ගන්නද?.. ඔහෙ ලේලිට ඒ වැඩේ බාර දෙනවට අකමැතියි. අපට ලොක්කො සැහෙන්ට බණිනව... යුද පෙරමුණට ආහාර ඕන. අපි සැලැස්ම අනුව වැඩ කරන්නෙ නැහැ. ඉතින් කොහොමද ඔය වැඩේ කරන්නෙ?”

කසය බිම ගාවමින් නිහඬව මම ඔවුන් වෙත ගියෙමි. මා දුටු විගස නව අදහසක් පහළවූ කලෙක මෙන් නඩ නායකයා ප්‍රීතිවිය.

“ඔහෙ ලේලි ගැන බයවෙනව නම් එයාගෙ පුංචි මස්සිනා ඉන්නෙ. එයා කිසි කෙනෙකුට ඇගේ ඇඟට අත තියන්න ඉඩ නොදෙවි” යැයි නඩ නායක ඕරෝස්මාට් මා පෙන්වමින් කීය. “සෙයිට් හරිම දක්ෂයා. ඔය වගෙ ළමයින් තමා අපේ දිරූ පවුල් පෝෂණය කරන්නෙ. අපට උදව් දෙන්නෙ” යැයි යළි වැඩිදුරටත් කීය.

අම්මා ඔහුට කතා කිරීමට ඉඩ නොතැබිය.

"බලපන් නුඹේ හැටි. පාදඩ තොල්ලෙක් වගේ! නුඹේ ඔළුව කපුටු කූඩුවක් වගෙ තාන්නට වෙලාවක් නැහැ නුඹේ හිස බූ ගාන්ට..." යැයි අම්මා මා දෙස බලමින් කීවාය.

"අන්න හොඳ වැඩේ. අද ඔහෙලගෙ පුතා ගෙදරට වෙලා දෙමාපියන් සමග නුරතල් වුණාවෙ" යැයි අම්මාගේ කතාව තේරුම් ගත් නඩ නායකයා කීවේය. "සෙයිට්, නුඹ අද ගෙදර නැවතිලා අස්සයින්ට තැම දීපන්. හෙට උදේට ජමීලාටත් කරත්තයක් දෙනව. එතකොට නුඹල දෙදෙනාටම එකට වැඩකල හැකි. නැනා වෙනුවට නුඹ වගකියන්ට ඕන. බලා ගෙන! සෙයිට් ඇ ආරක්පා කරාවි. මේ දෙදෙනා සමග දනියාරවත් යවන්ට පුළුවනි... මේ ලඟදි එයා යුද පෙරමුණෙන් ආවේ. ඔහෙල දන්නව එයා ගැන. අහිංසකයා. තුන්දෙනා එකවර දුම්රිය පළට තිරිඟු ගෙනයාවි. එතකොට කව්ද ඔහෙලගෙ ලේලිට අත තියන්ට එන්නෙ? සෙයිට් මා කියන්නෙ ඇත්ත නේද? මම යෝජනා කළා ජමීලාට කරත්තයක් බාරදෙන්ට. අම්මා විරුද්ධයි. නුඹ අම්මා කැමති කරවා ගනින්" යැයි නඩනායක ඔරොස්මාට් පැවසීය.

වැඩිහිටියකු සමග මෙන් මා සමග නඩ නායකයා කතා කිරීම සහ මෑගත් උපදෙස් ලබා ගැනීමට ඉදිරිපත්වීම මට සතුටක් විය. ජමීලා මා සමග දිනපතා දුම්රිය පළට යාමද මට ප්‍රීතියක් බව කිව යුතුය. බැගිරුම් පෙනුමකින් යුතුව මම අම්මා වෙත හැරී මෙසේ පැවසීමි:

"ඇට කිසි අනතුරක් වෙන්නෙ නැහැ. ඇව වෘකයෝ කාව්ද?"

නියම අසරුවකු මෙන් දත් අතරින් කෙළ කැසූ මම කසය අතින් ගෙන දෙවර සෙලවීමි.

"බලන්න මෙයාගෙ හැටි!" යැයි අම්මා කීවේ තරමක සතුටින් වුවද ඈ වහාම නැවත කිපී කෑගැසුවාය: "මම නුඹට වෘකයො පෙන්වන්නම්. නුඹ මොනවද දන්නෙ? හරිම පණ්ඩිතයෙක්. හැටි බලපල්ලා!"

"එයාට හැර වෙන කාට දැනගන්නද ඔය දේ ගැන. පවුල් දෙකක් පෝෂණය කරන ජිගිට්*--ඉලන්දාරියෙක් නොවැ සෙයිට් ඔහෙලට ආඩම්බර වෙන්ට පුළුවන් පුතෙක්" යැයි කී ඔරොස්මාට් අම්මා තම අදහස වෙනස් කරගෙන මුරන්ඩු වනු ඇතැයි බියගෙන ඇය දෙස බැලීය.

අම්මා ඔහුගේ කතාවට විරුද්ධ වූණද තරමක් සන්සුන් වූවා සුසුම්ලමින් කතා කලාය:

---

* ජිගිට් — නිර්භය අසරු භටයෙකි. දක්ෂ වැඩකරුවෙකි. අවංක සත්‍ය ගරුක තරුණයෙකි.

"මොන ජගිට් ඉලන්දාරියෙක්ද? තවම පොඩි ළමයෙක් නොවැ. උඹේ සිට රැ වන තුරු වැඩ කරනව... අපේ නියම ජගිට්--ඉලන්දාරියො මොනව කරනවද කියන එක දෙවියො තමා දන්නෙ! අපේ ගෙවල්, පාළුවුණු ගරක් මඩු වගෙ..."

මම ඇතට ගමන් කළ නිසා ඔවුන් අතර වූ කතාවේ ප්‍රතිඵල නොදත්තෙමි. අත තිබූ කසයෙන් ශබ්ද පිටවන සේ බිමට ගසතම ධූලි පැන නැගිණි. මිදුලේ ගොම වේලමින් සිටි නංගි මා දැක සතුටු සිතින් සිනා පැවද මම ඇය නොදැක්කාක් මෙන් ගෙට ඇතුළු වීමි. කලයෙන් වතුර ගෙන දෑත් සෝදා ගෙන කාමරයට ගොස් ඇඹුල් කිරි කෝප්පයක් බීමි. තවත් කිරි කෝප්පයක් ගෙන කඩා පාන් තැඹිලි එහි දැමීමි.

අම්මා සහ ඔරොස්මාට් තවම මිදුලට වී කතා කරති. ඒය වාදයකට වඩා පහත් හඬින් කෙරෙන සාමාන්‍ය සාකච්ඡාවකට සමාන විය. යුද්ධයට ගොස් සිටි මගේ සොහොයුරන් ගැන ඔවුන් කතා කළා විය යුතුය. අම්මා තම බොර පැහැති ඇස්වලින් කඳුළු පිසදමමින් හිස වැනුවාය. ඔරොස්මාට්ගෙ කතාවට සවන් දෙන ඇ ගසවලට ඉහළින් ඈත පිහිටා ඇති ගමක් දෙස බලන්නී, එහි වසන තම සෙබළ පුතුන් දැකීමට තැත් කළාය.

ශෝකයෙන් සිටි මව නව නායකයාගෙ යෝජනාවට එකඟ වූවාක් මෙනි. තම අදහස ඉටුවූ බැවින් සතුටට පත් ඔරොස්මාට් අසු ආපසු හරවාගෙන වේගයෙන් පළවන්නට විය.

ජමීලාගේ අලුත් රැකියාව කෙළවර වන්නේ කොතැනින්ද යන්න එදා මව හෝ මම හෝ නොදැන සිටියෙමු.

අසුන් දෙදෙනෙකු බැඳි රිය පැළවීමට ජමීලාට අපහසු නොවන බව මම විශ්වාස කළෙමි. කඳුකර අයිලයකවූ බකයිර්හි අසරුවකුගෙ දියණියකි ජමීලා. මගේ අයියා සදික්ද අසරුවෙකි. වසන්ත කාලයේ පවත්වනලද තුරඟ තරඟයකදී සදිත්ට ජමීලා පරදවමින් අසු පැලවිය නොහැකි විය. එදා තමා ලැබූ පරාජය නිසා කෝපයට පත් සදික් ඇය පැහැර ගෙන ආ බව මිනිස්සු කීවෝය. එහෙත් මෙය සත්‍යයක්ද යනු කීමට මම නොදනිමි. සදික් ජමීලාට ආලය කළ නිසා ඔහු ඇය විවාහ කරගත් බව සමහරු කීහ. කෙසේවූවද මේ දෙදෙනා එකට ජීවත්වූයේ මාස හතරක් පමණකි.

පැසිස්ට් ජර්මනිය සෝවියට් සංගමයට කඩා පැන ආරම්භ කළ යුද්ධය නිසා සදික්ටද යුද පෙරමුණට යාමට සිදුවිය.

ජමීලා කුසා කළ සිරම සිය පියාගේ අසුන් පැන්නිමෙහි යෙදී සිටියේ මන්ද යන්න කීමට අපහසුය. පුතාටත් දුවටත් සිටි එකම දරුවා ජමීලා වීම මෙයට හේතුවක් වූයේය. ඇගේ චරිතයේ කිසියම් පුරුෂ ලක්ෂණ පෙනෙන්ට තිබිණ. ඇ පිරිමියකු මෙන් උනනන්දුවෙන් වැඩ කළාය. අසල්වැසියන

සමග සාමයෙන් කටයුතු කළ ජමිලා අසාධාරණ ලෙස ඇට සලකන උදවියට පාඩම් උගැන්වීමට පසුබට නොවූවාය. බැණ වැදීමේදී අන් ගැහැනුනට නොදෙවෙනි වූ ඇ සමහර කතුන්ගේ කොණ්ඩයෙන් පවා ඇද්දාය.

අසල්වැසි ගැහැනු මවට පැමිණිලි කළහ:

``නුඹගෙ ලේලි තමා ගැනි! නුඹගෙ ගෙදරට ඇවිත් වැඩි කලක් ගියේ නැහැ. හරිම සණ්ඩු කෙත්තක! නුඹට පවා ගරු කරන්නෙ නැහැ. ඇ නන්දා නුඹට ලජ්ජා වීමට සිදුවේවි!``

``ඒ ගතිගුණ බොහොම හොඳා`` යැයි අපේ අම්මා පිළිතුරු දුන්නාය. ``මගේ ලේලි හැංගි හොරා නැතුව ඇත්ත එළිපිටම කියනවා. මුණ ඉච්චාවට බොරු කියනවට වැඩිය ඒක හොඳා. නුඹලගෙ නිහඬ ගැනු ඇත්ත වශයෙනම පිට අය රවටනව. බොරු ශාන්ත බවක් පෙන්වනව. හරියට කුණු බිත්තරය වගෙ. එළියට සුදු පාටයි. සිනිඳුයි. ඇතුළෙ ගඳ උහුලන්ට බැහැ.``

මාමා සහ නැන්දා ලේලියට සලකන රළු විධියට තාත්තා සහ කුඩම්මා ජමිලාට නොසැලකූහ. ඔවුහු ඇයට කරුණාවන්ත වූහ. දෙවියනට හා සැමියාට අවංකව සේවය කරන ලෙස පමණකි, ඔවුන ඇගෙන් ඉල්ලා සිටියේ.

මට ඔවුන් තේරුම් ගත හැකි විය. පුතුන් හතර දෙනෙකු යුද පෙරමුණට යැවූ දෙමහල්ලෝ තම ලේලිය වන ජමිලා නිසා සුළු හෝ සැනසීමක් ලැබූහ. එබැවින් ඔවුහු ඇය ආරක්ෂා කළහ. එහෙත් මට මගේ මව තේරුම් ගත නොහැකි විය. ඇ ආවාට ගියාට කෙනෙකුට ඇලුම් නොකරන්නිය. ආධිපත්‍යය සහිත දැඩි චරිතයකි, ඇට ඇත්තේ. ඇ තමාටම විශේෂවූ රීති අනුව ජීවත්වූ අතර ඒවා කිසි දිනක වෙනස් නොකළාය. හැම අවුරුද්දේම වසන්තයේදී අපේ පැරණි යූර්ට්* කඩාරම් ගෙවත්තට ගෙන ශුද්ධ කොට දුම් ගස්සවා ප්‍රවේසම් කරයි. අපේ තාත්තා සහ අම්මා තම තරුණ විවාහ ජීවිතය ඇරඹුවේ මේ යූර්ට්--කුඩාරමෙනි. කය වෙහෙසා වැඩ කිරීමට සහ වැඩිහිටියන්ට ගරු කිරීමට ඇ අපට උගැන්වූවාය. පවුලේ සියලු සාමාජිකයින්ගෙන් කොන්දේසි විරහිත යටත්වීමක් ඇ ඉල්ලා සිටියාය.

ජමිලාද අප ගෙදරට පැමිණි පළමුවන දවසේ සිට ලේලියක් මෙන් නොහැසුරුණාය. ඇ වැඩිහිටි අයගේ උපදෙස් පිළිපැද්දාය. එහෙත් කිසි දිනෙක ඔවුනට හිස පාත්කොට ආචාර නොකළාය. සමහර තරුණියන් මෙන් පළමුව හිස පාත් කොට පසුව ``මුණු මුණු`` ගාමින් ඇනුම් පද නොකිවාය. තමා සිතන දේ නිර්භයව කී ජමිලා තම නිගමනයන්ට හේතුවූ කරුණු කෙලින්ම පැහැදිලි කළාය. අම්මා ඇට අනුබල දුන්නාය, ඇය සමග

* තැනින් තැන යමින් එඬේර ජීවිත ගත කරන්නන්ගේ නෝණාකාර විශේෂ කඩාරම් වර්ගයකි.

එකඟ වූවාය. එහෙත් අවසාන වචනය හා තීරණය තමා සතු දෙයක් බව හැඟවූවාය.

ජමීලාගේ නොවක්බව හා සාධාරණත්වය දුටු අම්මා, ඇ තමාට සමාන ගති ඇති කෙනෙකැයි සිතා, ඇය (ජමීලා) පවුලේ තම ස්ථානයෙහි තැබීමට, පවුලේ ආරක්ෂකයා හෙවත් බායිබිචේ (ජ්‍යෙෂ්ඨ බිරිඳ) ගෘහ මූලිකයා කිරීමට කටයුතු කළහයි මට සිතිණි.

''ආශිර්වාද ලැබූ ශක්තිමත් ගෙදරකට නුඹට එන්ට වාසනාව ලැබීම ගැන නුඹ සර්වබලධාරී අල්ලාට පින් දීපන්'' යැයි අම්මා ජමීලාට කීවාය. ''ස්ත්‍රී වාසනාව දරුවන් හදා වඩාගැනීමයි, ගෙදර කටයුතු පාලනය කිරීමයි. තාත්තා අපි රුස්කළ හැම දෙයක්ම නුඹට අයිතියි. අපට එව අප යන තැනට ගෙනියන්ට බැහැ නෙව. අවංකබව හා නිර්දෝෂී බව ආරක්ෂා කරන ගැහැනියට වාසනාව ලැබෙනව. එක මතක තියා ගෙන ඒ අනුව වැඩ කරපන්'' යැයි අම්මා ජමීලාට අවවාද කළාය.

එසේ වුවද ජමීලාගේ සමහර ගති නිසා ඇගේ නැන්දලා සහ මාමා පුදුම වූහ: ජමීලා කුඩා ළමයෙකු මෙන් හැසුරුණාය. සමහර විට ඉතා සුළු දෙයකට පවා සිනහසෙන ඇ, කොක් හඬලමින් හඬනගා සිනාසී සතුටුවෙයි. දවසේ වැඩ අවසන් කොට ගෙදර එන ඇ දඟකාර කොල්ලෙකු මෙන් දුවමින් විත ගෙවත්ත ඉදිරියේ ඇති දිය අගල හරහා පනී. ගිටි හැටියේ ඇ එක් නැනදා කෙනෙකුවද පසුව තවත් දවසක තවත් නැන්දා කෙනෙකුවද සිප ගනියි.

වැඩිහිටියන් ඉදිරියේ වුවද ලජ්ජා නොවී ජමීලා ගී ගැයුවාය. නිතර ඇ කිසියම් ගීතයක් හෝ ගීතයක කොටසක් හෝ ගායනා කළාය. අයිලයේ පිළිගත් චාරිත්‍රවලට මේ හැසිරීම් කොහෙත්ම නොගැළපෙන බව නොකිව යුතුය. ජමීලා තරුණියක් නිසාත්, සමහර තරුණියන් එසේ හැසිරීම ස්වාභාවික නිසාත් කල්යාමේදී මේ හැසිරීම ඉබේටම නවතිනු ඇතැයි ඇගේ නැන්දලා දෙදෙනා සිතූහ. ජමීලා තරම් හොඳ කෙනෙක් මෙලොව නැතැයි මම සිතුවෙමි. අපි දෙදෙනා නිතර හඬනගා සිනහසුණෙමු. එකිනෙකා එලවමින් ඔට්ටු සෙල්ලම් කළෙමු.

ජමීලා රූමත් තරුණියක් වූවාය. ඇ සිහින්ය, ඍජුය. ඇගේ හිසකේ බොකුටුය. විශාල දිගැති කෙස් කැරලි දෙකකට එය බෙදා තිබිණි. සුදු ලේන්සුවක් ඇ හිස වැසෙන සේ පැළඳුවාය. ඇගේ දුඹුරු පැහැති මුහුණට ඒ සුදු ලේන්සුව සහ එය පැළඳ තිබෙන ආකාරය සසට ගැළපිණ. ඇ සිනාසෙන විට තද දුඹුරු පැහැති ඇගේ ඇස්වල යෞවණ ප්‍රබෝධයක් පැතිරිණ. අයිලයේ ගම්බද ගීගැයීමට ඇ පටන්ගත් විට ඇගේ සුන්දර ඇස් කාන්තිමත් ලෙස බැබලිණි.

තරුණයෝ, විශේෂයෙන්ම යුද පෙරමුණේ සිට පැමිණි සෙබලෝ ජමීලා දෙස මහත් ඕනෑකමින් බැලූහ. ඇද ඔවුන් සමග විහිළු කිරීමට ඉදිරිපත්වුණේද සීමාව ඉක්මවා යන ඔවුන්ට දඬුවම් දීමට පසුබට නොවූවාය. එසේවුවද එවැනි අවස්ථාවලදී මම රොසවීමි. වැඩිමහල් සොහොයුරියට බාල සොහොයුරු ඊර්ෂ්‍යා කරන්නාක් මෙන් මමද ඊර්ෂ්‍යා කළෙමි. ජමීලා අසල තරුණයන් සිටිනු දුටු විට ඔවුන්ට කිසි අවහිරයක් කිරීමට මම නිතර පෙළඹුණෙමි. ''නුඹල මනමාලකම් කරන්ට එනවද? ජමීලා මගේ අයියාගෙ බිරිඳ බව මතක තබා ගනිල්ලා!'' යැයි ඔවුන්ට කියන මම මුහුණ පුප්පා ගනිමි.

සුදුසු නුසුදුසු බව නොසලකා ජමීලා වටේ සිටගෙන ඇය සමග කතා කරන, කෙළි කවටකම් කරන තරුණයින්ට බාධා කිරීමට මම ඉදිරිපත් වීමි. ඔවුන්ට බාධා කිරීමට මට බැරිවූ විට කෝප වන මම කෑගැසීමි.

තරුණයෝ උපහාසාත්මක ලීලාවෙන් සිනාසුණහ:

''මන්න බලපල්ලකො මිනිහගෙ හැටි! කොහොම වුණත් එයාගෙ නෑනා නෙව. කලින් අපි ඔය ගැන දැනගෙන හිටියෙ නැහැ නෙව.''

ඔවැනි ඇණුම් පද නිසා මගේ දෙකන රත්විය. දැස කඳුලින් පිරිණි. ජමීලා මගේ නෑනා මගෙ තත්ත්වය අවබෝධ කර ගත්තාය. අමාරුවෙන් සිනාව මැඩගත් ඇ බැරෑරුම් මුහුණක් මවාගෙන මෙසේ ඇසුවාය:

''නුඹල හිතනවද ජේමෙත--නෑනල මහ පාර දෙපැත්තෙ වැටිල ඉන්නවයි කියල?'' ආඩම්බර ලෙස ඇ ඔවුන් දෙස බලා මෙසේ කීවාය: ''නුඹලගෙ ජේමෙත්--නෑනලා මහ පාරෙ වැටිල ඉන්නව ඇති. කයිනි* යමු යන්ට. නුඹල යන දිහාවකට පලයල්ල!'' අහද දගර පා හිස ඔසවා සෘජුව සිටගත් ජමීලා දෙවුර සොලවා මා කැඳවා ඉවත යන්නී මඳ සිනා පෑවාය.

ඇගේ සිනාවෙහි පීඩාකාරී බවක් සහ සතුටක් පෙනෙන්ට තිබිණි. එදා ජමීලා මෙසේ සිතුවා විය හැක: ''අනේ! නුඹ මෝඩ කොල්ලෙක්. මට හිතුනොත් මා නවත්වන්ට කාටවත් බැහැ. මුළු පවුලම සෙව්වත් සොයන්ට බැහැ!'' ඇත්ත වශයෙන් මම ජමීලාට ඊර්ෂ්‍යා කළෙමි. ඇ මගේ නෑනා වීම නිසා මම ආඩම්බර වීමි, ඇට කෘතඥවීමි, ඇගේ රූපය හා නිදහස් නිර්භය චරිතය නිසා ප්‍රීතිවීමි. අප දෙදෙනා අතිශයින්ම කිට්ටු මිතුරන් වූයෙන් අප අතර රහසක් නොවීය.

යුද්ධය පැවැති ඒ කාලයේදී අප අයිලයේ පුරුෂයින් ටික දෙනෙක් වූහ. මෙයින් අයුතු ප්‍රයෝජනය ගත් සමහර තරුණයෝ සාහසික ලෙස හැසුරුණහ. ස්ත්‍රීන් පහත් කොට සැලකූහ. ඔවුන් සමග දිගින් දිගට කතා

---

*කයිනි — බාල මස්සිනා.

කිරීමට නොකැමැති වූහ. ඉගියක් තල විගස ඕනෑම ගැහැනියක් ඔවුන් සමග එනු ඇතැයි ඔවුහු සිතූහ.

අපේ දුර නෑයකු වන ඔස්මොන් දවසක් දා පිදුරු මඩුවට වැද ජමීලා සිප ගැනීමට තැත් කළේය. තමාට ඕනෑම ගැහැනියක් යටත් කරගත හැකි යැයි සිතුවන් අතර ඔස්මොන්ද විය. ඇට ලංවූ ඔහු පසෙකට තල්ලු කර දැමූ ජමීලා පිදුරු ගොඩින් නැගී සිටියාය.

``පලයන් යන්ට!'' යැයි කෑ ගැසූ ජමීලා වේදනාවෙන් යුතුව මෙසේ කීවාය: ``තොපි වැනි මද කිපුණු අස්පයින් ගෙන් වෙන මොනවා බලාපොරොත්තු වන්ටද?''

නැගිට සිටි ඔස්මොන් දෙතොල් ලෙවකමින් ඇය දෙස කෝපයෙන් බැලීය.

``ඊට මුදුනෙන් ඇති මස් කැල්ල කන්ට බැරිවුණාම බලලා කීවලු, ඒ මස් කුණුවෙලා කියල. නුඹත් ඒ වගෙ තමා. හොඳට ආසයි. ඒ වුණාට බොරු ආඩම්බරකම් පෙන්වනව.''

ජමීලා පිටුපා ගමන් කළාය.

``සමහර වීට එහෙම වෙන්ට පුළුවනි. අපේ ඉරණමේ හැටි තමා! නුඹ මෝඩයෙක් වගෙ හිනාවෙනව. අවුරුදු සියයක් යුද සෙබලකුගෙ බිරිඳක්ව සිටියත් නුඹ වැනි නිවටයකු සමග සිතින්වත් ඔවැනි දේකට පෙළඹෙන්නෙ නැහැ. යුද්ධය නොතිබුණා නම් නුඹ මා සමග කතා කරන හැටි බලන්ට තිබුණ!''

``මා කියන්නෙත් යුද්ධය ගැන තමා! නුඹ පිරිමියකුගෙ පහසත් නැතුව පිස්සු වැටිල ඉන්නෙ'' යැයි කී ඔස්මොන් සුසුම් ලෑවේය. ``නුඹ මගෙ බිරිඳව හිටිය නම් ඔහොම කතා කරන්නෙ නැහැ.''

ජමීලා ඔහු ඉදිරියට පැන ඔහුට බැණ වැදීමට සූදානම් වූ නමුදු කිසිවක් නොකියා නිහඬ වූවා, බොහෝ වේලාවක් යනතුරු පිළිකුළ මුසු කෝපයෙන් ඔහු දෙස බලා සිටියාය. ඈ ඔහු ඉදිරියේ තෙල ගසා රිටිකරුව ගෙන පිදුරු මඩුවෙන් පිටවූවාය.

පිදුරු මඩුව අසල කරත්තයේ මම සිටියෙමි. මා දුටු ජමීලා අන් අතකට හැරී ගමන් කළාය. මා කෝපවී සිටින බව ඈ දැනගත්තාය. ඔස්මොන් අපහාස කළේ ඇට නොව මටය යන හැඟීමක් මා තුළ ඇතිවූයෙන් මම කෝපවීමි. සිත් තැවලෙන් යුතුව මම ඈට මෙසේ කීවෙමි:

``ඇයි අක්කා ඔය වගෙ වල් මිනිස්සු එක්ක කතා කරන්ට යන්නෙ. උන් සමග සම්බන්ධකම් ඇති කරගන්නෙ ඇයි?''

සවස් වනතුරුම ජමීලා බුම්මාගෙන අසතුට පළකරමින්, පෙර මෙන් මා සමග කතා නොකොට, යිනහ නොවී සිටියාය. මා ඈ ළඟට පිදුරු

කරත්තය ගෙන ගිය විට ඔස්මොන් කළ අපහාසය ගැන මා ඈ සමග කතා කරනැයි බියගත්තී, පිදුරු මිටියක් රිටිකරුවෙත් ගෙන මුහුණ ඉදිරියේ තබාගෙන ගමන් කළාය. ඈ ඉක්මනින් පිදුරු මිටි කරත්තයට පටවන්නට පටන් ගත්තාය. තරමක් ඈතට ගිය මම ඇය දෙස බැලීමි. රිටිකරුවට වාරුවී ජමිලා විනාඩියක්, දෙකක් විවේක ගත්තීය. ඇගේ මුහුණ ඇඳිරිවැ තිබිණි. යමක් කල්පනා කරමින් සිටි ජමිලා හිටි හැටියේම වේගයෙන් නැවත පිදුරු පටවන්නට පටන් ගත්තාය.

අවසාන පිදුරු කරත්තයද පැටවූ පසු, මෙලොව හැම දෙයක්ම අමතක කරමින් මෙන් ජමිලා බැස යන හිරු දෙස බලන්නට වූවාය. ගඟින් එහා කසාක් ස්ටෙප්ස් තැනි තලාව කෙළවර අහසේ බැසයන හිරු ගිනි ගත් හැලියක් මෙන් වටකුරු විය. සෙමින් බැස ගිය හිරු තුනී වලාකුළු ආලෝක කළේය. සැඳෑ හිරු රැසින් ස්ටෙප්ස් බිම්ද දම් පාටින් වැසිණ. හවස ඇඳිරි වැටෙන්නට ළං විය. ජමිලා බැස යන හිරු දෙස බලා සිටියේ යම් කිසි අවතාරයක් දුටු කලෙක මෙනි. ඈ ප්‍රබෝධයෙනි. ඇගේ මුහුණ කුඩා දරුවකුගේ මෙන් සිනිඳුය. ඈ දෙතොල් විවර කරමින් බොළඳ සිනහවක් පෑවාය. ම විසින් ඇගෙන් නොඅසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නාක් මෙන්, ඈ මා දෙස බලා කතාකරන්නට පටන් ගත්තේ. අප දෙදෙනා අතර කතාව දිගටම කෙරීගෙන ගිය කලෙක මෙනි:

``නුඹ ඒ මිනිහා ගැන කල්පනා කරන්ට එපා, කිච්නෙ බාලා*. ඒකාත් මිනිහෙක්ද?'' බැසයන හිරුදෙස ඕනෑකමින් බැලූ ජමිලා නිහඬව සිට, සුසුමක් හෙළා මෙසේ කීවාය: ``මිනිස් හිතක් ක්‍රියාකරන හැටි ඔස්මොන් වැනි මිනිස්සු දන්නෙ කොහොමද? කිසිවෙක් ඒ ගැන දන්නෙ නැහැ... ඒ ගැන දන්න මිනිහෙක් මෙලොව නැතුවා වෙන්ට පුළුවනි...''

මා අඳුන්ට සාන්තු කළ අතර තම වැඩ අවසන් කළ ජමිලා වෙනත් තැනක වැඩ කළ ගෙවිලියන් වෙත දුව ගිය බව මා දැනගත්තේ ඔවුන්ගේ සිනාහඬ ඇසුණු බැවිනි. ඇගේ සිත වෙනස්වූ හැටි විස්තර කිරීම අපහසුය. බැසයන හිරු දුටු නිසා හෝ කය වෙහෙසා වැඩ කිරීම නිසා හෝ ඇය නැවත සතුටු වූවාය. කරත්තයේ පිදුරු මිටි මත වාඩිවූ මම ජමිලා දෙස බැලීමි. ඈ සිය හිස බැඳි ලේන්සුව ගළවා යෙහෙළියක් සමඟ අසල තණ පිට්යට දුව ගියාය. සුළං පහරට ඇගේ ඇඳුම ලෙළදිණ. මා සිත වෙළාගෙන සිටි දුක්මුසු හැඟීම අතුරුදන් විය. ``ඔස්මොන්ගේ වාචාල කතා ගැන සිතීම නොවටී!''

``ඕ-ඕ,ඕ!'' යැයි කියමින් මම අසුන් එළවීමි.

---

*කිච්නෙ බාලා — බාල මස්සිනා.

නඩ නායකයා මට ගෙදර නවතින ලෙස නි දවසේදී සමූහ ගොවිපලට නොගොස්, ගෙදර නැවතුණු මම තාත්තා ලවා ගිය මුදු කරගැනීමට බලාපොරොත්තු වීමි. ඒ අතර සදික්ගේ ලිපියට පිළිතුරු ලිවීමද මට භාරවිය. ලියුම් පිළිබඳව අපගේ රීතිය මෙසේ විය. යුද පෙරමුණේ සිටින වැඩිමහල් සොහොයුරන් පියාට ලියුම් එවිය යුතුය. පියාගේ නම ඇති එම ලියුම් තැපැල්කාරයා මවට භාර දෙයි. ඒවා කියවීම සහ පිළිතුරු සැපයීම මට භාර විය. ලියුම නොකියවාම මම එහි ලියා ඇති දේ කල්තබා දැනගතිමි. සදික් හැමදාම ලියන්නේ එකම දෙයක් ගැනය. බැටළු රැළක පැටවුන් මෙන් ඔහුගේ හැම ලියුමක්ම සමානය. ඔහුගේ පළමුවැනි වැකිය වූයේ මෙයය: ``සැප සනීප ගැන දැන්වීමකි`` ඉන්පසු ඔහු හැම ලියුමකම මෙසේ ලිවේය: ``සකල සිරින්පිරි තලාස්හි ජීවත්වන ආදරණීය තාත්තා වන ජොල්චුබායි ඇතුළු නෑයන් සැම දෙනාටම මේ ලියුම තැපැල් මගින් එවමි...`` ඉන්පසු ඔහු නම් වශයෙන් මගේ මවද, ඔහුගේ මවද වයස අනුව අප හැම දෙනද සඳහන් කළේය. ඉන්පසු අපේ නෑයින් වන වැඩිහිටියන්ගේ සුවදුක්ද, ළඟ නෑයින් සියලු දෙනාගේම සුවදුක් ගැනද විචාළේය. ලියුම් අවසානයේදී හදිසියෙන් මෙන් ඔහු මෙසේද ලියුවේය: ``මගේ බිරිඳ වන ජමීලාටද එමෙන්ම සුබපැතුම් එවමි...``

පියා සහ මවද, අයිලයේ අනිකුත් වැඩිහිටියන්ද කිට්ටු නෑයින්ද ජීවතුන් අතර සිටින විට බිරිඳට ලියුම් ලිවීම අපහසු කරුණක් පමණක් නොවේ. එය අශෝභන ක්‍රියාවක් ලෙසද සලකනු ඇත. සදික් පමණක් නොව ගරු කටයුතු හැම පිරිමියෙක්ම මෙසේ සිතති. අපේ අයිලයේ සිරිත් වල හැටි එසේය. ඒ ගැන කතා කිරීමට පවා වුවමනාවක් නැත. ඒ ගැන සාකච්ඡා කිරීම තබා අප ඒ ගැන සිතාවත් නැත. යුද පෙරමුණෙන් ලියුමක් ලැබීම මුළු ගමම ප්‍රීතියට පත් කරවන ශුභාරංචියකි.

කිප වරක්ම ලියුම් කියවන ලෙස අම්මා මට අණ කළාය. පසුව ඈ දේවමඩ බැගෑපත් බවකින් යුතුව පිපිරී ඇති හම සහිත දෑත්වලින් ලියුම් අතට ගත්තාය. ඈ එය නුහුරු ලෙස අල්ලා ගත්තේ, පියාඹා ඉවතයාමට වෙර දරන කුරුල්ලකු අල්ලා ගත්තාක් මෙනි. අපහසු ලෙස ඈ එම ලියුම නැවත ත්‍රිකෝණ* හැඩයට නවා ගත්තාය.

``අනේ මගේ දයාබර පුතුනේ! නුඹලාගේ ලියුම් කවච මෙන් අපි ආරක්සා කර ගන්නවා`` යැයි ඈ වෙව්ලන හඬින් කිවාය. ``අම්මා, තාත්තා, නැයින් ගැන අහනව. අපි කොහෙ යනවද, අපි අපේම අයිලයෙ ඉන්නව.

---

*යුද්ධ කාලයේදී ලියුම් කවර හිඟය නිසා මෙසේ ලියුම් නවා තැපැල් කරන ලදී.

නුඹලා කොහොමද? එක වචයක් පමණක් ලියා එවපල්ලා! ජීවත්ව ඉන්නවා! කියා ලියා පල්ලා!..''

අම්මා බොහෝ වේලාවක් ඒ ත්‍රිකෝණාකාර ලියුම දෙස බලා සිට, සියලු ලිපි ලියවිලි තැන්පත් කර ඇති යම් පසුම්බිය තුළ ඒ ලියුමද තැන්පත් කළාය.

ලියුම කියවන විට ජමිලා ගෙදර සිටියොත් ඇයටද කියවීමට ඉඩදෙන ලදී. ලියුම අතට ගන්නා හැම වාරයකදීම ඇගේ මුහුණ රතු විය. දෑසින් හැම වචනයක්ම බලන ඈ ගිජුලෙස නිහඬව ලියුම කියැවූවාය.ලියුම කියවා අවසාන වන විට ඇගේ දෙලුර පහතට වැටී මුහුණේ රත් පැහැය අතුරුදහන් විය. ඇස් බැම් උස්සාගෙන තලල රැළි ගස්වමින් ලියුමේ අවසාන වැකි කීපය කියන ජමිලා මන්දොත්සාහී ලෙස ලියුම නැවත අම්මාට දෙන්නේ ණයට ගත් යමක් ආපසු දෙන්නාක් මෙනි.

ලේලියගේ හැඟීම් අම්මා වෙනත් අන්දමකට සිතාගනිමින්, කැලඹුණු ස්වරයෙන් ප්‍රශ්න කළාය:

''නුඹට මක්වෙලාද? අප සමග එක්ව ප්‍රිති වෙනවා වෙනුවට නුඹ කනගාටු වෙනවා. තමඹ මිනිහ විතරද යුද පෙරමුණට ගිහින් තියෙන්නෙ? විපතට මුණ පා ඉන්නෙ නුඹ විතරක් නෙවි. මේක ජනතා දුකක්. ජනතාව සමග එක්වී ඉවසපන්. නුඹ හිතනවද ස්වාමි පුරුෂයින් ගැන සිතමින් දුක් නොවන ගැනු නැතෙයි කියල... එයා ගැන හිතමින් දුක් වෙයන්. ඒ වුණාට පිටතට පෙන්වන්ට එපා!''

ජමිලා නිහඬවූවාය. එහෙත් කාන්සියෙන් යුතු ඇගේ දඟකාරී ඇස් මෙසේ කිවාක් මෙනි: ''අම්මාට කිසි දෙයක් වැටහී නැහැ!''

මේවර සදික්ගෙන් ලියුමක් ලැබුණේ සරාටොව් නගරයේ තැපැල් ලාංඡනය සහිතවය. තුවාල ලැබූ සදික් හමුදා රෝහලක නැවති ප්‍රතිකාර ලබමින් සිටියේය. තුවාල ලැබීම නිසා සේවයෙන් අස්වී දෙව පිහිටෙන් හේමන්තයේදී ගෙදර පැමිණීමට ඉඩ ලැබෙනු ඇතැයි ඔහු විශ්වාස කරන බව ලියා තිබිණි. මේ ගැන ඔහු මිට ඉහත ලියා එවා තිබුණු බැවින් ඉක්මනින් ඔහු මුණගැසීමට අපි බලාපොරොත්තුවීමු.

එදින ගෙදර නොනැවතුණු මම සමූහ ගොවිපළට ගොස් නිදාගතිමි. අසුන් ගාලට ගෙනගොස් ලිහා හැරියෙමි. ලූසෙර්න් තණ පිටියේ සතුන් බැඳීම සමූහ ගොවිපළේ සභාපතිවරයා තහනම් කළද, මගේ අසුන් හොඳ තත්ත්වයක සිටිය යුතු බැවින් මම එම තණ පිටියේ අසුන් බැඳ ඔවුන්ට තණ කැවීමි. ලූසෙර්න් තණ පිටියේ එක් මුල්ලක සතුන් බැඳ මට හොඳට පුරුදුය. රෑ කාලයේ එතැනට සතුන් දක්කා ගෙන යාමද කිසිවකුට නොපෙනෙනසේ කළ හැක. එහෙත් එදින මා එතැනට මගේ අසුන් ගෙනගිය විට , එතැන

අසුන් හතරදෙනෙක් තණ කන සැටි මම දුටුයෙමි, කෝපවීමි. අසුන් ජෝඩුවක් බැදි කරත්තය භාර මටය. මගේ කෝපය සාධාරණ බව මට හැඟුණේ එබැවිනි. මගේ තැන හිමිකරගත් පුද්ගලයාට නිසි පාඩමක් උගැන්වීම පිණිස ඒ අසුන් මම ඈතට එලවා දැමීමට තීරණය කලෙමි. එහෙත් ඒ අසුන් හතරදෙනාගෙන් දෙදෙනෙක්, තඩ නායකයා විසින් සඳහන් කරන ලද දනියාර්ට අයත් බව මට පෙනිණි. හෙට දවසේ සිට ඔහු සමග එක්ව් ආහාර දුම්රිය පලට ගෙනයාමට සිදුවී ඇති බැව් මතක්වුයෙන් අසුන් නොඑලවා මම සමූහ ගොවිපලට ගියෙමි.

දනියාර් මෙතන සිටී බවක් පෙනෙන්නට තිබිණ. ඔහු තම කරත්තයේ රෝද වලට තෙල් දමා පිරිසුදු කොට කඩ ඇණ සවි කරමින් සිටියේය.

``දනිකෝ, තණ පිටියේ ඉන්න අශ්වයෝ නුඹගෙදැ?`` යි මම ඔහුගෙන් ප්‍රශ්න කලෙමි.

දනියාර් සෙමින් හිස හැරවීය.

``දෙදෙනෙක් මගේ.``

අනිත් දෙන්නා කාගෙද?``

``එවුන් අර, අර ජමීලාගෙ. එයා නුඹේ කවුද? නෑකම අනුව!``

``මගේ ජේනේ--නැනා.``

``තඩ නායකයා ඒ අශ්වයෝ දෙන්නව ඔතන ලිහල ගියා. මට කිවා බලාගන්ටයි කියල...``

මා අසුන් නොඑලවීම කොතරම් හොඳද!

රෑ බෝ විය. කඳු මුදුන් පිසගෙන ප්‍රණීත සුලං හමා ගියේ සමූහ ගොවිපල අවට නිහඬ විය. දනියාර් මා අසල පිදුරු ගොඩක් මත වැතිර නිදා ගන්නට සැරසුණද විනාඩි කීපයකට පසු නැගිට ගඟ වෙත ගියේය. ගං ඉවුරේ කඳු ගැටයකට නැග ගත් හෙතෙම දැත් පිටිතලහා කොට ගෙන හිස උරිසක් මත රඳවා ගෙන ගල් රූවක් මෙන් නිසලව සිටියේය. ඔහු මට පිටුපා සිටී බැවින් පසුතලයේ චන්ද්‍රාලෝකය නිසා ඔහුගේ මුහුණත්, උසැති සිරුරත් පෙනිණ. බැසයන ජලකඳ දෙස බලමින් ඔහු එහි 'හු' හඬ අසන බවකි. මට නැසෙන කිසියම් ගුප්තමය ශබ්දයක් ඔහු අසා සිටියා විය හැකිය. ``ආයෙමත් ගඟ ළඟට වෙලා මුළු රෑම ගත කිරීමට මිනිහ ලෑස්ති වෙලා වගෙ. හරි ඔල්මාද කාරයෙක්`` යැයි මම මටම කියා ගතිමි.

දනියාර් අපේ අයිලයට පැමිණියේ මේ තොබෝදාය. දවසක් ආ පිදුරු මඩුවට දුවගෙන ආ කොල්ලෙක් යුද පෙරමුණේ සිට තුවාල ලැබූ සෙබලෙකු පැමිණ සිටින බව පැවසීය. ඔහු කාගේ කවුද යන්න කිසිවෙක් නොදන්හ. එදින අයිලය එක තැනකට රැස්වූවාක් මෙනි. යුද පෙරමුණේ

සිට කිසිවෙකු පැමිණි විට බාලයගේ සිට මහල්ලා දක්වා හැම දෙනෙක්ම ඔහු හමුවීමට පැමිණෙති. සෙබළාගේ අත ගෙන ඔහුට ආචාර කොට, තම පුතුන්, පියවරුන්, සැමියන් හා සහෝදරයින් ගැන විමසති. යුද පෙරමුණේ සටන් ගැන ඇසීමට ආශා කරති. එදින හැම දෙනෙක්ම අනාවැකි පළ කළහ: සමහරු ඔහු ඔවුන්ගේ සොහොවුරෙකියි සිතූහ. සමහරු ඔහු මඟුල් කපුවෙකියි කීහ. පැරුන්නෝ ඔහු හමුවීමට ඉදිරියට ගියහ.

දනියාර් අපේ අයිලයේ උපන් කෙනෙකු බව දැනගන්නට ලැබිණි. කුඩා කලම ඔහුගේ දෙමාපියන් මිය ගියෙන් තුන් හැවිරිදි වයසේ සිට ගෙයින් ගෙට ගොස් සිඟාකෑමට යොමු විය. මවගේ නෑයින් විසින් ඔහු චක්මාක්ස් ස්ටෙප්ස් බිමට පසුව ගෙනයන ලදී. අපේ අයිලයේ ඔහුගේ කිට්ටු නෑයින් නොසිටියෙන් ඔහු ගෙන්වාගැනීමට කිසිවකු ඉදිරිපත් නොවූ අතර ගම්මු ඔහු අමතක කළහ. ගමෙන් පිටවූ පසු ඔහු ජීවත්වූයේ කෙසේදැයි ඇසූවිට, එයට පැහැදිලි ලෙස පිළිතුරු නොලැබිණි. අසරණයකු වූ ඔහු ඉතා අමාරුවෙන් ආහාර වේල සොයාගත් බව ඔහුගේ කතාවෙන් පැහැදිලි විය. දනියාර් තැනින් තැන ගොස් තම දිවි පෙවෙත රැක ගත්තේය. බොහෝ කාලයක් චක්මාක්ස්හි කඳු බෑවුම්වල බැටළුවන් රැකල බලා ගනිමින් සිටි ඔහු තරුණ වියට පැමිණි පසු කාන්තාරයේ දිය අගල් කැපීමට ගියේය. අළුතින් සාදනලද කපු සමූහ ගොවිපළක වැඩ කළේය, තෂ්කෙන්ට් අසල අන්ග්රෙන්ස්ක් පතල්වල වැඩ කළේය. යුද්ධාරම්භ වූ විට හමුදාවට බැඳී සටනට ගියේය.

දනියාර් සිය ජන්ම භූමියට පැමිණීම නිසා ගම්මු ආඩම්බර වූහ. ඔහුට පැසසූහ. ``ලෝකෙ කොයි රටකට ගියත් ආපසු අයිලයට ආවෙ තමා උපන් බිමේ පස් පැගීමට වාසනාව තියෙන හන්දා`` යැයි ගම්මු කීහ. ``පේනවද? එයාට ජන්ම බස අමතක වෙලා නැහැ. කසාක් බසින් යම්තම් වෙනත් විධියකින් කතා කළද, බස හොඳට හුරුයි.``

තුල්පාර්* ලෝකෙ අන්තිමට ගිහිල්ලා හරි තමන්ගෙ පට්ටිය හොයා ගනියි. තමා උපන් රටට, තමන්ගෙ මිනිසුන්ට ආදරය නොකරන්නෙ කවුද? ගමට ආ එක හරිම හොඳයි. නුඹ නුඹගෙ මුතුන් මිත්තන්ගෙ නමට ගරු කළා. ජර්මන් කාරයව පරද්දල දේව පිහිටෙන් සාමකාමී ලෙස ජීවිතය ආරම්භ කරමු. නුඹටත් ගෙයක් හදාගෙන පවුලක් වෙලා ඉන්ට හැකි වේවි`` යැයි මහලු අක්සකල්** වරු කීහ.

---

*තුල්පාර් — කල්පිත අශ්වයෙකි.
**අක්සකල් — වයෝවෘධ ගරුකටයුතු පුද්ගලයෙකි.

දනියාර්ගේ පියා, සීයා සහ මුත්තා ගැන තොරතුරු දත් පැරැන්නෝ ඔහු කිනම් ගොත්‍රයකට අයත්දැයි නිගමනය කළහ. දනියාර් නමින් අපේ අයිලයට අළුත් නැයකු ලැබුණේ ඒ විධියටය.

නවනායක ඔරොස්මාට් අපේ පිදුරු මඩුවට උසැති, තරමක් කුදු, වම් කකුලේ කොරයක් ඇති සෙබළෙකු කැඳවාගෙන ආවේය. සෙමින් ගමන් කරන අශ්ව පැටියකු මත නැග එමින් සිටින ඔරොස්මාට් අසලින් ගමන් කළ සෙබලා උඩ පනිමින් පා තැබිය. උසැති දනියාර් අසල තම අසු මත නැග එන නව නායකයා ගං ඉවුරක කොබයියකු සිහි ගැන්විය. අපේ කොල්ලෝ මේ දර්ශනය නිසා හඬ නගා සිනාසුණාහ.

එවකට ඔහුගේ කකුලේ තුවාලය සුව නොවී තිබුණු නිසා දනියාර්ට ගොයම් කැපීම වැනි ගොවිතැන් වැඩ කළ නොහැකිවූයෙන්, ඔහු පිදුරු මඩුවේ වැඩට යොදන ලදි. පළමුව දනියාර්ගේ හැසිරීම අප සිත් නොගත් බව කිව යුතුය. ඔහුගේ නිහඬතාවය අප සිත් නොගත්තේය. දනියාර් කතා කළේ වචන කීපයකි. ඔහු කතා කරන විටද වෙනයම් දෙයක් ගැන කල්පනා කරන සැටියක් ඇඟවිය. ඔහු අප දෙස බලා කතා කළද, ඔහුට අප පෙනෙන සැටියක් නොදැනේ. ඔහුගේ කල්පනාකාරී ඇස් අප දෙස බැලූ නමුදු ඔහු වෙනම සිහින ලොවක පසුවිය.

``යුද පෙරමුණේ මහ සටන් වලින් පසුව තවම හොඳ සිහිය ලැබී නැහැ. අනේ අසරණයා!`` ය යි ගම්මු කීහ.

එහෙත් එවැනි සිහින ලොවක පසුවෙද්දීත් දනියාර් ඉක්මනින්, නිවැරදි ලෙස තම වැඩ නිසි පරිදි සපුරාලිය. පිටත සිට බලන විට ඔහු සගයන් ප්‍රිය කරන විවෘත හදවතක් ඇති කෙනෙකැයි සිතේ. දෙමාපියන් නැති අසරණ ජීවිතය විසින් ඔහුට මුළුගැන්වීමට සහ තම සිතැඟියාවන් පිට නොකිරීමට උගන්වන ලදි. ඒ කටුක ජීවිතය ඔහුට ආත්ම සංගමයත් උගැන්විද? එසේ විය හැක.

සිහින් දෙතොල් සහිත ඔහුගේ කට තදින් වැසී ඇත. ඇස් නිසලය, දුක් මුසුය. ඔහුගේ සිහින් සදා විඩාපත් මුහුණ ප්‍රබෝධමත් කළේ ජංගමශීලි ඇස් බැමය. අන් අයට නැසුණු යමක් ඔහුට ඇසුණාක් මෙන් දනියාර් සමහර විට නොසන්සුන් විය. එවිට ඔහුගේ ඇස් බැමි නැටවී දෙනෙත්වල අමුතු ප්‍රාණවත් ගතියක් ඇතිවෙයි. පසුව ඔහු බොහෝ වේලාවක් මඳ සිනා පාමින් යම්කිසි හේතුවක් නිසා ප්‍රීතිවිය. ඔහුගේ මේ ගති ගුණ නිසා අපි පුදුමවීමු. ඔහු අපට නොතේරෙන ලෙස හැසුරුණේය. හවස අසුන් පිරිසිදු කොට උන් මුදාහරින අපි කුස්සි අම්මා අහර පිසන තුරු පැළ අසල රැස්වී සිටියෙමු. දනියාර් මුර ගොඩැල්ලට නැග ඈදිරි වැටෙන තෙක් එහි නැවතී සිටියේය.

``අපි මුරකරුවකු පත් කළා. එහෙම නේද? යි අසන අපි සිනාසීමු.

දවසක් දා නුදු කුතුහලය නිසා මම දනියාර් සමග කන්දට නැංගෙමි. මෙහි කිසිදු අමුත්තක් නොවූවාක් මෙනි. ස්ටෙප්ස් බිමට එහා කඳු ගැට පෙළක් පිහිටා ඇත. ඒවා ක්‍රමයෙන් අඳුරුවෙයි. සැඳෑ අඳුරට අසුවන කුඹුරු ක්‍රමයෙන් අතුරුදන් වන්නාක් මෙනි.

මා ඔහුට ලංවන සැටි පවා නොදුටු දනියාර් දණහිස් දෑතින් අල්ලාගෙන කල්පනාකාරී ලෙස ඈත බලාගෙන සිටියේය. ඔහුගේ බැල්ම සතුටුදායකය. මට නොඇසෙන, තේරුම් ගැනීමට බැරි කිසියම් අපූරු හඬකට සවන් දෙන්නාක් මෙන් මට පෙනිණ. හිටිහැටියේම කැළඹෙන ඔහු දෙනෙත් විදහා ගෙන ගල් ගැසිණ. ඔහු ගුප්ත බලයකින් පිඩා විඳින බව දුටු මම ඔහු දැන් නැගිට තම කතාව සම්පූර්ණයෙන් කියනු ඇතැයි සිතීමි. මා ඉදිරියේ නොවේ--ඔහු මා ගණන් ගත්තෙ නැත--මා නොදන්නා යම්කිසි දැවැන්ත ගුප්තමය බලයක් ඉදිරියේ ඔහු තම කතාව කියනු ඇතැයි සිතූ මම ඔහු දෙස බැලීමි. ඔහු විඩාපත්ව වාඩිවී සිටියේය.. දනියාර්ගේ මුහුණ ඇඳිරි වෙලාය. දවසේ ශ්‍රමය වැයකිරීමෙන් පසු විඩාහරින සැටියක් ඔහුගේ විලාසය කියා පෑවේය.

අපේ පිදුරු ගොඩවල් කුර්කූරේලු ගං ඉවුරට අයත් පෙදෙසේ විසුරුවා හැර තිබිණ. අපේ අයිලය අසල කඳු අතර පටු දෙණියකින් කුර්කුරේලු ගඟ ගලා බසින්නේ මහත්වූ වේගයකිනි. ගොයම් කැපීමත් සඳුකර ගංගාවල ජලය උතුරා ගලා යාමත් යන මේ දෙකම එකම කාලයකදී සිදුවේ. පෙර දින සිට කුර්කුරේලු ගඟේ ජලය බොර පැහැය සහ පෙණ සහිත විය. මහා හඬක් නගමින් කුර්කුරේලු ගලා බැසීම නිසා මම අවදිවීමි. නිල්වන් පැහැදිලි අහසේ බැබළෙන තරු අපේ පැළ තුළට එබී බලන්නට විය. ශීත කුණාටුවක් හැමිය. සෑටිවිය නිදාසිටියාක් මෙනි. හඬ නගමින් තර්ජනය කරන ගඟේ ඝෝෂාව පමණක් ඇසිණි. අපේ පැළ ගං ඉවුරේ නොතිබුණද ගඟ උතුරා පිටාර ගැලීම නිසා ගංගා ජලය පැළ අසලටම පැමිණ ඇතැයි මම බිය ගතිමි. අපේ පැළ විනාශ කරමින් ගංවතුර ගලා ගියොත් කුමක්වේද? මගේ සගයෝ සැප නින්දෙන් පසුවූහ. මම එළියට ගොස් අවට පිරික්සා බැලීමි.

කුර්කුරේල ගං ඉවුර අසල පෙදෙස ලස්සනය. එමෙන්ම බියජනකය. තණ පිට්යේ තණ කමින් සිටින අසුන් කළු පැහැති ලප මෙනි. පිණි බිඳු සහිත ලපටි තණ කමින් සිටි අසුහු ඉඳ හිට හේෂාරවය කරමින් තිදති. සුළං පහරට නැමෙන තෙතැති විලෝගස් ඉවුරේ ගල්වලට වැද හඬක් නගමින් ගඟ ඝෝෂා කරයි. ගං ඉවුර බිහිසුණුය. ත්‍රාස ජනකය.

මෙවැනි අවස්ථාවලදී මම නිතර දනියාර් මතක් කළෙමි. ගං ඉවුරේ පිදුරු ගොඩක් මත නිදාගනිමින් රෑ ගත කිරීම දනියාර්ගේ සිරිත විය. ඔහුට බිය නොදැනුනේද? ගඟේ ඝෝෂාව නිසා ඔහුගේ දෙකන් බිහිරි නොවන්නේ මන්ද? ඔහු අවදිවෙලාද? නැතිද? හුදකලාව ඔහු ගඟ අසල රාත්‍රිය ගතකරන්නේ ඇයි? ගඟ අසල රැය ගතකිරීමට ඔහු ආශා කරන්නේ මන්ද? ඔහු අන් අය මෙන් නොවේ. ඔහු පුදුම මිනිහෙකි. දැන් ඔහු කොහිද? වටපිට බැලිමි. කිසිවකු පෙනෙන්නට නැත. කඳු මුදුන්වල ජායා අඳුර තුළින් පෙනේ. අහස පැහැදිලිය. තරු බැබලේ.

අයිලයේ මිතුරන් ඇතිකර ගැනීමට දනියාර්ට කාලය පැමිණ ඇති බව කිව යුතුය. ඔහු පෙර මෙන්ම හුදකලාව සිටියේය. මිතුරු බව සහ සතුරුබවද, සුහද හැඟීම් සහ ඊර්ෂ්‍යාවද ඔහු නොදන්නා, නොසැලකිලි දක්වන ගතිගුණ විය. තමා සහ තම මිතුරන් වෙනුවෙන් කටයුතු කිරීමෙහි සමත්, යහපත් වැඩ කරන, ඉදහිට අයහපත් වැඩ වලට මුල පුරන, මඟුල් හා අවමඟුල් වලදී පැරුන්නන්ට, ශිල්පීන්ට නොදෙවෙනි ලෙස දැනීම හා දක්ෂකම් පෙන්වන තරුණයින්ට අයිලය සලකයි, ගැහැනු ඔවුන්ට කැමති වෙති.

අයිලයේ එදිනෙදා කටයුතුවලට මැදහත් නොවී නොන්වී සිටින දනියාර් වැන්නන් ගැන සමහරු අමතක කරති. අන් සමහරු අනුකම්පා සහගත ලෙස මෙසේ පවසති:

''ඒ මිනිහගෙන් කාටවත් අනතුරක් නැහැ. ප්‍රයෝජනයකුත් නැහැ. දුප්පතා ඔහේ ජීවත්වෙනවා. ඔහොම ඉඳපුවාවෙ...''

එවැනි මිනිසෙක් උපහාසයට හෝ අනුකම්පාවට හෝ ලක්වෙයි. වයසට වඩා වැඩි මේරූ ගතියක් පෙන්වීමට හා නියම තරුණයන් සමග කරට කර හැසිරීමට ආශා කළ ගැටවරයන්වූ අපි, දනියාර් ගැන ඔහු ඉදිරිපිටදී නොව, අප අතර ඔහුට සිනාසීමු. දනියාර් තම සෙබළ කමිසය ගඟට ගෙන සෝදනු සැටි දුටු අපි ඔහුට සිනාසීමු. සෙබළ කමිසය සෝදා එය වේළෙන්නටත් කලින් ඔහු එය නැවත ඇඳ ගනී. ඔහුට තිබුණේ එක ඇඳුමක් පමණකි.

දනියාර් නිහඬ, අහිංසකයකු නමුදු අපි ඔහු සමග සෙල්ලම් කරන්නට තම කිරීමට නොගියෙමු. ඔහු අපට වඩා වයසින් වැඩි මහල්වීම නිසාම නොවිය අපට වඩා අවුරුදු තුනක් හෝ හතරක් වයසැති අයට පවා අපි ''තුඹ'' යැයි ඇමතිමු ඔහු දැඩි නිසා හෝ බොරු වැදගත් කමක් ආරූඪ කරගත් නිසා හෝ නොවිය. එවැනි ගතිගුණ බොහෝ විට ගරු සැලකිලි ලැබිය. දනියාර්ගේ නිහඬතාවයේ හා කල්පනාකාරීබවේ කිසියම් ගුප්තමය බවක් තිබිණි. හැමදෙයකටම සාවඥ ලෙස සිනාසීමට සූදානම් අපි මේ ගුප්ත බවට බිය වීමු.

දනියාර්ට කෙලි කවටකම් කිරීමට අප ඉදිරිපත් නොවූයේ එක් සිද්ධියක් නිසාය. මම නිතර හැම දෙනෙකුගෙන්ම ප්‍රශ්න ඇසීමට ආශා කළෙමි. සමහරු මේ නිසා මා සමග කෝප වූහ. යුද පෙරමුණේ සිට පැමිණි අයගෙන් තොරතුරු ඇසීම මගේ බලවත් ආශාව විය. දනියාර් අපේ පිදුරු මඩුවට පැමිණි දවසේ සිටම ඔහුගෙන් යුද පෙරමුණේ ගැන තොරතුරු අසා දැන ගැනීමට සුදුසු අවස්ථාවක් මම සොයමින් සිටියෙමි.

දවසේ ගොවිතැන් වැඩවලින් පසුව දවසක් දා අපි රාත්‍රී ආහාර ගෙන ගිනි මැලය අවට වාඩිවී විවේක ගනිමින් සිටියෙමු.

``දනිසේ කියන්නකො යුද පෙරමුණේ තත්ත්වය ගැන තොරතුරු විකක්`` යැයි මම දනියාර් අමතා කීවෙමි.

අමනාප වූ ගතියක් පෙන්වූවාක් මෙන් දනියාර් පළමුව නිහඬ විය. බොහෝ වේලාවක් යන තුරු ගිනි මැලය දෙස බලා සිටි දනියාර් සෙමින් හිස හරවා අප දෙස බැලීය.

``අහන්නේ යුද්ධය ගැනදැ?`` යි ඔහු ප්‍රශ්න කළේ තම සිත තුළ පැන නැගී අදහසක් පළ කරන්නාක් මෙනි. ``නැහැ, වඩා හොඳයි නුඹලා යුද්ධය ගැන නොදන්නවානම්`` යැයි ඔහු පහත් හඬින් කීය.

පසුව ඔහු වියළි අතු කීපයක් ගිනි මැලයට දමා ගින්න වැඩි කළේ අප දෙස නොබලමිනි.

ඉන්පසු ඔහු වචනයකුදු කතා නොකළේය. එහෙත් යුද්ධය ගැන ඔහු කී වචන ස්වල්පයෙන් ආවාට ගියාට ඒ ගැන කතා නොකළ හැකි බව අපට වැටහිණ. මිනිස් හදවත තුළට යුද්ධයේ තුවාළ කා වැදී ඇත. එබැවින් යුද්ධය ගැන කතා කිරීම ලෙහෙසි නැත. මගේ හැසිරීම නිසා මා තුළ ලජ්ජාවක් උපණි. යුද්ධය ගැන ඉන්පසු කිසි දිනෙක මම දනියාර්ගෙන් ප්‍රශ්න නොකළෙමි.

අයිලයේ මිනිස්සු දනියාර් ගැන අමතක කළහ. එදින මා ඇසූ ප්‍රශ්නය නිසා ඇතිවූ තත්ත්වයද අමතක විය.

පසු දින උදැසන දනියාරුත් මමත් අසුන් කමතට ගෙනගියෙමු. ඒ වන විට ජමීලා පැමිණ සිටියාය. අප දුටු ජමීලා ඈත සිටම මහ හඬින් කතා කළාය:

``කිචිනෙ බාලා, මගේ අශ්වයින් මෙහාට ගේන්න. අශ්වයින්ගෙ කර පටි කෝ?`` ඈ මුළු ජීවිත කාලය තුළම අසුන් බැඳි කරත්ත දැක්වූවාක් මෙන්, කරත්තය පිරික්සා බලා රෝදවලට පයින් ගසා එහි කඩ ඇණවල ශක්තිය මැණ බැලුවාය.

අපේ හැටි දුටු ඇයට සිනා නොවී සිටිය නොහැකි විය. දනියාර්ගේ දිග කකුල් වැයි තිබුණේ ගොරහැඩි ළාරු හමින් සාදන ලද දණහිස දක්වා

උසැති සපත්තු වලිනි. ඒවා කොතරම් විශාලවීදයත්, හකුල් එළියට පැනීමට යන්නාක් මෙනි. මා අසුන් එලවූයේ පාවහන් රහිතවය. විශාල කළු පැහැති කුණු පැල්ලම් වලින් මගේ දෙපා වැසී තිබිණ.

``කරත්ත දක්කමු!`` යැයි ජමීලා කියන්නී සිනාසී හිස හරවා ගත්තාය. ඇ සැණෙකින් අණ කරන්නට වූවාය. ``ඉක්මන් කරපල්ලා! ඉර මුදුන් වෙන්ට ඉස්සෙල්ලා ස්ටෙප්ස් බිම් හරහා යන්ට ඕන.``

අසුන්ගෙ කට කලියාවෙන් අල්ලා ගත් ජමීලා ඔවුන් කරත්තය වෙත ගෙන ගොස් බැන්දාය. අසුන් කරත්තයට බඳින සැටි සහ තෝන් ලනුව ගන්නා සැටි පෙන්වන ලෙස ඇ මගෙන් ඉල්ලා සිටියේ එක් වරක් පමණකි. පසුව ඇ තනිවම ඒ සියල්ල කලාය. දනියාර් ඇ අසල සිටින බවක් හෝ ඇ නොඇගවූවාය.

ජමීලාගේ තීරණාත්මක බව සහ තුප්පන සුළු ආත්ම විශ්වාසයද නිසා දනියාර් මවිත විය. අමිත්‍ර එමෙන්ම සැඟවුණු උද්දාමයකින් යුතුව, දෙතොල් තද කර ගනිමින් දනියාර් ජමීලා දෙස බැලිය. තරාදියෙන් තිරිඟු මිටියක් නිහඬව ඔසවා ගත් දනියාර් තම කරත්තයට පැටවීමට යත්ම, ජමීලා ඔහුට බාධා කරමින් මෙසේ පැවසුවාය:

``එහෙම නොහොමද! එක් එක්කෙනා තමන්ගේ කරත්ත වලට පැටවීම් හරිද? නැහැ යාළුවා. එහෙම බැහැ. මෙහෙට දෙනව තමුසෙගෙ අත. කිව්වෙ බාලා, නුඹ මොකද බලාගෙන ඉන්නෙ නැගපන් කරත්තෙට. හරි හැටි තිරිඟු මිටි ගොඩ ගහපන්!``

``ජමීලා දනියාර්ගේ අතක් අල්ලා ගෙන එකවර තිරිඟු මිටිය කරත්තය තුළට වීසි කලාය. අසරණ දනියාර්ගේ මුහුණ ලජ්ජාවෙන් රතු විය. තිරිඟු මිටි ගැනීමට දෙදෙනාම එකවර පහත් වන විට ඔවුන්ගේ හිස් එකිනෙකට වැදෙන තරම් ළං විය. දනියාර් එවිට වේදනාවකින් මෙන් යටිතොල සපා ගනිමින් ජමීලා දෙස නොබැලීමට වැර දරන සැටි මම දුටිමි. ජමීලා තමා සමග වැඩ කරන මිනිහා ගැන මදකුදු නොසලකමින්, තිරිඟු මිටිවල බර කිරන ගැහැනිය සමග විහිළු කතා කියමින් සරදම් කලාය. අපේ ගැල්වලට තිරිඟු පැටවූ පසු තෝන් ලනුව අතට ගත් ඇ ඇසක් අඩවන් කොට ගෙන සිනා පාමින් මෙසේ කීවාය:

``ජයි, නුඹේ නම දනියාර්ද? බැලූ බැල්මට නුඹ පිරිමියෙක් නොවැ. අපට මග පෙන්වමින් ඉස්සරහින් දක්කාපන්!``

දනියාර් නිහඬව තම ගැල ඉදිරියට ගත්තේය. ``අනේ අසරණයා, හරිම ලජ්ජා කාරයෙක්`` යැයි මම ඔහු දෙස බලමින් කියා ගත්තෙමි.

අප යා යුතු මග දිගය. ස්ටෙප්ස් බිම් හරහා කිලෝමීටර විස්සක් දුර යා යුතුය. ඉන්පසු කඳු බෑවුම් අතර දෙණිය හරහා දුම්රිය පළ දක්වා

ගැල් පැදවිය යුතුය. කඳු මුදුන්වල සිට පහතට ගැල් පැදවීමට ඉඩ ලැබීම නිසා අසුන්ට අපහසුවක් නොවිය.

අපේ අයිලය--කුර්කුරේඋව පිහිටා ඇත්තේ මහා කඳු වැටි අසලින් ගලා ගිය ගඟේ ඉවුරකය. දෙණියට යන තුරු පඳුරු වශයෙන් උසට වැවී ඇති ගස් සහිත අයිලය පෙනෙයි.

එක දවසක් අපට දුම්රිය පලට ගෙන යා හැක්කේ ගැල් තුනක් පමණකි. උදෙන්ම තිරිඟු මිටි පටවාගෙන යන අප දුම්රිය පළට ගොස් නැවත අයිලයට එන්නේ හවසය.

ඉර අව්ව ඇවිළිය. දුම්රියපලට යාම ලෙහෙසි නොවිය. ප්‍රදේශයේ හැම ගොවිපලකින්ම පැමිණ ඇති ගැල් වල සංඛ්‍යාව විශාලය. බුරුවන් බැඳි කරත්තද, කඳුකර පෙදෙස්වල සමූහ ගොවිපළවලින් පැමිණි ගොන් බැඳි කරත්තද එහි තිබිණ. ඒවා දක්කනු ලැබුවේ කොල්ලන් හා තුවාල ලැබූ සෙබළුන් විසිනි. සමහරු පාවහන් රහිත වූහ. ගල් මුල් හැප්පීම නිසා ඔවුන්ගේ පා ඇඟිලි තුවාල වී ඇත. දැඩි අව්ව හා දූලි නිසා ඔවුන්ගේ තොල් වියලී පිපිරී ගොස් තිබිණි. ඒවා වලින් ලේ ගලන්නටද විය.

තිරිඟු මිටි භාරගන්නා කාර්යාලය අසල ඇද තිබුණු දිගැති රෙදි පටියක ``හැම තිරිඟු ඇටයක්ම යුද පෙරමුණට යවමු!`` යැයි ලියා තිබිණ. කාර්යාලය ඉදිරිපිට රැස්ව සිටි ගැල්කරුවෝ එකිනෙකා තල්ලු කිරීමටත් කැකෝ කැසීමටත් පටන් ගත්හ. අසල පහත් වැටකට එහා දුම්රිය යන්ත්‍රයක් හූ හඬ නගමින් ගමනට සූදානම් වෙමින් සිටියේය. ඉන් පිට වූ කළු පැහැති දුම්වලා අහසට වැද කෙමෙන් අතුරුදහන් විය. දුම් බටයෙන් කුඩා බිම් අඟුරු කැට විසිවිණි. යාබද දුම්රිය මග දිගේ වේගයෙන් දිව ගියේය. දුම්රිය පොළ අසල වූ හිස් බිමේ වැතිර සිටි ඔටුවෝ එඬේරුන්ගේ ``ඩෑවිට් පහරට විරුද්ධව හඬ නැගූහ.

ටකරන් වහලක් සහිත ගබඩා කාමරය තුළ තිරිඟු මිටි ගොඩ ගසා තිබිණි. පඩි පෙළක් වැනි ලී ඉණි මග ඔස්සේ තිරිඟු මිටි ගෙන ගොස් වහල දක්වා උසට ගොඩ ගැසිය යුතුය. දැඩි උෂ්ණය, තිරිඟු සුවඳ හා දූවිලිද නිසා හුස්ම ගැනීම පවා අපහසු විය.

``ඒයි ඉලන්දාරියා හුඹ බලාගෙන!`` යැයි නිදිමැරීම නිසා බොර පැහැති ඇස් ඇති ලිපිකරුවා කෑ ගැසීය. ``උඩට ගෙනියපන්, වහල ළඟටම ගෙනියපන්!`` යැයි කී ඔහු අත මිටිකොට පෙන්වමින් තර්ජනය කරයි.

ඒ මිනිහා බැණ වදින්නේ මන්ද? තිරිඟු මිටි ගොඩ ගැසිය යුතු පිළිවෙල අපි දනිමු. අප ඒ තිරිඟු ගෙන එන්නේ ගොවි පළේ සිටය. ගොවිලියෝ ඒවා ප්‍රවේශමෙන් සිටවා සාත්තු කළහ. මහල්ලෝද ළමයිද ඔවුන් සමග එක්ව ගොවිතැන් කළහ. ගොයම් කැපීමේ කාලයේදී උදේ සිට

හවස්වන තුරු නොකඩවා තොම්බයින් යන්ත්‍රය ඵලවනු ලැබේ. එයද යල්පැන ගිය පැරණි තොම්බයිනයකි. දැකැති අතින් ගෙන පහතට නැමී වැඩ කරන ගැහැනුන්ගේ අත් යන්ත්‍ර මෙන් වේගවත්ව ක්‍රියා කිරීම නිසා, දැකැති ගින්නෙහි දැමූ කලෙක මෙන් රත් වී ඇත. කුඩා ළමයි ප්‍රවේශමින් හැම තිරිඟු ඇටයක්ම එක්රැස් කළහ.

මා කරින් ගෙනගිය තිරිඟු මිටි කොතරම් බරදයත් එය දැන් සිදුවූවාක් මෙන් මට මතකය. එවැනි බර වැඩ කළ හැක්කේ ශක්තිමත් පිරිමින්ට පමණකි. තිරිඟු මිටිය කරින් ගත් මා පඩි පෙළ නැග්ගේ මහත් අසීරුවෙනි. ලී පඩි ත්‍රිස් යන හඬ නැගිය. මම සම්බරට පා තබමින් ඉහළ නැංගෙමි. තිරිඟු මිටිය කරින් වැටෙතැයි බියවූ මම එහි කොනක් තදින් සපාගත්තෙමි. දුවිලි නිසා උගුර හිරවෙන්නාක් මෙන් දැනිණි. තිරිඟු මිටියේ බර විසින් මම වේදනාවෙන් පෙලුනෙමි. ඇස් ඉදිරිපිට ගිනිබෝල වැනි යමක් මතුවිය. මිටිය කරින් ගෙන පඩිපෙළ නගින මගේ කය දුබල වූ වාර අපමණය. මිටියත් සමග පහතට පෙරළීමට තරම් සිත්වූ වාර කීපයකි. කරින් බිමට නොවැටෙන ලෙස තිරිඟු මිටියට මා යාච්ඤා නොකළා පමණකි. මා පිටුපසින් තිරිඟු මිටි කරින් ගත් මා වැනිම ගැටවරයෝද නැතිනම් මා වැනි පුතුන් ඇති, තුවාල ලැබූ යුද්ධ හටයෝද පඩි පෙළ නැග්ගාහ. යුද්ධය නොතිබුණේ නම් මෙවැනි බර වැඩ කිරීමට ළමයින් යෙදවෙත්ද? මෙවැනිම බර වැඩ කාන්තාවන් කළ විට පසුබැසීමට මට අයිතියක් නොතිබිණි.

ගවොම් දණහිස දක්වා නවා ගන්නා ජමීලා තිරිඟු මිටිය කරින් ගෙන පඩිපෙළ නැංගාය. ඇගේ නලෙලලූ ලස්සන කකුල් වල මස් ගොබ පිම්බී ඇත. ඇ තම දෙනය මහත් අසීරුවෙන් සම්බරට තබා ගෙන තිරිඟු මිටිය කරින් ගෙන පඩි පෙළ දිගේ ඉහළ නගිත්ම ඇ දුන්නක් මෙන් ප් මේ අත වැණුනාය. විඩාපත්ව හෙමින් හෙමින් මා ඉහළ නගින විට පමණකි, ජමීලා තම ගමන් වේගය අඩු කළේ.

``ධෛර්‍යය් ගනින්, කිවිනෙ බාලා තව පොඩ්ඩයි!`` මෙසේ කියන ඇ මා දිරිගැන්නුවාය.

එහෙත් ඇගේ කට හඬ අඳුරුය! ජීවයෙන් තොරය!

මෙසේ අපේ තිරිඟු මිටි සිස් කොට හැරී එන අපට තිරිඟු මිටියක් කරින් ගෙන තරමක් නොන්ඩි ගසමින්, ශක්තිමත් ලෙස පා තබමින් පඩිපෙළ නගින දනියාර් හමුවිය. හුදකලාව හා නිහඬව සිටින පුද්ගලයින් හැම කෙනෙක්ම එලෙස ගමන් කරති. දනියාර් ජමීලා දෙස අඳුරු එහෙත් දැවෙන සුළු බැල්මක් හෙළිය. ඇ වහාම තම ගවොම හරි ගස්සා ගත්තාය. දනියාර් නිතර ඇය දෙස බැලුවේ පළමුවරට දුටුවාක් මෙනි. ඇ ඔහුගේ බැල්ම ගණන් නොගත්තාය.

එක්කෝ ජමීලා ඔහු දෙස බලා ඔහුට සරදම් කළාය, නැතිනම් ඔහු තමා අසල සිටිනිද යන්න ගැන පවා නොසැලකුවාය. මේ හැසිරීම ඇගේ මනෝභාවය අනුව වෙස් විය. අපේ ගැල් දක්කමින් අපි අයිලයට යමින් සිටියෙමු. හිටි හැටියේම ඇ මට ඇසෙන සේ කෑගසන්නීය: ''ඔට්ටුවට දක්කමු!'' කසය හිසට උඩින් කරකවා ශබ්දයක් ඇති කොට අසුට පහරන් ගසන ජමීලා වේගයෙන් තම ගැල පදවන්නීය. මම ඇ පසුපසින් ලුහුබඳිමි. දනියාර් පසු කරමින් ගිය අපි ඔහු වටා දූලි වලා ඇති කළෙමු. මෙය අප කළේ විනෝදය පිණිස වුවද, හැම කෙනෙකුම මෙවැන්නක් නොඉවසනු ඇත. එහෙත් දනියාර් කිසිදිනෙක අමනාප නොවිය. දූලි නංවමින් කෑගසමින් අපි ඔහු පසුකර ගැල් දැක්කුවෙමු. හඬ නගා සිනාසෙන ජමීලා දෙස ඔහු මහත් ආශාවකින් බැලීය. ඇ ගැල මත සිටගෙන අසුන් දක්කන්නට වූවාය. ඔහුගේ බැල්ම හැම දෙයකටම සමාවදෙන්නකි, දයාන්විතය. එහෙත් එහි සැඟවුණු කාන්සියක් හා දහකාරී ගතියක් තිබෙන සැටි මට පෙනිණි.

ජමීලාගේ උපහාස කතා හා හැසිරීමද, උදාසීන බවද දනියාර් කුපිත කරවීමට අපොහොසත් විය. ඇගේ හැම හිරිහැරයක්ම සතුටු සිතින් විඳදරා ගැනීමට ඔහු ප්‍රතිඥා දුන්නාක් මෙනි. මුලදී දනියාර්ට අනුකම්පා කළ මම කීපවරක්ම ජමීලාට මෙසේ කීවෙමි:

''ඇයි නැංගේ! නුඹ ඒ මිනිහාට ඔයතරම් සරදම් කරන්නෙ ඒ මිනිහා අහිංසකයෙක්!''

''අනේ නිකම් ඉඳපන්!'' යැයි කී ජමීලා අතක් වනමින් මෙසේද කීවාය: ''මම විහිළු කළා. ඒ මූසලයට ඒ හන්දා පාඩුවක් වුණේ නැහැ නෙව!''

පසුව ජමීලාට නොදෙවෙනි සේ මම දනියාර්ට සරදම් කළෙමි. ඔහුගේ පුදුමාකාර දැඩි බැල්ම මගේ සිත්තැවුලට හේතු විය. ජමීලා තිරිඟු මිටිය කරින් ගත් විට ඔහු ඇය දෙස අමුතු බැල්මක් හෙළීය. සෙනග පිරී තෙරපී එකිනෙකා තල්ලු කර ගනිමින් කෑ කෝ ගහන මෙතැන ජමීලා නොසැළී තම වැඩ කටයුතු කළාය. ඇගේ ගමන සැහැල්ලුය, ඇ හැම දෙයක්ම කළේ ඉවකඩ ඇති තැනෙක හැසිරෙන්නාක් මෙනි. එබැවින් ජමීලා දෙස අවධානයෙන් බැලීම පුදුමයක් නොවිය.

ඇශ දෙස නොබලා සිටිය නොහැකි විය. කරත්තයේ ඇති තිරිඟු මිටියක් කරින් ගැනීම පිණිස කඳ පාත්කොට නැමුණු ඇ, තම සුන්දර හිස සහ බෙල්ල දිගු කර ගත්තී, දිගැති කෙස් කළඹ පහත වැටෙන්ට ඉඩ හැරියාය. වැඩ කරන අතර කිසිවකුට නොපෙණෙන පරිදි, හිරු රැස් නිසා රත් පැහැගෙන තිබූ ඇගේ බෙල්ල හා උරුහිස් දෙස දනියාර් අමුතු බැල්මක් හෙළීය. පසුව, තිරිඟු මිටිය කරින් ගෙනයන ජමීලා ගබඩාවට ඇතුළු වන

නෙක්ම ඔහු ඇය දෙස බලාගත්වනම සිටියේය. ඔහු මෙසේ බලන සැටි කිසිවෙකුත් නොදකිතියි ඔහු සිතුවා විය හැකි වුවද, මම එය දුටිමි. එහෙත් ඔහුගේ මේ ක්‍රියාව මා සිත් නොගත්තා පමණක් නොව මගේ හැඟීම්වලටද එය බල පෑවේය. ඔහු මට නින්දා කළාක් මෙන් විය. දනියාර් ජමිලාට කැමෙපන මිනිහකු ලෙස පිළිගැනීමට මා සිත ඉඩ නොදිණි.

``මේ මිනිහා පවා අමුතු විධියට බලන කොට අනිත් අය ගැන මොනවා කියන්ටද!`` යි මම සිතීමි. මා සිත තුළ දැඩි අප්‍රසන්නතාවයක් උපණි. ළමා ආත්මාර්ථකාමී බව මා සිතින් තවම බැහැර නොවූයෙන්, එය ගිනිගෙන දැවෙන ඊර්ෂ්‍යාවකට හැරිණි. තම කිට්ටු නෑයින් නිසා ළමයි පිට අයට ඊර්ෂ්‍යා කිරීම ස්වභාවික දෙයකි. දනියාර් කෙරෙහි මා සිත තුළ හටගත්, අනුකම්පාව දැන් අප්‍රසන්නතාවයක් දක්වා දියුණු වී ඇත. ඔහුට සරදම් කරන විට මම සතුටු වූණෙමි.

ජමිලාත් මාත් එකතුව දනියාර්ට කළ සරදම් නිසා වරක කනගාටුදායක සිද්ධියකට මුණ පෑමට සිදුවිය. අපේ තිරිඟු මිටි අතර පුඩ හතක් (රාත්තල් 252 ක්) බරැති මිටියක්ද විය. එහි කවරය ලොම් සහිත රෙද්දකින් මසා තිබිණි. අපි දෙදෙනා එක්වී එය අමාරුවෙන් ඉස්සීමු. කම්මතේදි මේ විශාල තිරිඟු මිටිය දුටු අපි දනියාර්ට සරදමක් කිරීමට ඉටා ගෙන එය ඔහුගේ ගැලට අමාරුවෙන් පටවා එයට උඩින් තවත් තිරිඟු මිටි කීපයක් තබා එය වැසීමු. අතර මගදී අපි රුසියානු ගම්මානයට ගොස් ඇපල් ගෙඩි කඩාගෙන කමින් හඬ නගා සිනාසීමු. ජමිලා දනියාර්ට ඇපල් ගෙඩිවලින් ගැසුවාය. පසුව අපි අපේ ගැල් වේගයෙන් දක්කමින් දනියාර් පසු කර ගියෙමු. අපේ අසුන්ගේ කුර ගැටීම නිසා පැන නැගී දූලි වලා විසින් දනියාර් නැවිණි. දුම්රිය පාර දෙණිය හරහා වැටී ඇති තපොල්ල අසලදී ඔහු අපට ලංවිය. දුම්රිය පාර තපොල්ලෙන් වසා තිබුණු බැවින් අපි තිදෙනාම එකට තිරිඟු භාර දෙන ගබඩාව වෙත පැමිණියෙමු. රාත්තල් 252 බරැති යෝධ තිරිඟු මිටිය ගැන අපට අමතක විය. තිරිඟු බාන විට, තම ගැල තුළට මේ යෝධ තිරිඟු මිටිය පැමිණියේ කෙසේද, එය ගෙනයන්නේ කොහොමදැයි කල්පනා කරන්නාක් මෙන් දනියාර් බලන සැටි දුටු ජමිලා මගේ උරැහිසට තට්ටු කොට ඔහු පෙන්වූවාය. අපට තිරිඟු මිටිය ගැන මතක් වූණේ එවිටය. වටපිට බැලූ දනියාර් උපහාසාත්මක ලෙස සිනාසෙන ජමිලා දුටුවේ, කාරණය අවබෝධ කරගත්තේය.

``පටක් තදකොට බැඳගනින්, නැතිනම් කලිසම මගදී ගැලවී වැටේවි`` යැයි ජමිලා ඔහුට කීවාය.

දනියාර් අප දෙස නපුරු බැල්මක් හෙළිය. සිදුවූයේ කුමක්ද යන්න අපට අවබෝධවීමට පෙර, සැනෙකින් තිරිඟු මිටිය තමා වෙතට ඇදගත්

දනියාර් එය තර තබා ගෙන පඩිපෙළ වෙත ගියේය. ඔහුගේ ක්‍රියාවේ අමුත්තක් නැතැයි හැඟවීමට මෙන් අපි මුලදී හැසුරුණෙමු. අත් අයද කිසි අමුත්තක් නොදුටහ. මෙතැන හැම කෙනෙක්ම තිරිඟු මිටි කරින් ගෙනයති. එහෙත් දනියාර් පඩිපෙළ ළඟට පැමිණි විට ඔහු වෙත දිවගිය ජමීලා මෙසේ කීවාය:

''මිටිය බිම දාපන්, මම විහිළු කළා!''

''අහකට පලයන්!'' යැයි ගොරෝසු හඬකින් කී දනියාර් පඩිපෙළ නගින්නට විය.

''බලපන් උස්සා ගෙන යනවා''යැයි ජමීලා කීවේ තම හැසිරීම නිවැරදි බව පෙන්වීමට මෙනි.

ඈ සෙමින් සිනාසුණද, එය ස්වභාවික සිනහවක් නොවිය. වුවමනාවෙන් කෘත්‍රිම සිනහවක් ඈ මවාගත්තාය.

තමා තුවාල කකුලට වඩා බර වෙමින් දනියාර් ගමන් කරන සැටි අපි දිටිමු. ඔහුගේ කකුලක් තුවාල වී තිබෙන බව අපට කලින් අමතක වූයේ මන්ද? අද වන තුරුත් ඒ මෝඩ සරදම ගැන අමතක කළ නොහැක. මන්දයත්, එහි ආදි කතුවරයා මා බැවිනි.

''ආපසු වරෙන්!'' යැයි ජමීලා කීවාය.

ආපසු ඒමට ඔහුට බැරිය. මුහු පිටුපසින් තිරිඟු මිටි කරින් ගත් මිනිස්සු පෙළගැසී ගමන් කළහ.

ඉන්පසු කුමක් වී දැයි කීමට මට මතක නැත. තිරිඟු මිටියේ බර නිසා දෙකට නැමී සිටි දනියාර්ගේ හිස පහතට වැටී තිබිණි. ඔහු යටි තොල සපාගනිමින් පඩිපෙළ නැංගේය. සෙමින් පඩියෙන් පඩිය නැගී හෙතෙම තුවලවූ කකුල ප්‍රවේසමින් තැබිය. හැම පියවරක්ම ඔහුට වේදනාව ගෙන දුන්නෙත් ඔහු මොහොතක් ගල් ගැසිණි, ඔහුගේ හිස නැටවිණි. පඩියෙන් පඩිය ඉහළ නගිත්ම ඔහු පැත්තෙන් පැත්තට විසිවිණි. තිරිඟු මිටියේ බර ඔහු පාගන්නාක් මෙනි. බියවුණු මා කොතරම් ලජ්ජා විදයත්, මගේ උගුර කට වේලිණි. කිසියම් විපතක් දැන් දැන් සිදුවෙතියි බියගත් මම, තුවාල වූ ඔහුගේ කකුලේ වේදනාව සිතින් විඳගතිමි. ඔහු නැවත වරක් පැත්තකට විසිවී ගියේය. ඔහුගේ හිස නැටවිණි. මගේ ඇස් ඇඳිරි වී මහ පොළවේ උඩු යටිකුරු ගිය බවක් දැනිණ.

යමෙක් මගේ අත ගෙන වේදනාව ඇති වන තෙක් මිරිකූ විට මට ප්‍රකෘති සිහිය ලැබිණ. මට ජමීලා එකවර හඳුනා ගැනීමට බැරිවිය. ඈ පිහන් මැටි මෙන් සුදුමැලිවී සිටි අතර ඇගේ ඇස්වල කළු ඉංගිරියාවන් විශාල වී තිබිණ. ඇගේ දෙතොල් සැමෙලන්නට විය. අප පමණක් නොව අවට සිටි අයද තිරිඟු භාර ගන්නා ලිපිකරුවාද ඔහු වෙත දිවමින් ආහ.

තවත් දෙපියවරක් ඉහළට නැගි දනියාර් නැවතුණ විගස ඔහුගේ පිටි කොන්ද නැමෙන්නට විය. ජමීලා දෑතින් තම මුහුණ වසා ගත්තාය.

``විසි කරපන්! තිරිඟු මිටිය විසිකරපන්!`` යැයි ඕ කෑ ගැසුවාය.

මිට බොහෝ වේලාවකට පෙර තිරිඟු මිටිය පඩිපෙළේ පැත්තකට--මිනිසුන්ට අනතුරු නොවන සේ --විසිකළ හැකිව තිබුණද, ජමීලාගේ කටහඬ ඇසුණු විට ඔහු නැවත තවත් පියවරක් ඉදිරියට තබා පඩියක් නැග ගල් ගැසුණාක් මෙන් සිට ගත්තේය.

``විසි කරපන්!`` යයි රුස්ව සිටි අයද කීහ.

දනියාර් මිටිය කරින් ගෙන සිටගෙන සිටියේය.

``නැහැ, ඒ මිනිහ විසි කරන්නෙ නැහැ!`` යැයි කිසිවෙක් දැඩිලෙස කීහ.

ඔහු පිටුපසින් තිරිඟු මිටි කරින් ගෙන ගිය අයද, පඩි පෙළ අවට රැස් වූ අයද ඔහු තිරිඟු මිටිය විසි නොකරන බව අවබෝධ කර ගත්හ. එක්තෝ ඔහු ඒ තිරිඟු මිටිය මුදුනට ගෙන යනු ඇත, නැතිනම් ඔහු එයත් සමග බිම ඇද වැටෙනු ඇත. සම්පූර්ණ නිහඬතාවයක් ඇතිවිය. අසල දුම්රියක් හු හඬ නගන සැටි ඇසිණි.

ඒ මේ අත විසිවුණු දනියාර් දෙකන් බිහිරකු සේ ඉහළ නැංගේ ගිනි රත්වූ යවට මත පා තබන්නාක් මෙනි. ලී පඩි කිට් කිට් යන ශබ්දයක් මතු කළේය. පඩියක්, දෙකක් නගින ඔහු නවතින්නේ නැවත සමබර ලබා ගැනීමටය. ඔහු පිටු පසින් ගමන් කළ අයද තම තිරිඟු මිටි කර තබා ගෙන, ඔහු අනුව නැවතුණහ. ඔවුහු මේ නිසා විඩාපත් වුණද, මුවින් නොබැණ, කෝප නොවී නිහඬ වූහ. එකකුගේ ජීවිතය අනිකාගේ පා නැගීම මත රඳා පැවතියාක් මෙන්, තිරිඟු මිටි කරින් ගත් ඔවුහු ලිස්සන සුළු පඩි පෙළ දිගේ ඉහළ නැංගාහ. නිහඬව මෙසේ ඉහළ නගින ඔවුන්ගේ පා රිද්මයක් අනුව තැබිණි. දනියාර් අනුව ඔවුහු පියවරෙන් පියවර ඉහළට තැබූහ. දනියාර් පිටුපසින් තිරිඟු මිටියක් කරින් ගෙන ගියේ සෙබල බිරිඳකි. ඇගේ පය පැටලුණද, තොල් සපාගත් ඇ මුවින් නොබැණ ඔහු දෙස බලා නිහඬව දෙවියන් යදින්නට වූවාය. විඩාපත් වූ ඈ ඔහු අනුව පියවර තැබුවාය.

පඩි පෙළේ ඉහළටම යාමට තව ඇත්තේ පියවර කීපයකි. දනියාර් තම තිරිඟු මිටියත් සමග නැවත වැනෙන්නට විය. ඔහුගේ තුවාල කකුල ඔහුට අකීකරු වූවාක් මෙනි. ඔහු තිරිඟු මිටිය බිම දැමිය යුතුය. නැතිනම් ඔහු බිම වැටෙනු ඇත.

``දුවපන්! ඉක්මනට උදව් වෙයන්!`` යැයි මට කී ජමීලා අතක් දිගු කළේ ඔහුට පහසුවක් ලැබෙතියි යන හැඟීමෙනි. පඩිපෙළට නැඟී ගත් මම මිනිසුන් හා තිරිඟු මිටි අතරින් රිංගමින් දනියාර් වෙත දිව ගියෙමි. ඔහු

සටැසින් මා දෙස බැලීය. දහඩියෙන් තැතැවී ඇති ඔහුගේ නලළේ නහර පිම්බී, ඇස් ලේ පැහැගෙන ඇත. ඔහු මා දෙස නොකැත්විත බැල්මක් හෙළීය. ඔහුගේ තිරිඟු මිටියට අත ගැසීමට මට වුවමනා විය.

``පලයන් යන්ට!`` යැයි දනියාර් කීවේ කෝපයෙන් ගොරවමිනි.

තිරිඟු මිටිය සිස්කොට එමින් සිටි ඔහුගේ මුහුණ මලානිකව, දෑත් අප්‍රාණිකව පරඬැල් මෙන් වැනෙන සැටි මට පෙනිණි. හැම කෙනෙක්ම ඔහු ඉදිරියේ නිහඬව පසුබැස්සාහ. මිටි භාරගන්නා ලිපිකරුවා නොඉවසුම් ලෙස කෑ ගැසීය:

``ඉලන්දාරියා නුඹට මක්වෙලාද? මම මිනිහෙක් නෙවිද? නුඹට පහළින් තිරිඟු ගලන්ට මම ඉඩ නොදේවි කියල හිතුවද? ඔය තරම් බරැති මිටි කර ගහන්නෙ මොකටද?``

``ඒක—මගේ වැඩක්!`` යැයි පහත් හඬින් දනියාර් පැවසීය.

ඔහු උගුර පාදා කෙල ගසා කරත්තය වෙතට ගියේය. ලජ්ජාව නිසා අපට ඇස් ඔසවා බැලීමට පවා බැරිවිය. අප කළ මෝඩ සරදම දනියාර් එතරම් ඉහත් කොට සැලකීම නිසා අප තුළ කෝපය හා ලජ්ජාව ඇති විය.

මුළු රැය නිස්සේම ගමන් කළ අප ආපසු අයිලයට ගියේ ගොළුවන් මෙන් නිහඬවය. හැමදාම නිහඬව සිටින දනියාර්ට එය අමුත්තක් නොවුවද ඔහු තවමත් අමනාපයෙන් සිටී ද නැතිනම් ඔහුට ඒ සියල්ල අමතක විද යන්න නොදත් අපට ඔහු තේරුම් ගත නොහැකි විය. අපි සිතින් පීඩා වින්දෙමු.

පසුදින උදැසන අප ගොවිපලට පැමිණි විට රාත්තල් 252 බරැති තිරිඟු තොගයක් සැටවිය හැකි ඒ කාලකන්නි ගෝනිය එක් පයකින් පාගා ඇද ඉරාදැමූ ජමිලා, විස්මය පත්ව බලා සිටි තිරිඟු මිටි කිරන්නියට මෙසේ කීවාය.

``මෙන්න නුඹේ ගෝනිය! ඔය වගෙ ගෝනි මිටි පස්සෙ අපට දෙන්ට එපයි කියල නව නායකයට කියනව.``

``නුඹට මක්වෙලාද? නුඹට මක්වෙලාද?``

``මොකවත් වෙලා නැහැ!``

පසුදින පුරුදු පරිදි නිහඬව සිටි දනියාර් අමනාප වූ බවක් නොපෙන්වා තම කටයුතු වල යෙදුණේය. තිරිඟු මිටි කරින් ගෙනයන විට ඔහු වෙනදාට වඩා තොණ්ඩි ගැසීය. ඒයේ තිරිඟු මිටිය නිසා ඔහුගේ තුවාලය පැරී තිබෙන බවකි. අප කළ වරද නිසා අපට නිහඬව සිටීමට සිදුවිය. ඔහු සිනාසී විහිළු කළේ නම්, අපටද කිසියම් පහසු ගතියක් දැනෙනු

ඇත. එවිට අපේ හෝදයද අමතක වනු ඇත.

අමුත්තක් සිදු නොවූ හැටියට ජමිලාද හැසුරුණාය. ආඩම්බරකාරී ලෙස ඈ සිනාසුණද, ඈ වෙනදා මෙන් නොවූවාය.

දුම්රිය පළේ සිට අප ගෙදර පැමිණියේ රෑ බෝවිය. දනියාර් තම ගැල ඉදිරියෙන් පැදවිය. රාත්‍රිය අලංකාර විය. අගෝස්තු මාසයේදී අහස පැහැදිලිය. වලාකුළු රහිතය. දීප්තිමත් තරු වරෙක මැනද වරෙක ඈනද බැබළේ. එක් තරුවක වටය සුදෝසුදු හිමෙන් වැසී ඇතිවාක් මෙනි. ආලෝකධාරා පිටකළ එම තරුව අඳුරු අහසේ සිට මහ පොළව දෙස බලයි. කඳු අතරින් වැටී ඇති දෙණිය ඔස්සේ අප ගැල් පැදවූ අතර මම ඒ තරු දෙස බොහෝ වේලාවක් බැලීමි. ගැල්වල රෝද මහ පාරේ කුඩා ගල් පොඩි කරන හඬට සමාන හඬක් සතුටින් නිවෙස බලා යන අසුන්ගේ කුර විසින් ඇති කරන ලදී. ස්ටෙප්ස් භූමිය පිසගෙන ආ සිසිල් සුළං පහර මත්වන සුලු සුවඳක් ඇති කළේය.

පහතින් කුර්කුරේව් ගඟ දෝංකාර නංගවමින් ගලාබසී. ඈත පාලමක් හරහා දුවන දුම්රියක ඝෝෂාව ඇසිණ. එහි රෝද ගැටෙන හඬ බොහෝ වේලාවක් යනතුරු දෝංකාරයක් ඇති කළේය.

තරමක් සීත මඳ පවනේ ගැල පදවමින් අසුන්ගේ නැටවෙන පිට දෙස බැලීමද, අගෝස්තු රෑයෙහි සිරියාව නරඹමින් හා මල් සුවඳ ඇති වාතය ආශ්වාස කරමින් යාමද සිත කය පිනවයි. තෝන් ලනුව දැතින් ගෙන වට පිට බලමින් පහත් හඬින් ගීයක් ගැයූ ජමිලා මා ඉදිරියෙන් තම ගැල පැදවූවාය. අපේ නිහඬතාවය ඇගේ සිත පීඩා කළ බව මට අවබෝධ විණි. මෙවැනි සුන්දර රෑයක ගී නොගයා නිහඬව සිටීමට බැරිය.

ඈ ගීයක් ගායනා කළාය. දනියාර් හා අප අතර ඇති සබඳකම් යථා තත්ත්වයට ගෙන ඒමටද, අප ඔහුට කළ වරද පිළිබඳ හැඟීම එළවා දැමීමටද ඈ ගීත ගැයියැයි මට සිතිණි. ඇගේ කට හඬ ලස්සනය. සරදම්කාරී සිනාවක් එහි ගැබ්වී තිබිණි. ඈ ගම්බද ගී ගැයූවාය. බොහෝ ගීත කට පාඩමින් දත් ජමිලා ඇසූවන් මත පිනවන ලෙස ඒවා ගායනා කළාය. එහෙත් හිටි හැටියේම ගායනා නැවැත්වූ ජමිලා දනියාර්ට ඇසෙන සේ කෑගසන්නී මෙසේ තෙපලාය:

''ජයි, දනියාර් සිංදුවක්වත් කියපන්! නුඹ ජිගට්-- ඉලන්දාරියෙක්ද නැද්ද?''

''ගයපන්, ජමිලා ගයපන්!'' යැයි දනියාර් ලජ්ජාවෙන් පැවසීය. තෝන් ලනුව තමා වෙත ඇදගත් හෙතෙම මෙසේ කීය: ''නුඹ ගයන ගීතය අසා රසවිඳින්න මම ලැහැස්ති වුණා.''

``නුඹ හිතන්නෙ අපට ගීත අසන්ට කන් නැතැයි කියලද! ගයන්ට බැරිනම් නිකා ඉඳින්!`` යැයි කී ජමීලා නැවත ගයන්ට වූවාය.

ඈ ඔහුට ගයන ලෙස ආරාධනා කළේ ඇයිදැයි දන්නේ කවිද! නිකම් සිතුණු නිසා විය හැකිය. ඔහු හා සමග කතා කිරීමට විය හැකිද? ඈට ඔහු සමග කතා කිරීමට සිතක් ඇතිවී තිබෙන බව මට වැටහුණේ, ජමීලා දනියාර්ට ඇසෙන සේ කෑගසා මෙසේ කී විටය:

``දනියාර් නුඹ කවදා හෝ කාටවත් ආලය කරල තියෙනවද?`` ඈ හඬනගා සිනාසුණාය.

දනියාර් පිළිතුරු නොදුන් අතර ජමීලාද නිහඬ වූවාය.

``හරි මිනිහෙකුට නොවැ සිංදු කියන්ට කියන්නෙ!`` යැයි කී මම සිනාසුණෙමි.

පාර හරහා වැටී ඇති දියපාර අසලදී අසු තෙතමනය ඇති ගල් මත ගමන් කළේ සෙමිනි. අසුන්ගේ ලාඩම් එම ගල්වලට හැපී හඬක් නැගිය. අප දියපාර පසුකොට ගිය විගසම අසුට කස පහරක් ගැසූ දනියාර් හිටිහැටියේම නුහුරු, පතින සුලු, කම්පනික කට හඬකින් ගීයක් ගයන්නට විය:

``උස් කඳු වැටි නිල් අහස
පිය මුතු මගේ නිජබිම!``

ඔහු හිටි හැටියේ විත්කල් ගසා, උගුර පාදා, ගැඹුරු, තරමක් බැරැඩි කට හඬකින් ගායනය කළේය`:

``උස් කඳු වැටි නිල් අහස
මගෙ තොටිල්ල...``

පසුව බියවුණාක් මෙන් නැවත නිහඬ විය.

ඔහු කොතරම් ලජ්ජා වෙයිද යන්න මට සිතාගත හැකි විය. ඔහුගේ ඒ කුලැටි ගායනයේ පවා කිසියම් කැළඹීමක් දක්නට තිබිණ. ඔහුගේ කටහඬ පියකරු විය යුතුය. දනියාර්ට එතරම් හොඳින් ගායනා කළ හැකි බව මා දැන සිටියේ නැත.

``ඔන්න බලපල්ල වැඩක හැටි!`` යැයි මා කීවේ හැඟීම් යටපත් කර ගැනීමට අපොහොසත් වෙමිනි.

ජමීලා මටත් වඩා විස්මය පත් වූවා මෙසේ කීවාය:

``මීට ඉස්සර නුඹ හිටියෙ කොහේද? හරි හැටි ගායනා කරපන්!``

කඳු බෑවුම් අතරින් ගිය අපි නිම්න භූමියට ඇතුළු වූණෙමු. සුළං ප්‍රහරක් හැමිය. දනියාර් නැවත ගායනා කළේය. පෙර මෙන්ම කුලැටි ලෙස ගායනය පටන් ගත් ඔහු ක්‍රම ක්‍රමයෙන් හඬ උස් කොට මනහර ලෙස ගැයීය. ඔහුගේ හඬ කඳු බෑවුම් අතර දෙණියට වැද දෝංකාරයක් ඇති කළේය.

ඔහුගේ ගීතය දුක මුසු රාගයකින් පිරී තිබීම මගේ පුදුමයට හේතු විය. ඔහුගේ එම හැඟීම හැඳින්විය යුත්තේ කෙසේද යන්න මම එදා නොදැන සිටියෙමි. එය කෙසේ විග්‍රහ කළ යුතුද යන්න මම දැනුදු නොදනිමි. මිනිසාගේ අතිශයින්ම අභ්‍යන්තර හැඟීම් ඇවිස්සෙන, කැළඹීම් තවත් මිනිසෙකුට කාවද්දන බලයක් තිබුණේ ඔහුගේ කට හඬෙහිද නැතිනම් අධ්‍යාත්මයෙහි ද යන්න කිව නොහැක.

දනියාර්ගේ ගීතය යම්තමින් හෝ මට ගයන්නට හැකි නම්! එහි වචන නොවිය. මිනිස් හදවත සම්පූර්ණයෙන්ම විදහා පෙන්වීමට ඔහුගේ ඒ ගීතය සමත් විය. ඉන්පසු හෝ ඊට පෙර හෝ එවැනි ගීයක් මා අසා නැත. එය කිර්ගිස් හෝ කසාක් හෝ ගීතයකට සමාන නොවිය. කිසියම් වෙනත් බසකින් ගයන ලද එම ගීතය කසාක් හා කිර්ගිස් ජනතාවගේ ඉතාම උසස් කලාත්මක රාග මුසුවූ අනගිතම ගීතයක් විය. එය කඳුකරය හා ස්ටෙප්ස් බිම් පිළිබඳ ගීතයකි. කිර්ගිසියාවේ කඳු ගැන මෙන්ම කසාක් ස්ටෙප්ස් බිම්වල අලංකාරය ගැනද එම ගීය කියා පෑවේය.

ඔහුගේ ගීය ඇසූ මම පුදුමවීමි: ''ඔන්න අපේ දනියාර්ගේ හැටි! ඔහුගේ මේ හැඟීම් ගැන දැන සිටියේ කවුද?''

අපි පාරක් දිගේ ගැල් පැදවීමු. දනියාර් එක් ගීයක් ගයා අවසන් කොට තවත් ගීයක් ගැයීය. ඔහු නොයෙක් රාග තාල අනුව ගායනා කරන්නට විය. ඔහු මෙතරම් දක්ෂ පුද්ගලයෙක්ද? ඔහුට කුමක් විද? හරියට ඔහු තමාගේ කාලය හා දිනය පැමිණෙන තෙක් බලා සිටියාක් මෙනි!

මිනිසුන්ට නොතේරුණු, ඔවුන් විසින් උපහාසයට ලක් කරන ලද ඔහුගේ හැසිරීම මට අවබෝධ වී ඇත. ඔහු සිහින දකින්නාක් මෙන් වමේරක පසුවිය. තවත් වරෙක ඔහු හුදකලාව සිටීමට ආශා කළේය. ඔහු නිහඬ විය. මිනිසුන්ගේ උපහාසයට හසුවූයේ මේ හැසිරීමය. සවස් කාලය මුර කපොල්ලට වැද ඔහු ගතකළ සැටිද, රාත්‍රී කාලය ගඟ අසලට වී ගතකළ සැටිද මට අවබෝධ විය. අන් අයට නෑසෙන කිසියම් ශබ්දයක් නිතර ඇසීමට ඔහු සමත් වූයේ මන්ද, ඉඳ හිට ඔහුගේ දෙනෙත් කාන්තිමත් ලෙස බැබලීමට සහ ඇස් බැමි පෙරසේම නොසන්සුන් බවක් ඇඟවීමට හේතු කවරේද යන්න මට අවබෝධ විය. ඔහු කියිවකට ගැඹුරු ලෙස හද පත්ලෙන් ආලය

කර ඇත. එය සප්‍රාණික පුද්ගලයකුට ආලය කිරීමක් නොව, පොදුවේ ජීවිතයට හා මව්බිමට ආලය කිරීමකි. ඔහු එම ආලය සතවා ගෙන, එමෙන්ම තම ගීතවලට ආදරය කරමින් එයින් ජීවන ශක්තිය ලබා ගත්තේය. කොතරම් හොඳ කටහඬක් තිබුණද උදාසීනත්වයෙන් පෙළෙන්නකුට එලෙස ගායනය කළ නොහැක.

ඔහුගේ අවසාන ගීතය ගැයීම නිමවූ විට, නිදාසිටි ස්ටෙප්ස් බිම අවදිවූ සැටියක් දැනිණි. සුපුරුදු ගීත ගයමින් ස්ටෙප්ස් බිම නැලවීම නිසා එය කෘතඥතාවය පළකලාක් මෙනි. රන්වන් තිරිඟු කරල් කෝමල පාමින් නටන්නාක් මෙන් සුළඟට වැනී සර සර හඬක් නැගීය. ඈඹරුම් යන්ත්‍රය අසල වෙර්බ් ගස් වල කොළ සෙළවිණි. ගඟින් එහා සමූහ ගොවීන්ගේ වාඩිවල ගිනිමැල දීප්තියක් ඇති කළේය. කිසියම් අසරුවෙක් සෙවනැල්ලක් මෙන් නිහඬව අයිලය දෙසට අසු මෙහෙයවන්මෙන් වරෙක ගෙවතු වලට මුවාවීය, වරෙක හිස් බිමේ පෙනී සිටියේය. සුළං පහර නිසා ඇපල් ගෙඩි වල සුවඳද, පැසුණු ඉරිඟු කරල්වල තැවුම් සුවඳද, වියලි ගොම සුවඳද දැනිණි.

ස්වයං විස්මෘති ලෙස දනියාර් බොහෝ වේලාවක් ගැයීය. නිහඬ අගෝස්තු රාත්‍රිය පවා ඔහුට සවන් දුන්නාක් මෙනි. අශ්වයෝ පවා ඒ නිහඬතාවයට හානි කිරීමට බිය වූවාක් මෙන් රිද්මයක් අනුව කුර ගටමින් ගියහ.

ගීතයේ උච්ච ස්ථානයට පැමිණි දනියාර් හිටිහැටියේම ගායනය නවත්වා, ප්‍රීතිය ප්‍රකාශ කරමින් යටි උගුරෙන් කෑගසා අසු එළවන්නට විය.

ජමිලා ඔහු පිටුපසින් තම ගැල පදවනු ඇතැයි සිතූ මම ඈ පිටුපසින් යාමට සූදානම් වීමි. එහෙත් වාඩිවී සිටි පරිද්දෙ, නොසැලී, උරහිස මත හිස තබා ගෙන ජමිලා නිහඬව සිටියාය. වාතය සමග මුසුවූ ගීතය තවම ඇයට ඇසෙන්නාක් මෙනි. දනියාර් වේගයෙන් ගැල පදවමින් ගියද, අපි අයිලයට යන තුරු එකද වචනයක්වත් කතා නොකළෙමු. කතා කළ යුතුව තිබුණේද? හැම හැඟීමක්ම වචන වලින් පැවසිය හැකිද...

එදා සිට අප ජීවිතයේ කිසියම් වෙනසක් ඇති විය. කිසියම් යහපතක් මම නිතර බලාපොරොත්තුවෙන් සිටියෙමි. උදෙන්ම අපි තිරිඟු මිටි පටවාගෙන දුම්රිය පොළට ගියෙමු. අයිලයට ආපසු යන විට දනියාර්ගේ ගීත ඇසීමට අප තුළ මහත් ආශාවක් ඇතිවිය. ඔහුගේ කට හඬ මා ප්‍රීතිමත් කළේය. ඔහුගේ ගීත මා ලුහුබඳිමින් එන සැටියක් දැනිණි. හිම්දිරි පාත්දර පිනි බිඳු සහිත තණ බිමේ දුවමින් අසුන්ගේ පිට පිරා මදින විටද, කඳුගැට වලට එපිට හිරු අහසට නගිමින් මා දෙස බලා සිනාසෙන විටද ඔහුගේ ගීත මා ලුහුබැඳ ආවේය. තිරිඟු ඇට පොළන විට ඇතිවන ශබ්දයෙහිද, රාජාලියකු ස්ටෙප්ස් අහසෙහි හුදකලාව පියාඹන විටද මට

එම ගීත රාවය ඇසිණ. මා දුටු මට ඇසුණු හැම දෙයකම දනියාර්ගේ ගීත ඇති බව මට දැනිණි.

හවස අප නැවත කඳු බෑවුම් අතරින් එන විට මට එය අමුතු ලොවකට පිවිසෙන සැටියකි දැනුණේ. දෑස් වසාගෙන මම දනියාර්ට සවන් දුන්නෙමි. මගේ මනැස ඉදිරියේ සුපුරුදු මගේ ළමා කාලය මැවිණි. වසන්ත කුඩාරමට ඉහළින් පැහැදිලි නිල්වන් අහසේ සැරිසරමින් පියාසර කළ කුරුල්ලන්ගේ අලංකාරත්වයද, ගිම්හානයේ තණ කමින් හේෂාරවය කරන අසුන්ගේ හඬද, ගිනි අඟුරු මෙන් බැබලෙන ඇස් ඇති අශ්ව පැටව් තම මව්වරුන් වෙත වේගයෙන් දුවන සැටිද, එඬේරුන් තම බැටළු රංචු කඳු ගැට වලට දක්කන සැටිද, සුදෝසුදු පෙණ නගමින් ගලා බසින දිය ඇලිවල සිරියාවද, විශි පඳුරුවලට මුවාවෙමින් හිරු බැස යන හැටිද, හිරු රැසින් බබලන ක්ෂිතිජය ළඟින් අසු එළවන අසරුවකුගේ--හිරු ඔහුට හොඳටම ළංවී ඇත--සේයාවද ඔහු අතුරුදහන් වූ සැටිද මට සිහිවිය.

කසාක් ස්ටෙප්ස් බිම විශාලය. අපේ කඳුවැටිය දෙපසින් ඇති ඒ මහා බිම දැඩිය, පාළුය...

එහෙත් ඒ අමතක නොවන ගිම්හානයේදී යුද්ධය ඇවිළිණ. ස්ටෙප්ස් බිමෙහි ගිනි පැතිර ගියේය. අසරුවෝ, අසු හා අසුන් රංචු දසත විසිර ගියහ. ගඟේ එහා ඉවුරේ සිට අසකු පිට නැග ගත් කසාක් ජාතික එඬේරෙක් මෙසේ කෑගැසූ සැටි මතක් විය:

``කිර්ගිස් වරුනි! අසු පිට නැගගනු, හතුරා ඇවිත්!'' වේගයෙන් තම අසු එළවූ ඔහු දූලි වලාවලට හා දැඩි උණුසුම නිසා හටගත් මිරිඟුවට මුවාවී අතුරුදන් විය.

ස්ටෙප්ස් බිම හැම තෙනෙකුම සටනට කැඳවිය. කඳුකරයේ සිට නිම්න භූමිය දක්වා ගම්භීර ලීලාවකින් අපේ පළමුවැනි අසරු හමුදාව පැමිණියේය. දහස් ගණන් තරුණයෝ යුද පෙරමුණට යාම සඳහා සූදානම් වූහ. ගෙවල් ඉදිරිපිට රතු ධජ ලෙළදිණි. ගෙවල් පිටුපසින් මව්වරු, බිරියෝ සහ සොහොයුරියෝ අඬා වැලපුණාහ. අසුන්ගේ කුර ගැටීම නිසා දූලි වලා නැගිණි. ``ස්ටෙප්ස් බිම නුඹලාට ආධාර කරනු ඇත. අපේ ජාතික වීරයා වන මනාසගේ පිහිට ලැබෙනු ඇත!''

යුද්ධය පැතිර ගිය හැම තැනම ජනතාව දුක්ඛිත පා සටහන් තැබූහ...

අප පෘථිවියේ හැම සුන්දරත්වයක් සහ නොසන්සුන් භාවයක්ම දනියාර්ගේ ගීතවල ගැබ්වී ඇති බව මම දැනගතිමි. මේ ගීත ඔහු ඉගෙන ගත්තේ කොයින්ද, කාගෙන්ද? අවුරුදු බොහෝ ගණනක් තිස්සේ තම මව්බිමට ආලය කළ, ඒ නිසාම පීඩා විඳි කෙනෙකුට පමණකි. එතරම්

මනහර ගීත ගායනය කළ හැක්කේ. ඔහුගේ ගී අසන මා ඉදිරියේ ස්ටෙප්ස් බිම හරහා ඇවිදින කුඩා කොල්ලකුගේ පින්තූරයක් මැවිණි. මව්බිම ගැන ගීතය ඔහු සිත තුළ හට ගත්තේ ඒ කාලයේදී විය හැකිද? එසේත් නැතිනම් යුද පෙරමුණේ ගිනි ජාලාවන් තුළින් ඇවිද සටන් කළ කාලයේදීද?

දනියාර්ගේ ගීත ඇසූ මට මවක වැලඳ ගන්නා පුතෙකු මෙන් මගේ මව්බිම තදින් වැලඳ ගැනීමට සිත්විය. නම්කළ නොහැකි කිසිවක් පළමුවැනි වරට මා තුළ ඇතිවිය. එය යටපත් කළ නොහැකි හැඟීමකි. තම හැඟීම් ප්‍රකාශ කිරීමට, තමාට පමණක් දැනෙන පෙනෙන දෑ තමාට සීමානොකර අන් අයට පෙන්වීමට හා ඇසවීමටද, දනියාර් කළාක් මෙන් උද්වේගී ලෙස අප මව්බිමේ සුන්දරත්වය ගැන ජනතාවට කියා පෑමටද මා තුළ සීමා රහිත ආශාවක් ඇතිවිය. නාදුණන කිසිවක් ඉදිරියේ මම එකවර බියෙන් වෙව්ලන්නට වීමි. ඒ සමගම ප්‍රීතිවීමි. චිත්‍ර ඇඳීම මගින් මගේ අදහස් කියා පෑ යුතුයැයි මම එදා නොදැන සිටියෙමි.

ළමාවියේ සිට චිත්‍ර ඇඳීමට මම ප්‍රිය කළෙමි. පාඩම් පොත්වලින් පින්තූර ඇඳීම මගේ සිරිතක් විය. මගේ පින්තූර පාඩම් පොතේ පින්තූර වලට ''හොඳටම සමාන'' බව ළමයි කීහ. පාසලේ 'බිත්ති පුවත් පතට' පින්තූර ඇඳ ගුරුවරුන්ට පෙන්වූවිට ඔවුහු සතුටු වූහ. යුද්ධය පටන්ගත් පසු මගේ වැඩිමහල් සොහොයුරන් යුද්ධයට ගිය පසු අනිකුත් කොල්ලන් මෙන් මමද පාසල අතහැර ගොවිපළේ වැඩට ගියෙමි. මගේ තෙලි තුඩ, පාට ආදිය ගැන මට නැවත මතක් වනු ඇතැයි මම නොසිතීමි. එහෙත් දනියාර්ගේ ගීත මගේ ගත සිත පුබුදු කළේය. මා සිහිනෙන් ඇවිදින්නාක් මෙන්, ලෝකය දෙස පළමුවැනි වරට බලන්නාක් මෙන් පුදුමව බැලීමි.

ජමීලා සම්පූර්ණයෙන්ම වෙනස් වූ සැටි! ඇ කිසි කලෙක වාචාල කතා දොඩමින් නොහැසුරුණාක් මෙනි. ඇගේ දෙනෙත් ආලය පුබුදුවන වසන්ත දොම්නසින් වැසී ඇත. ගැල පදවන අතර ඇ නිතර කල්පනාවෙහි යෙදී සිටියාය. බලාපොරොත්තු සහිත මඳ සිනාවකින් ඇගේ මුව සැරසී ඇත. තිරිඟු මිටියක් කරින් ගත් ජමීලා ගල් ගැසුණාක් මෙන්, යාමදෝ නොයාමදෝ යැයි නොදැන සිටගෙන සිටියාය. දනියාර් මුණ ගැසීමට ඉදිරියට නොපැමිණි ඇ ඔහු දෙස නොබැලීය.

තිරිඟු මිටි පටවන ස්ථානයේදී දනියාර් අමතා සෙමින් කතා කළ ජමීලා මෙසේ තෙපලාය:

''නුඹේ සෙබල කමිසය ගලවපන් මම සෝදා දෙන්නම්!''

කමිසය සෝදා අව්වේ වේලීමට දැමූ ජමීලා ඒ අසල වාඩිවී කමිසය ප්‍රවේසමින් අතගාන්නට වූවා, ගෙවීගිය කමිස උරහිස් දෙස බලමින් හිස

සැලුවාය. නැවත ඇ ඒ කමිසය සෙමින් හා දොම්නසින් යුතුව අත්ලෙන් පිරිමැද්දාය.

පෙර මෙන් ඇ හඩ නගා සිනාසුණේ එක් වරක් පමණකි. එවිට ඇගේ දෙනෙත් කාන්තිමත් ලෙස බැබලෙන්නට විය. ගැහැනු, තරුණියෝ හා සුදු පෙරමුණෙන් පැමිණි තරුණ අසරුවෝ වියලි තණකොළ හා පිදුරු ගොඩගසා කමත දෙසට යමින් සිටියහ.

``ජයි බායි තිරිඟු පිටිවලින් හදපු පාන් තඹුසෙල තනිවම කනවද. අපටත් දෙන්න, නැතිනම් ගඟට විසි කරනව!`` යැයි තරුණ අසරුවෝ කියමින් තම රිටිකරු ඉදිරිපත් කළහ.

``රිටිකරුවලින් අප බය කරන්ට බැහැ! තඹුසෙලගෙ කෙල්ලන්ට කියනව තඹුසෙලට සංග්‍රහ කරන්ටයි කියල. තඹුසෙල ඒ අයට මොනව හරි හොයා දෙනව!`` යැයි මහ හඬින් ජමිලා කියා සිටියාය.

``එහෙනම් අපි නුඹලව ගඟට දානව!``

තරුණයන් හා තරුණියන් එකිනෙකා අල්ලාගෙන ගඟට විසි කරන්නට වූහ.

``අල්ලාගනින්, ගඟට විසි කරපන්!`` යැයි හැමදෙනාටම වඩා මහ හඬින් සිනාසෙමින් ජමිලා කීවාය.

පුදුම දෙය වූයේ හැම තරුණ අසරුවෙක්ම ජමිලා පමණක් දැක ඇ අල්ලා ගැනීමට ඉදිරියට පැමිණීමය. හැම එකෙක්ම ඇ බදා ගැනීමට සූදානම් වූහ. තරුණයෝ තිදෙනෙක් ජමිලා බදා අල්ලාගෙන මෙසේ පැවසූහ.

``සිඹපන්, නැතිනම් ගඟට විසිකරනව!``

``ගඟට විසිකරනව!``

ජමිලා ඔවුන්ගෙන් ගැලවීමට ඒ මේ අත පනිමින් තම යෙහෙළියන්ගෙන් ආධාර ඉල්ලා කෑගසමින් සිනාසුණාය. එහෙත් තරුණියෝ තම හිස බැඳි ලේන්සු අල්ලා ගනිමින් ගං ඉවුර දිගේ දිව ගියහ. තරුණයෝ ජමිලා අල්ලා ගෙන ගඟට විසි කළහ. දිය බත් වූ ජමිලා ගඟින් ගොඩ වූ සැටි දුටු මට ඇය දැන් වඩාත් රූමත් බව පෙනිණි. ඇගේ ඇඳුම සිරුරට ඇලී තිබුණු නිසා වටකුරු කකුල් හා වතෝරවල හැඩයද, යොවුන හංසයන් වැනි පයෝධරද පැහැදිලි ලෙස පෙනිණ. ඇ ඒ කිසිවක් නොදන්නී හොත් හඬ ලමින් සිනාසුණාය. තෙමුණු හිස කේ වලින් දිය බිඳු ගලන්නට විය.

``අපව ඉඹපන්!`` යැයි කී තරුණ අසරුවෝ ඉදිරියට ආහ.

ජමිලා ඔවුන් සිපගත්තාය. තරුණයෝ නැවත ඇය අල්ලා ගඟට විසිකළහ. තෙත්වූ කෙස්වැටිය පිරිමදිමින් හඬ නගා සිනාසුණු ජමිලා නැවත ගොඩ ආවාය.

කමතේ සිටි හැම තරුණ තරුණියක්ම මේ සරදම නිසා සිනාසුණහ. තමන්ගේ වැඩ කරමින් සිටි මහලු උදවිය උපකරණ වීසි කර දමා, රැලිගැසුණු තම මුහුණුවලින් වැගිරෙන දහඩිය පිසදමා ගෙන ප්‍රීතියෙන් සිනහසුණේ, තම තරුණ බව මොහොතකට නැවත ලැබුණාක් මෙනි. තරුණ අසරුවන්ගෙන් ජමීලා මුදා ගැනීම තම ඊර්ෂ්‍යාසහගත යුතුකම බව අමතක කළ මහල්ලෝ සිත පුරා සතුටුවෙමින් සිනාසුණහ.

සිනහනොවූ එකම පුද්ගලයා දනියාර් පමණකි. ඔහුගේ නිහඬතාවය මා දුටුවේ අහම්බෙනි. ඔහු කමතේ මුල්ලකට වී සිටියේය. දනියාර් ඉදිරියට පැන තරුණ අසරුවන් අතින් ජමීලා උදුරා ගනීනැයි මට සිතිණි. ඔහු ඇය දෙස බලාගත්වනම සිටියේය. ඔහුගේ දෙනෙත්වල බැල්ම දොම්නස් සහගතය. වරෙක එය සතුටු දක්වාද තවත් වරක එය වේදනාව දක්වාද වෙනස්විය. ජමීලාගේ සුන්දරත්වය ඔහුට සොම්නස හා දොම්නස ගෙන දුන්නේය. තරුණ අසරුවන් ඇය බදාගෙන තමන් සිපගන්නා ලෙස ඇයට අණකළ විට, ඔහු හිස පහත් කරගෙන ඉවත්ව යාමට මෙන් සැරසුණද, ඉවත් නොවිය.

මේ අතර ජමීලා ඔහු දුටුවා, සිනහසීම නවත්වා රොස් ගතියක් පෑවාය.

''හුරතල් කළා ඇති පලයව් අහකට!'' යැයි ඇ හිටි හැටියේම ඉවත යන තරුණ අසරුවන්ට කීවාය.

තවත් එකෙක් ඇ බදා ගැනීමට ඉදිරියට ආවේය.

''අහකට පල!'' යැයි මහ හඬින් කී ඇ වරදක් කළ එකියක මෙන් දනියාර් දෙස බලා ළඟ ඇති පදුරකට වැද නෙත්වූ ඇළුම් මිරිකා හැරියාය.

ඔවුන්ගේ සබඳකම් ගැන මට හැම දෙයක්ම පැහැදිලි නොවිය. ඒ ගැන කල්පනා කිරීමට පවා මම බිය වීමි. ජමීලා දනියාර් දකින විට මුළු ගැමෙන සැටි දුටු මා තුළ යම්කිසි අප්‍රසන්නතාවයක් ඇතිවූයේ මන්දැයි මම නොදනිමි. පෙර මෙන්ම ජමීලා ඔහුට සරදම් කළා නම්, හඩ නගා සිනහසුණා නම් වඩා හොඳ බව මගේ වැටහීම විය. එහෙත් ඒ අතරම ඔවුන් නිසා මා තුළ ප්‍රීතියක් ඇති විය. තිරිඟු හාරදී නැවත අයිලයට අප එන විට දනියාර්ගේ ගී ගායනය අසන මා තුළ එවැනි හැඟීමක් උපණි.

කඳු බැවුම් අතර දෙණිය හරහා යද්දී ජමීලා ගැලෙහි වාඩිවී අසුන් එලෙව්වාය. ස්ටෙප්ස් බිමට පැමිණි විට ඇ ගැලෙන් බැස අසුන් ළඟින් ගමන් කළාය. මමද ඇය අනුව පයින් ගමන් කළෙමි. එසේ යන විට වඩාත් හොඳින් ගී ඇසිය හැක. පළමුව අපි අපේ ගැල් අසලින් ගමන් කළෙමු. පසුව අපටම නොදැනී අපි සෙමෙන් දනියාර් වෙත ළංවීමු. කිසියම් අවිද්‍යමාන බලවේගයක් විසින් අප ඔහු වෙතට ඇදගනු ලැබිය. අඳුරේ දනියාර්ගේ

මුහුණ සහ ඇස් දැකගැනීමට අපට වුවමනා විය. මිනිසුන් ප්‍රිය නොකරන මුසල දනියාර් ගායනා කරන්නේද?!

විස්මයට හා සිත් කැලඹීමට පත් ජමීලා සෙමින් ඔහු වෙත අත දිගු කරන හැම විටම ඔහු එය නොදුටු සැටිත්, ඔහු ඇගේ සිතට හා අතට උඩින් අහස දෙස බලන සැටිත්, ගිය ජ් අත මේ අත වනන සැටිත් මම දුටිමි. ජමීලාගේ අත ඔහුගේ ගැලෙහි බෝං ලිය දක්වා පහත වැටිණි. එවිට ඇ නිගැස්සී අත ආපසු ගෙන නැවතුණාය. මහ මග මැද සිටගත් ඇ හිස පහත් කරගෙන විස්මය පත්ව පිටු පා යන ඔහු දෙස බලා සිට නැවත ගමන් කළාය.

මාත් ජමීලාත් එකම දෙයක් බලාපොරොත්තු වෙමින් තේරුම් ගත නොහැකි යම්කිසි හැඟීමකින් පසුවුණ බව මට හැඟිණි. මේ හැඟීම අපේ සිත් තුළ සැඟවී තිබුණා විය හැකිය. දැන් ඒ හැඟීම් පිටවීමට කාලය පැමිණ තිබේද?

වැඩ කරන විට ජමීලා විස්වෘතියට පැමිණියාය. කමතට පැමිණ අප විවේක ගන්නා සළු කාලය තුළදී පවා ජමීලා තමා කළ යුත්තේ කුමක්දැයි නොදැන ළත වූවාය. තිරිඟු ශුද්ධ කරන ගොවීන් අතරට වී සිටි ජමීලා ඔවුන්ට උදව් කිරීමට මෙන් ඉස්කෝප්පයකින් තිරිඟු ගෙන වැරෙන් තිරිඟු ගොඩට විසි කළාය. මෙසේ කීපවරක්ම විසිකළ ඇ ඉස්කෝප්පය අහකට දමා පිදුරු ගොඩ වෙත ගියාය. සෙවණ ඇති තැනක වාඩිවූ ජමීලා තනිව සිටීමට බයවූවාක් මෙන් මට කතා කළාය:

''මෙහෙ වරෙන් කිච්නෙ බාලා අපි මෙතන ඉඳ ගනිමු!''

ඇ මට යම්කිසි වැදගත් දෙයක් කියනු ඇතැයිද, ඇගේ කාංසියට හේතුවූ කරුණු ගැන ඇ මට විස්තර කරනු ඇතැයිද මම සිතීමි. එහෙත් ඇ කිසිවක් නොකියා නිහඬව සිටියාය. මගේ හිස ගෙන ඇගේ දණහිස් මත තබා ගනිමින්, මගේ හිසකේ අවුල් කරමින්, මගේ මුහුණ මෘදු ලෙස අතගාමින් ඇත බලන්නට වූවාය. ඇගේ උණුසුම් අත්වල ඇඟිලි නොසන්සුන්තාවයකින් වෙව්ලන්නට විය. මම හිස ඔසවා ඇගේ මුහුණ බැලීමි. එය කාංසියෙන් හා දොම්නසින් පිරී ඇත. ඇගේ මුහුණ මගේ හැඟීම් පිළිබිඹු කළාක් මෙනි. ඇගේ හදවත තුළ යම්කිසිවක් වැඩී මෝරා පිටවීමට මගක් සොයන බව පෙනිණි. ඔම් නිසා ඇ බියවූවාක් මෙනි. ඇ දනියාර්ට ආලය කිරීම ගැන මා කැමති හෝ අකැමැති වූවාක් මෙන්ම, ඇ ඔහුට ආලය කරන බව පිළිගැනීමට බියවූ අතර වේදනාවෙන් එය අපේක්ෂා කළාය. ඇ මගේ දෙමාපියන්ගේ ලේලිය, මගේ අයියාගේ බිරිඳය.

එවැනි අදහස් මා සිත තුළ හටගත්තේ සැනෙසිනි. මම ඒවා එළවා දැමීමි. ළදැරියකගේ මෙන් සුන්දර දෙතොල්ද, කඳුළු සහිත ඇගේ දෙනෙත්ද

දැකීමට මම ආශා කළෙමි. ඇ යහපත් සුන්දර තරුණියක් වූවාය. ඇගේ මුහුණ කොතරම් ලස්සන ආශ්වාදයකින් හා උද්දාමයකින් පිරී තිබුණේද! මම ඒ සියලු ලක්ෂණ දුටුවද, ඒවායේ තේරුම් වටහා නොගතිමි. චිත්‍ර ශිල්පියාගේ හා කවියාගේ ආශ්වාදය මෙන් ආලයද ආශ්වාදයක් ගෙන දෙන්නේද? යන පැණය දැන් මම නිතර අසමි. ජමීලා දෙස බලන මට ස්ටෙප්ස් බිමට දිවගොස්, මා තුළ හටගෙන ඇති, තේරුම් ගත නොහැකි වස්තිය හා සතුට ගැන හඬනගා, කෑ ගසා අහසෙන් හා මහපොළොවෙන් ප්‍රශ්න කිරීමට සිතිණි. දිනක් මගේ පැණයට පිළිතුරු ලැබුණාක් මෙනි.

නිරිතු හාරදි අපි නැවත අයිලයට යමින් සිටියෙමු. අවට ඇඳිරි පැතිර ගොස් පැහැදිලි අහසේ තරු සමූහ වශයෙන් පෙනෙන්නට විය. ස්ටෙප්ස් බිම් නැමති දැවැන්තයා නිදන්නට සැරසෙන්නාක් මෙනි. නිහඬතාවය බිඳිනු ලැබුවේ දනියාර්ගේ ගීත විසිනි. ඒවා හඬනගා අඳුරට වැද අතුරුදහන් විය. ජමීලාත් මාත් ඔහු පිටුපසින් ගමන් කළෙමු.

මේවර දනියාර්ට කුමක් විද? ඔහුගේ ගායනය වඩාත් මෘදු විය, එය කාන්සියෙන් හා හුදකලා බවකින් පිරී තිබිණි. ඔහුගේ ගීත අසන අප නෙත් කඳුළෙන් පිරිණි. ගායකයා ගැන අප තුළ ඇතිවූයේ අනුකම්පාවකි.

ජමීලා හිස පහත් කරගෙන ගැමල් බෝන් ලිය අල්ලාගෙන නිහඬව ගමන් කළාය. දනියාර් උස් හඬකින් ගායනය පටන් ගත් විටම, හිස ඔසවාගත් ජමීලා ගැලට පැන ඔහු ළඟින් වාඩිවූවාය. ඇ ගල් රුවක් මෙන් දැත් ළය මත තබාගෙන සිටියාය. තමා අසල වාඩිවී සිටි ජමීලා ගැන කිසිදු සැලකිල්ලක් නොදක්වා දනියාර් තම ගීය ගයන්නට විය. ඇගේ අත් අප්‍රාණිකව වැටුණු සැටිත්, ඇගේ හිස ඔහුගේ උරහිස මත සෙමින් පතිත වූ සැටිත් මම දුටිමි. ධාවනයෙහි ගුර අසකු තම ගමන් විලාසය හදිසියෙන්ම වැදුණු කස පහරක් නිසා මාරු කරන්නාක් මෙන් දනියාර්ගේ කටහඬ ගැස්සිණි. නැවත ඔහු නව ශක්තියකින් ගායනය ඇරඹීය. ඔහු මේවර ගායනය කළේ ආලය ගැනය.

මම විස්මයට පත්විමි. ස්ටෙප්ස් බිම වසා සිටි අඳුර පහව් ගොස් ආලෝකයක් ඇති වූවාක් මෙනි. ඒ මහා ස්ටෙප්ස් නිම්න භූමියෙහි පෙම්වතුන් දෙදෙනකු මම දුටිමි. ඔවුහු මා සිටින බවක් හෝ නොතැකූහ. ලෝකයේ හැම දෙයක්ම අමතක කර දමමින් ඔවුන් ගීතය අනුව පැද්දෙන සැටි මට පෙනිණි. අඳුනාගත නොහැකි තරමට ඔවුන් වෙනස් වී ඇති සැටියකි. එහෙත් දනියාර් මා පෙර දුටු පුද්ගලයාම විය. ඔහු තම පරණ සෙබළ කමිසය හැඳ සිටියේය. අවට අඳුර රජ කළද, ඔහුගේ දෙනෙත් ගිනිබෝල මෙන් දිලිසිණි. ඔහුගේ උරහිස මත හිස තබාගෙන සිටින්නේ මගේ ජමීලාය. ඇගේ දෙනෙත් ප්‍රීති කඳුළෙන් පිරිලාය. නොදුටු වීරු අළුත් පෙම්වතුන්

දෙදෙනෙකු ප්‍රීතිවන සැටිය, ජ්. එය සැබවින්ම ප්‍රීතියක් නොවේද? ජ් මිහිරි ගීතයක් හැම එකක්ම දනියාර් ජමීලාට නැප කළාය. ඔහු ඇය ගැන ගායනා කළේය.

දනියාර්ගේ ගීත අසන විට මා තුළ ඇතිවන අපූරු හැඟීම නැවත මතුවිය. මා නැමති, මවිසින් කළ යුතු දේ ගැන පැහැදිලි අවබෝධයක් ඇතිවුණේ මෙතැනදීය. මට ඔවුන් ඇඳීමට වුවමනා විය.

මගේම හැඟීම් නිසා මම බියවීමි. අවශ්‍යතාවය බිය මැඩ ජය ගත්තේය. ප්‍රීතියෙන් පසුවන පෙම් යුවල මම චිත්‍රයට නගමි! දැන් ඔවුන් ප්‍රීතියෙන් පසුවන සැටියෙන් අඳිමි! එය මට කළ හැකිද? බිය සහ සතුට නිසා හදවත ගැස්සිණි. මධු පානය කළ කලෙක මෙන් මම මත්වීමි. ගරුසරු නැති අභිලාෂය නිසා අනාගතයේදී කොතරම් අමාරුකම්වලට මුණපෑමට සිදුවේදැයි නොදත් මම ප්‍රීතිවීමි. දනියාර් ලෝකය දෙස බලන්නාක් මෙන් මාද බැලිය යුතුයයි මම මටම කියා ගතිමි. දනියාර්ගේ ගීතය වර්ණවලින් චිත්‍රයට නැගිය යුතුය. කඳුවැටි, ස්ටෙප්ස් බිම, මිනිස්සු, තණ, වලාකුළු, ගංගා අඳින්නෙමි. පාට ලබා ගන්නේ කොහෙන්දැයි මම එදා කල්පනා කළෙමි: ``මා පාට ලබාගන්නේ කොහෙන්ද? පාසලින් ලබාගත නොහැක. එය ඔවුන්ට වුවමනා බැවිනි!`` ප්‍රධාන දෙය පාට ලබාගැනීම නොවේ.

ගීතය බලාපොරොත්තු රහිතව නැවතිණි. ජමීලා හිටිහැටියේම දනියාර් වැළඳගෙන සිපගත් බැවිනි. ඈ වහාම ඔහුගෙන් ඈත්වී ගල් ගැසුනාක් මෙන් සිට, ගැලෙන් ඉවතට පැන්නාය. දනියාර් අස්ථිර ලෙස නෝන් ලනු අදින්නම අශ්වයෝ නැවතුණහ. ජමීලා දනියාර්ට පිටු පා සිටගත්තාය. පසුව සැනෙකින් ආපසු හැරුණු ඈ හිස ඔසවා ඔහු දෙස බැලුවාය. ඇගේ දෙනෙත් කඳුළෙන් පිරී තිබිණි.

``නුඹ මොකද මා දිහා බලන්නෙ?`` මෙසේ කී ඈ නිහඬව සිට නැවත දැඩි හඬකින්, ``මා දිහා බලන්න එපා! නුඹේ කරත්තය දක්කාගෙන පලයන්!`` යැයි කීවා, තම ගැලට ගොස් එහි වාඩිවුණාය. ``නුඹ මොකද කට ඇරගෙන බලා ඉන්නෙ?`` යැයි මගෙන් ප්‍රශ්න කළ ජමීලා ``තරන්තෙ දක්කාපන්!`` යැයි මට අණ කොට යළි මෙසේද පැවසුවාය: ``උඹලා නිසා මට වී ඇති විපැත්තියක මහත!``

``ඇට මොනව වෙලාද?`` මෙසේ සිතූ මම වේගයෙන් අසුන් මෙහෙයැවීමි. ඇගේ හැසිරීම ගැන අනුමාන කිරීමට වුවමනාවක් නැත. ඇගේ ක්‍රියාව නිසා ඇට අපහසුවක් දැනීම ස්වභාවිකය. ඇගේ විවාහක සැමියා සරාටොව්හි රෝහලක නැවති ප්‍රතිකාර ගනිමින් සිටියේය. දනියාර් මින් පසු කිසි දිනෙක නොගායනු ඇතැයිද ඔහුගේ ගී ඇසීමට මට කිසිදිනෙක

නොහැකි වෙතැයිද මා දැන සිටියේ නම්, ජමීලා කෙරෙහි සැබැවින්ම වෛරයක් මා තුළ ඇතිවන්නට ඉඩ තිබිණි.

විඩාව නිසා ඇටකටු පවා කකියන්නට වූයෙත් හැකිතරම් ඉක්මනින් මඩුවට ගොස් පිදුරු ගොඩ මත වැතිර සිටීමට වුවමනා විය. අසුන්ගේ පිටවල් අඳුරේ නැටවෙන්නට වූ අතර ගැල ඉවසා සිටීමට නොහැකි ලෙස ගැස්සෙන්නට විය. තෝන් ලනු අතින් ගිලිහිණි.

කෙසේ හෝ අමාරුවෙන් කමත දක්වා ගැල ගෙනගිය මම හිස් ගෝනි බිම දමා පිදුරු ගොඩකට ලනොවී ඒ මත ඇද වැටුණෙමි. දනියාර් මගේ අසුන්ද තණ බිමට ගෙනගියේය.

පසුදින උදැසන මා අවදි වූයේ සතුටු සිතිනි. ජමීලා හා දනියාර් මම අඳින්නෙමි. මම ඔවුන් දෙදෙනා චිත්‍රයට නගන අයුරු දැස් වසාගෙන සිතින් මවා ගන්නෙමි. තෙලිතුඩ හා පාට අතට ගෙන ඇඳීම පමණකි, ඉතිරිව ඇත්තේ.

ගඟට ගොස් මුහුණ සෝදාගත් මම අසුන් වෙත ගියෙමි. පාවහන් රහිත මගේ දෙපා පිණි බිඳු සහිත තණ පිටිය සිප ගත්තේය. පැළුණු යටිපතුල් තණ ගස් විසින් පිඩා කරන ලදී. දුවමින් ගමන් කළ මම අවට සිදුවන දේ පිරික්සා බැලීමි. හිරු කඳුවලට ඈතින් අහසට නැගෙත්ම සූරිය මල් ඒ දෙසට හැරිණි. තණ පිටියේ සූරිය මල් නොවැවුණද, දිය අගල අසල වැවී තිබිණි. වල් පැළෑටි සූරිය මල් වටා වැවී ඒවා විනාශ කිරීමට වැර දැරුවද, සූරියමල් උදේ හිරු රැස් ගිලගනිමින් පෝෂණය විය. දිය අගල් හරහා යන ගැල්වල රෝද විසින් දිය පාරක් ඇති කර ඇත. දම්පාට පැළෑටි වලින් ගහණ දූපතකි. ඉන් සුවඳ වහනය විය. මා උපන් නිජබිමෙ දුවමින් ගිය මගේ හිසට උඩින් ලිහිණියෝ පියඹා ගියහ. මා අත පාට වර්ග තිබුණි නම් උදය හිරු රැස්ද, ලා නිල් පැහැති කඳුවැටිද, පිණි බිඳු සහිත තණ බිමද, දිය අගල අසල වැවී ඇති සූරිය මල්ද චිත්‍රයට නගමි.

මා කමතට ගියවිට මගේ ප්‍රීතිමත් හැඟීම් සියල්ල අතුරුදහන් විය. බූම්මාගෙන හැකිලී සිටි ජමීලා මම දුටිමි. ඈ පෙර දවස රැය නොනිදා පහන් කළ බව කියැවෙන ලකුණු ඇගේ මුහුණෙහි දක්නට තිබිණි. දෙනෙත් වටා කළු පැහැති පැල්ලම් ඇත. ඈ මා දුටුවද මා සමග කතා නොකළාය. වෙනදා මෙන් මඳ සිනා නොපෑවාය. අප තඩයේ නායක ඔරොස්මාට් පැමිණි විට, ඔහුට ආචාර කළ ජමීලා මෙසේ තෙපළාය:

"ඔහෙගෙ තරත්තය ආපහු ගන්න. ඕන තැනකට මාව වැඩට යවන්න. මීට පස්සෙ මම නම් දුම්රිය පළට යන්නෙ නැහැ!"

"ජමීලා නුඹට මක්වෙලාද? ඇටමැස්සෙක් වත් නුඹට ඇන්නද?" යි තඩ නායකයා සිනහ මුහුණින් ප්‍රශ්න කළේය.

''ඇට මැස්සො ඉන්නෙ වගු පැටියගෙ වලිගෙ යට! මගෙන් ප්‍රශ්න අහන්න එපා! යන්නෙ නැහැ කිව්වොත් යන්නෙම නැහැ!''

ඔරොස්මාට්ගේ සිනහව අතුරුදහන් විය.

''කැමති වුණත් නුණත් තිරිඟු පටවා ගෙන දුම්රිය පළට යන්ට ඕන!'' මෙසේ කී නව නායකයා තම කිහිලිකරුවෙන් බිම කෙටිය. ''කවුරු හරි නුඹට හිරිහැර කළා නම් මට කියපන්. මම ඒකාට මේ කිහිලිකරුවෙන් පහර දෙන්නම්! එහෙම හිරිහැරයක් නැත්නම් බොරු නැතුව වැඩ කරපන්. සෙබළුන්ට ආහාර ගෙනියන්ට ඕන. නුඹගෙ ස්වාමි පුරුෂයත් යුද පෙරමුණේ!'' යැයි කී හෙතෙම තම කිහිලිකරුවලට වාරු වෙමින් ගියේය.

ලජ්ජාවට පත් ජමීලාගේ මුහුණ රතු විය. ඈ දනියාර් දෙස බලමින් සුසුම් ලෑවාය. ජමීලාට පිටුපා තරමක් ඈතින් සිටගෙන සිටි දනියාර් තම අසුට තටකලියාව ඇන්දවිය. නව නායකයා හා ඈ අතර ඇතිවූ දෙබස ඔහුටද ඇසිණි. නිහඬව සිටගෙන හුන් ජමීලා කසය අතින් ගෙන බලාපොරොත්තු රහිත ලෙස අතක් වනා තම ගැල වෙත ගියාය.

එදින අපි වෙනදාට වඩා වේලාසනින් අයිලයට පැමිණියෙමු. එදින දනියාර් මුළු දවස තිස්සේම අසුන් එළවිය. ජමීලා සුදුමැලිව, නිහඬව සිටියාය. මා ඉදිරියේ හිත්නට දැවුණ කළු පැහැති ස්ටෙප්ස් බිම බව මට විශ්වාස කළ නොහැකි විය. ඊයේ ස්ටෙප්ස් බිම අමුතු සිරියක් දැරීය. ඊයේ ස්ටෙප්ස් බිම ගැන මා ඇසූ කතාව සුරඟනා කතාවකට සමාන විය. ප්‍රීතිය පිළිබඳ මා මනැසෙහි ඇතිවූ චිත්‍රයෙන් එය ඉවත් නොවිය. ජීවිතයේ අතිශයින්ම ආලෝකමත් කොටසක් මා දුටු බව මගේ හැඟීම විය. එහි සවිස්තර පැති සිතින් මවා ගැනීම නිසා මම කැළඹීමට පත්වීමි. තිරිඟු කිරන ගැහැනියගෙන් සුදු කඩදාසියක් යොජනාම් කර ගන්නා තුරු මට සැනසුමක් නොවිය. ගැහෙන හදවතින් යුතුව මම පිදුරු ගොඩට මුවාවී දිව්වෙමි. කමතේ වැඩ කරමින් සිටි ගොවීන්ට අයත් ලී උදැල්ලක්ද ගත්තෙමි.

මා පළමුවැනි දවස අසු පිට වාඩි කළ තාත්තා අහස දෙසට නෙත් යොමා ''සර්වබලධාරී අල්ලා ආශිර්වාද කරන සේක්වා!'' යැයි කීවාක් මෙන්, මමද දේව පිහිට අයැද ඔප මට්ටම් වී ඇති උදලු තලය මත කඩදාසිය තබා අඳින්නට පටන් ගතිමි. එය නුහුරු නුපුරුදු චිත්‍ර ශිල්පියකුගේ කටු සටහනක් පමණකි. දනියාර්ගේ රූපය ඇඳ අවසාන වන විට මට සියල්ල අමතක වූවාක් මෙන් විය! මා මනැස ඉදිරියේ අගෝස්තු මාසයේ ස්ටෙප්ස් බිම මැවිණි: දනියාර් මිහිරි ගී ගයයි. ඔහුගේ පපුව නග්නය. හිස පහතට නැමිලාය. ජමීලා තම හිස ඔහුගේ උරහිසක් මත තබාගෙන නිහඬව ගීයට කන් දෙන්නීය. මෙය මගේ පළමුවැනි ස්වාධීන චිත්‍රයයි. ගැල මත මවුනු

වාඩිවී සිටිති. කෙට්ටි බෝං ලිය මත තබා ඇත. අඳුරේ අඳුන්ගේ පිට නැටමෙන සැටි පෙනේ. ඇත ස්ටෙප්ස් තිම්න බිම්ය. අහසේ ඇත තරුය.

මම මහත්වූ ප්‍රමෝදයකින් යුතුව චිත්‍රය ඇන්දෙමි. යම් කිසිවෙක් මට හඩ නගා කතා කළ විට පමණකි, මා අවදිවූයේ.

"නුඹ බිගිරි වෙලාද?"

මෙසේ ඇසුවේ ජමීලාය. මම අන්දමන්ද වීමි. ලජ්ජාව නිසා රතුවූ මට චිත්‍රය සැගවීමට අමතක විය.

"කරත්තවලට තිරිඟු පටවල දැන් පැයක් වෙනව. අපි නුඹව සෙව්ව. නුඹ මෙතන මොනව කරනවද?.. මේ මොකක්ද?" යි ඇසූ ඈ චිත්‍රය අතට ගත්තාය. "හ්ම්!" යැයි කී ඈ කෝපයෙන් දෙබුර සොලවූවාය.

මට පොළොව පලාගෙන යන්නට සිතිණි. ජමීලා බොහෝ වේලාවක් යනතුරු චිත්‍රය දෙස බලා සිට හිස ඔසවා සොමින් මෙසේ කිවාය.

"නිව්නෙ බාලා, මට දීපන් මය පින්තූරය... මතක වස්තුවක් හැටියට මම තියාගන්නම්."

ඇගේ කණගාටුදායක ඇස් කඳුලෙන් පිරී ඇත. ඈ චිත්‍රය නවා හැට්ටයට යටින් සඟවා ගත්තාය.

අපි ගැල් පදවන්නට විමු. එහෙත් මට සිදුවූ දේ ගැන අමතක කිරීමට බැරිවිය. සිහිනයක් මෙන් විය. මා දුටු දෙයට සමාන කිසිවක් ම විසින් අඳින ලදැයි මට විශ්වාස කළ නොහැක. එහෙත් යටි සිතෙහි කිසියම් ප්‍රීතියක් ඇතිවී යැයිද එය උඩගුවට සමාන යැයිද, මගේ බලාපොරොත්තු එකකට එකක් වඩාත් බලගතුයැයිද, වඩාත් රවටන සුලු යැයිද මට සිතිණි. තවත් බොහෝ චිත්‍ර ඇඳීමට--පැන්සලකින් නොව පාට වලින්--මට සිත් විය. අප බොහෝ වේගයෙන් ගැල් පැදවූ බව මට නොදැනිණි. දනියාර් වේගයෙන් අසුන් මෙහෙයූ අතර ජමීලා ඔහු අනුව වේගය වැඩි කළාය. ඈ වට පිට බලමින් අහිංසක ලෙසද, වරදක් කළ එකියක ලෙසද මදසිනා පෑවාය. ඇය අනුව මම ද මඳ සිනා පෑවෙමි. ඈ දනියාර් කෙරෙහි කෝපවී නැති සැටියකි. දනියාර්ට ආයාචනා කළහොත් ඔහු අද ගී ගයනු ඇත...

එදින අප දුම්රිය පළට පැමිණියේ වෙනදාට වඩා බොහෝ වේලාසනින් වුවද, අපේ අශ්වයෝ බෙහෙවින්ම විඩා පත්වී සිටියහ. ගැල් නැවැත්වීමටත් පෙර දනියාර් තිරිඟු මිටි කරින් ගෙනයන්නට පටන් ගත්තේය. අද ඔහුට කුමක් වී ඇද්ද, කවර හේතුවක් නිසා ඔහු ඉක්මන් වන්නේද යන්න අපට වටහා ගත නොහැකි විය. තමා අසලින් දිවගිය දුම්රිය දෙස ඔහු බොහෝ වේලාවක් බලාගත් වනම සිටියේය. දනියාර් දිවෙන දුම්රිය දෙස බලනවිට ජමීලාද ඔහු අනුව ඒ දෙස බලන්නී, ඔහුගේ අදහස් වටහා ගැනීමට වෑයම් කළාය.

''මෙහෙට එන්න. මේ අශ්වයාගේ ලාඩම ගිරවෙලා. ඒක ඇද ගන්න මට උදව් කරන්න'' යැයි ජමිලා ඔහුගෙන් ඇයද සිටියාය.

දනියාර් අසුගේ කකුල ගෙන තම දණහිස් වලට තද කොට උගේ කුර මැද හිරවී තිබුණු ලාඩම ඇද දැම්මේය. ජමිලා ඔහු දෙස බලා පහත් ස්වරයෙන් මෙසේ පැවසුවාය:

''ඔයාට මක්වෙලාද? ඔයාට තේරෙන්නෙ නැතිද?.. එහෙමත් නැතිනම් මේ ලොව ඉන්නෙ මා පමණක් කියල හිතනවද?..''

දනියාර් නිහඬව ඉවත බලාගෙන සිටියේය.

''ඔයා හිතනවද මට පහසුයි කියල?'' මෙසේ ඇසූ ජමිලා සුසුම් ලෑවාය.

දනියාර්ගේ ඇස් බැම් ඉස්සිණි. ඔහු ඇය දෙස ආදරයෙන් හා උක්මුසු හැඟීමකින් බලා රහසක් කියන්නාක් මෙන් යමක් කීවේය. එය මට නැසිණි. පසුව දනියාර් තම ගැල වෙත ඉක්මනින් ගියේ කිසියම් සතුටු හැඟීමෙකිනි. ඔහු තම අත තිබුණු අශ්ව ලාඩම අත ගැවේය. ඔහු දෙස මම කිසිවක් තේරුම් ගත නොහී පුදුමයෙන් බැලීමි: ජමිලා සැනසීමට ඔහු කීවේ කුමක්ද? කෙනෙක් පහත් බැරෑඩි හඬින් කතා කරන විට මොන සැනසීමක්ද ''ඔයා හිතනවද මට පහසුයි කියල?..''

අප තිරිඟු බා අවසන් වනවාත් සමගම, ඇඳුම් හා බඩු සහිත උරයක් ගත්, කෙට්ටු සිරුරක් ඇති, රැලි ගැසී පොඩිවුණු කබායක් හැදගත්, තුවාල ලැබූ සෙබළෙක් දුම්රියෙන් පිටතට බැස වටපිට බලා කැගැසීය.

''කුර්කුරේල අයිලයෙන් මෙතැන කවුරු හරි ඉන්නවද?''

''මම කුර්කුරේල වෙත්!'' යැයි පිළිතුරු දෙමින් ඉදිරියට ගොස්, කුමක් නිසා ඔහු මෙසේ විමසන්නේදැයි සිතන්නට වීමි.

''මල්ලි නුඹ කාගෙ කවුදැ?'' යි අසමින් ඉදිරියට එන්නේ, ඔහු ජමිලා දැක විස්මයෙන් හා ප්‍රීතියෙන් සිනාසුණේය.

''කරීම් ඒ නුඹදැ?'' යි ජමිලා හඬ නගා ඇසුවාය.

''ජමිලා, නංගියේ!''යැයි කී සෙබළා ඉදිරියට පැන ඇගේ දෑත් අල්ලා ගත්තේය.

ඔහු ජමිලාගේ ගමෙහි උපන්නෙකි.

''හරිම හොඳා! මෙහෙට එන්ට ලැබේවී කියල කව්ද හිතුවෙ!'' යැයි ඔහු සතුටු සිනින් කීවේය. ''මම සදික් සමග එක ඉස්පිරිතාලෙ නැවතිල හිටියෙ. දෙව පිහිටෙන් තව මාසෙකින් දෙකකින් විතර සදික් ගෙදර එවී. මම ගෙදර එන්ට ලැස්ති වෙලා සදික්ට කීව ලියුමක් ලියා දීපන් ගෙදරට ගිහින් බාර දෙන්නම් කියල... ඔන්න ලියුම බාර ගන්න'' යැයි කී කරීම් ත්‍රිකෝණ ලියුම් කවරයක් ජමිලා අත තැබුවේය.

ජමීලා දැතින්ම ලියුම ගෙන සතුටු වී, නැවත දුක්මුසු වැ යටැසින් දනියාර් දෙස බැලීය. දෙපා පලල් කොට සිටගත් දනියාර් එදා කමෙනේදී මෙන්, තම ගැල අසලට වී බලාපොරොත්තු රහිත ලෙස ඇය දෙස බලාගන්වනම සිටියේය.

හැම අතින්ම මිනිස්සු සෙබලා වෙත දිව ආහ. ඔහුගේ නෑයින් හා මිතුරන් ඒ පිරිසෙහි වූයෙන් ඔහු ඔවුන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු දෙන්ට විය. ජමීලාට ලියුම ගෙනා කරීමට ස්තුති කිරීමට පවා නොහැකි විය. දනියාර් තම ගැල වේගයෙන් පදවමින් පිරිස අතරින් ගියේය. ගැලේ රෝද වලවල් හරහා යමින් හඩ නැගීය.

''මේ මිනිහට යකා වැහිල!'' යැයි වේගයෙන් දිවෙන ගැල දෙස බලමින් මිනිස්සු දනියාර්ට බැණ වැදුනාහ.

සෙබලා වට කරගත් ඔහුගේ නෑ පිරිස ඔහු සමග වෙන තැනකට ගියහ. තනිවූ අපි දූලි නගමින් දිවෙන ගැල දෙස බලා සිටියෙමු.

''යමු යන්ට ජේනේ*'' යැයි මම ජමීලාට කීවෙමි.

''නුඹ පලයන් මට තනියම ඉන්ට ඉඩ හැරපන්!'' යැයි ඈ මට කීවාය.

තිරිඟු ගෙනයාම ඇරඹූ පළමුවැනි දවසේ සිටම එකට ගිය අපි පළමු වරට එදා තනිව ගියෙමු. නොසන්සුන් උණුසුම මගේ උගුර හිර කළේය. දෙතොල් වේළිණි. දහවල් කාලයේදී ගිනි රත්වූ මහ පොළොව ඉරි තැලී තිබුණද දැන් එය සිසිල්ව සිහින් ලුණු තට්ටුවකින් වැසී ඇත. බැසයන හිරුගේ රැස් නොපැහැදිලි ලෙස බැබලුණද, උණුසුමක් ඇති නොකළේය. ක්ෂිතිජයට ඉහලින් ලාරත් පැහැති වලාකුළු රැස්විණි. වියලි සුළං පහර අසුන්ගේ මුහුණු මත ලුණු සහිත වාෂ්ප තට්ටු ඇති කළේය. අසුන්ගේ දිගැති ගෙලෙහි ඇති ලොම්ද, කඳු වැටිවල පඳුරුද සුළගට සෙලවිණි.

''වගින්ට වගේ!'' යැයි සෙමින් කීවෙමි.

මා අනාථවූ සැටියකි. මා සිත තුළ නොසන්සුන් භාවයක් ඇතිවිය. සෙමින් ඉදිරියට යන අසුන්ට මම පහර දුනිමි. දිගැති කඟුල් ඇති කුරුල්ලන් සිදුරු වැනි ගුහා වලට දිවගියේ තැති ගත් විටෙක මෙනි. අප පෙදෙසේ නැති, කසාක්ස්තානයට අයත් පඳුරු වගයක වියලි කොළ සුළං පහරට අසුව පාවෙන්නට විය. හිරු බැස ගියේය. හැමතැනම පාළු වූ සැටියකි. මා ඉදිරියේ ස්ටෙප්ස් බිම පමණකි.

මා ගොවිපලට එන විට ඇඳිරි වැටී තිබිණි. මඳ සුළං හැමීමක් පවා නැත. මම දනියාර් සොයන්නට වීමි.

---

*ජේනේ — නැනා.

ඔහු ගඟට ගිය බව මුරකරුවා කීය: ``උාජ්ණය ඉවසාගත නොහැකිව හැම දෙනාම ගෙදර ගියා. තිරිඟු පොල ශුද්ධ කිරීමටත් හුළඟ ඕන! හුළඟ නැතිව කමතෙ මොනවා කරන්ටද!``

අසුන් තණ පිටියට ගෙන ගිය මම ගඟට යාමට තීරණය කළෙමි. ගඟ අසල දනියාර් කැමති ස්ථානය මම දැන සිටියෙමි.

ප්‍රපාතය අසල කඳු ගැටය මත වාඩි වී පිටි කොන්ද නමාගෙන දණහිස් අතරට හිස ඔබා ගෙන සිටි දනියාර් දුටු මට ඔහු වෙත ගොස් යමක් කියා ඔහු සතුටු කරවීමටද ඔහු බදා ගැනීමටද සිත්විය. එහෙත් ඔහුට කිව හැක්කේ කුමක්ද? මම ඔහු අසල ටික වේලාවක් නැවතී සිට නැවත ගොවිපලට ගියෙමි. පිදුරු ගොඩ මත වැතිර ගෙන සොමෙත් අඳුරු වෙමින් පවතින අහස දෙස බලමින්, ``ජීවිතය මෙතරම් සංකීර්ණ මන්ද?`` යන්න සිතන්නට වීමි.

ජමිලා තවම පැමිණ නැත. ඈ කොහේ ගියාද? මා විඩාපත්ව සිටියද, මට නින්ද නොගියේය. කඳුවලට ඉහළින් ඈත අහසේ ගිම්හාන ආලෝක ඇතිවිය.

දනියාර් පැමිණියද මට නින්දක් නොවිය. අරමුණු රහිතව ඔහු කමතේ ඇවිදිමින් මඟ පාර දෙස කිප වරක්ම බැලීය. පසුව මා වැතිර සිටි පිදුරු අසලවූ පිදුරු ගොඩක් මත ඔහු වැතිර ගත්තේය. ``දනියාර් අන් පලාතකට යනු ඇත. ඔහු මින්පසු අයිලයේ නොනවතිනු ඇත! ඔහුට යා හැක්කේ කොයිබටද? ගෙයක් දොරක් නැති තනිකඩයකු වන ඔහු වුවමනා කාටද?`` අව නින්දේ පසු වන මට ළඟ එන ගැලක රෝද ගැටෙන හඩ ඇසිණි. ජමිලා පැමිණි හැඩයි...

මා කොපමණ වේලා නිදාගත්තේදැයි මට කිව නොහැකි වුවද, කිසිවෙක් සර සර හඩක් නගමින් පිදුරු ගොඩ මත ගමන් කරන සැටි ඇසිණි. කුරුල්ලෙකුගේ තෙත්වූ පියාපතක් මගේ සිරුර සිපගත්තාක් මෙනි. මම ඇස් හැර බැලීමි. ජමිලා පැමිණ ඇත. ඈ දිය මිරිකා හරින ලද ගවොමක් ඇඳ සිටියාය. අපහසු ගතියකින් වටපිට බැලූ ජමිලා දනියාර් ළඟින් වාඩිවුණාය.

``දනියාර් මම ආවා. මගේම කැමැත්තෙන්ම ආවා.`` යැයි ඈ කොඳුලාය.

අවට නිසල විය. ගෙරවීම රහිත විදුලි කෙටීමක් ඇතිවිය.

``ඔයා අමනාප වුණාද? හුඟාක් අමනාප වුණාද?``

නැවත නිසල තාවයකි. ගලා බසින ගඟ අයිනේ ඇති පස් කන්ඩියක් දිය පාරට ඇද වැටිණි.

ඈත කඳුවලට එහා මෙහෙණ හඩකි.

''මා වරද කාරියක්ද? ඔයා වරද කරුවෙක් නොවේද...''

විදුලි කෙටීම විසින් ජමීලාගේ මුහුණ ආලෝක කැරිණි. ඈ වටපිට බලා දනියාර්ගේ සිරුර මත හිස තැබුවාය. දනියාර් ඇගේ දෙඋර අතින් ගත් විට ඈ වෙව්ලන්නට වූවාය. පසුව ඈ ඔහු ළඟින් පිදුරු ගොඩේ වැතිර ගත්තාය.

ස්ටෙප්ස් බිම හරහා ඇතිවූ කුණාටුවක් පිදුරු ගසක් කරකවා, නාමත කෙලවරේ ඇති සෙලවුණු යුර්ට--කුඩාරමක වැදී, බමරයක් මෙන් කැරකුණේය. නැවත ඇඳිරි වලාකුළු බිඳගෙන ඇතිවූ විදුලි කෙටීමත් සමග ගෙරවීමත් ඇති විය. පහසු හා ප්‍රීතිමත් ගතියක් දැනිණි.

''ඔයා හිතනවද මම ඔයා අතහැර එයා ගනීවියි කියලා? '' ජමීලා උණුසුම් ලෙස කොඳුලාය. ''මම කවදාවත් එහෙම කරන්නෙ නැහැ! එයා මට කිසිදවසක ආලය කළේ නැහැ. එයාගෙ ලියුම්වල පවා මට සුබපැතුම් එව්වෙ අන්තිමටයි. එයාගෙ ප්‍රමාදවුණු ආලයෙන් මට වැඩක් නැහැ. ඕන කෙනෙක් ඕන දෙයක් කියපුවාවෙ! මගේ ආදරණීය තනිකඩයා, ඔයාව කාටවත් මම දෙන්නේ නැහැ! මම ඔයාට ආලය කළේ බොහෝ කලක සිටයි. ඔයා එනතුරු මා බලා හිටියා. ඔයා ආවෙ හරියට මා ඔයා එනතුරු බලා හිටින බව දැනගෙන වගේ!'' මෙසේ කීවේ ජමීලාය.

ගඟට ඉහළින් නිල් පැහැති විදුලි කෙටීම් ඇතිවිය. ශීතල වැහි බිඳු හඬ නගමින් පිදුරු බට දිගේ වැටිණි.

''ජමීලා! මගේ පෙම්බර ජමීලා!'' යැයි දනියාර් සෙමින් කොඳුළේය. කසාක් හා කිර්ගිස් භාෂාවල ඇති සුරතල් නම් වලින් ඔහු ඇය ඇමතීය. ''මා දෙසට හැරෙන්න. ඔයාගෙ ඇස් දිහා බලන්න මා කැමතියි!''

ගෙරවීම් ඇරඹිණි.

බැටළු සමින් කරනලද යුර්ට පියස්ස පියාපතක් කැඩුණු කුරුල්ලෙකු මෙන් ගැහෙන්නට විය. පොළොව සිප ගන්නාක් මෙන් වැසි වසින්නට විය. ගොරවමින් පැන නැගී ගෙන හඬ අහස දෙවනත් කළේය. වසන්තයේ රත් පැහැති ටියුලිප් මල් මෙන් ගෙරවීම් අහස ආලෝකමත් කළේය. කුණාටු හඬ නගන්නට විය.

මොර සූරන වැස්ස ඇරඹිණි. පිදුරු ගොවක් මත වැතිර සිටි මගේ හදවත ගැහෙන සැටි මට දැනිණි. මා ප්‍රීතියෙනි. රෝගීව බොහෝ කාලයක් තිස්සේ ගෙයි මුල්ලට වී සිටි යමෙක් පළමුවරට හිරු එළිය බැලීමට ආවාක් මෙන් විය. වැස්ස හා විදුලි කෙටීම නිසා පිදුරු ගොඩ තුළට වැදුණද මා සතුටිනි. මා නිදා ගත්තේ මඳ සිනා පාමිනි. මට ඇසෙන ශබ්ද දනියාර්ගේ හා ජමීලාගේ කෙඳිරීමද නැතිනම් වැහි බින්දු පිදුරුවලට වැටෙන විට ඇතිවන ශබ්දයද යන්න මට අවබෝධ නොවිණි.

වැසි කාලය ඇරඹී ඉක්මනින්ම වස්සාන සෘතුව පැමිණෙන්නු ඇත. ස්ටෙප්ස් තණ කොළවල හා පිදුරුවල නැවුම් සුවඳ දසත පැතිර ගියේය. වස්සාන සෘතුවෙන් අප බලාපොරොත්තු වන්නේ කුමක්ද? ඒ ගැන යම්කිසි හේතුවක් නිසා මම නොසිතිමි.

අවුරුදු දෙකකට පසු මම නැවත පාසලට ගියෙමි. ගඟ අසල පාළුවී ඇති කමතට යාබද කන්දට ඉදගිට යාම මගේ සිරිතක් විය. මා පළමු අභ්‍යාස චිත්‍ර පාඨවලින් ඇඳීම පටන් ගත්තේ මෙහිදිය. එදා මගේ අවබෝධය අනුව වුවද හැම දෙයක්ම හොඳින් ඇඳීමට මම අපොහොසත් වීමි.

''මහ සවුත්තු පාට වගයක්! නියම උසස් වර්ගයට අයත් පාට ඇත්නම්!'' යැයි මම මටම කියා ගතිමි. එසේ වුවද ඒ පාට කිනම් වර්ගයට අයත් විය යුතුදැයි මම නොදැන සිටියෙමි.

ඒයම් ට්යුබ්වල ඇති තෙල් සායම් වැනි පාට වර්ග මා දුටුවේ ඊට බොහෝ කලකට පසුවය.

පාට වර්ග ගැන කෙසේවුවද, චිත්‍ර හැදෑරිය යුතු යයි කියා සිටි ගුරුවරුන් නිවැරදි බව මට අවබෝධ විය. එහෙත් ඉගෙන ගැනීමට අවස්ථාවක් නැති විය. යුද්ධයට ගිය තම පුතුන් නැවත එනතුරු, තම එකම පුතු වූත්, ''පවුල් දෙකකට ආහාර පාන සපයන එකම ජීගිට්--තරුණයා වූත්'', මා පාසලට යැවීම ගැන සිතීමට පවා මගේ මව අකමැති වූවාය. මගේ පාසල් යාම ගැන ඇය සමග කතා කිරීමට පවා මම මැලිවීමි. එහෙත් මේවර වස්සාන සෘතුව කොතරම් ලස්සනද යත්, එය ඇඳීමට මා තුළ ඇතිවූ ආශාව ඉමහත් විය.

ශීතට අසුවූ කුර්කුරේව් ගම්මානය හැකිලී ඇතිවාක් මෙනි. ගලා බසින ගඟෙහි ඇති ගල් තැටවල වැදුණු පෙද පාසි තද කොළ පාටින් සහ කහ පාටින් යුක්තය. තාල්නික් නැමැති කුඩා පඳුරු අකාලයේ ශීතට අසුවීම නිසා රත් පැහැ ගෙන ඇත. පොප්ලර් ගස්වල කොළ ලා පැහැයක් දැරීය.

රත් පැහැති තණ සහිත ගං ඉවුරේ තනා තිබුණු එබේරුන්ගේ කූර්ට--කුඩාරම් අව්වට වේලී, වැස්සට තෙමී කළු පැහැයෙන් යුක්ත විය. අශ්වයෝ මහ හඬින් හේෂාරවය කළහ. වෙලඹියෝ විසිර ගියහ. උන් රංචු පිටින් වසන්තය දක්වා තබාගැනීම ලෙහෙසි නැත. කඳුකරයේ සිට පැමිණි බැටළුවන් කාණ්ඩ ගැසී ස්ටෙප්ස් බිමෙහි ඇවිදින්නට විය. දම් පැහැ ගත් වියලි ස්ටෙප්ස් බිම හරහා දිගට සහ හරහට අඩිපාරවල් ඇතිවිය.

හිම වැටීමේ පෙර ලකුණු කියන්නට මෙන් ස්ටෙප්ස් බිම හරහා ඉණාවු ඇති විය. අහස අඳුරු විය, ශීත වැසි වසින්නට විය. කාලගුණය යහපත්වූ එක් දවසක මම ගඟ අසලට ගියෙමි. රිබින පඳුරු කීපයක් ගං

ඉවුරේ රන් පැහැගෙන තිබෙනු මම දුටිමි. තොටුපල අසල පදුරක මම වාඩිවුණෙමි. සවස් විය. පුද්ගලයින් දෙදෙනෙකු තොටුපල අසලින් ගඟ හරහා යන සැටි මට පෙනිණි. ඔවුන්ගේ ලක්ෂණ හා ඉරියව් අනුව ඔවුහු දනියාර් හා ජමීලා වූහ. ඔවුන්ගේ දැඩි හා නොසන්සුන් මුහුණු දුටු මට ඇස් ඉවත ගැනීමට නොහැකි විය. ගමන් මල්ල උරෙන් ගත් දනියාර් වේගයෙන් පා තබත්ම ඔහුගේ දිග කබායේ වාටිය දණහිස දක්වා උසැති සපත්තු වල වැදී හඬක් පිට කළේය. හිස වැසෙන සේ සුදු ලේන්සුවක් බැඳ සිටි ජමීලා මල් සහිත--කඩ පොළට යනවිට ඈ ඇඳිමට ආශා කළ--ලස්සන ගවොමක් හැඳ සිටියාය. ඇගේ උඩුකය වාස තිබුණේ වැල්වටි කබායකිනි. එක් අතකින් මල්ලක් ගත් ඈ අනින් අතින් දනියාර් උරෙන් ගෙන සිටි මල්ලේ පටිය අල්ලා ගත්තාය. ඔවුන් යම්කිසිවක් ගැන කතාකරමින්, ගමන් කළේ.

ඔවුන් වියි පඳුරු උසට වැඩී ඇති ගැඹුරු දෙණිය මැදින් ගමන් කරන සැටි දුටු මම කුමක් කරම්දැයි නොදැන බලා සිටියෙමි. කැගසන්නටද? එහෙත් මගේ දිව වියලී ගොස් උඩු තල්ලට ඇලී ඇතිවාක් මෙනි.

කඳු වැටී දිගේ පාවෙන වලාකුළු අතරින් බැස යන සැඳෑ හිරුගේ රන් පැහැති ආලෝකය යම්තමින් පෙනිණි. හවස ඇඳිරිය ඉක්මනින් පැතිර ගියේය. දනියාර් සහ ජමීලා වට පිට නොබලා දුම්රිය ගේට්ටුව දෙසට ගමන් කළහ. උසට වැඩී ඇති වියි පඳුරුවලට ඉහලින් වරක් දෙවරක් ඔවුන්ගේ මුහුණු මා දුටුවද, පසුව ඔවුහු නොපෙනී ගියහ.

``ජමීලා-ආ-ආ!'' යැයි මම මහ හඬින් කෑ ගැසීමි.

``ආ-ආ-ආ!'' යන දෝංකාරය පමණක් මට ඇසිණි.

``ජමීලා-ආ-ආ-!'' යැයි තව වරක් කෑගැසූ මම කරන්නේ කුමක්දැයි පවා නොදැන ගඟට පැන, දිය පාර හරහා දිව්වෙමි.

අයිස් කැටයක් මගේ මුහුණට වැදුණු අතර මගේ ඇඳුම්ද තෙමිණි. යන්නේ කොහේදැයි නොදැන මා දුවන්නට වූ නිසා පය පැටලී මම බිම ඇද වැටුණෙමි. හිස නොඔසොවා වැතිර සිටි මම අඩන්නට වීමි. මා සිත අඳුරු විය. වියි පඳුරු කාන්සියෙන් යුතුව වැතිණි.

``ජමීලා! ජමීලා!'' යැයි මම ඉකිගසමින් හැඬුවෙමි.

ඉතාම වටනා කිට්ටු මිනිසුන්ගෙන් මම ඈත්වීමි. මහ පොළොව මත වැතිර සිටින මා ජමීලාට ආලය කළ බව මට අවබෝධ වූයේ දැන්ය. එය මගේ කුලුදුල් ළමා ආලය විය.

වැලමිටිවලට හිස මැදි කරගෙන මම බොහෝ වේලාවක් වැතිර සිටියෙමි. ජමීලාගේ පමණක් නොව දනියාර්ගෙන්ද මම ඈත්වීමි. මගේ ළමා කාලයටද මම ආයුබෝවන් කීවෙමි.

ඇඳිරි වැටුණු පසු ගෙදර ආ මම ගෙවත්තේ කලබැගෑණිය හා සැදෑල පටි සහිත වළලු ගැටෙන සැටි දුටිමි. යමෙක් අසුපිට නැග සිටියහ. වෙරිමත්ව සිටි මස්මොත් අසු පිට නැග වැනෙමින් මහ හඬින් කෑගැසීය:

``අපේ අයිලයෙන් පන්නල දාන්ට තිබුණ ඔය අකීකරු බල්ලාව! අවජාතකයව! අපේ ගෝත්‍රයටම නින්දාවක්. මගෙ අතට අසුවුණොත් මම ඔකව මරනව. තවු දැම්මත් කමක් නැහැ. හැම රස්තියාදු කාරයෙකුටම අපේ ගෑනු ගෙනියන්න ඉඩදෙන්න බැහැ! අසරණ තරුණයනි යමු. උගට දුම්රිය පලෙන් එහාට යන්ට ඉඩ ලැබී නැහැ.``

මට රත්විය: ඔවුන් යන්නේ කොයිබටද? අසරුවෝ මහ පාර දිගේ දුම්රිය පලට ඔස දුම්රිය ගේට්ටුව දෙසට නොයන බව දැනගත් මම කිසිවකුට නොපෙණෙන සේ ගෙට ගියෙමි. තාත්තාගේ හිම කබාය හිස සිට දෙපා දක්වා වැසෙන සේ පොරෝවාගෙන හැඩීමි.

අයිලයේ මේ සිද්ධිය ගැන කොතරම් කතා ඇති විද! ගැහැනු හැම එකියක්ම ජමීලා හෙළා දුටුවාහ.

``ඒකි මහ මෝඩියක්! කොතරම් හොඳ පවුලක්ද අත හැරල ගියේ! ඈ ඇගේ වාසනාව පයට පාගා ඇමුවා!``

``ඔය ගෑනි මොනවා හිතාගෙනද ඔහොම කළේ? ඒ මිනිහගෙ එකම වස්තුව කැඩිච්ච සපත්තු දෙකයි සෙබල කබායයි විතරයි!``

``ඔව්, ඇත්තටම ඒ මිනිහට එළුවෝ බැටළුවෝ නැහැ! ගමක් රටක් නැති රස්තියාදුකාරයා. එයාගෙ ඇඳුම් කෑලි දෙක තුන විතරයි එයාට තියෙන්නෙ. ගැනිට මතක් වෙන කොට පමාවෙලා.``

``ඒකනම් එහෙම තමා! සදික් තරක මිනිහෙක්ද, තරක ස්වාමියෙක්ද? අපේ අයිලයේ හොඳම අසරුවා තමා සදික්!``

``නැන්දම්මා කොහොම ගැනියක්ද? දෙයියො හැම ගැනියකුටම ඔය තරම් හොඳ නැන්දම්මා කෙනෙකු දෙන්නෙ නැහැ. ඔතරම් හොද නැන්දම්මා කෙනෙකු සොයාගන්ට පිළිවන්ද? කිසිම තේරුමක් නැතිව ඈ තම ජීවිතය විනාශ කරගත්තා!``

මගේ නෑනාවූ ජමීලාට නොබැන්නේ මා පමණකි. දනියාර්ගේ සෙබල කබාය සහ සපත්තු පරණවූවාට කමක් නැත. දනියාර් අධ්‍යාත්මික වශයෙන් අප හැමටම වඩා පොහොසත් බව මම දැන සිටියෙමි. ජමීලා ඔහු සමග ජීවත්වීම නිසා දුකට පත්වනු ඇතැයි මම කිසිදිනෙක විශ්වාස නොකළෙමි. මගේ කනගාටුවට එකම හේතුව වූයේ මගේ මට පමණකි. ජමීලා අපේ ගෙදරින් පිටව් යාමත් සමගම මවගේ ශක්තියද ගිත විය. පැරණි පදනම් මෙතරම් දැඩි ලෙස නැඩියාම පිළිගැනීමට මැලිවූ මගේ මව දුක්වූවා, ඈ හැකිළි ගියාය. බලසම්පන්න ගසක් කුණාටුවට අසුව් ඉදිරි වැටුණොත් එය

නැවත නැගී නොසිටිනු ඇත. ඉදිකටු මලට නූල අමුණන ලෙස ඉස්සර අම්මා කියවකුගෙන් ඉල්ලා නොසිටියාය. ඇගේ ප්‍රෞඪත්වය ඊට ඉඩ නොතැබිය. දවසක් පාසලේ සිට ගෙදර ආ මම අම්මා වෙව්ලන අත්වලින් යුතුව ඉදිකටුවට නූල අමුණා ගැනීමට බැරිව අඩමින් සිටින සැටි දුටිමි.

``ඉදා මෙන්න මේ නූල අමුණාපන්!`` යැයි කී ඇ සුසුම් හෙළුවාය. ``ජමීලා විනාශ වුණා... ඇ කොතරම් හොඳ, වැඩට දක්ෂ ගෑනියක්ද! ඇ ගියා!.. අපව අතහැර දැම්මා... ඇ ගියේ ඇයි? අප නිසා ඇට තරකත් වුණාද?..``

ඇ වැලඳගෙන සනසා, දනියාර් කොන විදියේ පුද්ගලයෙක්ද යන්න කියා සිටීමට මට සිත්වුණද මම එසේ නොකළෙමි. සදහටම මගේ මවට අපහාස කිරීමට ඉඩ තිබුණු බැවිනි.

කෙසේවුවද, ඔවුන් පැනයාමේදී මා ගත් අහිංසක ක්‍රියා කලාපය හෙලිවිය...

සදික් සුවය ලැබ ගෙදර ආවේය. ඔහු සැබවින්ම දුක් වුණා, මත් පැන් බී වෙරිවූ දවසක ඔස්මොන් අමතා මෙසේ පැවසීය:

``ඇට වුවමනා දිහාවට ඇ ගියා. කොහේදි හරි කන්ට නැතිව මැරිල යාවි. අපේ කාලෙ ඔහ තරම් ගෑනු ඉන්නව. ඉතාම ලස්සන ගෑනි වුණත් ඉතාම අවලස්සන මිනිහ තරම් වටින්නෙ නැහැ.``

``ඒ කතාව නම් ඇත්ත!`` යැයි ඔස්මොන් පිළිතුරු දුන්නේය. ``මගෙ හිතට අමාරු එදා ඌ මගෙ අතට අහුවුණේ නැති එකයි. එදා මා ඌව මරා දමනව! ඒකිගෙ කොණ්ඩෙ අශ්වයගෙ වලිගෙට බැඳලයි මම ඒකිව මෙහෙට ගේන්නෙ. දකුණු පෙදෙසේ කපු වතුවල වැඩ කරනව ඇති. කයාක් ජාතිකයින් ළඟට යන්න ඇති. ඌට රස්තියාදුවීම ලොකු දෙයක් නෙවි. මේ වැඩේ කොහොම කෙරුණාද කියල මට නම් තේරෙන්නෙ නැහැ. කිසිවෙක් මේ ගැන දැන හිටියෙ නැහැ. කාටවත් මේ ගැන හෝඩුවාවක් වත් දැනගන්ට තිබුණෙ නැහැ. මේකට මුල පිරුවෙ ඔය ගෑනි තමා. ඇ මහ වල් ගෑනියක්. මම ඒකිට!..``

ඔස්මොන්ගේ කතාව අසා සිටි මට මෙසේ කීමට සිත්විය: ``ඔස්මොන් නුඹට මතක නැද්ද එදා පිදුරු මඩුවේදී ජමීලා නුඹව එළවා ගත්ත හැටි. නුඹ මහ නිවටයෙක්!``

දවසක් දා ගෙදර සිටි මම පාසලේ බිත්ති පුවත්පතට අවශ්‍ය චිත්‍රයක් අඳිමින් සිටියෙමි. අම්මා මුළු තැන් ගෙයි ආහාර පිසමින් සිටියාය. මා සිටි කාමරයට සදික් පැමිණියේය. කෝපයෙන් සිටි ඔහුගේ මුහුණේ රැලි වැටී දෙඇස් හැකිළී තිබිණි. ඔහු මට කඩදාසියක් පෙන්වා ප්‍රශ්න කළේය:

``මේක ඇන්දෙ නුඹද?``

මම කලබල වීමි. එය මගේ පළමුවැනි චිත්‍රය විය. ජීවමාන දනියාර් සහ ජමිලා බොහොනකට මා දෙස බැලූහ.

''මම යි.''

''මේ කවුද?'' යි ඔහු ඇඟිල්ලෙන් පෙන්විය.

''දනියාර් .''

''නෝ පාවාදෙන්නෙක්!'' යැයි සද්දක් ගුගුළේය.

ඔහු එම කඩදාසිය තුතු තොට ඉරා බිම දමා පිටව ගියේ, තඩ තංවමින් දොර වසා දමමිනි.

බොහෝ වේලාවක් නිහඬව සිටි අම්මා මගෙන් මෙසේ ඇසුවාය:

''නුඹ ඔය ගැන දැනගෙන හිටියද?''

''ඔව්.''

අම්මා ලිපට ඇලවෙමින් අවලාද සහිත බැල්මක් හෙළුවාය. මම මෙසේ පැවසිමි: ''මම ආයෙමත් ඔය පින්තූරය අඳිනව!'' එය ඇසූ ඈ දුක්මුසු හා බෙලහීන ලෙස හිස වැනුවාය.

බිම වැටී ඇති කඩදාසිය දෙස බැලූ මගේ හිත අඩපණවූවා මෙන් දැනුණේය. පාවාදෙන්නෙක් ලෙස මා ගණන් ගනු ලැබූවාවෙ. මා පාවා දුන්නේ කාවද? පවුලද? මගේ ගෝත්‍රයද? මම සත්‍යය ජීවන සත්‍යය පාවා නොදුනිමි. ඒ දෙදෙනා පිළිබඳ සත්‍යය පාවා නොදුනිමි. ඒ ගැන කිසිවකුටවත් කීමට මට බැරිය. මගේ මව පවා මා තේරුම් නොගනු ඇත.

මගේ ඇස් ඉදිරියේ හැම දෙයක්ම එකට ගුලිවී පෙනිණි. බිම වැටී ඇති කඩදාසි කැලි පණ ඇතියවුන් බවට පත්වූවාක් මෙනි. චිත්‍රයේ දනියාර් හා ජමිලා මා දෙස බැලූහ. දනියාර්ගේ ගීතය මට ඇසෙන්නාක් මෙන් විය. ඒවා ඔහු ගායනා කළේ අගෝස්තු මාසයේ ඒ රැයෙහිදිය. ඔවුන් දෙදෙනා අයිලයෙන් පිටවී ගිය සැටි මට මතක් විය. ඔවුන් ගියාක් මෙන් ඒ මග දිගේ, ප්‍රීතියේ අසීරු මග දිගේ නිර්භය හා තීරණාත්මක ලෙස ගමන් කිරීමට මට වුවමනා විය.

''මම යනව ඉගෙන ගන්ට... තාත්තාට කියන්න. මම චිත්‍ර ශිල්පියකු වීමට ඉගෙන ගන්න යනවා!'' යැයි මම මවට කීවෙමි.

මියගිය මගේ වැඩිමහල් සොහොයුරන් මතක් කරමින් අම්මා මට බැණවැදී, අඩා, අවලාද කියනු ඇතැයි මම සිතිමි. ඈ නොහැඩීම නිසා මම විස්මය පත්වීමි. ඈ දුක්මුසු ලෙස පහත් ස්වරයෙන් මෙසේ තෙපළාය:

''පලයන්... ගැදි වැව්ල ඇත් පියාපත් සොළවනව... නුඹලා බොහෝ ඉහලින් පියාසර කරාවිදැයි අප දන්නේ කොහොමද? නුඹලා ඇත්ත යුක්තිය අනුව වැඩ කරනවා වෙන්ට පුළුවනි. පලයන්...ගිය පසු අදහස වෙනස් කරන්ට පුළුවනි. පින්තූර ඇඳීම, තින්ත ගැම හොඳ රස්සාවක් නොවෙ...

ඉගෙන ගනිත් එනකොට තේරුම් ගනිවි... නුඹේ ගෙය අමතක කරන්ට එපා...''

එදින සිට කුඩා ගෙදර අපෙන් වෙන් විය. දවස් කීපයකින් මම ඉගෙනීම සඳහා පිටව ගියෙමි.

ඔන්න ඕකයි කතාව.

චිත්‍ර කලා පාසලෙන් සමත් වූ මම වැඩිදුර ඉගෙනීම සඳහා චිත්‍ර කලා ඇකැඩැමියට ඇතුළු වුණෙමි. උපාධි සංග්‍රහය සඳහා මා ඉදිරිපත් කළේ, මා බොහෝ කලක සිට ඇඳීමට සිහින දකිමින් සිටි චිත්‍රයකි.

එම චිත්‍රයේ දනියාර් හා ජමීලාගේ රූප ඇන්දෙමි. වස්සාන සෘතුවේදී ස්ටෙප්ස් බිම හරහා ඔවුහු ගමන් කරති. ඔවුන් ඉදිරියේ පළල් මඟකි, දීප්තිමත් අනාගතයකි.

මගේ ඒ අවසන් නොකළ චිත්‍රය-- චිත්‍ර ශිල්පියකු වීමට එක්වරම නොහැකියි--මට කිව නොහැකි තරම් අගනා වස්තුවකි. එය මගේ කැළඹුණු සිත පිළිබිඹු කරන පළමුවැනි කෘතියයි.

ඇනුදු මා සිත කලකිරවන අවස්ථා එමට පැමිණේ. මගේ ජීවය බඳු ඒ පින්තූරය දෙසට--දනියාර් හා ජමීලා දෙසට--එවිට මා ඇදී යන්නේ නිතැතිනි. මම ඔවුන් දෙස බොහෝ වේලාවක් බලා සිටිමි. ඒ සෑම අවස්ථාවකදීම ඔවුන් සමඟ කථා කරමි.

ඔබ දැන් කිනම් මගක් ඔස්සේ ගමන් කරන්නෙහිද? ස්ටෙප්ස් බිම හරහා දැන් මාර්ග බොහොමයකි. කසාක්ස්ථානයේ හැම තැනමත්, අල්තායි සහ සයිබීරියාව දක්වාත් අලුත් මංමාවත් විශාල ගණනකි. නිර්භය බොහෝ දෙනා එහි වැඩ කරති. ඔබ එහි ගියෙහිද? මගේ ජමීලා ආපසු හැරී නොබලාම පිටවී ගියාය. ජමීලා! දැන් ඔබ සමහර විට විඩා පත්වී හෝ අඩුවූ ආත්ම විශ්වාසයකින් පසු වන්නෙහිද? එසේනම් දනියාර්ගේ උරමත හිස තබාගන්න. ආලය, මහ පොළොව සහ ජීවිතය ගැන ගී ගයන ලෙස දනියාර්ට කියන්න! ස්ටෙප්ස් බිම විවිධ වර්ණවලින් බැබළුණාවේ! එවිට ඔබට අගෝස්තු රාත්‍රිය මතක් වේවා! ජමීලා ඉදිරියට යන්න. කනගාටුවෙන්න එපා. ඔබ අසිරු භාග්‍යයක් සොයා ගත්තෙහිය.

මා ඔවුන් දෙස බලන්නම, මට දනියාර්ගේ ගීතය ඇසේ. ඔහු මට ගමනට අඬ ගසයි. ගමන් මලු සූදානම් කළ යුතුය. ස්ටෙප්ස් බිමෙහි මගේ අයිලයට ගොස් එහිදී නව වර්ණ සොයා ගන්නෙමි.

මගේ චිත්‍රයේ හැම වර්ණයක් තුළින්ම දනියාර්ගේ ගීත ඇසේවා! මගේ චිත්‍රයේ හැම වර්ණයක් තුළින්ම ජමීලාගේ හදවත ගැසෙන සැටි ඇසේවා!



# නැතිවුණු
# වස්තුව

## සංඥාපනයක් වෙනුවට

පුවත්පත් කලාවේදියෙකු වන මට නිතර තයාන්-ෂාන් කඳු අසල වෘත්තිය කටයුතු සඳහා යාමට සිදුවිය. වසන්ත සමයේදී මා නරින්හි ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ නැවතී සිටි දවසක, වහාම කර්තෘ මාණ්ඩලීය කාර්යාලයට පැමිණෙන ලෙස මට දන්වා එවා තිබුණි. මා බස් නැවතුම් පොළට පැමිණීමට විනාඩි කීපයකට පෙර, මා යා යුතු බස්රිය මගීන් රැගෙන ගිය බැව් දැනගන්නට ලැබිණි. මීළඟ බස්රිය පිටත් වන්නේ පැය පහකට පසුවය. මහ මග යන රියකට නැග ගැනීම හැර අන් මඟක් නොමැතිය. නගර සීමාවේ මහ මග දෙසට මම ගියෙමි.

ඛනිජ තෙල් විකුණන ස්ථානය අසල ලොරියක් නවතා තිබිණි. ටැන්කියකට ඛනිජ තෙල් පුරවා ගෙන එහි පියන වසා දැමූ රියැදුරු තැන දුටු මම සතුටු වීමි. ජාත්‍යන්තර ප්‍රවාහන සේවයට අයත් ``su`` යන අකුරු දෙක එහි ලියා තිබිණි. චීනයේ සිට රිබාච්යෙ පිහිටි ඩිපෝවට යමින් සිටි එම ලොරිය ප්රුන්සෙ නගරය දක්වා යාමට සැරසෙමින් සිටියේය.

``තමුසේ දැන්ම යනවද? කරුණාකර මාවත් රිබාච්යෙට ගෙන යන්නැ!`` යි මම රියැදුරුගෙන් ඉල්ලා සිටියෙමි.

ඔහු හිස හරවා උරහිසට උඩින් බලා සෘජුව සිටගෙන සාන්ත ලෙස මෙසේ පැවසීය:

``බැහැ, අගායි,* මට බැහැ!``

``මා බැගෑපත්ව ඉල්ලා හිටිනවා. බොහොම හදිසි කාර්යයකට ප්රුන්සෙ නගරයට යන්ට තියෙනවා.``

රියැදුරු තැන නැවත මා දෙස අමිහිරි බැල්මක් හෙළීය.

``මට තේරෙනවා. අගායි අමනාප වෙන්ට එපා. මා අද කාවවත් ගෙන යන්නෙ නැහැ.``

මම විස්මයට පත්වීමි. රියැදුරු අපූන ලහැති අපූන හිස්ය. ඔහුට මගියෙකු ගෙනයාමට බැරි ඇයි?

``මම පුවත්පත් වාර්තාකරුවෙක්. බොහොම හදිසි ගමනක්. ඕන ගණනක් ගෙවන්නම්...``

``මුදල් ගැන නෙවෙයි කතාව අගායි!`` යැයි කී රියැදුරා රොස් ගතියක් පාමින් ටයරයකට පා පහරක් ගැසීය. ``වෙන වෙලාවක මම තමුසෙට හොම්ලේ ගෙනයන්නම්. නමුත් දැන්... අද බැහැ. අමනාප වෙන්ට

---

* අගායි – කෙනෙකු හැඳින්වීමට යොදන ගෞරවාන්විත පදයකි.

එපා. අපේ ලොරි තව ඒවි. ඒවායින් ඕන එකක යන්ට පුළුවනි. මට ඉවක් නම් නැහැ...''

ඔහු වෙන යම්කිසිවෙකු ගෙනයාමට පොරොන්දු වී ඇතැයි සිතූ මම මෙසේ කීවෙමි:

''ලොරිය පිටපස්සෙ ඉඩ නැතිද?''

''කොහොම වුණත්... මට සමාවෙන්න අගායි.''

තම අත්ඔරලෝසුව දෙස බැලූ රියැදුරා ඉක්මන් විය.

අන්දමන්ද වූ මම විස්මයට පත්වූයේ, අපේ දෙබසට සවන් දී සිටි බනිජ තෙල් සේවිකාව වන මහලු රුසියන් කාන්තාව දෙස බැලීමි. නිහඬව ඇ හිස වනන්නට වූවාය: ''ඒ මනුස්සයාට ඔහෙ නිකම් ඉන්ට ඉඩ හරින්න.'' පුදුමයකි.

රියැදුරා ලොරියට නැග, සිගරැට් කොටසක් දෙතොලින් ගෙන යන්ත්‍රය ක්‍රියා කරවිය. ඔහු අවුරුදු තිහක් පමණ වයසැති තරමක් කුදු උසැති මිනිහෙකි. ඔහුගේ දැඩි, විශාල අත් සුක්කානම මත තිබෙන සැටිද, විඩාපත් ඔහුගේ ඇසි පිය අඩ වශයෙන් වැසී ඇති සැටිද මම දිටිමි. ඔහු තම ලොරිය පැදවීමට පෙර අමුතු විධියකට අත්ලෙන් මුණ පිසදා, කොසත්සුත් ලෙස කඳු මැදින් වැටී ඇති මග දෙස බලා සුසුමක් හෙළිය.

ලොරිය ගියේය.

සේවිකාව එළියට විත් මා අස්වැසීමට මෙන් මෙසේ තෙපලාය:

''කනගාටුවෙන්ට එපා. එන වාහනයකින් යන්ට පුළුවනි.''

මම නිහඬවීමි.

''ඒ ඉලන්දාරියා ගිහෙත් අමාරුවකින් පසුවෙනව... බොහොම දිග කතාවක්... එයා මෙහෙ ඩිපෝවක වැඩ කළා...''

සේවිකාවගේ කතාව ඇසීමට මට ඉවක් නැති වූයේ ''පබියෙදා'' මොටෝ රියකින් යාමට ඉඩ ලැබුණු බැවිනි.

මා ගමන් කළ මෝටෝරිය ලොරිය පසුකරමින් ගියේ ඩොලොන්ස්ක් කපොල්ල අසලදිය. තයාත් ෂාත් කඳුකර මාර්ගයෙහි රිය පදවන හොඳ පලපුරුද්දක් ලත් රියැදුරන් පවා නොයන වේගයකින්, ඔහු එම ලොරිය පැදවිය. වංගුවලදී පවා වේගය අඩු නොකළ හෙතෙම කොතරම් වේගයකින් ලොරිය පැදවිදයත්, හඩක් නගමින් වේගයෙන් පියාඹා ගොස් කඳුබෑවුමක මගක් ඔස්සේ යමින් නොපෙනී ගියේය. පසුව නැවත අප ඉදිරියෙන් වේගයෙන් ගිය එම ලොරියේ කැන්වස් රෙද්ද සුළං පහරට අසුව ශබ්දයක් නැගීය.

''පබියෙදා'' මොටෝරියට ලොරිය පසුකර යාමට පුළුවන් විය. මේ මිනිහා මෙතරම් වේගයකින් ලොරිය පදවන්නේ මන්ද? යන්න දැනගැනීමට

මෙන් මම හැරී බැලීමි. එවිටම වාගේ ලොකු අයිස් කැට සමග වැසි වසින්නට විය. කඳුකරයේ කපොලුවල ඉමටැති වැසි නිතර පාහේ වසී. සැඩ සුළඟත් සමග අයිස් කැට සහිත වැස්ස ලොරියේ රියැදුරු ආසනය ඉදිරිපිට ඇති වීදුරුවට පහර දෙයි. මට ඔහුගේ මුහුණ බැලීමට හැකිවිය. එය සුදුමැලිය. තකු තද වී ඇති අතර දෙතොල මත සිගරට් කොටයකි. ඔහුගේ දෑත් සුක්කානම ඒ අත මේ අත කරකැවිය. ඔහු අසල ආසනයේ හෝ බඩු පටවන කොටසේ හෝ කිසිවෙක් නොවිය.

නරීන් ගමනින් පසු දකුණු කිර්ගීසියාවේ ඔෂ් පෙදෙසට යන ලෙස මට දන්වන ලදි. පුවත්පත් කලාවේදින් වන අපට වෙලාවක් නැත. දුම්රිය පිටත් වීමට මොහොතකට කලින් යම්තමින් දුම්රියට නැගගත් මම, මට අයත් ඇඳ සහිත ආසනය වෙත ගොස් වාඩි වුණෙමි. මා ඉදිරියේ කවුළුව අසල වාඩිවී සිටි මගියා මගේ අවධානයට භාජන නොවිණි. දුම්රිය වේගය වැඩි කරමින් ගමනාරම්භ කළද, ඔහු හැරී නොබැලිය.

දුම්රිය ගුවන් විදුලි සේවාව ගීතමය වැඩ සටහනක් ප්‍රචාරය කළේය. එය මා හොඳින් දන්නා කිර්ගීස් වාදනයකි. සවස් කාලයක ස්ටෙප්ස් බිම හරහා වේගයෙන් අසු පලවන අසරුවෙකු මේ ගීතය අසන හැම වාරයකදීම මා මනැස ඉදිරියේ මැවී පෙනිණි. ගමන් මග දිගය, ස්ටෙප්ස් බිම විශාලය, කල්පනා කරමින් සෙමින් සෙමින් ගීතය ගායනා කළ හැකිය. හුදකලාව සිටින මිනිසෙක් බොහෝ දේ ගැන සිතයි. අවට නිහඬය, අසුගේ කුර ගැටෙන හඬ පමණකි. මෙයද සිතීමට අනුබල දෙයි. පිරිසිදු අගලකින් ගලා බසින දිය කඳෙන් පැන නගින හඬකට සමාන අඩ ස්වරයකින් එම ගීය ගායනා කැරිණි. බැස යන හිරු ඉක්මනින්ම කඳුවලට මුවාවී නොපෙනී යනු ඇතැයිද, සිසිල් සුළං නිහඬව පැතිර යනු ඇතැයිද මේ ගීතයෙන් කියැවිණි. ගුරු පාරේ කහ පැහැති, අළු පැහැති තණ කොළද, දූලිද සුළඟට අසුව පැදෙන්නට විය. අසරුවාට සවන් දෙන ස්ටෙප් බිම ඔහු සමග සිතමින් ගයයි.

සමහර විට මේ පෙදෙස හරහා අසරුවෙකු ගියා විය හැක... ඇත ස්ටෙප්ස් බැසයන හිරු ගිනි රත් පැහැගෙන පසුව දිප්තිමත් කහ පැහැයෙන් බැබළෙන්නට ඇත. හිරුගේ අවසාන රශ්මි ගිලගත් ගිරි මුදුන්වල හිම රෝස පාටට හුරු පැහැයක් ගන්නට ඇත. පසුව එය අඳුරු පැහැයක් ගන්නට ඇතැයි සිතිය හැක.

වේගයෙන් දිවෙන දුම්රියේ කවුළුවෙන් බලන විට ගෙවතුද, මිදි වතුද, තද කොළ පැහැති බඩ ඉරිඟු ගෝන්ද පෙනිණි. ප්‍රණීත තණ පුරවාගත් අසුන් ජෝඩුවක් බැඳි ගැලක් රේල් ගේට්ටුව වෙත වේගයෙන් දිව ගියේය, දුම්රියට ඉඩදෙන කපොල්ල අසලදී එය නවත්වන ලදි. අවටට පිලිස්සී ගිය

ඉරුණු හම්සයක් ඇඳ සිටි කොල්ලෙක් අස් ගැල මත නැගී සිට දුම්රිය දෙස බැලිය. ඔහුගේ දිග කලිසම ද දණහිස දක්වා නවා තිබිණි. ඔහු දුම්රිය දෙස බලා කිසියම් අඳුණන කෙනෙකු එහි සිටිනු දැක අතක් වනමින් මඳ සිනා පෑවේය.

වාදනය දුම්රියේ වේගය හා රිද්මය සමග හොඳින් ගැළපිණි. අසකුගේ කුර ගැටීම වෙනුවට දුම්රිය පීලි හා රෝදවල ගැටීම නිසා නැගෙන ශබ්දය ඇසිණි. අතකින් මුණ වසාගෙන මේසය අසල වාඩි වී සිටි ඔහු වාදනය අනුව සෙමින් ගයන සැටි මට ඇසුණාක් මෙනි. ඔහු දුක්වන්නේද නැතිනම් සිහින දකිමින් සිටින්නේද යන්න කිව නොහැකි වුවද, ඔහුගේ පෙනුමෙහි යම්කිසි දොම්නස් බවක් හා දුක්මුසු බවක් තිබිණි. ඔහු කොතරම් ගැඹුරු ලෙස යමක් ගැන කල්පනා කරමින් සිටියේද යත්, මැදිරියට ඇතුළු වූ මම පවා ඔහු නොදිටිමි. ඔහු හැඳින ගැනීමට මම උත්සාහ කළෙමි. මා ඔහු දුටුවේ කොහේදීද? ඔහුගේ දෑත් පවා මා දැක තිබෙන බව මට හැඟිණි. තලෙලලූ පැහැති ජ අත් ගොරෝසුය, ඇඟිලි දිගය.

එදා මට ලොරියේ ඉඩ නොදුන්නේ මේ රියැදුරු තැන බව මට මතක් විය. සන්සුන් වූ මම පොතක් අතට ගතිමි. ඔහුට එදා සිද්ධිය ගැන මතක් කළ යුතුද? ඔහු මා අමතක කොට බොහෝ කල් ගොස් ඇතැයි මට සිතිණි. රියැදුරෝ ඔවැනි ගමන් හා මගීන් ගැන කොපමණ දනිත්ද?

එකිනෙකා දෙස නොබලා මෙලෙස අපි බොහෝ වේලාවක් ගමන් කළෙමු. අවට ඇඳිරි වැටිණි. මගේ ගමන් සගයා දුම් බීමට සූදානම් විය. ඔහු සිගරැට්ටුවක් අතට ගෙන දිග සුසුමක් හෙළා ගිනි කූරක් දැල්විය. පසුව හිස ඔසවා මා දෙස බලා විස්මයට පත්විය. ඔහු මා හැඳින ගත් බව දැනගත්තේ ඔහුගේ මුහුණ රත්පැහැ ගත් බැවිනි.

''ආයුබෝවන් අගායි!'' මෙසේ කී හෙතෙම වරදක් කළ එකෙකු මෙන් මඳ සිනා පෑවේය.

මම ඔහුට අත දී ආචාර කළෙමි:

''බැහැරකද?''

''ඔව්... දුර ගමනක්!'' මෙසේ කී හෙතෙම සෙමින් දුම් පිටකොට යළි මෙසේද කීය: ''පාමීර්වලට.''

''පාමීර්වලටද? එහෙනම් අපි එකට යමු. මම ඔය් වලට යනව... තමුසෙ නිවාඩු පිටද? එහෙම නැතිනම් මාරුවීමක්ද?''

''ඔව් මාරුවීමක් තමා... දුම් බොනවද?''

අපි දුම් බිවද නිහඬවීමු. අපට කතා කිරීමට වෙන දෙයක් නැතිවාක් මෙනි. මගේ ගමන් සගයා නැවත සිතුවිලි ලෝකයෙහි නිමග්න විය. ඔහු හිස පාත්කර ගෙන වාඩිවී සිටියේය. දුම්රියේ ගමන් රිද්මය අනුව ඔහුගේ

හිසද නැටවිණි. මා පළමුවරට දුටුවාට වඩා ඔහු බොහෝසෙයින් වෙනස් වී ඇත. ඔහු කෙට්ටුවෙලාය. ඔහුගේ මුහුණ ඇදී ගොසිණි. තලලේ රැලි තුනකි. ඔහුගේ ඇස් බැම ඒකවීම නිසා ඔහු බුම්මාගෙන සිටින සැටියක් පෙනෙන්නට ඇත. හිටි හැටියේම ඔහු අප්‍රසන්න ලෙස සිනාසී මෙසේ ඇසීය:

``එදා මා අගායිව ගෙනයන්ට බැහැ කී නිසා තරහ වුණාද?''

``තමුසෙ කියන දේ මට මතක නැහැ!'' යැයි මා කීවේ ඔහුට නැවත එම සිද්ධිය ගැන මතක් කරමින් ඔහුගේ සිත රිදවීමට මා නොකැමැති වූ බැවිනි. ඔහු කොතරම් දුක්මුසු ලීලාවකින් මා දෙස බැලිදයත්, එදා වූ සිද්ධිය මට සිලිගැනීමට සිදුවිය. ``ආ එදා සිදුවුණ දේ ගැනද... සුළු වැඩක්. මට අමතක වුණා. මහ මග යනකොට ඕවගෙ වැඩ ඕන තරම් වෙනවා. ඔබට තවමත් ඒ ගැන මතකද?''

``වෙන වෙලාවකදී නම් මටත් ඔය ගැන අමතක වෙන්ට තිබුණා. එදා වගෙ දවසක් ගන්දා අමතක වුණේ නැහැ.''

``එදා මොකද වුණේ? අනතුරක්වත් සිදුවුණාද?''

``අනතුරක් සිදුවුණේ නැහැ. වෙනින් වැඩක්...'' යැයි ඔහු කීවේ තම අදහස් කියා පෑමට සුදුසු වචන සොයන්නාක් මෙනි. පසුව ඔහු සිනාසුණේය. ඔහු උවමනාවෙන්ම සිනාසුණේය. ``දැන් තමුසෙ ඕන තැනකට ගෙනියන්න මම සූදානම්. හැබැයි දැන් මමත් මගියෙක්...''

``අශ්වයා එකම මගක දහස් වාරයක් ගමන් කරනව නෙවද? කවදා හරි යන්ට බැරියැ...''

``සත්තකින්ම මගදී හමුවුණොත් බලෙන්ම වාඩි කරවා ගෙන ගෙනියනව!'' යැයි ඔහු පැවසීය.

``එහෙම නම් අපි ඒ ගැන කතාකරගත්තද?'' මම විහිළු කළෙමි.

``අගායි, මම පොරොන්දු වෙනව!'' යැයි ඔහු ප්‍රීතියෙන් පිළිතුරු දුන්නේය.

``ඇයි තමුසෙ එදා මාව ගෙන නො ගියේ?''

``ඇයි?'' දැයි ඔහු මගේ පැණයම අසා මලානිකව නිහඬ විය. බීම බැලු හෙතෙම නැවත සිගරැට්ටුවෙන් පිටවන දුම දෙස බැලීය. එම සිද්ධිය ගැන ඔහුට මතක් නොකළ යුතු බව අවබෝධ කර ගත් මම මගේ වරද නිසා පසුතැවිලි වුණෙමි. ඔහු තම සිගරැට් කොටය අළු බඳුනට ඔබා තිවා දමා අසීරුවෙන් කතා කළේය:

``බැරි වුණා... පුතාට පොරොන්දු වුණා... මා එනතුරු ඔහු බලා සිටියා...''

``පුතාවද?'' මෙසේ ඇසූ මම පුදුම වීමි.

''වැඩේ මේකයි... තේරුණද... මම කොහොමද තමුසෙට ඒ ගැන අවබෝධ කරන්නෙ...'' ඔහු නැවත දුම් වැටියක් උරන්නට විය. තම කැළඹීම මැඩ පවත්වා ගත් හෙතෙම මා දෙස බැරෑරුම් බැල්මක් හෙළා තමා ගැන කියන්නට පටන් ගත්තේය.

රියැදුරු තැනගේ කතාව මට අසන්නට ලැබුණේ ඒ විධියටය.

කතාව ඇසීමට ඉඩ ප්‍රස්තාවක් හා වේලාවක්ද තිබිණි. මප් දක්වා දුම්රියෙන් යාමට පැය හතලිස් අටක් පමණ ගතවේ. මම කලබල නොවීමි, හරස් ප්‍රශ්න නොඇසීමි. ඔහු විත්දනය ලබමින්, ඉඳහිට නිහඬවෙමින් හා වචනයකින් අවක් පමණක් පවසමින් තම කතාව කීය. ඔහුගේ කතාවට බාධා නොකර සිටීමට මම මහත් පරිශ්‍රමයක් දැරීමි. මන්දයත්, පුවත්පත් කලාවේදියකු වන මා මගේ වෘත්තියේ විශේෂතාවය නිසා ඔහුගේ කතාවට සම්බන්ධ සමහර පුද්ගලයින් ගැන දැන සිටි බැවිනි. ඔහුගේ කතාවට අතිරේකව තවත් විස්තර එකතු කිරීමට මට පුළුවන් කමක් තිබුණද, මා එසේ නොකළේ, කතාව අවසානයෙන් පසු එසේ කිරීමට තීරණය කළ බැවිනි. මගේ අදහස මම වෙනස් කළෙමි. මා ගත් පියවර නිවැරදි බව මගේ හැඟීමය. මේ කතාවේ වීරයින්ට දැන් සවන් දෙන්න.

## රියැදුරාගේ කතාව

...එය පටන් ගැනුණේ ගිටි තැටියේමය. මම ඒ දවස්වල යුද සේවයෙන් පසු ගෙදර පැමිණියෙමි. යුද හමුදාවේ සේවය කළ කාලයේදී මම යාන්ත්‍රික අංශයේ සේවය කළෙමි. දසවැනි පංතියෙන් සමත් වූ පසුද රියැදුරෙකු ලෙස වැඩ කළෙමි. කුඩා කලම දෙමාපියන් නැතිව ගියෙන් මා හැදී වැඩුණේ ළමා ගාරයකය. මගේ මිතුරු අලිබෙක් ජන්තුරින් යුද සේවය අවසන් කළේ මට අවුරුද්දකට උඩදිය. ඔහු රිබාචියෙ ඩිපෝවේ වැඩ කළ අතර මම ඔහු වෙත පැමිණියෙමි. අලිබෙක් සහ මම තයාන්-පාන්හි හෝ පාමීර්හි හෝ රුසියා පැතුවෙමු. මා හොඳින් පිළිගත් ඩිපෝ නිලධාරී තැන නේවාසිකාගාරයේ ඇඳක්ද දුන්නේය. මොස්කව්හි ලිහවොව් මෝටෝ රථ කම්හලේ සාදනලද ලොරියක්ද මට භාර දෙන ලදී. එහි එතද පැල්ලමක්වත් නොතිබිණි... මම එම ලොරියට මිනිසකුට මෙන් සැලකිලි දැක්වීමි. එය ප්‍රවේසම් කළෙමි. එය උසස් වර්ගයේ රියක් විය. ඇන්ජිම බලගතු විය. එහෙත් ලොරිය පුරා බඩු ගෙනයාමට නොහැකිවූ බව කිව යුතුය. අපේ මහා මාර්ගය--තයාන්-සාන් මහා මාර්ගය--ලෝකයේ උසම මෝටෝ රථ මාර්ගයකි. ගිරි කඳු, කඳුවැටි, කපොලු වලින් යුක්තය. කඳුවල ඕන තරම්

වතුර තිබුණද, ලොරියේ එක් කොණක ලී වැටක් මැද වතුර ටැංකියක් තිබෙන සැටි ඔබ දුටහයි මම සිතමි. කඳු නගින විට ඇන්ජිම ගිනි රත් වන බැවින් එසේ වතුර ගෙනයාමට සිදුවී ඇත. එතරම් විශාල තොගයක් බඩු නොගෙනියෙමු. හැකි තරම් විශාල ප්‍රමාණයක් බඩු ගෙනයාමට මුලදී මම නොයෙකුත් උපායන් කල්පනා කළෙමි. එහෙත් එසේ කල නොහැකි විය. කාදුකරය කාදුකරයමය.

රැකියාව මට ප්‍රීතියක් විය. ප්‍රදේශයද සිත්ගන්නා සුලුවිය. අපේ ඩිපෝව ඉස්සින්කුල් වැව අසලම විය. විදේශිය සංචාරකයින් මෙහි පැමිණ වැව අසලට වී වශිවූ කලෙක මෙන් එහි සුන්දරත්වය දෙස බලා සිටි විට මම තනිවම උඩඟු වීමි. ''ඔන්න බලාපල්ලා අපේ ඉස්සින්-කුල් වැවේ ලස්සන! මෙතරම් සුන්දර තැනක් තවත් තිබේද!..''

මුල් දවස්වලදී මගේ අමනාපයට හේතුවූ කරුණක් විය. සැප්තැම්බර් මාසයේදී පවත්වනලද ජ්ලිතම් රැස්වීමෙන් පසු වසන්තයේදී සමූහ ගොවියෝ උනන්දුවෙන් වැඩ කළහ. ඔවුන් විශාල ව්‍යාපාර ආරම්භ කළද ඔවුන් සතු යන්ත්‍ර ප්‍රමාණය සුළු විය. අපේ ඩිපෝවේ ලොරි වලින් සමහරක් සමූහ ගොවීන්ට ආධාර පිණිස යවන ලදි. අළුතින් වැඩට පැමිණි රියැදුරෝ මෙසේ ගොවිපලවලට යැවිණහ. මමද මේ පිරිසට අයත් වීමි. මහ මාවත් ඔස්සේ රිය පැදවීමට පුරුදුවීමට පටන් ගත් විටම වාගේ අපි නැවත සමූහ ගොවිපලවලට යවන ලදිමු. මෙය වැදගත්, අවශ්‍ය දෙයක් බව මා දැන සිටියද, රියැදුරෙකු වූ මම ලොරියට බොහෝ සෙයින්ම ඇලුම් කළෙමි. වලවල් සහ ගොඩැලිවල වැටි වැටී මඩෙහි එරී වැඩ කරන්නට වූයේ ලොරියට නොව මට යැයි සිතිණි. එවැනි පාරවල් සිහිනෙන් පවා දැකිය නොහැක...

දවසක් මම ගව මඩුවක් සඳහා ලැලි ගෙනයමින් සිටියෙමි. එම අයිලය කඳු පාමුලක පිහිටියේය. අයිලයට යාමට ඇති මාවතද ස්ටෙප්ස් බිම හරහා වැටී තිබිණි. මාවත වියලී තිබුණු බැවින් කරදරයක් නැතිව යා හැකි විය. අයිලටය හොඳටම ලංවූ පසු දිය පාරක් හරහා යාමට සිදුවූයෙන් මම දියපාරට රිය හැරවීමි. රිය රෝද තියා පාරේ වලවල් හා ගොඩැලි තිබිණි. ඔටුවකු පවා එතරන තරම් එතැන විශාල මඩවලකි. එහෙත් කිසිදු පලක් නොවිය. මඩ ගොහොරු බිම ලොරිය දඟයක් අඩු විසින් අල්ලාගත් සැටියකි. මම දුක්කාතම කරකවා බලාපොරොත්තු රහිතව පැඩලය පෑගිමි. බැරිම තැන රිය යටට රිංගන්නට සිදුවිය... මහ පාරට බැණ වදිමින්, සාප කරමින්, දහඩිය පෙරමින් මම රිය යට වැඩ කළෙමි. කිසිවකු එන හඬක් ඇසිණි. රිය යටට වී සිටි මට පෙනුණේ රබර් සපත්තු දෙකක් පමණකි. සපත්තු දෙක මා ළඟට වීත් නැවතිණි. මම කෝපවීමි. ''කවුද මෙතනට වීත් බලන්නේ. මෙතැන සර්කස් එකක් තියල තිබුවද?''

``යනව යන්ට මෙතන ඉන්ට එපා!`` යැයි රිය යටට වී සිටි මම කෑගැසීමි. ඇස් කොණින් බැලූ මට ගොම තැවරී ඇති පරණ ගවොමක වාටියක් පෙනිණි. අයිලයට ගෙන යන ලෙස ඉල්ලා සිටීමට පැමිණි මැහැල්ලක විය යුතුයැයි සිතූ මම ඇට මෙසේ කීවෙමි.

``ආච්චි අම්මේ ඉවසන්න! මට මෙතන වැඩ ගොඩක්. මගෙට ඉවසුම් නැතිවෙන්ට පුළුවනි...``

``මම ආච්චි කෙනෙක් නොවේ`` යැයි මට පිළිතුරු ලැබිණි.

ඒ හට හඬෙහි එක්තරා ලජ්ජාවක් හා උපහාසාත්මක බවක්ද තිබිණි.

``එහෙනම් කවුද?`` මම විස්මය පත්වීමි.

``තරුණියක්.``

``තරුණියක්ද?`` සපත්තු දෙක දෙස බැලූ මම මුරණ්ඩු ලෙස මෙසේ ඇසීමි. ``ලස්සනද?``

සපත්තු දෙක ආපසු යන්නට හැරුණු සැටි දුටු මම රිය යටින් ඉක්මනින් එළියට ආමි. සැබැවින්ම මා ඉදිරියේ තරුණියකි. ඇ සිගින්ය. ඇගේ ඇස් බැමි එකිනෙකට ලංවී ඇති නිසා ඇගේ බැල්ම රොස්ය. ඇගේ හිස බැඳි රතු ලේන්සුවකි. ඇගේ උඩුකය වසා ඇති තබාය ඇගේ පියාගේ විය යුතුය. ඇ මා දෙස බලා සිටින්නිය. මඩ ගොහොරුව මත වැතිර සිටි මගේ ඇඳුම් වල මඩ තැවරී ඇත.

``ඇත්තටම ලස්සන තරුණියක්`` යැයි මම කීවෙමි. ඇ සැබැවින්ම ලස්සනය. ``හොඳ සපත්තු දෙකක් තිබුණ නම් හරි අගෙයි,`` මෙසේ කියමින් විගිළු කල මම නැගිට සිටියෙමි.

තරුණිය ආපසු හැරී මා දෙස නොබලාම යන්නට ගියාය.

ඇ එසේ ගියේ ඇයි? අමනාප වීද? මා සිත තුළ නොසන්සුන් තාවයක් ඇති විය. දිවගොස් ඇට ලංවීමට මට සිතුණද, ආපසු උපකරණ රැස් කොට රියැදුරු ආසනයට නැග වාඩිවීමි. රිය ඉදිරියටද, පිටුපසටද පැදවෙන්නට විය. කෙසේ හෝ ඇට ලංවීමට මිස වෙනත් දෙයක් ගැන මම කල්පනා නොකළෙමි. එහෙත් මගේ ලොරිය ඉදිරියට නොගියේය. ඇ ඈතට ගමන් කරන්නට වූවාය. ලොරියේ රෝද හතර මඩ ගොඩේ එකතැන භ්‍රමණය විය.

``පලයන්! පලයන්! නුඹට ඇහුණාදැ?`` යි මම පණ ඇතියකුට කතා කරන්නාක් මෙන් ලොරියට කතා කළෙමි.

හැකිතරම් ශක්තිය යොදා ඇක්සලරේටරය පෑගීමි. යම්කිසි හාස්කමෙකින් මෙන් රෝද මඩගොඩින් ඉවත්වූයෙන් ලොරිය ඉදිරියට පැදවිණි. මම කොතරම් සතුටුවීම්ද! රිය පදවන ගමන්ම ලේන්සුවක් ගෙන

මගේ මුහුණේ තැවරී තිබූ මඩ පිසදැමීමි. හිස ඇඟිලි තුඩුවලින් පිරා ගතිමි. තරුණිය වෙත ලංවී ලොරිය නවතා සැනෙකින් රියැදුරු ආසනය මත දිගාවී දොර හැරියේ කෙසේදැයි කිමට මම නොදනිමි.

''එන්න! වාඩිවෙන්න!'' යැයි කී මම ඇට ආරාධනා කළෙමි.

තම ගමන නොනැවැත්වූ තරුණිය ඉදිරියට ගියාය. මගේ කෝපය හිරු දුටු අඳුර මෙන් අතුරුදන් විය. නැවත ඇය ළඟට ලොරිය පැදවූ මම ඇගෙන් සමාව අයැද සිටිමින් මෙසේ පැවසීමි:

''තරහ වෙන්ට එපා!'' මම නිකම් විහිලු කළා... වාඩි වෙන්ට!''

එහෙත් තරුණිය පිළිතුරු නොදුන්නාය.

එවිට පාර හරහා ලොරිය සිටවා රියැදුරු ආසනයෙන් බැස දකුණු පැත්තේ දොර හැර එහි මිට අතින් ගෙන සිට ගතිමි. මා ළඟට පැමිණි තරුණිය, මේ මිනිහා මොකටද මෙතරම් ඇවිටිලි කරන්නේ යන හැඟීමකින් මා දෙස සැක සහිත බැල්මක් හෙළුවාය. නිහඬවූ මම එසේම සිටියෙමි. ඇ මට අනුකම්පා කළාද, එසේත් නැතිනම් වෙනයම් හේතුවක් නිසාද යන්න මට කිව නොහැකිය. ඇ හිස වනා නිහඬව ලොරියට නැග රියැදුරු අසුන අසලින් වාඩිවුණාය.

මම ලොරිය පැදවීමි.

ඇ සමග කතා කිරීමට මුල පුරන සැටි මම නොදැන සිටියෙමි. තරුණියන් හැඳින ගැනීම සහ ඔවුන් සමග කතා කිරීම මට නුපුරුදු දෙයක් නොවීය. එහෙත් මෙහිදී මම අමෛධ්‍යයට පත්වීමි. හේතුව කුමක්ද? සුක්කානම කරකවන අතර ඇ දෙස මම හොරැසින් බැලීමි. ඇගේ ගෙල මෘදු කළු කෙස් වැටියකින් වැසී තිබිණි. ඇගේ උඩුකය වසා ඇති කබාය උරෙන් පහළට වැටී ඇත. ඇ තම කබාය වැලමිට් වලින් අල්ලා ගෙන මගෙන් ඇත්වූයේ එය මට පැටලේය යන බියෙනි. ඇ ව්‍යාජ දැඩි ගතියක් පෙන්වූවද, ඇගේ මෘදු ගතිය සඟවා ගැනීමට ඇට බැරිවිය. නළල රැලි ගස්සා ගැනීමට තැත් කළද එයද අසාර්ථක විය. ඇද පුවේසමින් මා දෙස හොරෙන් බැලිය. අපේ ඇස් හමුවිණි. මඳ සිනා පැවෙමු. එවිට කතාව පටන් ගැනීමට මම තීරණය කළෙමි.

''ඔහෙ මොකටද ලොරිය ළඟ නැවතුනෙ?''

''ඔහෙට උදව් වෙන්ට සිතුවා'' තරුණිය පිළිතුරු දුන්නාය.

''උදව් වෙන්ටදැ?''යි ඇසූ මම සිනාසුණෙමි. ''ඇත්තටම ඔහෙ මට උදව් කළා! ඔහෙ ආවේ නැත්නම් මට හවස් වනතුරු මඩ ගොඩේ ලගින්ට තිබුණා... ඔහෙ හැමදාම යන්නෙ මේ පාරෙන්ද?''

''ඔව්. මම සත්ව ගාලේ වැඩ කරනව.''

''ඒක බොහොම හොඳා!'' යැයි කියමින් සතුටුවූ මම නැවත ඇය අසතුටුවීමට ඉඩ නොතබමින් මෙසේ පැවසීමි: ''මහ පාර හොඳයි!'' එවිටම වාගේ ලොරිය වළකට වැටී ගොඩ ආවෙන් අපේ උරහිස් එකට හැප්පිණි. උගුර පාදාගෙන මම වට පිට බලන්නට විමි. ලජ්ජාව නිසා මගේ මුහුණ රතුවිය. ඈ හඩනගා සිනාසුණාය. එවිට මමද ඉබේටම වාගේ සිනාසෙන්නට විමි.

''සමුහ ගොවිපළට එන්නට මම අකැමැති විමි'' යි සිනාසෙන අතරම ඇට කීමි. ''ඔබෙ වගෙ හොඳ උදව්කාරියක් ලැබෙන බව දැන හිටියනම් අපේ කළමණාකාරියට බණින්නෙ නැහැ... ඉල්යාස්, ඉල්යාස්!'' යැයි කියමින් මම මටම දොස් තබා ගතිමි. මගේ නම ඉල්යාස් යැයි ඇට පැහැදිලි කළෙමි.

''මගේ නම අසේල්...''

අප අයිලයට ළංවෙත්ම මහ මග වඩාත් යහපත් විය. සුළං පහර ලොරියේ ජනේලයට වැදිණි. අසේල්ගේ හිස බැඳ තිබුණු ලේන්සුව සහ ඇගේ හිසකේද සුළඟට නැටවෙන්නට විය. අප සිත් තුළ සතුටක් ඇති වූ නිසාදෝ අපි නිහඬ වීමු. මීට පැයකට පෙර නොදත්, පුද්ගලයකු තමාගේ වැලමිටට හැප්පෙන තරමින් ළංවී වාඩිවී සිටින විට තමාට මෙතරම් සැහැල්ලු ගතියක් හා සතුටක් ඇතිවන බව මීට පෙර මම නොදැන සිටියෙමි. දැන් මට නිතර ඈ ගැන සිතීමට ආශාවක් ඇති වූයේ කෙසේදැයි මම නොදනිමි... අසේල්ගේ සිත ක්‍රියාකරන අයුරු මා නොදැන සිටියද, ඇගේ දෙනෙත් මඳ සිනා පාන බව නම් මට පෙනේ. ආපසු වෙන් නොවී බොහෝ කාලයක් එකට ගමන් කිරීමට ඇත්නම්... මගේ ලොරිය මේ වන විට අයිලයේ මගක යමින් තිබිණි. හිටිහැටියේම බියක් පළකළ අසේල් මෙසේ කීවාය:

''නවත්වන්න, මම මෙතනින් බහින්නම්!''

මම රිය නැවැත්වීමි.

''ඔබෙ මෙහෙද වාසය කරන්නෙ?''

''නැහැ!'' යි කී ඈ යම්කිසි හේතුවක් නිසා නොසන්සුන් ගතියක් පෑවාය. ''මෙතැනින් යන එක වඩා හොඳයි.''

''ඒ මොකද? මම ඔහෙට ගේ ළඟින්ම බස්සවන්නම්!'' ඇට විරුද්ධකම් පෑමට ඉඩ නොතබා මම තවත් දුර රිය පැදවීමි.

''මෙන්න මෙතන නවත්වන්නැ''යි ඈ කන්නලව් කළාය.

''බොහොම ස්තූතියි!''

''කරුණාකර බහින්න!'' යැයි විගිළි කළ මම නැවත බැගෑපත් ලෙස මෙසේ කීවෙමි: ''හෙට මගේ ලොරිය මඩ ගොඩක එරුණොත් ඔහෙ එනවද උදව් කරන්න?''

ඇට පිළිතුරු දීමට ඉඩක් නොලැබිණි: ගෙවැටෙහි දොර හැරගෙන මැහැල්ලක් මහ මගට පිවිසියාය. ඈ මහත්වූ නොසන්සුන් භාවයකිනි.

''අසේල්, නුඹ කොහෙද ගියේ? නුඹට දෙවියො සාප කරාවි! ගිගින් ඉක්මනට ඇඳ පැලඳ ගනින්. මඟුල් කපුවො ඇවිත්!'' අවසාන වැකිය ඈ නිවේ කටට අතක් තබා ගෙන රහසක් කියන්නාක් මෙනි.

අසේල් ලජ්ජාවට පත්වූවා, දෙඋර වසා තිබුණු කබාය බිම හෙළුවාය. පසුව කබාය අතින් ගෙන ඈ තම මව පිටුපසින් ගියාය. ඈ වැටට ඇතුළු වී මා දෙස හැරී බලන්නම, එහි දොර වැසිණි. ගෙවැට අසල දහඩිය පෙරමින් සිටි අසුන් බැඳ තිබෙන සැටි මම දුටිමි. අසරුවන් ඈත සිට පැමිණි බව පෙනිණි. රියැදුරු අසුනෙන් නැගී සිට ගෙවැටට උඩින් බැලිමි. ගෑනු ගෙයි පසු කොටසේ දුව ඇවිදිමින් උන්හ. ලොකු තඹ සමෝවාරයෙන් දුම් පිටවිය. පුළුස්සන ලද එළුවකු බුදින මිනිසුන් දෙදෙනෙකු මම දුටිමි. මෙහි සියලු චාරිත්‍ර අනුව මඟුල් කපුවන් පිළිගනු ලැබිය. මගේ ලොරියට පටවා ඇති බඩු ගෙනගොස් භාරදීම හැර අන් කිසිවක් කිරීමට මට නොහැකි විය.

හවස් වූ පසු ඩිපෝවට පැමිණි මම ලොරිය සෝදා පිරිසිදු කොට ගරාජයට ගෙන ගියෙමි. හැම තැනම යමින් වැඩ පළ සොයමින් තලෙමි. අද සිදුවීම මෙතරම් මා සිතට කාවැදී ඇත්තේ මන්දැයි මම නොදනිමි. මග දිගටම මම මටම දොස් නැගීමි: ''නුඹට ඕන මොනවද? නුඹ මොන මෝඩයෙක්ද? ඈ නුඹෙ කවිද? මනමාලිද? නංගිද? මගදි හමුවී ගෙදරට ගොස් හැරලුවා. හරියට ආලය පිළිබඳ ඓකගතාවයක් ඇතිවුණාක් මෙන් කනගාටු වෙනව! ඈ නුඹ ගැන හිතන්නවත් සුදානම් නැතිව ඇති! නුඹ ඇට කොහෙත්ම වුවමනා නැතිව ඇති. ඈ බැලීමට ඇවිත් සිටින මනමාලයා සිරිත් අනුව කටයුතු කරනව. නුඹ නිකම් සොච්චමෙන්! නුඹ මහ පාරෙ ගිය රියැදුරෙක්. ඒ වගෙ උදවිය බොහෝ ගණනකි... නුඹට ඈ ගැන බලාපොරොත්තු ඇති කරගැනීමට ඇති අයිතිය කුමක්ද? මඟුල් කපුවො කතිකා කරගෙන විවාහය සිදු කරාවි. නුඹට මක්වෙලාද? අල්ලා විසිකර දාපන්. නුඹෙ සුක්කානම කරකවාපන්. එපමණයි...''

අසේල් ගැන අමතක කර දැමීමට කොතරම් වෙර දැරුවද එසේ කිරීමට මට නොහැකි විය.

තව දුරටත් ලොරිය ළඟට වී සිටීම වැඩකට නැති දෙයක් විය. අමෙජ් නේවාසිකාගාරයට යා යුතුය. එහි වාසය කරන අපි ප්‍රීතිමත්, සෝපාකාරී පිරිසක් වම්හ. මට හුදකලාව සිටීමට වුවමනා විය. රියේ වහල උඩට නැග උඩුබැලි අතට හැරී හිස දෑතින් ගෙන සිටියෙමි. මා අසල වූ තවත් මොටෝ රියක් අලුත්වැඩියා කරමින් සිටියේ ජන්තායිය. ඔහු අප

සංවිධානයේම රැකියාව කළ රියැදුරෙකි. රිය යට සිට එළියට ආ ජන්නායි කෙඳිරි ගෑවේය:

``ජගිට්--තරුණයා මොනව ගැනද හිතන්නෙ?``

``සල්ලි ගැන!`` යැයි මම කෝපයෙන් පිළිතුරු දුනිමි.

ජන්නායි සල්ලි වලට කෑදරයෙකි. පළමුවැනි ශ්‍රේණියේ මෙකරාටිකයෙකි. ගේ කපටියෙකි. එමෙන්ම කුහකයෙකි. ඔහු අනිකුත් රියැදුරන් මෙන් නේවාසිකාගාරයේ පදිංචි නොවී පෞද්ගලික ගෙදරක කාමරයක් කුලියට ගෙන සිටියේය. ගේ අයිතිකාරිය සරණ පාවා ගැනීමට පොරොන්දු වූයේද, ගෙයි අයිතිය ලබා ගැනීමේ අදහසිනි.

මම වෙනත් අතකට හැරුනෙමි. රිය සෝදන තැන අසල අපේ තරුණයෝ කෙලි කවටකම් පටන් ගත්හ. ගිනි නිවන රියක් මත නැගගත් තරුණයෙක් රියැදුරන්ට නලයකින් වතුර විදින්නට විය. බටය දිගේ වේගයෙන් ගලා ආ ජල පහර නිසා රියැදුරෝ වැනෙන්නට වූහ. ගිනි නිවන රියමත නැගගත් තරුණයා හැම එකකුගේම හිස් වැසුම් ගැලවී යන ලෙස වතුර පහර විද්දේය. ජල පහර අහස දෙසට ගිවි හැටියේම විහිද ගියෙන්, දේදුනු සේයාවක් ඇතිවිය. වතුර විදින තැන අපේ කළමණාකාරිය--ලිපිකාරිය කදිවා සිටිනවා මම දුටිමි. ඈ පැන දුවන්නියක නොවේ. ඈ තම ආත්ම ගරුත්වය රැක ගැනීමට හොඳින් දැන සිටි අතර ඈට ලංවීම ලෙහෙසි කාරියක් නොවිය. ඈ දැන් බියනොවී කලබල නොවී සිටියාය. නුඹ දුබලයෙකු! යි යන හැඟීමෙන් ඈ වතුර විදින තරුණයා දෙස බලා එක පයක් සපත්තුවක ඔබාගෙන හිසකේ සකස් කරමින්, හිසකේ අලංකාරය සඳහා පාවිච්චි කරන කටු කීපයක් කටින් ගෙන සිනාසුණාය. රිදිවන් කුඩා දිය බිඳු යම්තමින් ඈගේ සිරුරේ වැදේ. දිය පහරින් නැහැවී යන තරුණයෝ, දිය විදින තරුණයා තවත් කුපිත කරවමින් සිනා සුණහ:

``ඈගේ ඇඟට වතුර විදපන්!``

``විදපන් ටිකක් රිදෙන්ට!``

``කදිවා, ප්‍රවේසම් වෙයන්!``

එහෙත් තරුණයා කදිවාගේ ඇඟට නොවදිනසේ ඈ වටේට වතුර විද්දේය. නලය මා අත තිබුණි නම්, ඈගේ හිස සිට දෙපතුල දක්වා වතුර විදිනු ඇත. මට විරුද්ධව කතා නොකරන කදිවා අන් අයට දක්වන ආකල්පයට වඩා වෙනස් ආකල්පයක් මා කෙරෙහි දැක්වූවාය. කදිවා මා ඉදිරියේ ගිනුවක්කාරී ලෙස ක්‍රියා කිරීමට පුරුදුව සිටියාය. ඈට ඉච්චා බස් කියමින්, ඈගේ හිස මා අතගාන විට ඈ කැමැත්තෙන් දැක්වූවාය. ඈ නිතර මා සමග තර්ක කරමින් මට බැණ වැදීමද, පසුව මා නිවැරදි නොවූවද මගේ අදහසට පක්ෂවීමද මගේ සිත් ගත්තේය. සමහර දවස්වලදී ඈ සමග

මම චිත්‍ර පටි බැලීමට ගියෙමි. මා පදිංචිව සිටි නේවාසිකාගාරය ඇගේ නිවස පිහිටි මාර්ගයේම පිහිටි බැවින් සමහර දවස්වලදී මම ඇය කැටුව ගියෙමි. නාම්රයකට ඇතුළු වන්නාසේ මම ඇගේ කාර්යාලයට ඇතුළු වීමි. එහෙත් අන් අය ඈ සමග කතා බහ කළ යුත්තේ කුඩා කවුළුවෙනි.

දැන් ඈ ගැන සිතන්නට මා සිත ඉඩ නොදෙයි. ඔවුන් කෙළි සෙල්ලම් කළාමෙව!

කදිවා තම හිස පිරා සකස් කොට අවසාන කොන්ඩා කටුවද ගසා මෙසේ තෙපලාය:

``දැන් ඉතින් නවත්තපන්. නුඹ පරාදයි!``

``එහෙමයි. ලිපිකාර සහෝදරිය!`` යැයි කී තරුණයා යුධ හමුදා ක්‍රමයට ආචාර කළේය. රියැදුරු පිරිස සිනාසෙමින් ඔහු අල්ලා බිමට ඇද දැමූහ.

කදිවා ගරාජය දෙසට ආවාය. ජන්නායිගේ රිය අසල නැවතුණු ඈ යමෙකු සොයන්නාක් මෙන් වටපිට බැලුවාය. ගරාජය බෙදා වෙන් කරන දැල් නිසා ඈ මා නොදුටුවාය. රිය යටට වී වැඩ කරමින් සිටි ජන්නායි වලෙන් ගොඩටවීත් ගොත ගසමින් ඇට ආචාර කළේය:

``ආයුබෝවන් සුන්දරිය!``

``ආ, ජන්නායි...``

ඔහු ගිජුලෙස ඇගේ කකුල් දෙස බැලූ අතර ඈ අසතුට පළකරන්නාක් මෙන් දෙවුර සෙල වූවාය.

``මොකද නුඹ ඔරවන්නෙ?`` මෙසේ කී කදිවා තම කකුලක සපත්තු තුඩ ජන්නායිගේ නිකටට යම්තමින් වැදෙනසේ තැබුවාය.

වෙන මිනිහෙක් නම් එවැනි ක්‍රියාවක් නිසා කෝපවනු ඇත. එහෙත් ජන්නායිගේ දෙනෙත් දිලිසෙන්නට වූයේ ඈ ඔහු සිපගත්තාක් මෙනි. ජන්නායි නැවත ලිය යටට රිංගා තම වැඩ ඇරඹිය.

කදිවා මා දුටුවාය:

``ඉල්යාස් විවේක ගන්නවද?``

``රජ සැපට විවේක ගන්නව!``

ඈ මුහුණ බිත්තියට හේත්තු කොට මා දෙස වුවමනාවෙන් බලා සිට සෙමින් මෙසේ තෙපලාය:

``මගේ කන්තෝරුවට එන්න.``

``හොඳා.``

කදිවා ගියාය. මා නැගිට යාමට සදානම් වත්ම, ජන්නායි නැවත රිය යටින් එළියට අවේය.

``යස කෙල්ල!`` යැයි කියමින් ඔහු ඉගි මැරිය.

''නුඹට තැපෙන කෙනෙක් නොවේ!'' යැයි මම තීවෙමි.

ඔහු කෝපව මා සමග පොරයට එතැයි මම සිතිමි. පොර බැදීමට මා ආශා නොකළද, ජන්නායි වැන්නකු සමග එවැනි කටයුත්තක යෙදීමට මා සූදානම්ය. මා සිත කොතරම් නොසන්සුන්භාවයකින් පෙලුනේදයත්, කළ යුත්තේ කුමක්දැයි නොදැන ළතැවීමි.

එහෙත් ජන්නායි අමනාප නොවීය.

''කමක් නැහැ! පසුවට බලාගනිමු...'' යැයි හේ පැවසීය.

ලිපිකරු කාර්යාලයේ කිසිවෙක් නොවීය. මෙහි තේරුම කුමක්ද? ඇ කොහිද? ආපසු හැරෙන්ම, මම කදිචාගේ ඇගේ හැප්පුනෙමි. ඇ කාර්යාලයේ දොරට පිටදී ගිය පිටුපසට වැටෙන සේ ගෙල ඔසවාගෙන සිටියාය. ඇසිපියවලට යටින් ඇගේ නෙත් බැබලිණි. ඇගේ ආශ්වාස ප්‍රශ්වාසය උණුසුම් විය. ආත්ම දමනය සිඳී ගියෙන් මම ඇ වෙත ඇදී ගියෙමි. එහෙත් වහාම පසුබැසීමට මම සමත් විමි. මා අසේලට වරදක් කරනැයි යන හැඟීම මා සිත තුළට පිවිසියේ මාද පුදුමයට පත් කරවමිනි.

''අඩගැසුවෙ මොකටදැ?'' යි මම අසතුටින් ඇසීමි.

කදිචා නිහඩව මා දෙස බලා සිටියාය.

''මොකටද?..'' යි මම නොඉවසිල්ලෙන් නැවත ඇසීමි.

''මොකද අඩූ සැලකිලි දක්වන්නේ'' ඇගේ කටහඬෙහි අමනාප ගතියක් තිබිණි. ''වෙන කාව හරි දැනටමත් හොයාගෙනද?..''

''මම අන්දමන්ද විමි. ඇ මට ඉගි කරන්නේ මන්ද? ඇ දැනගත්තේ කොහොමද?''

කාර්යාලයේ කුඩා කවුළුවට විවරව් ජන්නායිගේ මුහුණ පෙනිණි. ඔහු දත් විරිත්තන්නට විය.

''ලිපිකාර සහෝදරිය මෙන්න!'' යැයි ඕ හෙතෙම තපුරු බැල්මකින් ඇ දෙස බලා කඩදාසියක් දිගු කළේය.

කදිචා ඔහු දෙස කෝපයෙන් බලා පසුව මා දෙසට හැරී අමනාපයෙන් මෙසේ පැවසුවාය:

''හෙට වැඩට යා යුතු තැන දක්වන ලියවිල්ල ගැනීමට නාවෙ ඇයි? විශේෂ ආරාධනයක් බලාපොරොත්තු වෙනවද?''

මා පසෙකට තල්ලු කොට තම මේසය වෙතට ගිය කදිචා ලාච්චුවක් හැර මට ලැබිය යුතු ලියවිල්ල මා අත තැබුවාය.

නැවතත් මා සමූහ ගොවිපළට යා යුතු බව එහි සටහන්ව තිබීම නිසා මා හදවත ගැහෙන්නට විය. අසේල් බැලීමට එහිදී හැකිවේවි... ඇයි හැමදාම මා සමූහ ගොවිපළවලට යවන්නේ?

මම විරුද්ධ විමි.

``ආපහු ගොවිපලටද? ආයෙමත් ගොම, ගඩොල් පටවන්නද? මට යන්න බැහැ!`` යි කී මම කඩදාසිය මේසය මත තැබීමි. ``මඩ ගොඩේ ලැග්ගා ඇති. වෙනින් කාට හරි යවන්න!..``

``කැගහන්න එපා! සුමානයක් ඒ සමූහ ගොවිපලට යන්න නියම කරල තියනව. ඕන වුණොත් දිගු කරනව`` යැයි රොස්වූ කදිචා පැවසුවාය.

එවිට මම සන්සුන් ලෙස මෙසේ කීවෙමි:

``මම යන්නෙ නැහැ!``

හැම්දාම මෙන්ම එදිනද හිටිහැටියේම ඈ මගේ කීම පිළිගත්තාය:

``හොඳයි. මම ලොක්කා සමග කතා කරල බලන්නම්.``

ඈ එම ලියවිල්ල නැවත ගත්තාය.

``එහෙනම් මම යන්නෙ නැහැ`` යි සිතාගතිමි. ``ආයෙමත් අසේල්ව බලන්ට ලැබෙන්නෙ නැහැ.`` මගේ සිතට දොම්නසක් පිවිසිණි. ඈ නොදැක්කොත් මුළු ජීවිතයේම පසුතැවිලි වෙන්නට සිදුවෙතැයි මට පැහැදිලිවම අවබෝධ විය. මොනවා වුණත් කමක් නැහැ. යනවමයි!..

``හොඳයි මෙහාට දෙන්න!`` යැයි කී මම ලියවිල්ල අතට ගතිමි.

ජන්නායි නැවත කවුළුව තුළට හිස එබීය:

``මගේ ආච්චිට සුබපැතුම් දිපන්!``

මම නිහඬවීමි. ඔහුගේ මුහුණ පොඩි කරන්නට ඇත්නම්!.. වැරෙන් දොර වසා මම නේවාසිකාගාරයට ගියෙමි.

දෙවැනි දවසේදී ලොරිය පදවමින් ගොවිපල දෙසට යන්නේ වට පිට බලමින් ඇය සොයන්නට වීමි. පොප්ලර් පැලයක් මෙන් සිහින් සිරුරක් ඇති තරුණියක් මගට පැමිණෙතැයි මම පිරික්සීමි. රබර් සපත්තු ඇඳගෙන පියාගේ ලොකු කබායෙන් දෙවුර වසාගෙන සිටියද කම් නැත. මොන බොරුද, ඈ කව්දැයි මා දැන ඇත!

අසේල් මගේ හදවතට නව පණක්ද, අධ්‍යාත්මයට ආශ්වාදයක්ද දී ඇත!

මම වටපිට බලමින් ලොරිය පැදවීමි. ඈ පෙනෙන්නට නැත. අයිලයට ගොස් ඇගේ ගෙය ඉදිරිපිට රිය නැවැත්වීමි. ඈ ගෙදර සිටින්නීද? මා කොහොමද ඇට අඬගසන්නේ? කියන්නේ මොනවාද? ඈ හමුවීමට තරම් වාසනාවක් මට නැතිය. පටවා ගත් බඩු බැම සඳහා වේගයෙන් රිය පැදවීමි. ආපසු යන ගමන් මට අසේල් මුණගැසෙතැයි යන හැඟීමක් මා සිත තුළ උපන් නිසා උණුසුම් බලාපොරොත්තුවක් ඇති විය. ඈ සතුන් ඇති කරන මඩුවේ වැඩ කරන්නියක් බැවින් අයිලයෙන් ඈත පිහිටි ඒ සත්ව ගාලට

ගියෙමි. ඈ එදින වැඩට නොපැමිණි බව තරුණියක් මට කීවාය. ``මගේ මා හමුවෙතියි යන හැඟීම නිසා ඈ වැඩට නොපැමිණිහ`` යි සිත මම පසුතැවිලි වූයෙමි. නැවත ඩිපෝවට මා ගියේ උදාසීන ගතියකින් යුතුවය.

නියමය අනුව දෙවැනි දවසේද මම සමූහ ගොවිපළට ගියෙමි. ඈ දැක ගැනීමට මා තුළ තිබූ බලාපොරොත්තුවද නැතිව ගොසිණි. මගෙන් ඇයට ඇති ප්‍රයෝජනය කුමක්ද? ඇට කසුවත් විවාහයක් යෝජනා කොට ඇත. අපේ හමුවීම එතනින් අවසාන වෙතියි යන විශ්වාසයක් මා තුළ නොවීය. අද වුවද ඈත ගම්වල තරුණියන්ගේ කැමැත්ත නොවිමසා ඔවුන් විවාහ කැරවීම සිරිතකි. එවැනි විවාහ ගැන පුවත්පත්වල පළවූ ආරංචි මා කීප වරක්ම කියවා ඇත. ඉන් ඇති ඵලය කුමක්ද? යකඩ ගිනි ගත් විට පිළුරු බේරා ගත නොහැක. විවාහවූ තරුණිය නැවත අවිවාහක තත්ත්වයට පත්කළ නොහැක. ජීවිතය අඳුරු විය... මගේ හිස එවැනි අදහස් වලින් පිරී පැවතිණි...

මේ වසරේ වසන්තය විවිධ මල්වලින් පිරී ඇත. කඳු පාමුල ටියුලිප් මල් සරුවට වැවිලාය. ළමා වියේ සිටම අන් සියලු මල්වලට වඩා මම ටියුලිප් මල්වලට ආශා කලෙමි. ඇට ටියුලිප් මල් කලඹක් තෑගි කරන්ටද! ඈ සොයා ගන්නේ කොහොමද...

මා දුටුවේ මටම විශ්වාස කල නොහැකි විය. මීට දවස් කීපයකට පෙර මගේ ලොරිය එරුණු මඩ ගොහොරුව අසල තැනක අසේල් වාඩිවී සිටියාය. ඈ යමකිසිවකු බලාපොරොත්තුවෙන් සිටියාක් මෙනි! මම ඇය වෙත ගියෙමි. බියවී තිගැස්සුණු අසේල් නැගිට සිට, තම හිස බැඳ තිබුණු ලේන්සුව අතට ගත්තාය. අසේල් එදා මෙන් නොව අද ලස්සන ගවොමක් හා සපත්තු ඇඳ සිටියාය. උසැති අඩි සහිත සපත්තු ඇඳගෙන ඈ ගමන් කළාය. මම ලොරිය නැවැත්වීමි. මගේ හදවත ගැහෙන්නට විය.

``ආයුබෝවන්, අසේල්!``

``ආයුබෝවන්!`` ඈ සෙමින් පිළිතුරු දුන්නාය.

රියට නැගීමට ඇට උදව් වීමට මා ඉදිරිපත් වුණද, ඈ එය නොපිළිගෙන සෙමින් මහ මග දිගේ ඇවිදින්නට වූවාය. මම ඈ අසලින් රිය පැදවීමි. මෙසේ ඈ පයින් ගමන් කල අතර මම සුක්කානම කරකවමින් රිය පැදවීමි. අපි නිහඬවීමු. කතා කළ යුත්තේ මොනවාද? පසුව ඈ මෙසේ ඇසුවාය:

``ඔබෙ ඊයේ සත්තු ගාලට ආවද?``

``ඔව්. ඇයි?``

``නිකම් ආවෙ. මීට පස්සෙ එහෙට එන්ට එපා.``

``ඔබෙට දැකගැනීමට මට වුවමනා වුණා.``

ඈ පිළිතුරු නොදුන්නාය.

අර කාලකණ්ණි මඟුල් කපුවන් ගැන අමතක කිරීමට මට බැරිවිය. මඟුල ගැන විස්තර ඇසීමට වුවමනා වුණද, දිව අප්‍රාණික වූවාක් මෙන් දැනිණි. ඇගේ පිළිතුරට මම බියවීමි.

අසේල් මා දෙස බැලුවාය.

''ඒක ඇත්තද?'' මම ඇසීමි.

ඈ හිස වැනුවාය. මා අත ඇති සුක්කානම පාලනය කර ගැනීමට මම අපොහොසත් වීමි.

''මඟුල කවදාද?'' මම ඇසීමි.

''ඉක්මනින්ම'' යැයි ඈ පිළිතුරු දුන්නාය.

ඇස් හැරුණු දෙසට රිය පැදවීමට මට සිත්විය. වේගය වැඩිකරන යන්ත්‍රය තවත්වා ඇමීමි. මෝටරය මහ හඩක් නගත්ම, අසේල් අහකට පැන්නාය. මම සමාව පවා නොඉල්වීමි. එවැන්නක් ගැන සිතීමට පවා වෙලාවක් නොවිය.

''එහෙනම් අපි මීට පසු හමු නොවෙමුද?'' මම ඇසීමි.

''දන්නෙ නැහැ. හමුනොවීම හොඳා.''

''මොනවා වුණත්... ඔහෙ කොහොම හිටියත්, මම ඔහෙව සොයනවාමයි!''

නැවත අපි නිහඬවීමු. අප දෙදෙනාම එකම දෙයක් ගැන සිතුවා වෙන්නට පිළිවන. එහෙත් අප දෙදෙනා අතර ප්‍රාකාරයක් මැවී ඇතිවාක් මෙනි. මට ඇය වෙත ළංවීමට හෝ ඇට මගේ රියට නැග වාඩිවීමට හෝ මේ අදෘශ්‍යමාන ප්‍රාකාරය ඉඩ නොදෙයි!

''අසේල්, මා එනවිට හැංගෙන්ට එපා. මම ඔහෙට බාධා කරන්නෙ නැහැ. මම දුර සිටගෙන ඔහෙ දිහා බලන්නම්. පොරොත්දු වෙනවද?''

''දන්නෙ නැහැ, සමහර විට...''

''වාඩිවෙන්න, අසේල්''

''බැහැ. යන්න. අයිලය ළංවෙලා.''

ඉන් පසුවද අපි අහම්බෙන් මෙන් කීපවරක්ම හමුවීමු. නැවත මම රිය පදවමින්ද, අසේල් පයින් ගමන් කරමින්ද ගියෙමු. කළ හැකි අන් දෙයක් නොවිය.

ඇගේ මණමාලයා ගැන මම නොඇසුවෙමි. ඔහු ගැන ඇසීමට මම උනන්දු නොවීමි. එය සතුටුදායක දෙයක්ද නොවිය. ඇගේ කතාව අනුව ඈ ඔහු ගැන දන්නේ ස්වල්පයකි. මනාලයා ඇගේ මවගේ නෑයකුගේ පුතෙකි. ඔහු ඈත කැලෑ ආරක්ෂක ආයතනයක වැඩ කළේය. කඳුකරයේ වාසය කළ කෙනෙකි ඔහු. ඔවුන්ගේ පවුල් අතර පරම්පරා කීපයක් තිස්සේ

ආවාහ විවාහ සිදුවිය. අසේල්ගේ දෙමාපියන් ඈ වෙනත් කෙනෙකුට විවාහ කර දීම ගැන සිතුවේ නැත. මා ගැන සලකා බැලීම පිළිබඳ අදහසක් පවා ඇතිවිය නොහැක. මා කවුද? පිට ගමකින් පැමිණි දෙමාපියන් නැති, රියදුරෙකි. මනමාලයකු වශයෙන් ඉදිරිපත් වීමට මා තුළද ධෛර්‍යයක් නොවිය.

ඒ දවස්වලදී අසේල් නිහඬව, නිතරම යමක් ගැන සිතමින් සිටියාය. ඈ ලබාගැනීමේ කිසිදු බලාපොරොත්තුවක්ද මා තුළ නොතිබිණි. ඇගේ ඉරණම තීරණය වී අවසානය. ඈ හමුවීම පවා තේරුම් රහිත ක්‍රියාවක් විය. ළමයින් මෙන් හැසුරුණු අපි ඇගේ විවාහය ගැන කතා නොකිරීමට වෑයම් කළෙමු. හමුනොවී සිටීමට නොහැකි නිසා අපි හමුවීමු. අප දෙදෙනාට එකිනෙකාගෙන් වෙන්වී, ඈත්වී ජීවත්විය නොහැකි බව අපට හැඟිණි.

මේ විධියට අපි දවස් පහක් හමුවීමු. රදින උදේ ඩිපෝවට පැමිණි මම, මට නියමිත වැඩ සඳහා පිටත්වීමට සූදානම් වීමි. හදිසියේත්ම මම කාර්යාලයට කැඳවන ලදීමි.

``මන්න තුඹට සන්තෝෂවීමට පුළුවනි`` යි කදිචා සිනහ පාමින් කීවාය: ``නුඹව සිනටිස්යාන් මහා මාර්ගයට මාරු කළා.``

මගේ සිහි විකල වුවාක් මෙනි. පසුගිය දවස් කීපය තුළ මා ජීවත්වූයේ හැමදාම සමූහ ගොවිපළට යන්නකු මෙනි. විනයට බඩු පටවා ගෙන යන ගමන්වලට දින කීපයක් ගතවේ. අසේල් දැකගැනීමට ඉඩක් ලැබෙන්නේ කවදාද? ඈට දන්වන්නේ නැතිව ගිටිහැටියේම අතුරුදහන් විය හැකිද?

``නුඹ සන්තෝෂ වක්‍ෂෙ නැති හීදියි.`` මෙසේ කීවේ කදිචාය.

``සමූහ ගොවිපළේදී භාරගත් වැඩ තවම ඉවර නැහැ`` යි මම කීවෙමි.

කදිචා විස්මය පළකරන්නී දෙවුර සෙලවූවාය.

``නුඹ ඉස්සර ඔය වගෙ මගක් ඉල්ලා හිටිය නෙවදැ`` යි ඈ මගෙන් ඇසුවාය.

``ඉස්සර දේ ගැන දැන් කතාකිරීමෙන් ඇති වැඩක් නැහැ`` යි මම කෝපයෙන් පැවසීමි.

පුටුවක වාඩිවූ මම කළ යුත්තේ කුමක්දැයි නොදැන කල්පනා කළෙමි.

මා වෙනුවට සමූහ ගොවිපළට ජන්තායි යැවීමට තීරණය කළ බව ඔහු මට කීය. මම පරීක්ෂාකාරී වීමි. ගම්බද පාරවල අමතර ආදායම් ලබාගැනීමට ඇති ඉඩකඩ බොහෙවින් අඩු බව දන්නා ජන්තායි සමූහ ගොවිපළට යාම ප්‍රතික්ෂේප කරනු ඇතැයි මම සිතීමි. එහෙත් එහි යාමට පිටත්වෙමින් කඩදාසිය අතට ගත් ජන්තායි මෙසේ පැවසීය:

``කදිවා නුඹ මාට පිට සක්වලට පිටත් කළත් මා එහි යන්ට කැමතියි! කදිවා,නුඹට ගොවිපළෙන් බැටළු පැටවකු ගේන්ටද?``

මා කදිවාගේ මේසය අසල වාඩිවී සිටින බව ඔහු දිටීය.

``නුඹලට බාධා කළාට මට සමාවෙයන්!`` යැයි ඉන් පැවසීය.

``මෙතැනින් පලයන් යන්ට!...`` යැයි මා කීවේ හිස නොඔසවමිනි.

``ඉල්යාස් නුඹ මොකද මෙතන වාඩිවෙලා ඉන්නෙ?``යැයි ඇසූ කදිවා මගේ උරහිසට අතක් තැබුවාය.

``මට සමුහ ගොවිපළට යන්නට ඕන. කදිවා මට එහි යන්නට අවසර දෙන්නැ`` යි මම ඇගෙන් ඉල්ලා සිටියෙමි.

``නුඹට පිස්සුද? අවසර නැතිව මම කොහොමද නුඹව ගොවිපළට යවන්නෙ?`` මෙදේ කී කදිවා නොසන්සුන් ලෙස මගේ මුහුණ බැලුවාය: ``සමූහ ගොවිපළ නුඹට රස වැටුණේ මොන කරුණක් නිසාද?``

කිසිවක් නොකියා කාර්යාලයෙන් පිටවුණු මම ලොරිය ගරාජයට ගෙන ගියෙමි. ජන්නායි මගේ ලොරියට හැප්පෙන තරම් ළංවෙමින් මා දෙස බලා ඇසක් අඩවන් කොට ඉහි මරා වේගයෙන් තම ලොරිය පැදවීය.

මම බොහෝ වේලාවක් පමාවෙමින් අතපසු කළෙමි. එහෙත් විසඳුමක් නොවීය. බඩු පටවන ගබඩාවට ගොස් බැලීමි. එහි වූ පෝලිම එතරම් දිගු නොවීය.

මගේ සගයන් දුම්බීමට එන ලෙස මට අඬගැසුවද, මම රියැදුරු අසුනෙන් ඉවත නොගියෙමි. අසේල් මා එනතුරු නිකරුණේ බලා සිටින සැටි දෑස් වසාගෙන කල්පනා කළෙමි. ඇ දවසක්, දෙකක් හෝ තුනක් මා එනතුරු බලා සිටිනු ඇත. ඉන්පසු ඇ මා ගැන කුමක් සිතනු ඇද්ද?

මගේ වාරය පැමිණ ඇත. මට පෙර ඇති ලොරියට බඩු පටවන ලදි. විනාඩියකින් මගේ ලොරිය දොඹකරය යටට ගෙනාවෙමි. ``අසේල් මට සමාවෙයන්! මගේ පොප්ලර් පැළය! ස්ටෙප්ස් බිමේ සුන්දරිය මට සමාවෙයන්!`` යැයි මම සිතිමි. ගිටි හැටියේම මට නව අදහසක් ඇති විය: ``අසේල් හමුවී ඇට කියා සින්ට්ස්යාන් ගම සඳහා පිටත්වීමට පුළුවන. පැය කීපයකින් ගමන පමාවීම එතරම් විශාල හානියක් නොවේ. ඩිපෝවේ ලොක්කාට මේ ගැන අවබෝධ වනු ඇත. සමහර විට මට දොස් පවරනු ඇත. අන් මගක් නැත. සමහර විට මට නිළ වශයෙන් චෝදනා කරනු ඇත. ඇට නොදන්වා සිටිය නොහැක!මම යමි!``

මම යන්ත්‍රය ක්‍රියා කරවා ලොරිය තරමක් පස්සට ගැනීමට තැත් කළෙමි. පිටුපසින් තිබූ ලොරි එකිනෙකට වැදෙන තරම් ළංව ඇත. මා ඉදිරිපිට වූ ලොරිය බඩු පටවාගෙන ඉවත්වී ගියේය. දැන් මගේ වාරය යි.

``ඉල්යාස් දොඹකරයට ළං වෙයන්!`` යැයි දොඹකරය ක්‍රියා කරවන්නා හඬ නගා කීවේය.

දොඹකරය බඩු පටවන්නට විය. සියල්ල අවසානය. පිටරට යවන බඩුත් සමග වෙනත් පෙදෙසකට යා නොහැක. මීට පෙර මේ ගැන මට කල්පනා නුණේ මන්ද? බඩු සඳහා ලියවිලි භාරදෙන ලිපිකරුවා පැමිණියේය. මම පිටුපස හැරී කවුළුව දෙස බැලීමි. කොන්වේයරයක් සෙමින් සෙමින් ලොරියට පාත්වෙමින් තිබිණි. එය හොඳටම ළංවූ විට, මම කෑගැසීමි:

``ප්‍රවේසම් වෙයල්ලා!``

මෝටරය නොනවත්වා තිබුණු බැවින් මට ලොරිය ඉක්මනින් ගෙනයාමට පුළුවන් විය. කෑකෝ ගසන හඬද, මට බැණ වදින හඬද ඇසිණි...

ගබඩා පෙළ, ලැලි ගොඩ සහ අඟුරු ගොඩ අසලින් වේගයෙන් ලොරිය පැදවීමි. මා වඩාත් හොඳ රියැදුරෙකු වූ බව හැඟිණි. මහ පොළොව සෙලවෙන්නාක් මෙනි. ලොරිය ඒ අත මේ අත පැද්දිණි. පුරුදුවීම ලෙහෙසි නැත...

ඉක්මනින් මම ජන්තායිට ළං වීමි. ඔහු මා දැක විස්මය පත්වූයේය. ඔහුගේ දැස් එළියට පැන්නාක් මෙනි. ඔහු මා හඳුනා ගත්තද, මා වේගයෙන් රිය පදවන බව දැක දැකත්, මට ඉඩ නොදී, බාධාකරමින් රිය පදවන්නට විය. මම මහ පාර අයිනේ ඇති වගුරු බිම දිගේ ලොරිය පැදවීමි. ජන්තායි ඔහු පසුකර යාමට ඉඩනොදෙමින් මහ පාර මැස්සේ තම ලොරිය පදවමින් මට බාධා කළේය. මේ විදියට අපි ගියෙමු. ඔහු මහ මග මැස්සේද මම වගුරු බිම මැස්සේද රිය පැදවීමු.

``නුඹ කොහෙද යන්නේ? මොකද වුවමනාව?`` ඔහු මගෙන් ඇසුවේ මහ හඬින් කෑගසමිනි.

මම ඔහුට මිට මෙළවූ අත පෙන්වමින් තර්ජනය කළෙමි. මගේ ලොරිය වඩාත් අලුත් නිසා ඔහු පසුකර යාමට මට හැකි විය.

එදා අසේල් මට හමු නොවුවාය. අයිලය දක්වා රිය පැදවූ මට එඩා දැනුණේ දෙපයින් දුවමින් ගිය කලෙක මෙනි. මට හති වැටිණි. ඇගේ ගෙය අසලද මහ මගද කිසිවෙක් නොසිටියේය. කණුවක සැදැලය සහිත අසෙකු බැඳ ඇත. කළ යුත්තේ කුමක්ද? මගේ ලොරිය දුටු විට අසේල් ගෙයින් පිටතට එනු ඇතැයි සිතූ මම, පිටතට විත් මෝටරය අළුත් වැඩියා කරන්නාක් මෙන් සිටියෙමි. ගෙවැටෙහි දොර දෙස නිතර නිතර බලන්නට වීමි. වැඩි වේලාවක් ගත නොවිණි. ගෙවැටෙහි දොර හැරගෙන ඇගේ මව සහ තවත් මහල්ලෙක් එළියට ආහ. කළු පැහැති යටි රැවුලක් ඇති මහල්ලා තර බාරු පුද්ගලයෙකි. පුළුන් පුරවන ලද උඩ කබා දෙකක් ඔහු ඇඳ

සිටියේය. එකත් ලොම්ත් කරන ලද්දකි. අනිත වැල්වට රෙද්දෙන් මසන ලද්දකි. ඔහුගේ අනැති කසය අළුත්ය. ඔහු උණු තේ මේ දැන් බී ඇතියි කියන්නාක් මෙන් ඔහුගේ මුහුණ රත් පැහැගෙන ඇත. ඔවුහු අසු බැඳ ඇති තැනට ආහ. අසේල්ගේ මව අසුගේ කර පටිය අතින් ගෙන, මහල්ලාට අසු පිට නැගීමට ආධාර වුණාය.

``කපු මහත්තයා ගැන අපි බොහොම සතුටු වුණා! අප ගැන කලබල වෙන්ට එපා. අපේ දුවට අපි ලෝබ නැතුව ආධාර දෙන්න සූදානම්. අපේ අත් සිස්වෙලා නැහැ. ඒ ගැන දෙවියන්ට ස්තුති වේවා!`` යි මැහැල්ල කීවාය.

``ඔව්, ඔව්, බායිබිචෙ, අපිත් ගිහ තරක් කරගන්ට ඉඩ තියන්නෙ නැහැ``යි සැදැලය මත හරි-බරි ගැසී වාඩිවුණු කපුරාල පැවසීය. ``තරුණ දෙපොළට දෙවියො දීර්ඝායු දෙන්ට ඕන. දැවැද්ද ගැන කතා කරන්ට ඕනද. අපේ ළමයි නෙව. පිට අය නොවෙයි. අපි මෙහෙම ගිර ගනුදෙනු කරන්නෙ පළමුවැනි වරට නොවෙයි නෙව... බායිබිචෙ, ඉතින් එහෙනම් තීරණය කර ගන්න. මගුල සිකුරාදට!``

``ඔව්, ඔව්, සිකුරාදට හොඳ නැකතක් තියෙන දවසක්. සුබ ගමන්. කපු හාමිනේට අපේ සුබපැතුම් දෙන්ට.``

``ඔවුන් සිකුරාදා ගැන කතා කරන්නේ මන්දැ?`` යි මම කල්පනා කළෙමි: ``අද දවස කවදාද? බදාදා... සිකුරාදාට ඇව ගෙනයාවිද? තරුණ අපේ ජීවිත විනාශ කිරීමට යල් පැණපු සිරිත්වලට ඉඩ දිය යුතුද!..``

මහල්ලා අසු දක්කමින් කඳුකරය බලා ගියේය. අසේල්ගේ මව ඔහු යනතුරු බලා සිට පසුව මා දෙසට හැරී, රවා බලා මෙසේ කීවාය:

``නුඹ මොකද මේතන නැවතිලා ඉන්නෙ? මේතන තවලම් කාරයින්ගෙ අම්බලමක් නොවේ. හිටගෙන ඉන්න එපා! පලයන් යන්ට. ජයි ඉලන්දාරියා ඇහුනද? නුඹටයි කියන්නෙ.``

මැහැල්ල මා ගැන සැලකිලි දක්වා ඇත.

``මගේ ලොරිය කැඩිල!`` යැයි කී මම දෙකට නැමිගෙන මෝටරය අත ගාන්නට වීමි. අසේල් දකින තුරු නොයමියි සිතූ මම එතැනම සිටියෙමි.

මැහැල්ල මුමුණමින් ඉවත ගියාය.

පසුව ලොරියේ පා පුවරුව මත වාඩිවී සිගරැට්ටුවක් දල්වා ගතිමි. පුංචි කෙල්ලක් ලොරිය ළඟට වීත්, තනි කකුලෙන් එය වටේට පනින්නට වූවාය. මුහුණුවරින් ඇ අසේල්ට තරමක් සමානය. අසේල්ගේ නැගනියක්ද?

``අසේල් ගියා!`` යැයි කී ඇ උඩ පැන පැන යන්නට වූවාය.

``කොහෙද?`` මෙසේ ඇසූ මම ඇ අල්ලා ගතිමි. ``ඇ කොහෙද ගියේ?``

''මම කොහොමද දන්නෙ! මා අතහරින්න!'' මෙසේ කී ඇ ඉවත ගොස් දිව දිගු කරමින් පෙන්වූවාය.

ලොරියේ බොනට්ටුව වසා රියැදුරු අසුන මත වාඩිවී සුක්කානම අල්ලා ගනිමින් මීළඟට යා යුත්තේ කොහේදැයි කල්පනා කළෙමි. සෙමින් සෙමින් රිය එළවමින් ස්ටෙප්ස් බිම පසු කළෙමි. දිය පාරක් අසල නැවතුණු මම මී ළඟට කළ යුත්තේ කුමක්දැයි සිතන්නට විමි. දොර හැර බිමට බැස පොළොව මත වැතිර ගතිමි. හිස කකියන්නට විය. අසේල් හමු නොවිය. ගමනද කඩා කප්පල් විය... මා කල්පනා කළද, මට නොපෙණේ, නැසේ. මා කොතෙක් වේලා වැතිර සිටියේදැයි කිව නොහැක. ඇස් හැර බැලූ මට ලොරියට එහා පැත්තෙන් සිටගෙන සිටින සපත්තු සහිත කකුල් දෙකක් පෙනිණි. ඈ අන්කිසිවකු නොව අසේල්ය! මා කොතෙක් ප්‍රීතිවිදයත්, මගේ හදවත පවා නැවතුනාක් මෙන් දැනිණි. මා නැගිට සිටීමට තැත් කළද, අපොහොසත් විය. පළමුවරට අප දෙදෙනා මුණ ගැසුණේද මෙතනදිය.

''නවතින්න, නවතින්න! ආච්චි අම්මේ!'' යැයි මම සපත්තුකාරියට කීවෙමි.

''මම ආච්චි කෙනෙක් නොවේ'' යැයි මා කළ කවටකමට අසේල් කීවාය.

''එහෙනම් ඔහෙ කවුද?''

''මම තරුණියක්.''

''තරුණියක්ද? ඔහෙ ලස්සනද?''

''නැගිටල බලන්න!''

අපි එකවර සිනාසීමු. මම නැගිට ඇ වෙත දුව ගියෙමි. ඈ මා වෙත ආවාය. එකිනෙකාට ලංවී අපි සිටගතිමු.

''ලස්සනම තරුණියැ!'' යි මම කීවෙමි. ඈ ලපටි පොප්ලර් පැළයක් මෙනි. සුලං පහරට මුණ දෙමින් සිටි ඇගේ ගවොමේ අත් කෙටිය. එක් කිහිල්ලක පොත් දෙකකි. ''ඔයා කොහොමද මම මෙතන බව දැනගත්තෙ?''

''මම පුස්තකාලෙත් එන ගමන් පාරෙ සලකුණු දිහා බැලුවා. මා ඇඳින ගත්තා ඔහෙගෙ ලොරියෙ රෝදවල සටහන්!''

''එහෙමද?'' ඇගේ එම කතාව ''ආදරය යන වචනයට වඩා මට වටිණේ විය. ඈ මා ගැන සිතා ඇත. ඈ මගේ ලොරියේ සටහන් සෙවී නම්, ඈ මා අගය කොට ඇත.

''මම ඉක්මනට මෙහාට දුවගෙන ආවා. මා සිතුවා ඔහෙ මෙතන ඇතැයි කියල!''

ඇගේ අතක් අතින් ගත් මම මෙසේ පැවසීමි:

''වාඩිවෙන්න අසේල්! අපි රවුමක් යමු.''

ඈ එතවරම කැමති වුණාය. මම පුදුම වීමි. ඇය සහ මා හැඳින ගැනීමට මට බැරිවිය. සියලු දුක, දොම්නස අතුරුදහන් වූවාක් මෙනි. අප දෙදෙනා හා අපේ ප්‍රීතියද, අහස හා මහ මගද පමණකි ඇත්තේ. මම දොර හැර ඇය වාඩි කරවා රිය පදවන්නට වීමි.

අපි ගියෙමු. කොහේ යන්නේදැයි නොසිතා ඔහේ ගියෙමු. යන්නේ කොහෙද, කුමක් සඳහාද යන්න සොයා බැලීම අපට අවශ්‍ය කරුණු නොවේ. ලං ලංව වාඩිවී එකිනෙකා දෙස බලමින්, අතින් අත අල්ලා ගනිමින් යාම අපට සැපතකි. අසේල් මගේ සෙබල හිස්වැස්ම හරි ගැස්සුවාය. (මම ඒ සෙබල හිස්වැස්ම දෙවසරක්ම හිස පැළඳිමි.)

''ඔහොම වඩාත් ලස්සනයි!'' කී ඈ මගේ උරහිස මත හිස තැබුවාය...

කුරුල්ලන් රූගත් රිය ස්ටෙප්ස් බිම දිගේ වේගයෙන් ගියේය. මුළු මහත් ලෝකයම ක්‍රියාකාරී වී ඇත. අප පිළිගැනීමට හැම දෙයක්ම ඉදිරිපත් විය: කඳු, කුඹුරු, ගස්... සුළං අපට ආධාරයට ආවාක් මෙනි. මන්දයත්, අප ඉදිරියට ගිය බැවිනි. පැහැදිලි අහස ආලෝකමත් කළ හිරු බැබළිණි. අපි සිනාසීමු. ප්‍රණීත තණ සහ ටියුලිප් මල් වල සුවඳ පැතිර ගිය අතර අපි දිර්ඝ ලෙස ආශ්වාස කළෙමු...

ස්ටෙප්ස්-නිජ බිමේ රාජාලියෙක් පැරණි සොහොනකින් අහසට නැග පියාපත් විදහා ගෙන පහළින් පියාසර කරන්නට වූයේ අප සමග තරඟයෙක යෙදෙන්නාක් මෙනි.

අසරුවෝ දෙදෙනෙක් බියවී පැත්තකට පැන්නාහ. පසුව මහ හඬින් කෑගසන්නට වූහ.

''ඒ-ඒයි නැවතියව්! නැවතියව්!'' යැයි අසරුවෝ කෑගැසූහ. ඔවුන් කවුදැයි මම නොදනිමි. සමහර විට අසේල් ඔවුන් දැන සිටියා විය යුතුය. ඉක්මනින් ඔවුහු දූලි විසින් වසනු ලැබ, නොපෙනී ගියහ.

මං සන්ධියකින් ගැලක් හැරිණි. එහි වූ තරුණිය සහ තරුණයා අප දැක ඔවුනොවුන්ගේ උරහිස් අල්ලා ගනිමින් අපට සුබ පැතූහ.

''ස්තූතියි!'' යි මම ඔවුන්ට පිළිතුරු දීමි.

ස්ටෙප්ස් බිම අවසන් විය. මගේ ලොරිය දැන් තාර පාර දිගේ දුවන්නට විය.

වැව ඈත නොවේ. රිය හැරවූ මම නැවුම් බිම දිගේ එය පැදවීමි. තණ බිම හා පඳුරු මැදින් ගිය අපි වැව් ඉවුරට ළඟා වීමු. ලොරිය වැව අසලටම ගෙන ගියෙමි.

සුදු නිල් පැහැති රැළි රන්වන් පාටැති වෙරළට වැදිණි. හිරු බැස යන්ම වැවේ ඈත කොටසේ දිය ලා පැහැයෙන් බැබළිණි. ඈත හිම පිරි කඳු

මුදුන් දම් පැහැයෙන් දිලිසිණි. අහස අළු පැහැති වලාකුළින් වැසිණි.

``අසේල් අන්න බලන්න! හංසයෝ !``

වස්සාන හා ශීත ඍතුවලදී ඉස්සික්-කුල් වැවේ හංසයින් දැකිය හැක. එහෙත් වසන්තයේදී ඔවුන් දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. දකුණුදිග හංසයෝ උතුරුදිග බලා යතියි සමහරු පවසති. එය වාසනාවේ ලකුණකියිද කියති...

ඊදින සවස ධවල වර්ණ හංසයෝ රැසක් පියාඹා ගියහ. හංසයෝ වරක ඉහළින්ද තවත් වරෙක පහළින්ද පියැඹූහ. වැවට බැස පිනමින් පෙණ නංවා පියාපත් ගසා නැවත පියැඹූහ.

පසුව ඔවුහු පෙලගැසී පියාඹා ගොස් වැවේ බොක්කේ වැලි සහිත බෑවුමට වැද, රැය ගත කිරීමට සූදානම් වූහ.

රියෙහි වාඩිවී සිටී අපි නිහඬව බලා සිටියෙමු. ඉන්පසු මා කතා කළේ අප තීරණය කළාක් මෙනි:

``අන්න අර පෙනෙන වෙරළේ වහළ තමා අපේ ඩිපෝව. මේ තමා අපේ ගේ!`` මෙසේ කී මම ලොරියේ වහළ අතගාමින් සිනාසුණෙමි. අසේල් ගෙනයාමට තිවසක් නැති බැවිනි.

අසේල් මා දෙස බලා, මගේ පපුව බදාගෙන අඩමින් සිනා සෙන්නට වූවාය.

``මගේ පෙම්වත! මට ගෙයක් වුවමනා නැහැ. කවදා හෝ මගේ තාත්තා සහ අම්මා මා ගත් තීරණය ගැන අවබෝධ කරගත්තොත්, ඒ ඇති. ඒ ගොල්ලො මැරෙන තුරු මා සමග අමනාපයෙන් හිටිවී... මම වැරදිකාරියක්ද...``

අඳුර පැතිරිණි. වලාකුළු පහතින් පියාඹන්නට විය. වැවේ ජලය ශීතල වී කළු පැහැ ගති. කඳුවල විදුලි බලයෙන් ලෝහ පාස්සන්නන් වැඩකරන්නාක් මෙනි. ඇස් අන්ධ කරවන දීප්තිමත් එළියක් පැන නැග අතුරුදන් විය. ගෙරවීම පටන් ගැනිණි. හංසයින් තම ගමන නවතා නවාතැන් ගත්තේ නිකමට නොවේ. අයහපත් කාලගුණයට කඳුකර පෙමදෙසේදී ඔවුන්ට මුහුණ පෑමට සිදුවන බව ඔවුහු ඉවෙන් මෙන් දැන සිටියහ.

හෙණ පිපිරිණි. මොර සූරන වැස්ස ඇරඹිණි. වැව උතුරා යන්නට විය. වසන්තයේ පළමුවැනි විදුලි කෙටීම හා හෙණ වැදීම එය විය. එය අප දෙදෙනාගේ පළමුවැනි රැයවිය. රියැදුරු අසුන ඉදිරිපිට ඇති වීදුරුව මත වැටුණු වැහි බින්දු ගලා යන්නට විය. වැවේ කළු පැහැති ජලය ආලෝක කළේ විදුලි කෙටීම් විසිනි. අපි දෙදෙනා එකිනෙකා තදින් වැළඳගනිමින් සෙමින් පහත් හඬින් කතා කළෙමු. අසේල් බියෙන් වෙවුලන සැටි දැනේ: ඈ

බිය වී හෝ ශීත උසුලා ගත නොහැකි නිසා හෝ වෙවුලන්නට වූවාය. මගේ කබායෙන් ඇගේ උරහිස් වසා ඇය වඩාත් තදින් මා වෙත ළං කර ගතිමි. ඒ නිසා මට අමුතු ශක්තියක් හා බලයක් දැනිණි. මා තුළ මෙතරම් මුදු සෙනහසක් ඇති බව මීට පෙර මම නොදැන සිටියෙමි. කිසිවකු ආරක්ෂා කරමින්, ඇට සරණවීම මෙතරම් සතුටක් ගෙන දෙන්නක් බව මීට පෙර මම නොදැන සිටියෙමි. අසේල්ගේ කනට කොඳුරා මම මෙසේ පැවසීමි: ``ළපටි පොප්ලර් පැළයක් වැනි මගේ පෙම්බර අසේල්! ඔයාට වරදක් කිරීමට මම කිසිවකුට කිසිකලෙක ඉඩ නොතබමි!..''

ගිගිහැටියේ පටන්ගත් විදුලිය කෙටීම ගිගිහැටියේම නැවතිණි. එහෙත් පොද වැස්ස කැලඹී සිටි වැවට ඉහළින් වැස්සේය.

එවකට මා සතු එකම වස්තුව වූ කුඩා ට්‍රාන්සිස්ටර් ගුවන් විදුලි යන්ත්‍රය අතට ගතිමි. තරංග අනුව යම්කිසි ප්‍රකාශක ස්ථානයක් ඇල්ලීමි. නගරයක රඟහලකින් ``වොල්පොන්'' මුද්‍රා නැටුම ගුවන් විදුලිය මගින් ප්‍රචාරය කැරිණි. එම මුද්‍රා නැටුමෙන් කියැවෙන ආලය තරම් බලගතු, මුදු සංගීතයක් ඈත කඳු හා කඳුවැටි අතරින් අප වෙත ගලා ආවේය. රඟ හලේ ප්‍රේක්ෂකයින් අත්පොළසන් දෙමින්, මුද්‍රා නැටුම්කරුවන්ගේ නම් හඬ නගා කියමින්, සමහර විට ප්‍රධාන චරිතය රඟ පෑ නිළිය වෙත මල් පොකුරු විසි කරමින් තම සතුට හා ප්‍රීතිය පළ කළ හයි සිතිය හැක. එහෙත් කෝපවී ඇති ඉස්සික්-කුල් වැව අසල ලොරිය තුළට වී සිටි අප තරම් එම ගීතවාදන නිසා ඔවුන් නොකැලඹීණැයි කිව හැක. එම මුද්‍රා නැටුමෙන් අපේ ආලය පැවසිණැයි මට සිතිණි. තම වාසනාව සොයා ගිය වොල්පොන් නැමැති තරුණියගේ ඉරණම ගැන අපි බියවීමු. මගේ වොල්පොන්, මගේ උදය තරුව මා සමග වූවාය. මැදියම් රැයෙහිදී අසේල් මගේ උරහිසකට ඇගේ හිස තබා නිදන්නට වූවාය. එහෙත් නොනිදා ඇගේ හිස පිරිමදිමින්, ඇ ආශ්වාස ප්‍රශ්වාස කරන සැටි බලා සිටියෙමි. ඉස්සික්-කුල් වැවේ ජලය නගන හඬටද මම සවන් දී සිටියෙමි...

පසුදින උදෑසන අපි නැවත ඩිපෝවට පැමිණියෙමු. ඩිපෝවේ ලොක්කා මට සැහෙන්ට බැණ වැදුණේය. මා එසේ කිරීමේ හේතුව දැනගත් විට ඔවුහු මට සිනාසෙමින් විහිළු කළහ. එහෙත් එවැනි විශේෂ සිද්ධියක් නිසා මට සමාව දෙන ලදී. පෙරදින දොඹකරය අසල මා හැසුරුණු ආකාරය නිසා ඔවුහු බොහෝ වේලාවක් යන තුරු සිනාසුණහ.

බඩු පටවාගෙන චීනයට යාමට මට නියමව ඇත. මගේ කිට්ටු මිතුරෙකු වන අලිබෙක් ජන්තුරීන්ගේ ගෙදර මගේ අසේල් නැවැත්වීමට අදහස් කළ මම් ඇය ලොරියේ නංවා ගෙන ගමනට පිටත්වීමි. නරීන් අසල සන්දියේ පදිංචිව සිටි ජන්තුරීන් පවුල මම හොඳින් දැන සිටියෙමි. චීන සෝවියට

දේශ සීමාව අසල පිහිටි මවුන්ගේ ගෙදරට ඉඳහිට යාම මට ඇබ්බැහිවූ පුරුද්දකි. ගුණවතියක්වූ අලිබෙක්ගේ බිරිඳට මම ගරු කළෙමි.

අපි ගමතට පිටත් වී, අසේල්ට අවශ්‍ය ඇඳුම් කිපයක් මිලදී ගතිමු. ඈ මා සමග පැමිණියේ ඇඳ සිටි ගවොම පමණක් රැගෙනය. ඇඳුම් සහ මල් සහිත සළුවක්ද මිලදී ගතිමු. එය අවස්ථාවට ඔබින්නක් විය. අතර මගදී අපට, මැදිවියේ සිටි පලපුරුදු රියැදුරකු වන අක්සකල් උර්මාට්-අකේ හමුවිය. ලොරිය නවත්වන ලෙස ඔහු ඇතදීම මට අතක් වනමින් සංඥා කළේය. ලොරිය නවතා අපි එළියට බැස්සෙමු.

``අස්සලෙම්-අලේයිකුම්, උර්මාට්-අකේ!`` අපි ඔහුට ආචාර කළෙමු.

``අලේයිකුම්-අස්සලාම්, ඉල්යාස්, නුඹේ උරහිස මත වසා සිටින රාජාලියගේ දම්වැල් පොට නොකැඩේවා! යි මම පතමි`` යි කී උර්මාට් අකේ සිරිත අනුව මට සුබ පැතිය. ``නිරෝගිබවත්, දරුවනුත් නුඹලාට දෙවියෝ ලබා දෙත්වා!``

``ස්තූතියි! මගෙ කොහොමද ඒ බව දැනගත්තෙ, උර්මාට්-අකේ?`` පුදුම වූ මම ඇසීමි.

``ආ, පුතේ, හොඳ පුවත් නිකම් එකතැන තියෙන්නෙ නැහැ. මහ මග දිගේ එය කටින් කට යනවා...``

``වැඩක නැට්!`` යැයි කී මම තවත් පුදුමවීමි.

අප දෙදෙනා මහ මග නැවතී කතා කළද, උර්මාට්-ගේ අප ළඟට නැවිත්, අසේල් දෙස නොබලා මා සමග කතා කරන්නට විය. එයට හේතුව දැනගත් අසේල් සළුවෙන් හිස හා මුහුණ වසා ගත්තාය. එවිට උර්මාට්-අකේ සතුටුවෙමින් මඳ සිනා පෑවේය.

``ඇත් සිරිත අනුව වැඩකළා! අපට ගරු කිරීම ගැන දුවට ස්තූතියි. නුඹ අද සිට මේ මග රිය පදවන සියලු රියදුරන්ගේ ලේලි. ඉල්යාස් හොඳින් ඇය රැක බලාගනිත්.`` මෙසේ කී උරමාට්-අකේ සිරිත් අනුව මට මුදලක් තෑගි කළේය. ඔහු අමනාප කිරීමට අකමැතිවූ මම එය ප්‍රතික්ෂේප නොකළෙමි.

සළුව පොරවාගෙන සිටි අසේල් කිර්ගිස් ගෙදරක මනමාලියක් මෙන් මා අසලින් වාඩිවී සිටියාය. අප ලොරිය ඉදිරියට රියක් එනු දුටුවිට ඈ වහාම තම මුහුණ වසා ගත්තාය. රිය අප පසුකර ගිය පසු ඈ නැවත හිස පමණක් වැසෙන සේ සළුව පොරොවා ගත්තාය. පසුව අපි සිනාසුණෙමු.

සළුව පොරවා ගත් විට අසේල් වඩාත් රූමත්ය.

``මගෙ මණමාලි, ඇස් ඇර බලා මාව සිපගන්නකො``යි මම ඇට කීවෙමි.

''අපොයි බැහැ! රියැදුරන් දකිව්!'' මෙසේ කී ඇ මඳ සිනාපාමින් මගේ කම්මුල සිප ගත්තාය.

අපේ ඩිපෝවේ රියැදුරන් හැම කෙනෙකම පාගේ අපට සුබ පැතූහ. බොහෝ දෙනෙකු අපට මල් පොකුරු තෑගි කළ අතර සමහරු අපට තෑගි බෝග දුන්හ. රුසියන්නු තම ගම්වල විවාමගුල් වලදී රථ මලින් සරසති. ඒ සිරිත අනුව ඔවුනු අපේ ලොරියද මල් පොකුරු වලින්ද, රතු, නිල් සහ කොළ පැහැති පිත්ත පටි වලින්ද සැරසූහ. අපේ මංගල රථය නොතරම් අලංකාර විදයත්, එය සැතපුම් කිපයක් ඇතින් වුවද පැහැදිලිව පෙනිණි. අපි ප්‍රීතිවීමු. අපේ මිතුරන් නිසා මම සහ අසේල්ද ආඩම්බර වීමු. මිතුරන් හඳුනා ගැනීමට ඉඩ ලැබෙන්නේ විපතේදීයැයි කියති. එහෙත් සැපතේදීද ඔවුන් හඳුනාගත හැකිය යනු මගේ අදහසයි.

මගේ හොඳම හා කිට්ටුම මිතුරා වන අලිබෙක් ජන්තුරින් මගදී අපට හමුවිය. ඔහු මට වඩා වයසින් අවුරුද්දකින් හෝ දෙකකින් හෝ වැඩිමහල් විය. පළල් උරහිස් සහිත විශාල හිසක් ඇති මිනිහෙකි, අලිබෙක් ජන්තුරින්. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හෙබි හෙතෙම බැරෑරුම් පුද්ගලයෙක් විය. ගේ ඉතාම හොඳ රියැදුරෙකි. ඩිපෝවේ හැම දෙනෙක්ම ඔහුට ගරු කළහ. වෘත්තීය සමිති කමිටුවටද ඔහු තෝරා පත්කරගෙන ඇත. මගේ විවාහය ගැන ඔහු කුමක් කියතිදැයි මම සිතන්නට වීමි.

අලිබෙක් අපේ ලොරිය දෙස බලා ගිසවනා නිහඬව අප වෙත විත්, අසේල්ට අතට දී ආචාර කොට අපට සුබපතා මෙසේ පැවසීය:

''මාර්ග පත්‍රය මෙහාට ගනින්'' යැයි ඔහු කීය. අන්දමන්දවූ මම ඔහු දෙස බැලීමි. මාර්ග පත්‍රය ඔහු අත තැබූ විට ඔහු එය ගෙන තම පෑනෙන් ලොකු අකුරින් මෙසේ ලියුවේය: ''මංගල චාරිකාවෙ අංක 167!'' මාර්ග පත්‍රයේ අංකය එකසිය හැට හතයි.

''යහළුවා නුඹ කරන්නේ මොනවාද?'' යි මම ඇසීමි. ''මේක ලියවිල්ලක්!''

''නුඹේ මංගල චාරිකාව ඉතිහාස ගතවුණා. අපේ ලිපිකරුවොත් මිනිස්සු . එහෙම නොවේද? දැන් අත දීපන්'' යැයි කී අලිබෙක් මා බදා සිපගෙන මට සුබ පැතීය. අපි හඩ නගා සිණාසුණෙමු. පසුව අප අපේ රියවලට නැග ගමන් ගත් විට ඔහු මෙසේ ප්‍රශ්න කළේය:

''පදිංචි වෙන්නේ කොහේද?''

''මේක තමා අපේ ගෙය'' මෙස් කී මම ලොරිය පෙන්වීමි.

''ලොරියෙද? නුඹට ලැබෙන දූ දරුවන් හදා වඩාගන්නෙත් මෙකෙද? යාළුවා, නුඹ අපේ ගෙදර දැනට පදිංචි වෙයන්. මම කළමනාකාර සහෝදරවරුන්ට දන්වන්නම්. අපි යමු අපේ ගෙදර පදිංචියට.''

``නුඹේ ගෙය තවම හදා ඉවර නැහැ නොවේදැ?`` යි මම ඔහුගෙන් ඇසීමි. රිබාවියෙහි අලිබෙක් ගෙයක් සෑදීමට පටන් ගත්තේය. ඩිපෝවට එතරම් දුරින් නොපිහිටි එම ගෙය සෑදීම සඳහා විවේක ලත් අවස්ථාවලදී මම ඔහුට ආධාර කළෙමි.

``සාමක් නැහැ. තව පොඩ්ඩයි ඉතුරු වෙලා තියෙන්නෙ. මෙයට වඩා හොඳ තැනක් හොයාගන්ට බැහැ. ගෙවල් ප්‍රශ්නෙ උග්‍ර බව නුඹ දන්නව නෙවද.``

``බොහොම ස්තූතියි. අපට ඔයිට වඩා හොඳ තැනක් සොයාගන්ට බැහැ. මා හිතුවෙ තාවකාලිකව අසේල්ව මෙහි නවත්වා යන්ටයි. නමුත් නුඹ මුළු ගෙයම අපට දෙන්ට හදනවා...`` යි මම කීවෙමි.

``පොදුවේ අපේ ගෙදර නැවතියන්. එන ගමන් නුඹ මා එනතුරු ඉඳපන්. එවිට අපේ පවුල් ගැන තීරණයක් ගනිමු`` යි අලිබෙක් කීවේ අසේල් දෙස බලා ඇසක් අඩවන් කර ගනිමිනි.

``මෙතැන් සිට පවුල් ගැන.`` මමද විහිළු කළෙමි.

අපි රියට නැග පදවන්නට වීමු. `` ශුභ මංගල චාරිකාවක්!`` යැයි තම රියට නැගගත් අලිබෙක් මහ හඩින් කීය.

සත්තකින්ම! එය සැබැවින්ම අපේ මංගල චාරිකාව විය! අතිශයින්ම වාසනාවත් චාරිකාවක් විය!

හැම දෙයක්ම ඉතා හොඳින් සිදුවෙතියි සිතූ අපි ප්‍රීතවීමු. අපට හමුවූ පුද්ගලයින් දෙදෙනෙකු නිසා නොවිනම්, අපේ ප්‍රීතිය එදින සම්පූර්ණ වීමට ඉඩ තිබිණි.

එක් මන්සන්ධියකදී අපි ජන්තායිගේ ලොරිය දුටිමු. ඔහු සමඟ කදිචාද ගමන් කළාය. ජන්තායි මා දැක අතක් වනා කතා කළේය. මම ලොරිය නැවැත්වීමි. අපේ ලොරි එකිනෙක හැප්පෙන තරම් ළංවිය. ජන්තායි විදුරු කවුළුව විවෘත කොට මෙසේ ඇසීය.

``මොකද නුඹේ ලොරිය හරියට මඟුලකට වගේ සරසලා තියෙන්නේ?``

``ඇත්තටම මා විවාහවුණු හන්දා!``

``හැබැද?`` මෙසේ ඇසූ ජන්තායි අවිශ්වාසයෙන් යුතුව කදිචා දෙස බැලීය. ``අපි නුඹව හැම තැනම හොයනවා.`` ඔහු කීය.

සුදුමැලිව සිටි කදිචා අන්දමන්ද වූවා නොසැලී සිටියාය.

``ආයුබෝවන්, කදිචා!`` යි මම ඇට ආචාර කළෙමි. ඈ නිහඬව හිස වැනුවාය.

``එහෙනම් නුඹ විවාහ ගිවිසගත් තරුණිය නුඹ සමගදැ?`` යි ජන්තායි ඇසුවේ ඔහුට කාරණය අවබෝධ වුණු පසුවය.

``නැහැ. මගේ බිරිඳ මා සමගැ``යි මම පිළිතුරු දුනිමි.

``ඒකත් එහෙමද?`` මෙසේ ඇසූ ජන්තායිගේ ඇස් දොට්ට පැන්නාක් මෙන් මහත් විය. ඔහු ප්‍රීතිවූණාදැයි කිව නොහැක. ``එහෙනම්, අපි නුඹට මුළු හදවතින්ම සුබ පතනවා...`` යැයි ඔහු කීය.

``බොහොම ස්තූතියි!``

මුහුණ ඇඹුල් කරගත් ජන්තායි යළි මෙසේ පැවසීය:

``නුඹ හරිම හපනෙක්. කලිම්* කාසි ගෙවන්නෙ නැතුව කසාද බැන්දා!``

``මෝඩයා! පලයන් පලයන්!`` යැයි මම ඔහුට බැණ වැදුනෙමි.

සමහරු ඩිමාව ඉක්මවා හැසිරෙති! ජන්තායිට සැහෙන්නට බැණීමට සූදානම් වූ මම රියෙහි කවුළුවෙන් හිස පිටතට දැම්මි. ජන්තායි ලොරිය අසල සිටගෙන දෙකොපුල් පිසදමන සැටිද, කදිවා ලොරියෙන් ඉවතට පැන දුවන සැටිද මම දුටිමි. ජන්තායි ඇ දෙස බලමින් යමක් කියමින් මිට මෙළවූ අත පෙන්වයි. කදිවා මහ මගෙන් ඉවතට දිවගොස් තණ පිටියට වැද දුවන්නී, බිම ඇද වැටුණාය. ඇ දැත් හිස මත තබා ගත්තාය. ඔවුන්ට කුමක්විදැයි මා නොදැන ගත්තද, ඇ නිසා මා තුළ කනගාටුවක් උපණී. එම සිද්ධියට මාද වරද කරුවෙක්මි යන හැඟීමක් ඇතිවිය. අසේල්ට මේ ගැන මම කිසිවක් නොකීවෙමි.

සතියකට පසු අපි අන්තර් මාර්ග ඩිපෝවේ කුඩා ගෙයක පදිංචි වීමු. රියැදුරන් හා බණිජ තෙල් පුරවන ස්ථානවල වැඩකරන සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා වෙන්කර ඇති කාමර දෙකක් බැගින් යුත් ගෙවල් කිපයකින් එකකි මෙය. අපේ කුඩා ගෙය පිහිටියේ මහ මග අසලය. එය තරීන්වලින් වැට් ඇත නොවිය. තරීන් ප්‍රාදේශීය අගනුවරය. සිනමා සිත්තම් බැලීමටද සාප්පු යාමටද ලෙහෙසි විය. තරීන්හි රෝහලක්ද ඇත. අපේ ධාවන මඟෙහි හරි මැද මේ ගෙවල් කිපය පිහිටා තිබීමද අපේ සතුටට කරුණක් විය. රිබාව්මෙය සිට සින්ට්ස්යාන් නගරය දක්වා බඩු පටවාගෙන යාම අපේ ප්‍රධාන කාර්‍යය විය. බඩු පටවාගෙන යන එන ගමන් ගෙදර නැවති විවේක ගත හැක, රෑ ගත කළ හැක. හැමදාම පාහේ අසේල් හමුවීමට මට හැකි විය. අතර මගදී පමාවුණද, මැදියම් රෑයෙහිදී හෝ ගෙදර පැමිණීමට මට පුළුවන් විය. අසේල් මා එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටි අතර නින්දට නොගියාය. ගෙදරට අවශ්‍ය බඩුබාහිරාදිය මිලදී ගැනීමට අපි පටන් ගත්තෙමු. අප පදිංචි ස්ථානය නියම ගෙයක ස්වරූපයක් දරන්නට විය. අසේල් වැඩට යාමට ඇඩි ආශාවක් දැක්වූයෙන් ඇගේ

---

*විවාහ වන විට මනමාලියගේ දෙමාපියන්ට ගෙවන මුදල.

තීරණයට මම එකඟ වීමි. සමූහ ගොවිපළේ සහ ගමේ නිතර වැඩ කළ ඈ ගෙදරටවී සිටීමට අකැමැති වූවාය. ගිවිහැටියේ අප දෙදෙනාම ප්‍රීතියට පත් කරවමින් අසේල් ගැබගත් බව ඈ දැන්වූවාය.

...අසේල් දරුවා ප්‍රසූත කළ දවසේදී මම විනයේ සිට ගෙදර එමින් සිටියෙමි. වේගයෙන් ලොරිය පැදවූ මම නොසන්සුන් වීමි. නරින්හි ප්‍රසූතිකාගාරයේ ඈ සිටියාය. එහි ගිය පසු අපට පුතකු ලැබුණු බව දැනගතිමි. ඇය වෙතට යාමට මට අවසර නොලැබිණි. මම ලොරිය ගෙන කඳුකර පෙදෙසේ සැරිසැරිමි. එවකට ශීත සමය වූයෙන් හැමතැනම හිමෙන් පිරී තිබිණි. හිමෙන් පිරී කඳු සහිත කඳු වැටිය. ධවල වර්ණ හිම හා කාල වර්ණ කඳු වල කාන්තිය නිසා ඇස් විඩාපත් විය. ඩොලොන්ස්ත් කපොල්ලේ මුදුනට නැගගත් මම වට පිට බැලීමි. වළාකුළු පහතින් පාවෙන සැටිද, උස් කඳු අඟුටු මිට්ටන් මෙන් පහත ඇති සැටිද, දුටු මම කොතරම් උසට නැග ගත්තෙම්දැයි වටහා ගතිමි. ලොරිය නවතා පිටත බැසගත් මම දීර්ඝ ලෙස ආශ්වාස කරමින් කෑගැසීමි:

''ජයි, පර්වත රාජයිනි! මට පුතෙක් ලැබුණා!''

මට පිළිතුරු දුන් කඳු නැති ගත්තාක් මෙනි. ඔවුනු මගේ වචන නැවත කිහ. දුර්ග මාර්ග එකිනෙක මා කී වචන නැවත දෝංකාරය කළේය.

පුතාට සමාට් යන නම තබන ලදී. එනම තෝරාගත්තේ මාය. අපේ හැම කතාවක්ම ඔහු ගැන විය. සාමට් අපේ සාමට්. සාමට් මඳ සිනා පෑවා. සාමට්ට දත් එනවා. තරුණ දෙමාපියන් මෙන් අපිද හැසුරුණෙමු.

අපි එකිනෙකාට ආලය කරමින් මිතුරු ලීලාවෙන් වාසය කළෙමු. ඉන්පසු අවාසනාව ළඟාවිය...

ඒ අවාසනාව කොහෙන් පිඹිණියේදැයි කීමට මට මතක නැතිය. එහි මුල හෝ අග හෝ සෙවීම අපහසුය.

අහම්බෙන් මට ඒ මිනිහා මගදී හමුවිණි. එය අපේ අවසාන හමුව නොවන බව සැක නොකරම අපි එදා විසිර ගියෙමු.

වස්සාන ඍතුව අවසානයේදී පුරුදු පරිදි මම බඩු පටවාගෙන ගියෙමි. කාලගුණය අයහපත් විය. වැස්සද, හිම වැස්සද යනු කිව නොහැකිය. තෙතමනය හා ශීතල සහිත කාලගුණයක් විය. කඳුකර පෙදෙස අඳුරු මීදුමකින් වැසී තිබිණි. විදුරු පිස දමන යාන්ත්‍රික අත් නිතර ක්‍රියා කරවීමට මට සිදුවිය. කඳුකරයේ උසම පෙදෙසට, එනම් ඩොලොන්ස්ත් කපොල්ලට මම ළංවෙමින් සිටියෙමි. අහෝ! ඩොලොන්ස්ත්, ඩොලොන්ස්ත්, තයාන්-ෂාන් යෝධය! එය සමග බොහෝ දේ සම්බන්ධ වී ඇත. අපේ

ධාවන මාර්ගයේ අතිශයින්ම භයානක කොටසද එයය. දරණ ගැසූ නාගයකුට සමාන ඒ මග කඩයන් කීපයකින් යුක්තය. ලොරිය අහස දෙසට නගී. වලාකුළු ලොරියේ රෝදවලට අසුව් තැලී පොඩිවේ. මෙසේ ලොරිය ඉහළ නගින විට, රියදුරාට ඉදිරියට නැමීගත නොහැකිය. පසුව වේගයෙන් කඳු බෑවුම් දිගේ පහළට ඇති මග දිගේ ලොරිය පදවන විට සුක්කානම් රෝදයට උඩුකය හැප්පෙන තරමට ඉදිරියට නැමීමට රියදුරුට සිදුවේ. තම කය කෙළින් තබා ගැනීමට ඔහු විශාල මහන්සියක් දැරිය යුතුය. මෙහි කාලගුණයද කෝපයට පත් මට්ටුවකු මෙනි. ගිම්හානය හෝ ශීත කාලය හෝ ඩොලොන්ස්ක් කඳුකරය ගණන් නොගනී. හිටි හැටියේ විශාල හිම කැට සහිත ඝෝර සුරත වැස්සකි. එසේත් නැතිනම් කිසිවක් නොපෙණෙන තරම් දැඩි හිම වැසි සහිත කුණාටුවකි. ඩොලොන්ස්ක්හි හැටි එසේය. එහෙත් ත්‍යාන්ෂාන්හි උපන් අපට එය පුරුදුය. මහ රෑ වුවද අපි එහි යමු. එහි අසීරුබව හා අවදානම ගැන මා මතක් කරන්නේ දැන්ය. දිනපතා එම මග දිගේ රිය පැදවීමට සිදුවූ විට ඒවා ගැන කල්පනා කිරීමට කාලයක් නැත.

ඩොලොන්ස්ක් අසල පිහිටි දුර්ගමාර්ගයකදී මම ලොරියක් දුටිමි. එහි නොම්මරය ``ගාස්-51`` බව මට මතකය. ඒ ලොරිය එහි නවතා තිබිණි. මිනිසුන් දෙදෙනෙක් එහි මෝටරය අතගාමින් සිටි අතර එකෙක් ඉන් ඈත්වී මහ මග මැදට විත් අතක් එසවීය. මම ලොරිය නැවැත්වීමි. තෙතබරිවූ වැහි කබායක් ඇඳගත් අවුරුදු හතලිහක් පමණ වයසැති මිනිහෙකි, ඔහුගේ උඩුරැවුල දුඹුරු පැහැතිය. වැහි කබායෙන් මහුගේ හිස වැසී ඇත. සෙබලකුගේ පෙණුමක් ඇති ඔහුගේ මුහුණ සුදුමැලිය. දෙනෙත් නිසලය.

``ඩොලොන්ස්ක් මාර්ග පාලක ස්ථානයට මාව ගෙනියන්ට. එහෙත් ටැක්ටරයක් ගෙනල්ලා මේ ලොරිය ගෙනයන්නම්`` යැයි හෙතෙම මට කීවේය.

``ඉඳගන්නව, ගෙනියන්නම්. අපට බැරිද මොකවහරි උපක්‍රමයක් සොයාගන්ට?`` යැයි මා ඔහුගෙන් ප්‍රශ්න කළේ එම ලොරිය ගෙනයාමට උදව්වීමට ඉදිරිපත් වීමෙනි.

``මොන උදව්වක්ද. මේ ලොරියෙ මෝටරය එහෙම පිටින්ම කැඩිල`` යැයි කී රියැදුරුතැන බොනට්ටුව වැසීය. ශීතල නිසා ඔහුගේ මුහුණ නිල් පැහැගෙන තිබිණි. ඔහු වෙව්ලන්නට විය. ඔහු කඳුකරයේ උපන්නකු නොව, නගර වැසියෙකි. ඔහු අන්දමන්ද වී වටපිට බැලුවේය. ඔවුනු ප්රුන්සෙ නගරයේ සිට මාර්ග පාලක ස්ථානය දක්වා බඩු පටවාගෙන යමින් උන්න. ඔවුන්ට ආධාර කිරීම සඳහා කුමක් කළ යුතුද? මා තුළ එක්තරා අදහසක් ඇතිවිය. පළමුව මම අහස දෙස බැලීමි. ඈඳුර පැතිර ගිය අතර වලාකුළු පහළින් පාවෙන්නට විය. තරමක අනතුරක් සහිත

වැඩක් ක්‍රියාවේ යෙදවීමට මම ඉටාගතිමි. එය එතරම් අනඟි අදහසක් නොවූවද, එහි ගැබ්වී ඇති අනතුරු සහිත බව නිසා මා තුළ උද්වේගයක් ඇතිවිය.

``තමුසෙගෙ ලොරියේ බ්රේක් හොඳට වැඩ කරනවද?`` මම රියැදුරාගෙන් ඇසීමි.

``බ්රේක් හොඳට වැඩ කරනව. නැතිනම් මෙහෙම ගමනක් එන්නෙ කොහොමද? ඇන්ජිම ලෙඩවෙලා.``

``ඇදගෙන යන කඹයක් තියෙනවද?``

``තියෙනව. ඇයි?``

``තමුසෙලගෙ ලොරිය මගේ ලොරියට කඹයෙන් බඳිනව. මම ඇදගෙන යන්නම්.``

ඔවුහු මා දෙස අවිශ්වාසයෙන් බැලූ තමුදු නොසෙල්වී සිටියහ.

``නුඹට පිස්සුද?`` ලොරියේ රියැදුරා ඇසීය.

මගේ හැටි එසේය. යම්කිසි අදහසක් මා තුළ ඇතිවුව හොත්, එය ක්‍රියාවේ යොදවා අවසන් කරන තුරු මම නොනවතිමි.

``යාළුවා. මා කියන දේ අහනවා. මම තමුසෙලට ඕන තැනට ගෙන යන්නම්`` යැයි මම රියැදුරුතැනට කීවෙමි.

ඔහු මගේ යෝජනය ප්‍රතික්ෂේප කරමින් අතක් වනා මෙසේ කිය:

``අනහැර දානව. මෙතරම් වංගු තියන පාරක ලොරියක් තව ලොරියකට ඇදල ගෙනියන්ට බැහැ තේරුණද? තමුසෙගෙ අදහස කල්පනා කර බැලීමටවත් මා සූදානම් නැහැ.``

ඔහු මගේ වැදගත් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ කලෙක මෙන් මගේ හිත රිදිණි.

``නුඹ හරිම බූරුවෙක්, ඒ විතරක් නෙවි බියගුල්ලෙක්!``

රියැදුරා අනිත් මිනිසා වෙත ගොස් මගේ අදහස ගැන කියා සිටියේය. මහා මාර්ග තැනීමේ නඩයක නායකයෙකුවූ ඔහු මා දෙස බලා, කඹයක් ගෙන ලොරිය ඇදන ලෙස රියැදුරාට කීවේය:

හේ කියාවිය:

``තමුසෙ මේ ගැන වගකියනව බයිටෙමිර්-අකෝ.``

``අපි හැම දෙනම වගකියමු!`` යැයි ඔහු කෙටියෙන් පැවසීය.

නව නායකයා මා සිත ගත්තේය.එවැන්නකුට එකවර ගරු කළ හැක.

කැඩුණු ලොරිය මගේ ලොරියට ඇදන ලදි. මුලදී අපේ ගමන බාධා රහිත විය. ඩොලොන්ස්ක් කන්දේදී ගමන අපහසු වූයේ වංගු සහිත කඳු නිසාත් ඉමක් නැති බෑවුම් නිසාත්ය. මගේ ලොරියේ ඇන්ජිම නු හඩක්

නගන්නට වුයෙන් මගේ දෙකන් බිහිරි විය. මගේ ලොරියේ ඇති සියලු ශක්තිය ඇද ගැනීමට මම ඉටාගතිමි. ඩොලොන්ස්ක් මාර්ගය කොතරම් අසීරු වුවද මගේ ලොරියේ ඇන්ජිම සම්පූර්ණ බලය යොදා වැඩනොකරන බව මා වටහා ගත්තේ මීට පෙරය. කළුකර අසීරු මාර්ගය ආදිය නිසා අප ගෙනගියේ ගෙන යා හැකි උපරිම බඩු ප්‍රමාණයෙන් සියයට හැත්තෑවක් පමණකි. මේ වේලාවේදී මම ඒ ගැන නොසිතිමි. සූදු කෙළින විට දිනා ගැනීමට ඇති වන දැඩි ආශාවට සමාන යම්කිසි හැඟීමක් මා සිත වෙළා ගති. මගේ අදහස ඉටුකිරීම සහ මිනිසුන්ට උදව්වීම එහි ගැබ්ව ඇත. එහෙත් එය සපුරාලීම ලෙහෙසි නොවිය. මගේ ලොරිය වෙව්ලන්නට විය. රියැදුරු ආසනයට ඉදිරියෙන් ඇති වීදුරුව මීදුමෙන් වැසිණි. වීදුරුව පිසදමන යාන්ත්‍රික අත්වලට එය සම්පූර්ණයෙන්ම පිරිසිදු කළ නොහැක. වළාකුළු කඳු මහට පාත්වී මගේ ලොරියේ රෝදවල හැපිණි. මහ මග තියුණු වංගු සහ ගැඹුරු පල්ලම් සහිත විය. මම මටම දොස්නගා ගතිමි. මේ මිනිසුන් දෙදෙනාට මා නිසා විපතක් වුවොත් යන බිය මා තුළ ඇති විය. ලොරියට වඩා මා විඩාපත් වී ඇත. මගේ 'කැප්' හිස් වැසුමද, කබායද, ලොම් සහිත කෙටි කබාය සහ වුලන් ස්වීටරයද උනා ඇම්මි. මගේ උඩුකය වසා ඇත්තේ කමිසයකිනි. එසේ වුවද, වාෂ්ප බලයෙන් ක්‍රියා කරන යන්ත්‍රයක් මෙන් මගේ සිරුර දහඩියෙන් නැවිණි. කාර්යය ලෙහෙසි නොවිය; බඩු පටවාගත් ලොරියක් තවත් ලොරියකුත් ඇදගෙන මෙවැනි වංගු සහිත මගක යාම. පාපුවරුව මත නැග ගත් බයිටෙමිර් මගේත් කැඩුණු ලොරියේ රියදුරාගේත් ක්‍රියා එකලස් කරනු වස් අතින් සංඥා කරන්නට විය. අප වංක ගිරියට පැමිණි විට බයිටෙමිර් පා පුවරුවෙන් බැස අනතුරු සහගත තැනින් ඇත්වනු ඇතැයි මම සිතිමි. එහෙත් ඔහු නොසෙල්වී සිටියේය. රාජාලියෙකු සේ ඔහු තම සිරුර ඒ මේ අත හරවමින් දොරෙහි මිට අල්ලා ගෙන පා පුවරුවේ සිටගෙන අපට සංඥා කළේය. මම ඔහුගේ මුහුණ දෙස බැලීමි. ඔහු දැඩි නිසලතාවයෙකිනි. ගෙලම්ය පිළිරුවක් වැනිය, ඔහුගේ මුහුණ. වැහි බිංදු ඔහුගේ මුහුණේ සහ රැවුලේ දක්නට ඇත. ඔහු දෙස බැලූ මට සැනැල්ලු ගතියක් දැනිණි.

අප ඉදිරියේ ඉතිරිව ඇත්තේ එක කන්දක් පමණකි. එය නැග්ග පසු අප ජයගනු ඇත. ඒ අවස්ථාවේදී බයිටෙමිර් මා දෙසට හැරී කෑ ගැසීය:

"ඉදිරියෙන් තව ලොරියක්. ප්‍රවේසමින් දකුණට හැරියන්."

මම දකුණට හැරුනෙමි. පල්ලම දිගේ බසින ලොරියකි. එය ජන්තායිගේය. ජන්තායි මා ගැන වාර්තා කරනු ඇත. ආරක්ෂක ක්‍රම පිළිබඳ නිලධාරියා මට චෝදනා කරනු සහතිකය. ජන්තායි මා වෙත වඩාත්

ළං විය. ඔහු කඳු බෑවුම දිගේ බසිමින් සුක්කානම් රෝදය අල්ලා ගෙන යටැසින් මා දෙස බැලීය. අපි දෙදෙනා එකිනෙකා වෙත වඩාත් ළං වීමු. අපේ ලොරිවල රෝද එකිනෙකට හැප්පෙන තරම් ළං විය. මා දුටු ජන්තායි හිවල් ලොමින් කරන ලද තම හිස්වැස්ම නැටවෙන සේ හිස වැනීය. ''තොට යකා වැහිල. ඔච්චර තරම් සෝලාම් තියපියෑ'' යි ඔහු දෙස බැලූ මම සිතිමි.

කන්ද නැගී අපි බෑවුම ඔස්සේ එකවර පහළ බැස මහ පාරට වැටී, පසුව මාර්ග පාලක ස්ථානය දක්වා ගියෙමු. කෙසේ හෝ මම ජයගතිමි. ඇන්ජිම වසා දැමුවද, දෙකන් තුළින් පැන නැගී ඝෝෂාව නිසා මට කිසිවක් නැසිණි. මා බිහිරි වී නැත. ප්‍රකෘති ස්වභාවය ගොළුවී ඇතැයි මට සිතිණි. අවට කිසිවක් නැසේ. අමාරුවෙන් නැගිට දොරහැර එළියට වීත් පා පුවරුව මත වාඩි වුණෙමි. හුස්ම ගැනීමට පවා අපහසු විය. දුර්ග මාර්ගයේ සුළං තුනී වීම නිසා මම තවත් පිඩා වින්දෙමි. බයිටෙමීර් මගේ ලොම් කබායෙන් මගේ උරහිස් වසා හිස්වැස්ම දෙකන් වැසෙන සේ ඇන්දවිය. අතින් රියදුරු තැන වැනෙමින් තිහඬව නැගී සිටියේය. සුදුමැලිවූ හෙතෙම ගොළුවකු මෙන් විය. ඔහු මා ඉදිරියේ උක්කුටියෙන් වාඩිවී සිගරැට් පැකට්ටුවක් ගෙන මට සිගරැට්ටුවක් පිළිගැන්විය. වෙව්ලන අතින් මම සිගරැට්ටුවක් ගෙන දල්වා ගතිමි. දුම්වැටි දල්වා ගත් පසු අපි යථා තත්ත්වයට පැමිණියෙමු. සුපුරුදු මුරණ්ඩු ගතිය මා තුළ නැවත ඇති විය.

''හා! හා! හොඳට හොඳ වැඩේ!'' යැයි කී මම හොඳටම වේගයෙන් රියදුරාගේ පිටට තට්ටු කළෙමිදයත්, ඔහුට බිම වාඩිවීමට සිදුවිය. පසුව අප තිදෙනාම නැගිට සිටගෙන එකිනෙකාගේ හපන්කම් ගැන වර්ණනා කරමින් උරහිසට තට්ටු කරගතිමු. ප්‍රීතියෙන් පිනාගිය මෝඩයින් මෙන් හඬ නගා සිනාසෙමින් කෑගසමින් ප්‍රීතිවුණෙමු.

පසුව වාඩිවී දෙවැනි වරටත් දුම්වැටි දල්වාගෙන බීවෙමු. මගේ ස්විටරය හා කබාය ඇඳගෙන, අත් ඔර්ලෝසුව දෙස බැලූ මම මෙසේ පැවසීමි:

''පිටත්වී යාමට වේලාව හරි!'' මම ඉක්මන් වීමි.

බයිටෙමීර් බුම්මා ගත්තේය:

''එහෙම බැහැ. අපේ ගෙදරට මගෙ අමුත්තා ලෙස එන්ට ඕන!''

ඒ සඳහා මට වේලාවක් නොතිබිණි.

''ආරාධනය ගැන බොහොම ස්තුතියි. මට වෙලාවක් නැහැ. මා එනතුරු මගේ බිරිඳ බලාගෙන ඉන්නවා.''

''යාළුවා යන්ට එපා. අපි බෝතලයක් ගහලා සන්තෝෂ වෙමු''යි රියදුරු තැන කීය.

``එයාට යන්ට ඉඩ දෙමු. එයාගෙ බිරිඳ එයා එනතුරු බලාගෙන ඉන්නව. යාළුවා තමුසෙගෙ නම කොහොමද?``මෙසේ කීවේ නව නායක බයිටෙමීර්ය.

``ඉල්යාස්.``

``ඉල්යාස්, ගෙදර යන්ට. අපට උදව්කලාට බොහොම ස්තුතියි.``

මගේ ලොරිය පා පුවරුවට නැගගත් බයිටෙමීර් මහ පාර දක්වා විත් මට නිහඬව අනදී සමුගෙන, රියෙන් බැස ගියේය.

කඳු වංගුවේදී මම හැරී බැලීමි. බයිටෙමීර් තවමත් මා දෙස බලාගෙන සිටී. හිස්වැස්ම අතින් ගෙන හිස පාත් කර ගෙන සිටි ඔහු කල්පනා ලෝකයක ගිලී සිටියාක් මෙනි.

එම සිද්ධිය එතැනින් අවසන් විය.

කඳුකරයේදී හමුවූ දෙදෙනා ගැන විස්තර නොකල මම අබලන්වූ ලොරියකට ආධාර කල සැටි පමණක් අසේල්ට කීවෙමි. මගේ බිරිඳගෙන් කිසිවක් නොසැඟූ මම මේ සිද්ධිය පිළිබඳ විස්තර කීම අවශ්‍ය දෙයක් ලෙස කල්පනා නොකලෙමි. ඈ නිතරම මා ගැන සැලකිල්ලෙන් සිටිමින් මා ගැන සොයා බැලුවාය. මෙවැනි විහිළු කිරීමට මින්පසු ඉදිරිපත් නොවීමට මම ඉටාගත්තෙමි. මිනිසෙක් මෙවැනි දේ සඳහා ඉදිරිපත් වන්නේ වරක් පමණකි. කඳුකර පෙදෙසේ දුර්ග මාර්ග ඔස්සේ අබලන් ලොරියක් ඇදාගෙන රිය පැදවීම පිළිබඳ සිද්ධිය අමතක කිරීමට මට නොහැකි වුයේ, පසු දින මා සෙම්ප්‍රතිශ්‍යාවෙන් පෙළෙන්නට වූ නිසාය. මහත්වූ ආයාසයකින් රිය පදවන්නට වූ මම ගෙදර පැමිණි විගසම සිහි නැතිව ඇද වැටුණෙමි. විබ්‍රමයෙන් පසුවූ මම ඩොලොන්ස්ක් දුර්ග මාර්ග ඔස්සේ ලොරියක් අදින සැටි සිහිනෙන් දුටිමි. දැඩි කුණාටුව මගේ මුහුණ පුළුස්සා දැමීය. මට හුස්ම ගැනීමට පවා අපහසු විය. මම සුක්කානම් රෝදය කරකැවීමි. එය පුළුන් මෙන් කුඩා කැබලි වලට වෙන්විය. දුර්ග මාර්ගය මා ඉදිරියෙහි විය. මග මග අවසානයක් නැතිය. මගේ ලොරියේ රේඩියේටරය අහස දෙසට හැරී තිබිණි. එන්ජිම මහ හඬක් නගමින් කඳු නැංගේය. හිටි හැටියේම මගේ ලොරිය ප්‍රපාතයකට ඇද වැටිණි... මගේ රෝගයේ අර්බුද අවස්ථාව එය විය. තෙවැනි දවසේදී රෝගය සුව අතට හැරිණි. ඊට දවස් දෙකකට පසු මගේ තත්ත්වය සතුටුදායක වූයෙන් මම ඇඳෙහි වාඩිවුණෙමි. එහෙත් අසේල් මට නැගිට සිටීමට ඉඩ නොදුන්නාය. රෝගයට ගොදුරු වූයේ මා නොව අසේල්ය, යන හැඟීමක් ඈ දෙස බලන මා සිත තුළ ඇතිවිය. ඈ කෙට්ටුවී, වෙහෙසට පත්වී ඇත. ඇගේ ඇස්වලට යටින් නිල් පැහැති ලප මතුවී ඇති අතර, ඈ කොතරම් කෙට්ටුවී සිටින්නීදයත්, කටින් පිඹින සුළං පහරකට වුව ඇය බිමට ඇද දැමිය හැක. මට සාත්තු කල අසේල් අපේ

පුතුද හදා වඩා ගන්නාය. රෝගියකු ලෙස ඇඳෙහි වැතිර සිටීම ප්‍රතික්ෂේප කල මම නැගිට කමිසයක් ඇඳ ගන්නට වීමි. විවේක ගත යුත්තේ මා නොව අසේල්ය.

නිදා සිටි පුතු අවදි නොවනු වස් සෙමින් ''අසේල්'' යැයි කී මම, ''සාමට් බලා ගැනීමට අල්ලපු ගෙදර අයට බාර කොට, අපි යමු චිත්‍ර පටියක් බලන්ට'' යැයි ඇයට යෝජනා කළෙමි.

ඇ මා වෙත දුවවිත් මා ඇඳට ඇද දමා, පළමුවැනි වරට මා දෙස බලන්නාක් මෙන්, මා වෙත දයාන්විත බැල්මක් හෙළුවාය. දෑසින් කඩා වැටෙන කඳුළු කැට නවත්වා ගැනීමට අසේල් උත්සාහ දැරුවද, එය සඵල නොවිය. ඇගේ දෙතොල් සෙලවිණි. මගේ පපුව මත හිස තබාගත් මගේ බිරිඳ ඉකි බිඳ අඩන්නට වූවාය.

''අසේල් මොකද හේතුව? මක්වුණාද?'' අන්දමන්දවූ මම ඇසීමි.

''ඔයා සනීප වුණ නිසා මම සන්තෝෂ වුණා.''

''ඔයා මොකටද මෙතරම් කලබල වෙන්නෙ. තරමක් අසනීප වුණා. ඔයත්, පුතාත් එක්ක ගෙදර ඉන්න මට ඉඩක් ලැබුණා නෙව.'' මේ වන විට අපේ පුතු සාමට් දණගාමින් යන්ට පටන් ගත්තේය. දවස් කීපයකින් ඔහු දෙපයින් යාමට පටන් ගනු ඇත. දරුවන්ගේ හුරතල් බැලිය හැකි හොඳම කාලය එයයි. ''ඔයා දන්නවද, මා කැමතියි තව වරක් අසනීප වෙලා ගෙදර ඉන්ට'' යැයි මම කීවෙමි.

''ඔයා අසනීපවෙලා ඉන්න හැටි බැලීමට මා කැමති නැහැ.'' මෙසේ කීවේ අසේල්ය.

සාමට් අවදි විය. අසේල් ඔහු අපේ ඇඳට ගෙනාවාය. අව තින්දෙන් සිටි ඔහු උණුසුම්ය. සාමට් කුඩා වලස් පැටියකු මෙන් අපේ සිරුර මත තඟමින් දණ ගාන්නට විය. අපි ඔහු කිති කවමින්, සිප ගනිමින් ප්‍රීති වීමු.

''බලන්න අපි සතුටු වන හැටි. ඔයා අඩනවා. අපි ගිහින් ඔයාගෙ දෙමාපියන් බලමු. සාමට්ව දුටු හැටියෙ ඒ ගොල්ල අපට සමාව දීල සියල්ල අමතක කරාවි.''

වරදක් කළ අය මෙන්, අපි ඔවුන් බැලීමට යාමට අදහස් කළෙමු. බොහෝසෙයින්ම කිපී සිටි අසේල්ගේ දෙමාපියන් ඇට කිසිකලෙක සමාව නොදෙන බව දන්වමින තරීන්ගී වැසියකු අත පණිවුඩයක් පවා එවා තිබිණි. අප ගැන කිසිවක් දැනගැනීමට ඔවුන් අකැමැති බවද දන්වන ලදි. ඇගේ දෙමාපියන් වෙත ගොස් සමාව ඉල්ලා සිටි විට ඒ අමනාපය මගහැරී යනු ඇතැයි අපි විශ්වාස කළෙමු.

ගමනට සූදානම් වීම සඳහා නිවාඩු ගැනීම අවශ්‍ය විය. අසේල්ගේ සියලු නෑයින්ට තෑගි බෝග ගෙනයාමද අනිවාර්ය්‍ය කාර්යයකි. හිස් අතින් යාමට මම මැලිවීමි.

ඒ අතර සීත සමය පැමිණියේය. ත්‍යාන්-ෂාන් කඳුකරයේ සීත සමය දැඩිය, හිම කුණාටු සහිත සුළි සුළං වලින් ගහණය. මහ මාර්ග හා දුර්ග මාර්ග හිමෙන් වැසී යාමද, මේ පෙදෙසේ ශීත ඍතුවේ එක් ලක්ෂණයකි. රියදුරන් වන අපට වැඩ වැඩිවන අතර මාර්ග පාලකයින්ගේ කටයුතු තවත් අධික වේ. ගිරිහිම නිපාත නවත්වා මාර්ග ශුද්ධ කිරීමේ කටයුතු ආදිය කිරීම අපේ කාර්ය්‍යය. එහෙත් එම සීත සමය එතරම් දරුණු නොවිය. රියදුරන් වන අපි නිතර කාර්ය්‍ය බහුල පිරිසක් වීමු. එනිසාදෝ අපි ඒ සීත සමයේ අසිරුකම් නොදිටිමු. මේ අතර අපට අමතර වැඩ කොටසක් කිරීමටද නියම විය. රියදුරන් වන අපි සිය කැමැත්තෙන්ම ඒ අමතර වැඩ කොටස භාර ගතිමුයි කීම වඩාත් සැහේ. ඒ සඳහා පළමුවෙන්ම ඉදිරිපත් වූයේ මාය. ඒ ගැන මා කනගාටු නොවූවද, සියලු කරදර වලට මුල වූයේ එය බව මගේ හැඟීමය. එය සිද්ධවූයේ මෙසේය.

දවසක් දා වැඩ හමාර කොට ගෙදර පැමිණි මට පාර්සලයක් දුන් අසේල්, එය අලිබෙක් ජන්තුරින්ගේ බිරිඳට දෙන ලෙස කීවාය. මම ලොරිය පදවමින් ඔවුන්ගේ ගේ අසලට ගොස් නලාව හැඩවීමි. අලිබෙක්ගේ බිරිඳ එළියට ආවාය. චීනයේ එක්තරා කම්හලක කම්කරුවෝ අපේ ඩිපෝවට විදුලි පුවතක් එවමින් ඔවුන්ට ලැබිය යුතු යන්ත්‍රෝපකරණ තොගය වහාම එවන ලෙස ඉල්ලා සිටියහ. මේ ගැන අලිබෙක්ගේ බිරිඳ මට කීවාය.

``අලිබෙක් කොහිදැ?`` යි මම ඇගෙන් ඇසීමි.

``කොහෙද? දුම්රිය පළට ගියා. එයත් අනිත් අය සමග එහෙ ගියා. දුම්රිය ඇවිල්ලා.``

වැඩි විස්තර දැනගැනීම පිණිස මම දුම්රිය පළට ගියෙමි. වැව අසල දුර්ගමාර්ගයෙහි වූ තැනකට යන්ත්‍රෝපකරණ ගොඩ බෑමට පටන් ගෙන ඇත. අවට අඳුරුය. නොසන්සුන්තාවයකි. දැඩි සුළං පහර නිසා කානුවල එල්ලා ඇති පහන් සෙලවිණි. දුම්රිය පාර වැසී ඇති හිම කැට ඉහල නැග විසිර ගියේය. දුම්රිය මැදිරි හා පෙට්ටි දුම්රිය යන්ත්‍ර විසින් අමුණන ලදි. යකඩ කොකු සහ කම්බි සහිත පෙට්ටි යෝධ දොඹකරයක් මගින් දුම්රිය පෙට්ටිවලින් පිටතට ගෙන බිම තබන සැටි දුටිමි. චීනයේ සින්ට්සියාන්හි විශාල ලෝහ කම්හලක් සෑදීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ මෙසේ ගොඩබාන ලදි. ඒවා චීනයට ගෙනයා යුතු භාණ්ඩය. සමහර උපකරණ දැනටමත් අපි එහි ගෙන ගියෙමු.

එතැන ලොරි විශාල සංඛ්‍යාවක් තිබුණද, කිසිවෙක් බඩු පැටවීමට ඉදිරිපත් නොවිය. ඔවුහු කිසිවක් බලාපොරොත්තුවෙන් සිටියහ. සමහරු තම ලොරි තුළට වී වාඩිවී උන්හ. අන් සමහරු පා පුවරුවල වාඩි වී සිටියහ. සුළං පහරින් ආරක්ෂාවීම සඳහා තවත් සමහරු යන්ත්‍රෝපකරණ සහිත පෙට්ටිවලට මුවා වෙමින් ආවරණය ලැබූහ. මා කතා කළ තමුදු එකෙක් වත් පිළිතුරු නොදුන්නේය. ඔවුහු දුම්බොමින් නිහඬව සිටියහ. පිරිසට තරමක් ඈතින් සිටි අලිබෙක් දුටු මම ඔහු වෙත ගියෙමි.

''මෙතන රැස්වෙලා ඉන්නෙ මොකටද? විදුලි පණිවුඩයක් ලැබුණද?''

''ඔව්. විත කම්කරුවන්ට ඕනවෙලා තියෙනව ඒ ගොල්ලන්ගෙ කම්හල නියමිත වේලාවට කලින් විවෘත කරන්ට.''

''ඉතින් මොකද?''

''අපේ පිළිතුර බලාපොරොත්තුවෙන් සිටිනවා... පේනව නේද කොතරම් විශාල තොගයක් බඩු ගෙනැවිත් තියෙනවද කියල. තවත් ගෙනෙව්. මේවා පටවාගෙන යන්ට කොතරම් වෙලාවක් ගතවේවිද? විනුන් මේවා බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඔවුන් අප ගැන විශ්වාසයකින් ඉන්නවා!.. බඩු ලැබෙන තුරු ඔවුන් ඇඟිලි ගණන් කරමින් ඉන්නවා!''

''උඹේ කතාව හරියට මම වැරදි කළා වගෙයි. ඔය ගැන මට කියන්නෙ මොකටද?''

''උඹේ හැටි මහොමද? උඹ වෙනින් රටකින් පැමිණි කෙනෙක්ද? මේ වැඩේ ඇති වැදගත් කම ගැන තුඹට අවබෝධ කර ගන්ට බැරිද?''

''නුඹ විකාරයෙන් දොඩවනවා.'' මෙසේ කී මම අමනාපයෙන් ඉවතට ගියෙමි.

එවිට අපේ ඩිපෝවේ ප්‍රධානියා වන අමන්ජොලොව් පැමිණියේය. රියදුරෙකු පත්තු කළ ගිනිකූරකින් තම සිගරැට්ටුව දල්වා ගත් ඩිපෝ ප්‍රධානියා අප පිරික්සන්නාක් මෙන් ඈඩි බැල්මක් හෙළිය.

'' සහෝදරවරුනි! මම ඇමති කාර්යාලයට ටෙලිෆෝන් කරල තව උදව් ඉල්ලන්නම්. කොහොම වුණත්, පිටස්තර ආධාර බලාපොරොත්තුවීම නුවණට හුරු නැහැ. අපේ ශක්තියෙන් පමණක් මේ බඩු ඔවුන්ට වුවමනා වේලාවට බාරදීම කොහොම කරන්ටද කියල හිතාගැනීම අමාරුයි...''

''අමන්ජොලොව් සහෝදරය, මේක අමාරු වැඩක්'' යැයි කෙනෙක් කීවේය. ''මේ පෙට්ටි හරි විශාලයි. දෙක තුනකට වඩා පටවන්ට බැහැ. පැය විසිහතරේම නොකඩවා වැඩ කළත් ලබන වසන්තය වන තුරු ඉවර කරන්ට බැහැ.''

''ඒක තමා ගැටළුව. කොහොම වුණත් මේ කාර්යය කළ යුතුමයි. දැන් සහෝදරවරු ගෙදර ගිහින් මේ ගැන කල්පනා කරන්න!'' යැයි අමන්ජොලොව් ඉල්ලා සිටියේය.

ඔහු තම මෝටෝ රියට නැග යන්නට ගියේය. එහෙත් අනිත් අය එසේම උන්හ. අඳුරේ සිටි යමෙක් පහත් හඬින් යමක් කීවේ කිසිවකු අමතමින් නොවේ.

''යක්ස වැඩක්! එක බැටළු හමකින් හිම සඟා දෙකක් මහන්ට බැහැ. කල්පනා කළ යුතුව තිබුණේ මීට ඉස්සෙල්ල!'' මෙසේ කී මිනිසා නැගී සිට තමා බොමින් සිටි සිගරැට් කොටය පයින් පාගා ලොරියට නැග ගියේය.

තවකෙක් ඔහුගේ කීම අනුමත කළේය: ''ඇත්ත තමා හැමදාම අප ආධාර කළ යුතුයි. නහයට ඉහලින් වතුර ගැලුවම අපට කියනව, රියදුරු සොහොයුරනි, අපව බේරා ගනිල්ලා!''

සමහරු ඔහුට විරුද්ධ වූහ:

''මේක සොහොවුරන්ට ආධාර දීමක්. ඉස්මයිල් නුඹ දොඩවන්නෙ කඩ පළට ආ වාචාල අම්මනඩි කෙනෙක් වගෙ!''

මම විවාදයට සහභාගි නොවීමි. හිටිහැටියේම ත්‍යාන් ෂාන් මහා මාර්ග ඔස්සේ ලොරියක් ඇදාගෙන ගෙන ගිය සැටි මට මතක් වූයෙන් මම ප්‍රබෝධයට පත්වීමි.

''ඔක එතරම් අමාරු වැඩක් නෙවී!'' යැයි කී මම පිරිස මැදට ගොස් මෙසේද කීවෙමි: ''අපේ ලොරිවලට ට්‍රේලර් රථය බැගින් ඇදන්න ඕන!''

කිසිවෙක් කලබල නොවූහ. ඔවුහු මා දෙස හැරී බැලීමට පවා ඉක්මන් නොවූහ. එවැනි අදහසක් ඉදිරිපත් කළ හැක්කේ පල් මෝඩයකුට පමණකි.

ජන්තායි සෙමින් සිවුරු හඬ ලෑවේය.

''කී දේ ඇහුණද?'' මම ඔහුගේ කටහඬ හඳුනා ගතිමි.

ත්‍යාන් ෂාන් කඳු කර මග ඔස්සේ මගේ ලොරියට තවත් ලොරියක් ඇදාගෙන ගිය සැටි ඔවුන්ට කීමට මම උත්සාහ ගත්තෙමි. යෝධයෙක් වැනි උස මහත තරුණයෙක් තම අසල්වැසියාට අත් වැසුම් භාර දී, ඔහු වාඩිවී සිටි තැනින් නැගිට මා දෙසට ආවේය. ඔහු මගේ කබා කරින් අල්ලාගෙන මා ඔහු වෙත ඇදගනිමින් මෙසේ පැවසීය:

''ඒයි! කටින් පිඹපන්!''

''හා-හා!'' මම ඔහුගේ මුහුණට පිම්බෙමි.

``මිනිහ බිලා නැහැ!`` පුදුමව මෙසේ කී යෝධ තරුණයා මා මුදා හැරියේය.

``එහෙනම් මිනිහා මෝඩයෙක් වෙන්ට ඕන!`` යැයි ඔහුගේ මිතුරා කිවේය. ඔවුහු තම ලොරිවලට නැග පිටව ගියහ. අත් අයද තහඩුව තම ගෙවල් බලා ගියහ. එදා තරම් මෝඩයකු ලෙස මා හැසුරුණු දවසක් මගේ ජීවිතයේ නොවීය. ලජ්ජාව නිසා මා පමණක් නොව මගේ හිස් වැස්මද රත් පැහැ ගත් සැටි දැනිණි.

``විනාඩියකට නැවතියල්ලා!`` කියමින් මම එක් එක්කෙනා වෙත යමින් කාරණය පැහැදිලි කිරීමට උත්සාහ දැරුවෙමි. ``මම කියන දේ අහපල්ල. ලොරියකට තව රියක් ඈඳල ගෙනයන්ට පුළුවනි.``

පැරණි රියැදුරෙක්--අක්සකල් මා ළගට විත් සිත් තැවුලෙන් යුතුව මෙසේ පැවසීය:

``මම රිය පදවන්ට පටන් ගත්තෙ තුඹ තිරුවතින් දණගාන කාලෙදි. ත්‍යාත්-ෂාන් කඳුකරය නැටුම් හලක් නොවෙයි. තුඹ ගැන මට දුක හිතෙනව. මිනිසුන්ට හිනස්සන්ට එපා...``

රියැදුරු පිරිස මා දෙස බලා සිනාසෙමින් විසිර ගියහ. එවිට මුළු දුම්රිය පලටම ඇසෙන සේ මම කෑගැසීමි:

``තුඹලගෙ හිතේ තුඹල ධිරයිවර්ල කියලද. නාකි ගැනු ගොඩක්!``

මා එසේ කීම අසාධාරණය. ඔවුන්ගේ සාධාරණ කෝපයට මම ලක්වුණෙමි.

ඔවුහු නැවති පසුව මා වෙත වේගයෙන් ආහ.

``තුඹ මහජනයගෙ ජීවිත සමග සෙල්ලම් කරන්ට ලැහැස්ති වෙනවද?``

``අලුත් ක්‍රම හොයන්නා! වැඩියෙන් හම්බ කරන්ට හදනව!`` මෙසේ කීවේ ජන්තායිය.

කෑ කෝ ගසමින් ඉදිරියට ආ මිනිස්සු මා පෙට්ටි ගොඩට තල්ලු කලාහ. ඔවුන් මට පහර දෙනු ඇතැයි සිතූ මම ළඟ තිබූ ලෑල්ලක් අතට ගතිමි.

``ජයි! තුඹලා විසිර පලයල්ලා!`` යැයි කිසිවෙක් මහ හඬින් කෑගැසීය. ඒ අලිබෙක්ය.

``නිහඬ වෙයල්ලා!`` යැයි කී අලිබෙක් මා දෙස හැරී මෙසේද කිවේය. ``ඉල්යාස් තුඹට කියන්ට තියෙන දේ පැහැදිලිව කියපන්! ඉක්මනට කතා කරපන්!``

``මොන තේරුමකටද``යි මා ඇසුවේ හති දමමින්. ``මගේ කබායේ බොත්තම් සියල්ලම කඩා දම්ලා. හොඳයි මම කියන්නම්. බඩු පටවපු

ලොරියක් මගේ ලොරියට ඇඳල කඳකර පාරෙ ගෙනගියා. දූර්ග මාර්ග දිගේ ගෙනගොස් මාර්ග පාලක ස්ථානය දක්වාම එහෙම ඇදගෙන ගියා.''

රුස්වූවෝ අවිශ්වාස ලෙස නිහඬ වූහ.

''නුඹ එහෙම ඇදාගෙන ගියාද?'' එකෙක් ඇසීය.

''ඔව්. ඩොලොන්ස්ක් දූර්ග මාර්ග හරහා ඒ ලොරිය ගෙන ගියා. මාර්ග පාලක ස්ථානය දක්වාම ආවා.''

''මදැ. ගපන්නමක හැටි!'' කිසිවෙක් පැවසූහ.

''මිනිහ පිස්සුවෙන් දොඩවනව!''

''දොඩවනව නොවෙයි. මම ලොරිය ඇදා ගෙන යන සැටි ජන්තායි දැක්කා. ජන්තායි නුඹ කොහෙද? මේ ගොල්ලන්ට කියපන්. මහකද නුඹට එදා මාව නුඹ දුටුවා නෙවද...''

එහෙත් ජන්තායි ගොළුවන රැකීය. ඔහු සැහෙන්නට බිය වූවාක් මෙනි. දැන් ජන්තායි සෙවීමට තරම් වෙලාවක් නැත. මේවර විවාදය පැන නැගි විට සමහරු මගේ මතයට පක්ෂපාත වූහ. මගේ කතාව අවිශ්වාස කළ එකෙක් නැවත තම සැකය පළ කළේය.

''මේක තේරුමක් නැති කතාවක්,'' යැයි ඔහු කීවේ ගොරෝසු හඬකිනි. ''එකෙක් එක වැඩක්, එක වරක් කළා. ඉතින් මොකද? අපි පොඩි ළමයි නොවේ. අපේ ගමන් මාර්ග වල තවත් රිය ඇදාගෙන පැදවීම තහනම්, කිසිවෙක් ඊකට අවසර දෙන්නේ නැහැ. ශ්‍රම ආරක්ෂක නිලධාරියාට කීවොත් එයා බැණවැදී එළවා ගනීවි. නුඹල හන්දා ඒ මිනිහ සිරගෙට යන්න ලැහැස්ති වන්නේ නැහැ...''

''අනේ නිකම් ඉඳපන්. කාගෙ අවසරයක් මොකටද?'' යි ඇසූ එක් රියැදුරෙක් මෙසේ පැවසීය. ''එක්දාස් නවසිය තිස් ගණන්වලදී ඉවාන් ස්තෙපානොවිච් පලමුවරට දූර්ග මාර්ගය ඔස්සේ ලොරිය පදවාගෙන ගිහිල්ල ඒ අලුත් ගමන් මග විවෘත කළා. එයාගෙ ලොරියෙ බර ටොන් එක හමාරයි. මේ වැඩේ කිරීමට ඔහුට කාගෙන්වත් අවසරයක් ඕන වුණේ නැහැ. එයා ඒ දූර්ග මාර්ග විවෘත කළේ නිකම්. මෙන්න එයාගෙන් අහපල්ලා. එයා ඒ කතාව කියාවි...''

''කතාව ඇත්ත'' යැයි කී ඉවාන් ස්තෙපානොවිච් ''ඒ වුණාට තවත් රියක් ඇදාගෙන යාම ගැන මම සැක කරනව. ගිම්හාන කාලෙදිවත් මහොම තවත් රියක් ඇදාගෙන ගියේ නැහැ. දැන් ශීත කාලෙ'' යැයි ඔහු වැඩිදුරටත් කීය.

මෙතෙක් වේලා නිහඬව සිටි අලිබෙක් කතා කළේය:

''අපි දැන් මේ ගැන බොහෝ වේලා විවාද කළා. මීට ඉස්සෙල්ලා මේ වගෙ වැඩක් නොකළාට, මේ අලුත් අදහස ගැන කල්පනා කරන්ට

වටිනව. ඉල්යාස් නුඹ කල හැටියට නොවෙයි. ඇදා ගත්තා. ගියා. මේ වැඩේ කරන්ට ඕන හොඳට සංවිධාන වෙලා. මේ ගැන කල්පනා කරල. විශේෂඥයින්ගෙන් මේ ගැන උපදෙස් ලබාගන්ට ඕන. ඒ වගේම පරීක්ෂණ ධාවනයත් පවත්වන්ට ඕන. නිකම් කතා කිරීමෙන්ද පලක් නැහැ.''

''මම මෙය ක්‍රියාවෙන් ඔප්පු කරන්නම්! නුඹල ඔය ගැන සිත සිතා ඉන්නා විට මම ක්‍රියාවෙන් ඔප්පු කරන්නම්! එතකොට නුඹලට පෙනේවි කවිද නිවැරදි කියල'' යැයි මම කීවෙමි.

හැම එකකුටම තමාට විශේෂවූ ගති ගුණ ඇත. එහෙත් එය නිතර මෙල්ල කර ගත යුතුය. සමහර අවස්ථාවලදී සමහරු එය මෙල්ල කිරීමෙහි අපොහොසත් වෙති. මම ලොරිය පැදවීමි. එහෙත් මා රියැදුරු අසුනෙත් සිටින බවක් හෝ මහ මග රිය පදවන බවක් හෝ මට නොදැනිණි. වේදනාව, අමනාපය, කනගාටුවක් හා නොරිස්සුම් ගතියක් දැනිණි. පෞද්ගලික අභිමානයට එදිරිව කළ අභියෝගය නිසා එය තවත් දැඩිව නැගී සිටින සැටි දැනිණි. තොපට මම යස පාඩමක් උගන්වන්නම්! මින් පසු මිනිසුන් අවිශ්වාස නොකිරීමට යස පාඩමක් උගන්වන්නම්. තොපි මිනිසුන්ට හිනාවෙණව, ඇඟ බේරාගෙන වැඩකරනවට තොපට යස පාඩමක් උගන්වන්නම්!.. අලිබෙක්, එයත් පුදුම මිනිහෙක්. අපි ඒ ගැන කල්පනා කළ යුතු වෙමු. ඒ ගැන සූදානම් විය යුතුය. පරීක්ෂණ ධාවන පැවැත්විය යුතුය. එයා හරිම ඔක පණ්ඩිතයා. එයත් ප්‍රවේසම් වෙන්ට බලනව. ඔය බොරු පරිස්සම තඹයක් වටින්නෙ නැහැ. මම ඔය වැඩේ කරල පෙන්නුවාම ඔවුන්ට ගිලගන්ට බැරිවේවි!

ගරාජයට ලොරිය ගෙනගිය මම එවැනි දේ ගැන කල්පනා කරමින් සිටියෙමි. රෑ බෝ වී ගෙන එන්නට විය. මගේ ගත සිත කැලඹී සීමාන්තය දක්වා වැඩී ඇත. මා සිතුවේ එක දෙයක් ගැන පමණකි: කඳු තරමයේ දුර්ග මාර්ග ඔස්සේ තවත් රියක් ඇදාගෙන ලොරියට බඩුත් පටවාගෙන පැදවීම ගැනය. අහස පොළොව ගැටලා හෝ එය කළ යුතුමය. එහෙත් මගේ ලොරියට ඇදාගත හැකි තවත් වාහනයක් ලබාගන්නේ කොහින්ද?

මෙවැනි අදහස්වල එල්බ ගනිමින් ගරාජ් බිමේ ඇවිද්දෙමි. රෑ බෝ විය. කළමනාකාර ලිපිකාරිය වන කදිචාගේ කාර්යාලයේ පමණක් එළියක් දැල්වේ. මගේ කාර්යාලයට ආධාර ලබාගත හැකි එකම හිතවතිය කදිචා බව මට වැටහිණි. අද කදිචාගේ හවස මුර වාරයයි. මෙය වඩාත් හොඳය. ඇ මා ප්‍රතික්ෂේප නොකරනු ඇත. ඇ ප්‍රතික්ෂේප නොකළ යුතුය. මා කිරීමට අදහස් කරන ඒ සාපරාධී ක්‍රියාව අන් අයට ප්‍රයෝජනයක් වන සේ ඉටුකර ලීමට කදිචාද ආධාර වනු ඇත.

කදිවාගේ කාර්යාලය ඉදිරිපිට සිටගත් මම එහි දොරටුවෙන් ඇතුළු වූයේ මීට බොහෝ දවසකට පෙර බව සිහිවූයෙන් සිනා සුණෙමි. පසුගිය කාලය තුළදී අනිත් අය මෙන් මමද ජනේලය අසල සිටගෙන කටයුතු ගැන ඇ සමග කතා කළෙමි. මේ අදහස් නිසා මම තරමක් ලජ්ජා වුණෙමි. එවිටම කාමරයේ දොර හැරිණි. කදිවා එළියට පැමිණියාය.

''කදිවා මම ඔහෙ හමුවෙන්ට ආවෙ! හොඳ වෙලාවට ඔහෙ ඉන්නව.''

''මම ගෙදර යනව.''

''මම ඔහෙව ගෙදර ඇරලන්නම්.''

විස්මය පත්වූ කදිවා ඇස් බැම් උස්සා ගෙන මා දෙස බලා මඳ සිනා පෑවාය:

''යමු.''

අපි දෙදෙන ගේට්ටුවෙන් පිටවීමු. පිටත ඇඳිරිය. වැව හරහා ශීත සුළං හමා ගිය අතර වෙරළට හැප්පෙන රැළි වල හඬ ඇසිණි. කදිවා මගේ අත අල්ලාගෙන ඇඩී ශීත සුළඟින් රැකවරණය ලබන්නට මෙන් වඩාත් මට කිට්ටු වුණාය.

''ඔහෙට ශීතලද?''යි මම ඇසීමි.

''ඔහෙ මා ළඟ ඉන්නා විට මට ශීතල දැනෙන්නෙ නැහැ!'' යි කී කදිවා සිනාසුණාය.

මීට විනාඩි කීපයකට පෙර නොසන්සුන්ව කැරලි ගැසූ මා සිත දැන් නිසලව ඇත.

''මෙහෙට ඔහෙ වැඩට එන්නෙ කීයටද? කදිවා!''

''දවල් වරුවට, ඇයි මොකද?''

''මට ඔබෙන් කරගත යුතු ඉතාම වැදගත් වැඩක් තියෙනව. කදිවාගෙ තීරණය උඩ තමා හැමදෙයක්ම රැඳී තිබෙන්නේ...''

පළමුව ඇ මගේ කතාව ඇසීමට පවා අකැමැති වූ නමුදු මම දිගින් දිගට විස්තර කළ විට ඇ සවන් දෙන්නට වූවාය. අපි මහ මග පහන් කණුවක් අසල නැවතුණෙමු.

''අනේ, ඉල්යාස්!'' යැයි කී කදිවා මා දෙස බැලුවේ මා විපතකට පත්වූ කලෙක මෙනි. ''ඔය වැඩේ ප්‍රයෝජනයකට ඇති දෙයක් නොවේ!''

ඇ මගේ ඉල්ලීම ඉටු කරන බව මට ඉවෙන් මෙන් දැනුණෙන්, මම ඇගේ අතක් ගත්තෙමි.

''කදිවා මාව විශ්වාස කරන්න! හැම දෙයක්ම ඉතා හොඳින් සිදුවේවි! කොහොමද මට උදව් දෙනවද?''

ඇ සුසුම් ලෑවාය.

''නුඹ වගෙ කෙනෙක් සමග මොනවා කරන්ටද'' යි ඇසූ කදිවා හිස වැනුවාය.

මා ඇය වැළඳගත්තේ ආවේගයකිනි.

''කදිවා උපදින්නට තිබුණේ පිරිමි අසරු බටයෙකු මෙන්! මම හෙට එන්නම්.'' මෙසේ කී මම ඇගේ අතක් ගෙන ආචාර කළෙමි. ''හවස් වෙනවිට මගේ ලියවිලි හදා තියන්ට හොඳේ!''

මගේ අතක් තදින් ගත් ඇ ''පැනල දුවන්ට එපා!'' යැයි කීවාය. පසුව ඇ හිටිහැටියේම හැරුණාය: ''හොඳයි, යන්න... අද හොස්ටල් එකේද රෑ ගත කරන්නෙ?''

''ඔව්. කදිවා!''

''සුබ රාත්‍රියක් වේවා!''

පසුදින අපේ රථ වාහන කාර්මික පරීක්ෂණයට භාජන කරන ලදි. අපේ ඩිපෝවේ හැම කෙනෙක්ම නොසන්සුන් වූහ. කාර්මික පරීක්ෂකයෝ නිතරම අවේලාවට පැමිණෙති. හැම රියකම වැරදි අඩුපාඩු සොයන ඔවුහු ඒ හැම දෙයක්ම ගැන දිගැති වාර්තා ලියති. ඔවුන් හැමටම කරදරයකි. ඔවුහු හැම දෙනෙකුටම බාධා කරති. ඔවුහු මෙසේ අනුන්ට කරදර කළද, කලබල නොවී තම කටයුතු කරගෙන යති.

මගේ ලොරිය හොඳ තත්ත්වයක තිබිණි. එසේ වුවද, මම ලොරිය අලුත් වැඩියා කරන බවක් පෙන්වීමි. කදිවා වැඩට එනතුරු මා වේලාව නාස්ති කළ යුතුය. කිසිවෙක් මට කතා නොකළ අතර ඊයේ රාත්‍රියෙහි හටගත් විවාදය ගැනද කිසිවෙක් නැසුහ. රියැදුරන්ට මා ගැන වෙහෙසීමට කාලයක් නැත. කාර්මික පරීක්ෂණ අවසන් කොට, නැතිවුණු කාලය වෙනුවට හැකි තරම් වේලාසනින් රිය ධාවනය පටන් ගැනීමට හැම කෙනෙක්ම යුහුසුළු වූහ. කෙසේවුවද, මගේ අමනාපය පහ නොවීය.

බත් පැයෙන් පසු මද්දහනෙහිදී මම කාර්මික පරීක්ෂණයට පෙනී සිටියෙමි. පරීක්ෂකවරු පිටව ගියහ. ගරාජය හිස්වීය, නිහඬවීය. ලොරිවලට ඈඳන රිය ගරාජයේ පිටුපස තබා ඇත. ප්‍රාදේශීය වැඩවලදී සමහර විට ඒවා පාවිච්චි කරනු ලැබේ. රෝද හතරකින් යුත් සාමාන්‍ය ඈඳන රියක් මම තෝරා ගතිමි. එය සාමාන්‍ය රියක් වුවද, ඒ සඳහා කොතරම් කැළඹී ගත්තෙමිද... ඉදිරියේදී මට මුහුණ පෑමට ඇති අසීරුකම් ගැන මා දැන සිටියා නම්! මම නොදැන සිටියෙමි. මම සන්සුන්ව නේවාසිකාගාරයට ගොස් විවේක ගත්තෙමි. බඩ පුරා ආහාර ගෙන පැයක් පමණ නිදාගත යුතුය. ගමන අපහසුය, අසීරුය. එහෙත් නිදාගැනීමට මට නොහැකි විය. යහන මත හැරෙමින් පෙරළෙමින් නිදාගැනීමට මම තැත් කළෙමි. හවස් වූ විට ඩිපෝවට ගියෙමි.

කදිවා වැඩට පැමිණ සිටියාය. ඈ නියමිත ලෙස සියලු ලියවිලි පිළියෙල කර තිබුණි. බලපත්‍රය ගෙන ගරාජයට ගියෙමි. ``දැන් ඉතින් නුඹලා සූදානමින් හිටපල්ලා!`` මගේ ලොරියට රිය ඈඳා ඇන්ජිම ක්‍රියාකොට වටපිට බැලිමි. ගරාජයේ කිසිවෙක් නොසිටියේය. අලුත් වැඩියා කරන වැඩපළේ උපකරණ ගැටෙන හඬ සහ වැවේ රළ ශබ්දයද පමණකි, නිහඬතාවයට බාධා කළේ. අහස වලා රහිත විය. තරු රහිත විය. එන්ජිම හඬ නගාත්ම හදවත ගැහෙන්නට විය. දුම් වැටියක් උරන්නට සිත්වුවද, දල්වාගත් දුම්වැටිය විසිකොට ගමනට පිටත් වුණෙමි.

ගේට්ටුව අසලදී මුරකරු මා නැවත්විය.

``නවතිනු! යන්නේ කොහෙද?``

``බඩු පටවාගන්න අක්සතල්--ලොකු උන්නැහෙ.`` උදාසීන ගතියක් පෙන්වූ මම ``මෙන්න ගමනට ඕන බලපත්‍ර`` යැයි කියමින් ඒවා මුරකරු අතට දුනිමි.

මහලු මුරකරුවා බලපත්‍ර කඩදාසි මූහුණ ළඟටම ගෙන කියවන්නට උත්සාහ කළද, අඳුරු ආලෝකය නිසා ඔහුට එසේ කළ නොහැකි විය.

``පමා කරන්න එපා ලොකු උන්නැහෙ! වැඩ අප එන තුරු බලා ඉන්නෙ නැහැ`` යි නොඉවසිල්ලෙන් පැවසීමි.

බඩු පැටවීම බාධා රහිතව කැරිණි. ඈඳනු ලැබූ රියට හා මගේ ලොරියට හැකිතරම් විශාල ප්‍රමාණයක් බඩු පටවා ගත්තෙමි. කිසිවකු විරුද්ධවීමට ඉදිරිපත්නොවීම මගේ මවිතයට හේතුවිය. මා දුම්වැටියක් දල්වා ගත්තේ මහ මගට රිය පැදවූ පසුවය. රියැදුරු අසුන මත හරිගැයි වාඩිවූ මම ලොරියේ පහන් දල්වා වේගය වැඩි කළෙමි. අඳුරු මහ මග මා ඉදිරියේ දිස්වී නැවත අතුරුදහන්විය. පාළු මහ මග දුටු මම වේගය තවත් වැඩි කළෙමි. ලොරියේ ගමන් වේගය වැඩිවුණද, වෙනසක් නොදැනිණි. ඈඳනු ලැබූ රියද අමුතු හඬක් නොනැගීය. වංගු වලදී ඈඳනු ලැබූ රිය තරමක් මහ මගින් පිටත පනින බව මට දැනුණද, පුරුදු වූ පසු එම වරද හරිගස්සා ගත හැකි බව මට සිතිණි. ``ඩොලොන්ස්ක් දුර්ග මාර්ගය සාර්ථක ලෙස පසුකර යමි! සින්ට්ස්යාන් දක්වා යමි!`` යි සුක්කානම දැතින් අල්ලාලත් මම මටම කියා ගතිමි. තම අසුගේ ග්‍රීවයට බර දෙමින් ඉදිරියට නැමෙන අසරුවකු මෙන් මමද ඉදිරියට නැමුනෙමි. වංගු රහිත මහ මග මම වේගය වැඩි කළෙමි. මැදියම් රැය වනවිට ඩොලොන්ස්ක් දුර්ග මාර්ගය පසුකර යාමට අදහස් කළෙමි.

මුලදී මගේ ගමන් වේගය මා සිතුවාටත් වඩා යහපත් වුවද, පසුව කඳු නැගීමට පටන් ගත් විට වඩාත් ප්‍රවේසමින් රිය පැදවීමට මම ඉටාගතිමි. මගේ ලොරියේ ඇන්ජිමට අමතර බඩු ඈදගෙන යාම අපහසුවීම නිසාම

නොව, කඳු නැගීමේදී දැනුණු අසීරුවට වඩා වැඩි අසීරුවක් කඳු බැසීමේදී දැනුණු බැවිනි. මෙසේ කඳු බැසීමේදී ඇදනු ලැබූ රිය ලොරියට හැප්පිණි, සමහර විට එය ගැස්සිණි. මේ නිසා මට බාධා හා කරදර ඇති විය. නිතර ගියරය මාරු කිරීමටද, රෝධක පාවිච්චි කිරීමට හා ඇදනු ලැබූ රිය නැවත මහ මගට ගැනීමටද සිදුවිය. මුලදී මම එම බාධා ගණන් නොගෙන ක්‍රියා කළෙමි. එහෙත් දුර යන්ම, කඳු බසින්ම එම බාධා වැඩිවූයෙන් මම කිපෙන්නට විමි. කඳු බැසීම් නැගීම් කොපමණද? මේවා ගණන් කිරීමට කිසිවකුට නොසිතුණේ මන්ද? මම අධෛර්යය නොවීමි. මට කිසිවක් තර්ජනයක් නොවිය. මගේ ශාරීරික ශක්තිය පමණක් කෙමෙන් දුර්වලවී යන සැටි දැනිණි. ''කමක් නැහැ. දුර්ග මාර්ගයට ඇතුළු වීමට පෙර මම විවේක ගනිමි'' යි මටම කියාගතිමි. ''මම ගමන සාර්ථක ලෙස නිම කරමි!'' බයිටෙමීර්ගේ ලොරිය මගේ ලොරියට ඇදා පසුගිය වස්සාන සෘතුවේදී රිය පදවන විට දැනුණු මහන්සියට වඩා වැඩි මහන්සියක් මට දැන් දැනෙන්නෙ මන්ද!

ඩොලොන්ස්ක් කඳුකරය ළං විය. මගේ ලොරියේ පහන් ආලෝකය නිසා කඳු මුදුන් වසා ඇති හිම කැටිද, කඳු බෑවුම්වල හිම තට්ටුද, මග මත මහ එල්ලී ඇති හිම කැටිද දිලිසෙන සැටි පෙනිණි. ලොකු හිම පියලි කෙමෙන් පහනට වැටිණි. ''සුළං පාරකින් හිම ගොඩක් කැළඹිලා වෙන්නට ඕන'' යැයි මම සිතිමි. හිම පියලි ආවරණ වීදුරු මත වැටී දියවිණි. ඒවා සැටි නොවිය. ''හිම පියලිත් මට හතුරු කම් කරනවා!..'' යැයි දත් සපමින් කී මම ඒවාට සාප කළෙමි. ආවරණ වීදුරු පිසදමන කෘත්‍රිම අත් ක්‍රියා කරවීමි.

දුර්ග මාර්ගය දක්වා ඇති පළමුවැනි උස කන්ද නැගීමට පටන් ගතිමි. ඇන්ජිම ගොර ගොර හඬක් නගන්නට විය. ඒකතානමය එම හඬ ශෝකාන්විත ගීතයකට සමාන විය. කඳු මුදුනටම නැග ගතිමි. දැන් දිගැති කඳු බෑවුමකි. ඇන්ජිම හඬ නැගිය. ලොරිය සහ පිටුපස රිය කඳු බෑවුම ඔස්සේ පහළට දිවෙයි. මම ඒ මේ අත පැද්දෙන්නට වීමි. ඇදනු ලැබූ පිටුපස රිය ඒ මේ අත පැද්දිණි. ලොරියට හැප්පිණි. කැළඹිගත් මම වෙහෙසීමට පත්වීමි. ලොරිය හා ඇදනු ලැබූ රිය හැප්පීම නිසා මගේ පිටිකොන්ද කකියන්නට විය. දත්වල වේදනාවක්ද ඇතිවිය. රෝධකවලට අහිතකර වූ රෝද හිම සහිත පාරෙත් ලිස්සන්නට විය. ලොරිය පාර හරහා යන්නට වූයේ මගේ රිය පැදවීම හා පාලනයටද අහිතකර වූවාක් මෙනි. වැඩිදුර රිය පැදවීමට ශක්තියක් මා තුළ නොතිබිණි. ලොරියේ පහන් නිවා දැමූ මම ඇන්ජිම නැවැත්වූයෙමි. හිරිවැටී ඇති මගේ දත් වියලි ලී දඬු දෙකක් මෙන් විය. මා ආශ්වාස ප්‍රශ්වාස කරන සැටි මට ඇසිණි. විනාඩි

තිපයකට පසු මට පහසුවක් දැනුණෙත්, සිගරැට්ටුවක් දල්වා ගතිමි. මා වටා අඳුර පැතිර ඇත. දැඩි නිසලතාවයකි. ලොරියේ හිඩස් අතරින් සීත සුළං හඩ නගමින් ඇතුළු විය. ඉදිරියේ ඇති ගමන් මග සිහි කළ මා තුළ බියක් උපණි. දරණ ගැසී සිටින දැවැන්ත පිඹුරකුට සමාන වංක ගිරි සහිත මාර්ගය ඇරඹෙන්නේ මෙතැනිනි. මෙය ඇන්ජිමටත් මගේ අත්වලටත් දැඩි නොසන්සුන් තාවයක් ගෙනදෙයි. ඉමක් නැති වංගු සහිත කඳුමග රිය පැදවීම අතිශයින්ම අමාරුය. වාඩිවී කල්පනා කිරීමට වේලාවක් නැත. හිම වැස්සක් පටන් ගැනිණි.

මම නැවත ඇන්ජිම ක්‍රියා කරවීමි. රොස් හඬක් නැගූ ලොරිය කඳු නගින්නට විය. හුස්ම ගැනීමට පවා ඉඩ නොතබමින් වංගුවෙන් වංගුව පසුකරමින් රිය පැදවීමි. දැන් කෙටි එහෙත් තියුණු බෑවුමකි. ඉන්පසු කෙලින් පාරකි. මාර්ග පාලක ස්ථානය දක්වා ඇති මග එතරම් අසීරු නැත. බොහෝ අමාරුවෙන් කඳු බෑවුම ඔස්සේ පහළට රිය පැදවීමි. කිලෝමීටර හතරක් පමණ දිගැති සමතලා මග ඔස්සේ රිය පැදවූ මම ඊළඟ කඳුකරය නගින්නට වීමි. මම දිගටම උස කඳු ඔස්සේ ඉහළට රිය පදවන්නට වීමි. කඳු නැගීමට එම වේගය ප්‍රමාණවත් නොවිය. ඇන්ජිම තම වේගය තර්ජනාත්මක ලෙස අඩුකරන්නට විය. දෙවැනි ගියරයටද පසුව පහත් ගියරයටද මාරුකරමින් ලොරිය පදවන්නට වීමි. මම ඇතිත්ම සුක්කානම අල්ලා ගතිමි. ඇඳිරි වලාකුළු අතරින් තරු පෙනිණි. ලොරියට අහලකුදු ඉදිරියට යාමට බැරිවිය. රෝද ඉදිරියට නොයැවිණි. ප්වා මහ මගින් එපිට පැනීමට තැත් කරන්නාක් මෙනි. මම ඇක්සලරේටරය පාගා වේගය වැඩි කළෙමි.

"තව ටිකයි! තව බොහොම පොඩ්ඩයි. ඉදිරියට පලයන්!" යැයි මා ඇන්ජිම ඇමතුවේ මිනිසකු අමතන්නාක් මෙනි.

සුසුම් ලන්නාක් මෙන් හඩ නගමින් සිටි ඇන්ජිම මේ වර වෙව්ලන්නට පටන් ගත්තේය. ඉන්පසු අමුතු හඩක් නගා නිහඩවිය. ලොරිය සෙමින් ආපසු පස්සට ලිස්සා යන්නට විය. රෝධක වලින් ප්‍රයෝජනයක් නොවිය. ඇදන ලැබූ රියේ බර නිසා රෝධක ක්‍රියා විරහිත වී ගොස් සෙමින් පහලට ගියෙත්, කන්දක හැප්පී නැවතිණි. හැම දෙයක්ම නිහඩවිය. මම දොර හැර එළියට ගොස් පිරික්සා බැලීමි. ඇදනු ලැබූ රිය අගලකට වැටී ඇත. සිදුවී ඇත්තේ මා සිතූ දෙයමය. අවාසනාවක මහත! ඉන් ගොඩ ගැනීම කළ නොහැක්කකි. විඩාපත්වූ මම නැවත ඇන්ජිම ක්‍රියා කරවීමි. එය හඩ නැගීය. රෝද වේගයෙන් භ්‍රමනය විය. එහෙත් ඉදිරියට නොගියේය. මම ඇදනු ලැබූ රිය වෙත ගියෙමි. එහි රෝද හතරම අගලට වැටිලාය. කුමක් කරම්ද? ව්‍යාඝ්‍රයකු මෙන් කිපුණු මා රෝද හතර ගොඩගනුවස් එක් එක්

රෝදය බැගින් අගලින් ගොඩ ගන්නට උත්සාහ කළද, එය නිෂ්ඵල විය. පසුව රිය යටටවී කරදි එය උස්සා අගලින් ගොඩ ගැනීමට උත්සාහ කළේ සතකු සේ හඩ නගමිනි. රිය නොසෙල්විණි. විඩා පත්වූ මම හිමෙන් වැයි ඇති මඩ වගුරු බිමේ වැතිර ගෙන, සුන්වූ බලාපොරොත්තු නිසා හැඬීමි. පසුව නැගිට සිටියද ගමන් කිරීමට තරම් ශක්තියක් නොතිබුණේත්, යම්තම් ලොරියේ පාපුවරුව ළඟට වීත් ඒ මත වාඩිවුණෙමි.

ඈත එන රියක හඬක් ඇසිණි. එහි විදුලි පහන් කඳු මග ඔස්සේ මා වෙත එන්නට විය. එය පදවන රියැදුරා මේ මහ රෑ යන්නේ කොහේද, මොකටද යන්න ගැන මම කල්පනා නොකලෙමි. ඒ ආලෝකය මා සොයමින් මා ඇල්ලීමට එන බවකි. බඩුත් සමග හොරු ඇල්ලීමට ඒ රිය මා වෙත එන සැටි දුටු මම බියවීමි. වහාම නැගිට ඇදා තිබූ රිය ලොරියෙන් වෙන්කොට, එය අගලේ තබා මගේ ලොරිය වේගයෙන් පැදවීමි.

තේරුම් රහිත ඝෝර බියක් මා සිත වෙලා ගත්තේය. අගලේ වැටී ඇති රිය මා පසුකර එළවන සැටියක් මට දැනිණි. දැන් දැන් එම රිය මා පසුකර යනු ඇතැයි මට හැඟුණි. උපරිමය වේගයකින් රිය පැදවූ මම අනතුරකට මුහුණ නොපෑවේ එම මග ඉතා හොඳින් දැන සිටි බැවිනි.

හිමිදිරි පාන්දර අන්තර් මාර්ග ස්ථානයට මම පැමිණියෙමි. මා පදිංචි ව සිටි ගෙදර දොරට මිට මෙළවූ අත්වලින් ගැසුවේ පිස්සකු මෙනි. අසේල් දොර හැරියද ඇය දෙස නොබලා හිසේ සිට දෙපා දක්වා කුණු හා මඩ තවරාගෙන සිටි මම ගෙතුලට ගියෙමි. නෙතමනය ඇති යමක් මත වාඩි වුණෙමි. එම ආසනය මත සෝදනලද රෙදි ගොඩකි. සිගරැට්ටුවක් සොයන අදහසින් සාක්කුවට අත යැවීමි. ඒ වෙනුවට ඇන්ජම ක්‍රියා කරවන යතුර මා අතට අසුවිය. වැරෙන් එය ඉවත විසි කලෙමි. හිස පහත් කර ගත් මම ගල්ගැසුණාක් මෙන් සිටියෙමි. අසේල් මේසය අසල නැතිගත් ලීලාවකින් ඒ මේ අත යන සැටි මට පෙනිණි. ඇට විස්තර කළ හැක්කේ කෙසේද? බිම තිබූ යතුරු ඇහිදගත් අසේල් එය මේසය මත තැබුවාය.

``ඇඟපත සෝදා ගන්නවද? ඊයේ හවස සිට මම වතුර උණුකොට බලා හිටියා`` යැයි ඇ මුදු හඬකින් පැවසුවාය.

මම සෙමින් හිස එසවීමි. රෑ නිදන ඇඳුමින් සැරසී සිටි අසේල් මා ඉදිරියේ සිටගෙන වෙව්ලන්නට වූවාය. ඇගේ සිහින් ඇඟිලි ළය මත විය. බියගත් නෙතින් ඇ මා දෙස බැලීය. කැළඹීම හා අනුකම්පාව එම බැල්ම කියා පෑවේය.

``ඇඳපු රිය අගලේ තියල ආවා`` යැයි මා කීවේ අමුතු හඬකිනි.

``මොන රියක්ද?`` මගේ කතාව නොතේරුණු ඇ ප්‍රශ්න කළාය.

``යකඩ රියක්. කොළ පාටයි. 02-38 අංකය. මොන රියක් වුවත් මොකද!`` යි නොසන්සුන් ලෙස මම කීවෙමි. ``මම ඒ රිය හොරකම් කළා! ඔයාට තේරුණද! හොරකම් කළා!``

``ඔන්!`` කී අසේල් ඇඳ මත වාඩි වූවාය.

``මොකටද?``

``මොකටද?`` ඈ තේරුම් නොගැනීම නිසා මම කිපුණෙමි. ``දුර්ග මාර්ග හරහා ලොරියට තවත් රියක් ඇදල ගෙනයාමට උත්සාහ කළා! තේරුණද? මගේ මතය හරි බව ක්‍රියාවෙන් ඔප්පුකිරීමට ඉදිරිපත් වුණා... ඔන්න මට වුණ විපත!..``

මම දැතින් හිස බදා ගත්තෙමි. විත වේලාවක් අපි නිහඬවීමු. අසේල් නැගිට ඇඳ ගන්නට වූයේ තීරණාත්මක ලෙසය.

``ඔයා මොනවද කරන්නෙ?`` ඈ මෙසේ ප්‍රශ්න කළේ දැඩි ස්වරයකිනි.

``මොනව කරන්ටද?`` පහත් හඬින් මම ප්‍රශ්න කළෙමි.

``ඩිපෝවට යන්නැ``යි ඈ මට කීවාය.

``කොහොමද? අගලෙ ඇමූ රිය නැතිවද?``

``ගිහිල්ල විස්තර කරන්න.``

``ඔයා ඥාඩවන්නෙ මොනවද?`` මෙසේ ඇසූ මම කෝපවී කාමරයේ ඔබ-මොබ ඇවිද්දෙමි. ``මම කොහොමද අගලෙ ඇමූ රිය නැවත ගේන්නෙ? සමාවෙන්න! මට වැරදුණා කියල ඔවුන්ට කියන්ටද? උන් ඉදිරිපිට බඩ ගාන්ටද? බැහැ! ඔන දෙයක් කළාවෙ. යන්නෙ නැහැ!``

මගේ කෑගැසීම නිසා බියවූ ගිනි සාමට් අවදිවී හඬන්නට විය. අසේල් ඔහු වඩාගත් විට ඔහු වඩාත් වේගයෙන් හැඩීය.

``ඔයා බිය ගුල්ලෙක්!`` අසේල් මෙසේ හිටිහැටියේම කීවේ පහත් ස්ථිර හඬිනි.

``මොනවා-ඥැ?`` යි ඇසූ මම තදින්ම කෝපවීමි. මීට මෙළවු අත් ඇගේ මුහුණ ඉදිරියේ වැණුවද ඇට පහරගැසීමට මම ඉදිරිපත් නොවීමි. විදහාගත් නෙත්වල තුබුණේ ඔච්චයට පත් ගතියකි. ඇගේ ඇස්වල කළු ඉංගිරියා තුළින් මගේ මුහුණ පිළිඹිබු විය. බිහිසුණු විකෘතිවුණු ඒ මුහුණ දුටු මම බියවීමි. මා ඇට පහර නොදුන්නේ මේ හේතුව නිසා විය යුතුය.

ඈ තල්ලු කළ මම ගෙයින් පිටතට ගොස් වැරෙන් දොර වැසීමි.

උදැසන හිරු පායා ඇත. ඊයේ සිදුවූ දේ හිරු එළිය නිසා වඩාත් කළු පැහැති හා නිවැරදි නොකළ හැකි වරදක් ලෙස මට පෙනිණි. දැන් කළ හැකි එකම දෙය මගේ ලොරියේ පටවා ඇති බඩු භාරදීමය. ඉන්පසු කුමක් වේදැයි මම නොදනිමි...

බඩු හාරදී හැරී එන ගමන් ගෙදර නොගියෙමි. අසේල් සමග කලහයක් ඇතිවූ නිසාම නොවේ. කිසිවකුට පෙනීමට හෝ කිසිවකු දැකීමට හෝ ආශාවක් මා තුළ නොවූ බැවිනි. මා අමාරුවේ වැටී සිටින විට කිසිවකුට නොපෙනී හුදකලාව සිටීමට මම ආශා කරමි. මා මුහුණ පා ඇති අමාරුකම් ගැන අන් අය සැලකිලි දක්වන්ද? තත්ත්වය යහපත් වනතුරු හුදකලාව ඉවසාගෙන සිටිය යුතු බව මගේ හැඟීමය...

අමුත්තන් සඳහා ඇති ගෙට වැදී එහි රෑ ගත කළෙමි. එය බිඳිසුණු සිහිනවලින් පිරී රැයක් විය, මට නිදාගැනීමට නොහැකි විය. කඳුකරයට ගිය මම ඇඳනු ලැබූ රිය සොයන සැටි සිහිනෙන් දුටුවෙමි. ඒ රියෙහි සටහන් මා දුටුවද, රිය නොදුටුවෙමි. කවුද එය ගෙනගියේ. හැමතැනම දුවමින්, පනිමින්, අසමින් ඒ රිය සොයන සැටි මම සිහිනෙන් දුටුවෙමි...

නැවත කඳු තරණා මා ලොරිය පදවාගෙන යන විට එය නොදුටුවෙන්, සැබැවින්ම මම පුදුම වීමි. පසුව මා දැනගත් පරිදි, අලිබෙක් එම රිය අගලින් ගොඩගෙන ඔහුගේ ලොරියට ඈඳා එය ඩිපෝවට ගෙනගොස් ඇත.

අලිබෙක් එය ඩිපෝවට ගෙන ගිය පසු මමද එහි ගියෙමි. ලොරියේ කණ්ණාඩිය දෙස බැලූ මට මගේ වැහැරී ගිය වල ගැසුණු මුහුණු පෙනිණි.

ඩිපෝවේ හැම කෙනෙක්ම තමන්ට අයත් කටයුතු වල යෙදුණහ. බලයක් නැතිව ඇතුළු වූ කෙනෙකු ලෙස මට හැඟිණි. අස්ථිර ලෙස රථය පැදවූ මම හැකි තරම් ඈතින් එය නැවතීමි. එකවර රියෙන් එළියට නොබැස මම වටපිට බැලීමි. වැඩ කරමින් සිටි මිනිස්සු තම අවි හා උපකරණ බිම දමා නෙත් විදහා ගනිමින් මා දෙස බැලූහ. ලොරියට නැග ඔවුන්ට නොපෙනී පලායාමට මට සිත්විය. එහෙත් මට ලොරියෙන් බිමට බැසීමට සිදුවිය. ආත්ම ශක්තිය එක්තැන් කරගනිමින් ගරාජයේ වත්ත ගරහා යමින් ලිපිකරුගේ කාර්යාල කාමරයට ගියෙමි. හැකිතරම් නිසලව සිටීමට උත්සාහ ගත්තද, සේනාංකයකින් පැනගිය සෙබලෙක් නැවත තම සගයින් අතරට පැමිණි විටෙක ඇතිවන හැඟීමට සමාන අපහසු ගතියකින් මම පීඩා වින්දෙමි. කම්කරුවෝද බුම්මාගෙන මා දෙස බැලූහ. කිසිවෙක් මා අමතා කතා නොකළහ. ``ආයුබෝවන්!`` කීවේ නැත. මම ද ඔවුන් පසුවන තත්ත්වයෙහි සිටියෙමි නම් එලෙසම හැසිරෙමි.

දොරටුව අසලදී පය පැටලිණි. මගේ හදවත ගැස්සිණි. කදිවා ගැනද මම අමතක කළෙමි. ම විසින් ඇය අමාරුවේ දමා ඇත.

කොරිඩෝරයේදී ``හෙන පහර`` නැමැති බිත්ති පුවත්පතේ විශේෂ ලිපිය දුටිමි. ``අවමානයකි`` යන මැයෙන් ලියන ලද ලිපියේ අගලක වැටී තිබෙන රියක චිත්‍රයක්ද ඇඳ තිබිණි.

මම ඉවත බැලීමි. කම්මුල හරහා පහරක් වැදුණු කලෙක මෙන් මගේ මුහුණ රත්විය. මම ලිපිකාරියගේ කාර්යාලයට ගොඩවීමි. කදිචා ටෙලිපෝනයෙන් කතා කරමින් සිටියාය. මා දුටු ඇ ටෙලිපෝනයේ කථනය බිම තබා මා දෙස බැලීය.

``මෙන්න!'' යැයි කියමින් මම බඩු පටවා ගෙන යාමේ බලපත්‍රය ඇගේ මේසය මත තැබීමි.

අනුකම්පාව මුසු බැල්මකිනි, කදිචා මට සංග්‍රහ කළේ. දැන් දැන් ඇ මා වෙත කඩාපැන බැණ වැදී පසුව කඳුළු සලනු ඇතැයි මට සිතිණි. ``පසුව. වෙනින් තැනක. පින් සිදුවෙයි. දැන් නම් එපා!'' යැයි සිතින් අමතමින් මම ඇය දෙස බැලීමි. මා අවබෝධ කර ගත් ඇ නිහඬ වූවාය.

``ඒගොල්ල කෑ ගැසුවද?'' යි මම පහත් ස්වරයකින් ප්‍රශ්න කළෙමි.

කදිචා හිස වැනුවාය.

``කමක් නැහැ'' යි මා කීවේ ඇට ධෛර්‍යය ලබා දෙන අදහසිනි.

``අන්තර් මාර්ග ධාවනයෙන් තුඹව ඉවත් කළා!'' යැයි ඇ මට කීවාය.

``ඉවත් කළා! සදහටම!'' මෙසේ ඇසූ මගේ මුහුණේ විකෘති සිනහවක් පහළවිණි.

``සදහටම ඉවත් කරන්ට සූදානම් වුණා... නමුත් අපේ රියැදුරු පිරිස ඒ තීරණයට විරුද්ධ වුණා... තාවකාලිකව රට තුළ බඩු ගෙනයාමට තුඹට අවසර දීල තියෙනව. ගිහිං ලොක්කව හමු වෙයන්. එයා තුඹ එනතුරු බලා ඉන්නව.''

``මම යන්නෙ නැහැ. ඒ ගොල්ලන්ට ඕන තීරණයක් ගත්තාවෙ. කනගාටු වෙන්නෙ නැහැ'' යි මම කීවෙමි.

සිත් වේදනාවකින් යුතුව මම එළියට බැස්සෙමි. මා හමුවීමට සොනෙඥ් ඉදිරියට ආහ. ඔහු මගහැර යාමට මම සැරසුණෙමි. එහෙත් ඒ මිනිසා මට බාධා කරමින් සිට ගත්තේ ය. ඔහු අලිබෙක්ය.

``ඒයි, තැවතියන්!'' යැයි කී අලිබෙක් මා කොටු කළේය. ඔහු මා දෙස ඇඩි බැල්ම හෙළා තපුරු ලෙස මෙසේ කීවේය: ``ඉතින්, තුඹ වීරයෙක් බව ඔප්පු කරන්ට හැදුව. නමුත් බැල්ලිගෙ පුතෙක් හැටියට තුඹ ඔප්පු වුණා.''

``හොඳක් කරන්ටයි මා බැලුවෙ!'' යැයි මම කොඳුරා කීවෙමි.

``ඒ බොරුවක්! තුඹ බැලුවෙ තනිවම වීරයෙක් වෙන්ටයි. තුඹ විනාශ කරගත්තා. ඉතාම හොඳ අදහසක් තුඹේ කුහක ගති නිසා නැතිවුණා. ලොරියට වැඩිපුර රියක් ඈදා බඩු පටවාගෙන යාමට පුළුවන් බව දැන් ඉතින් ඔප්පු කරන්ට බැහැ. තුඹ හරිම මෝඩයෙක්! උද්දච්චයෙක්!''

ඔහුගේ දැඩි වචන නිසා වෙනත් මිනිහෙක් ඇත්ත යුක්තිය ගැන කල්පනා කරනු ඇත. මම ඒ තත්ත්වය පසුකර සිටියෙමි. මට ඔහුගේ වචන ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නාක් මෙන් විය. තනිවම මා වීරයෙක් වීමට තැත් කළාලු! මා උද්දච්චයෙක්ලු. එහෙත් එය සත්‍යය නොවිය!

``පලයන් යන්න!`` යැයි කියමින් අලිබෙක් තල්ලු කර දැමූ මම ``නුඹ නැතුවට වේදනාවෙන් අඩුවක් නැතැ``යි කී වෙමි.

මම එළියට ගියෙමි. හිම කුණාටුවක් හමන්නට විය. වියලි හිම පියලි පාවිය. මිනිස්සු ඇස් කොණින් මා දෙස බැලූහ. එහෙත් ඔවුනු වචනයකුදු කතා නොකළහ. මම කුමක් කරම්ද? දැත් කබා සාක්කුවල ඔබාගෙන මහ මගට බැස්සෙමි. කුඩා දිය වළවල්වල තිබූ දිය දැඩි ශීතට හසුව තුනී අයිස් තට්ටු බවට පරිවර්තනය වී ඇත. එය මගේ පාවහන්වලට පැගී `කරස්` යන හඬක් නැගීය. ග්‍රීස් තෙල් ටින් බඳුනක් දුටු මම එයට වැරෙන් පා පහරක් ගැසීමි. පා පන්දුවකට ගසන්නාක් මෙන් ටින් බඳුනට පයින් ගසමින් මම මහ මග දිගේ ගමන් කළෙමි.

මුළු දවස තිස්සේම ඒ කුඩා නගරයේ ඒ මේ අත ඇවිදිමින් හිස් රේගුව වටා කිප වරක්ම ගමන් කළෙමි. ඉස්සික්-කුල් වැවේ බඩු පටවන පාරු සැඩ සුළං නිසා ඒ මේ අත පැද්දිණි.

රේගුව අසල අවන් හලකට ගොඩ වැදුණු මම වොඩ්කා බෝතලයක් හා ආහාර ස්වල්පයක් ගත්තෙමි. පළමුවැනි වොඩ්කා වීදුරුව නිසා වෙරිමත් වූ මම මගේ පාවහන් දෙස බලන්නට වීමි.

``ජිගිට්--තරුණයා මොකද ඔය තරම් කනගාටුවෙන්!`` මිතුරු හඬක් විසින් එම ප්‍රශ්නය ඇසුවද, එහි යම්කිසි උපහාසාත්මක බවක් ගැබ්ව තිබිණි. අමාරුවෙන් මම හිස ඔසවා බැලීමි. ඒ කදිචාය.

``මොකද තනිවම බොන්ට අමාරුද?`` මෙසේ ඇසූ කදිචා මා අසලින් වාඩි වූවා, ``දෙන්නම එක්වී බොමු!`` යැයි යෝජනා කළාය.

වීදුරු දෙකකට වොඩ්කා වත්කළ ඈ එකක් මා අතටදී අනික ගනිමින් මා දෙස බලා මඳ සිනාවක් පාන්නී, ඇසක් අඩවන් කොට ඉඟි මැරුවාය: ``එක උගුරට!``... අප දෙදෙනා අවන් හලට පැමිණියේ විවේක සුවය පිට සුහද කතාවකට බව හැඟවෙන සේ කදිචා හැසුරුණාය.

``කදිචා, මොකද ප්‍රීතිවන්නේ?`` යැයි මා ප්‍රශ්න කළේ මඳ අසතුටකිනි.

``කනගාටුවන්නේ මොකටද? ඉල්යාස් මා ඔයා සමඟ ඉන්නා විට කනගාටුව නැති වෙනවා. මා හිතුවෙ ඔයා මීට වැඩිය ශක්තිමත් කෙනෙක් කියල. හොඳයි මෙන්න තව උගුරක් බොමු!`` යැයි කී කදිචා ඇගේ වීදුරුව

මා අත තිබූ වීදුරුවට වැදෙන සේ ළං කොට, සුරතල් බැල්මකින් මට සංග්‍රහ කොට, වොඩ්කා වීදුරුව බිවාය.

මෙලෙස අපි සුරා පානය කළෙමු. මම දුම් වැටියක් දල්වා ගතිමි. මගේ සිතට තරමක සැහැල්ලු ගතියක් දැනිණි. එදින පළමුවරට මම සිනාසුණෙමි!

කදිචාගේ අතක් ගෙන මිරිකූ මම මෙසේ කීවෙමි: ``ඔයා හරිම දක්ෂයි, කදිචා!``

අපි දෙදෙන මහ මගට බටුයෙමු. ඇඳිරි පැතිර ඇත. ඉස්සික්-කුල් වැවේ සිට පැමිණි සුළං පහරක් විසින් තුරු මුදුන් හා කණුවල එල්ලා තිබූ පහන් සෙලවිණි. මගේ දෙපාවලට යටින් ඇති මහ පොළව සෙලවෙන්නාක් මෙනි. කදිචා මගේ අතින් අල්ලාගෙන ගියාය. මුදු ගතියක් හා දයාන්විත බවක් පළකළ ඈ සුළං පහරින් මා ආවරණය කරනු වස් මගේ හිම කබායේ කර පටිය එසවූවාය.

``කදිචා! මා ඔයා ඉදිරිපිට වැරදි කාරයෙක්!`` යැයි මා කීවේ ඇ මට කළ ආධාරවලට කෘතඥතාවය පළකරමිනි. ``මම ඔයාට චෝදනා කිරීමට කොහොමටවත් ඉඩ තියන්නෙ නැහැ... සම්පූර්ණ වරද මා අතේ`` යැයි මම වැඩිදුරටත් කීවෙමි.

``මගේ සුදු කොල්ලො ඒ ගැන අමතක කරන්න. ඔයා නිතරම කලබලෙන්. ඔයා දෙස බලන විට මගේ හිත රිදෙනව. මමත් ඉස්සර ඔයා වගේ. එත හැටියට ජීවිතයට මුණ දෙනව මිසක් ඉරණමට සරදම් කරන්න එපා...`` යැයි ඇ කීවාය.

``ඒක තේරුම් ගැනීම අනුව වෙනස් වෙනව,`` යැයි කී මම එම අදහසට විරුද්ධ වුණෙමි. පසුව මඳක් කල්පනා කොට මෙසේ පැවසීමි: ``සමහරවිට ඔයා නිවැරදි වෙන්ට පුළුවනි.``

'කදිචා පදිංචි නිවෙස අසල අපි නැවතුණෙමු. බොහෝ කලක සිටම තනිවම විසූ ඇ තම සැමියාගෙන් දික්කසාද වූයේ කලකට පෙරය.

``ඔන්න මම ගෙදර ආවෙමි`` යි කදිචා පැවසුවාය.

මම ඉවත්ව යාමට යුහුසුළු නොවීමි. අප දෙදෙනා එකට වෙළන යමක් ඇතිවා සේය. නේවාසිකාගාරයට යාමට මා තුළ අදහසක් නොවිය. සත්‍යය හැමදාම අනර්ඝය. එහෙත් එය ඉඳ හිට අමිහිරි රසයක් ගෙන දෙන බැවින්, ඉන් වැළකීමට වැර දරයි.

``ආදරවන්තය ඔයා මොනවද කල්පනා කරන්නේ! මහන්සිද? දුර යන්ට ඕනදැ?යි කදිචා ඇසුවාය.

``නැහැ. කමක් නැහැ. කොහොමහරි යන්නම්! සුබ රාත්‍රියක් වේවා!`` යි මම කීවෙමි.

ඇ මගේ අතක් අල්ලා ගත්තාය.

``ඔයාගෙ අත හොඳටම ශීතල වෙලා. හරියට අයිස් වගෙ! මම රත් කරන්නම්`` යැයි කී කදිවා මගේ අතක් ගෙන හිම කබායට යටින් ඇගේ පපුව මත තබාගෙන මිරිකන්නට වූවාය. අත ඇද ගැනීමට තරම් වුවමනාවක් මා තුළ නොවීය. ඇගේ උණුසුම් ආදරයට විරුද්ධවීමට තරම් ශක්තියක් මා තුළ නොවීය. ඇගේ හදවත ගැහෙන සැටි මගේ අතට දැනිණි. බොහෝ කලක් බලාපොරොත්තු වූ යමක් ඉල්ලා සිටින්නාක් මෙනි. මා මත්පැන් නිසා වෙරිමත්ව සිටියද, සිදුවන්නේ මොනවාද යන්න නොදැන ගැනීමට තරම් බීමත්ව නොසිටියෙමි. මම සෙමින් අත ඉවත ගතිමි.

``ඔයා යනවදැ?`` යි ඇ ඇසුවාය.

``ඔව්.``

``ශුභ රාත්‍රියක් වේවා!`` යි කී කදිවා සුසුමක් හෙළුවාය. ඇ ඉවත යත්ම ගෙවැටෙහි දොර වැසිණි. මම පියවර කීපයක් ගියෙමි. මා නැවතුණේ මන්ද, නැවත මා ගෙවැට ළඟට ආවේ මන්ද යනු මම නොදනිමි. කදිවා මා එනතුරු බලා සිටියාය. ඇ මා ගෙල තදින් ගෙන මගේ දෙතොල් සිප ගත්තාය.

``ආපසු ආවා!`` යැයි කී කදිවා මා අල්ලා ගෙන ගෙට ගෙන ගියාය.

නින්දෙන් අවදිවූ මා කොහේදැයි මම නොදන්නෙමි. මගේ හිස කකියන්නට විය. කදිවා මා ළඟින් නිදා සිටියාය. අඩ නිරුවතින් සිටි කදිවාගේ ප්‍රශ්වාසය මගේ උරහිසට දැනිණි. ඇ උණුසුම්ය. නැගිට පිටවී යාමට තීරණය කළ මා සෙලවුණු සැටියේම කදිවා දෙකෙන් වසාගත මා වැළඳ ගත්තාය.

``යන්න එපා!`` යැයි ඇ සෙමින් කොඳුලාය. පසුව හිස එසවූ ඇ අඳුරේ ඇස් විදහා ගනිමින් මෙසේ පෙපලාය: ``දැන් ඉතින් ඔයා නැතුව මට ජීවත් වෙන්ට බැහැ... ඔයා හැමදාම මගේ. මට අයිතිව තිබුණා!.. වෙන දේ ගැන හිතන්ට මට වුවමනා නැහැ. ඉල්යාස් මට ආලය කරන්න. මා ඔයාගෙන් ඉල්ලා හිටින්නෙ එපමණයි... ඔයාව මම වෙන කාටවත් දෙන්නේ නැහැ. ඔයාව ලබාගැනීමට කරන සටනෙදි මම පසු බසින්නෙ නැහැ!..`` කදිවා කඳුළු සලමින් හැඬුවාය, කඩා හැලෙන කඳුළු බිංදුවලින් මගේ මුහුණද තෙත් විය.

මම ඇය සමග රෑය ගත කළෙමි. අප නිදාගත්තේ හිමිදිරි පාන්දරය. පමාවී අවදිවූ මම ඉක්මනින් ඇඳගතිමි. මගේ හදවත දැඩිලෙස මිරිකා දමන ශීතල සුළඟක් හමන සැටියකි. ගෙයින් පිටවී ගෙවත්තට ඇතුළු වූ මම හිම කබාය ඇඳ ගනිමින් ගෙවැටෙහි දොර හැරියෙමි. රතු පැහැති හිවල් හමකින් කළ හිම තොප්පියක් දෙකන් වැසෙන සේ හිස පැළඳගත් මිනිහෙක් මා

ඉදිරියට ආමෙවිය. ඔහු අතිකතු නොව ජත්තායිය. ඔහු ජදිංචිව සිටින්නේ මේ පෙදෙසේය. දෙනෙත් වලින් මිනිසකු මරා දැමිය හැකි නම් මගේ ඇස් ඔහු මරා දමනු ඇත. ඔහු දවසේ වැඩ ඇරඹීම සඳහා යමින් සිටියේය. අපි දෙදෙන මොහොතකට ගල් ගැසුණෙමු. මම ඔහු නොදුටු සැටියක් පෙන්වා ආපසු හැරී ඩිපෝව දෙසට ගමන් කළෙමි. රහසක් හෙළිවූ කලෙක මෙන් ඔහු තරමක් කැස්සේය. ඔහුගේ පයට පැගෙන හිම තගන ශබ්දය මට ඇසේ. ඔහු මට ළංවීමට හෝ මගෙන් තවත් ඈත්වීමට හෝ උත්සාහ නොදැරිය. මේ විධිහට එක දුරින් ගමන් කළ අපි ඩිපෝවට ළඟාවීමු.

ගරාජය දෙසට නොගොස් මම කාර්යාලයට ඇතුළු වීමි. දිනපතා උදෑසන ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාමරයේ විනාඩි පහක රැස්වීමක් පවත්වනු ලැබේ. එදින පවත්වනු ලැබූ මේ රැස්වීමේදී හැම දෙනෙකම එකවර හඬනගා කතා කළහ. රියැදුරන් වාදවිවාද කරන සැටි අසමින් ජනේල පඩියක වාඩිවී, කකුලක් පිට කකුලක් දමාගෙන, දුම්වැටියක් උරන්නට මා තුළ ආශාවක් ඇති විය. එසේ කිරීම එතරම් සිත් ගන්නා සුලු දෙයක් බව මම මීට පෙර නොදැන සිටියෙමි. එහෙත් එහි නොයාමට මම තීරණය කළෙමි. බයවූ නිසා නොවේ. මගේ මුරණ්ඩුකමත්, කෝපයත්, පුහු ආත්මාඩම්බරයත් මට එහි යාමට බාධා කළේය. පසුගිය රැය කදිවා සමග ගත කිරීමද නිසා මගේ ව්‍යාකූලත්වය තවත් වැඩිවිය... මගේ අවාසනාවන් පර්යේෂණය අමතක කර දැමීමට මිනිසුන් සූදානම් නැත. රැස්වූ පිරිස කතා කළේ මා ගැනය. කිසිවෙක් මහ හඬින් කෑගැසිය:

``මහා අපකීර්තියක්! එයාට විරුද්ධව නඩු පවරන්න ඕන. තමුසෙල එයාව ආරක්ෂා කරන්න හදනව. එයාගෙ අදහස නිවැරදි බව තමුසෙල කියනව. නමුත් එයා ඇදන රිය අගලක දමල පැනල ආ සැටි මතක් කරන්නෙ නැහැ!..``

ඕනුගේ කතාවට බාධා කරමින් තව`කෙත් කෑගැසිය:

``කතාව ඇත්ත! අපි ඔය වගෙ පණ්ඩිතයින්ට දැකල තියෙනව. ඩිපෝවට උදවු කරනව කියල බොරු සෝෂාවක් කරල ප්‍රසාද මුදලක් ලබා ගැනීමයි එයාගෙ අදහස... ඔව්, වැඩේ හරිගියේ නැහැ!``

රැස්වූවෝ වාද විවාද කළහ. දොර ළඟ සිටගෙන ඔවුන්ගේ කතාවට සවන් නොදී මම පිටත ගියෙමි.

මා පිටුපසින් එන අයගේ කට හඬ ඇසුණෙත් මම ඉක්මනින් ගමන් කළෙමි. රැස්වීම අවසන් වුවද, මිනිස්සු උණුසුම් ලෙස විවාද කළහ. අලිමෙත් කතා කරන සැටි මට ඇසිණි. ඔහු කෙනෙකුට තම මතය ඔප්පු කිරීමට කරුණු ඉදිරිපත් කළේය.

``පිටුපසින් ඇදන රියවලට අපි බරේක් (රෝධක) හදන්ට ඕන. ඒක අපට ගරාජයේදි කරන්ට පුළුවනි. ඒයි ඉල්යාස් ඒ නුඹද? ඉල්යාස්, ඉල්යාස්`` යැයි කියමින් මා දුටු අලිබෙක් කෑගැසිය.

ඔහු දුවැවින් මගේ උරහිසින් අල්ලා ගත්තේ, ඔහුගේ හඩගෑම් ගණන් නොගනිමින් මා ගරාජය දෙසට යන විටය.

``නුඹ හරි යකෙක් නෙව. මේ අහපන් මම නුඹේ මතය නිවැරදි බව ඔප්පු කළා. ඉල්යාස් නුඹ වරෙන් මා සමග එක තඩයට. එනවද? ඇදපු රියකුත් සමග පළමුවැනි ධාවනය පරීක්ෂා කර බැලීමට!``

මම කෝපවීමි. අවාසනාවන් මා බේරා ගැනීමට ඉදිරිපත්වීම මගේ සිත නොගත්තේය. ඒයාගෙ තඩයට මා කැඳවනව! මගේ උරහිස මත තිබූ ඔහුගේ අත මම ඉවත් කළෙමි.

``නුඹ, නුඹගෙ ඇදපු රියත් සමග යකාට පලයන්.``

``මොකද නුඹට යකා වැහිලද? වැරදිකාරයා නුඹ බව නුඹම දන්නව... මට අමතක වුණා. වලෝද්කා පිර්යාගෙවි නුඹට කිවෙ නැතිද?``

``නැහැ. මට ඔහු මුණගැසුණෙ නැහැ. මොකක්ද?``

``මොකක්ද තමයි! නුඹ කොහෙද ගියෙ? අසේල් පාර අයිනෙ හිටගෙන හැම රියැදුරකුගෙන්ම නුඹ ගැන විපරම් කරනව. නුඹ හන්දා කනගාටු වෙනව! නුඹ!..``

මගේ දෙපා පණ නැතිව ගියාක් මෙනි. මගේ ගාත සිත දෙකම මට විරුද්ධව නැගී සිටියි. සැනෙකින් සිය දිවි හානි කරගැනීම යෙහෙකැයි මට සිතිණි: එහෙත් අලිබෙක් මගේ උරහිසින් අදිමින් ඇදන රිය ගැනත්, එයට සවිකරන රෝධක ගැනත් දිගු විස්තරයක් කළේය... ජන්නායි අයිනකට වී අපේ කතාවට සවන් දී සිටියේය.

``පලයන්! අසවල් දේකටද නුඹ මගේ ඇහේ එල්ලෙන්ට එන්නෙ? පලයන්! මට ඕන ඇති රියක් නැහැ. කිසිවකු සමග එක්වී රිය පැදවීමට මම කැමති නැහැ. නුඹට පැහැදිලිද?``

තදින් දත් සපාගත් අලිබෙක් ඇඩීලෙස මෙසේ පැවසිය:

``නුඹයි මේ වැඩේ පටන් ගත්තෙ. දැන් නුඹ පැනල දුවන්ට හදනව.``

``නුඹට ඕන විදියකට බාර ගනින්`` යැයි මම කිව්වෙමි.

ලොරියට නැග රියැදුරු අසුනෙහි වාඩිවුණද දැන් වේලන්නට විය. පසුව ලොරිය අළුත් වැඩියා කරන වළකට බැස එහි වූ ගඩොල් කැටයකට හිස තබා ගත්තෙමි.

``ඉල්යාස් මේ අහපන්!`` යැයි කිසිවෙක් කියන හඬක් ඇසිණි.

මේවර මට කතා කරන්නේ කවුද? මම හිස ඔසවා බැලීමි. රතු හිවල් සමෙන් කළ හිම තොප්පිය පැළඳගෙන සිටි ජන්නායිගේ මුහුණ මම

දුටිමි. මා සිටි වල අසල ඔහු උත්කූටිකමයෙන් සිටියේ ගෙම්බෙකු මෙනි. ඔහුගේ පුංචි ඇස් කපටිකමින් දිලිසිණි.

``නුඹ එයාට සැගෙන්ට දුන්නා, ඉල්යාස්!``

``කාටද?``

``අලිබෙක්ට. ක්‍රියාශීලියාට!.. එයාගෙ දතකට කළු ගලක් හැප්පුණා වගෙ වුණා. අලුත් ක්‍රම සොයන්නාට උත්තර නැතිව ගියා.``

``ඒක නුඹට අයිති වැඩක් නොවෙයි.``

``කාටද අයිති නැත්තෙ. අපටද? අප වැනි රියැදුරන්ටද අයිති නැත්තෙ? තව රියක් ඇදාගෙන දුවන්ට බැහැ. මා වගේම නුඹ ඒ ගැන හොඳට දන්නව. ඒක මිනිහෙක් බඩු විශාල තොගයක් පටවාගෙන අඩු කාලයක් තුළදී ඔය ගමන යනව. පස්සෙ හැම කෙනෙක්ම ඒ විධියට කරන්න ඕන. දුර හා බරප්‍රමාණය අනුව ගෙවන මුදල අඩුකරාවී. ඉතින් මොකටද අපි අපටම හතුරෝ වෙන්නෙ. ඔය කීර්තිය එක දවසකදි ඉවර වේවි. ඊට පස්සේ? නුඹ කළ වැඩේ හන්දා අපි අමනාප නැහැ. නුඹ ඔය විධියට වැඩ කරපන්...``

``කවුද ඔය අපි?`` මා මෙසේ ඇසුවේ හැකි තරම් සන්සුන් වීමෙනි. ``අපි කියන්නෙ නුඹට විතරක්ද?``

``මම විතරක් නෙවි``යි ජන්තායි ඇසක් අඩවන් කොට ඉගි මැරීය.

``නුඹ බොරු කියනවා. කපටි හිවලා! නුඹව කෝන්ති ගැන්වීමට මම ආයෙමත් තවත් රියක් ඇදාගෙන කඳුමග දිගේ යනව. මම මලත් එය කරනවමයි. දැන් හොඳ ගිහින් මෙතැනින් පලයන් නැතිනම් නුඹට ගුටි කන්ට සිදුවේවි``යි කෝපවූ මම කීවෙමි.

``ජයි, ඕනනැති දේ වලට ඉදිරිපත් වන්ට එපා`` යැයි ජන්තායි මට හරස් කපමින් කීවේය. ``නුඹ හරිම ශුද්ධවන්තයා බව මම දන්නව. අර උන්දැ ඉඩමදන තුරු සන්තෝෂ වෙයන්...``

ඔහුට ශාප කළ මම ඔහුගේ හනුවට වැරෙන් පහරක් ගැසීමි.

ඔහු බිම පෙරළිණි. ඔහුගේ හිම තොප්පිය පෙරළී ඈතට විසිවිණි. මම වලෙන් ගොඩ විත් නැවත ඔහුට පහර දීමට ඉදිරියට ගියෙමි. ජන්තායි ඉක්මනින් නැගිට සිට මහ හඬින් කෑගැසීය:

``මැරවරයා, වනචරයා මට ගහනවා! මට කළ දේ හන්දා නුඹට සිරගෙට යන්ට වේවි. නුඹගෙ කෝන්තිය නුඹ මා පිට යවන්ට හදනවා... නුඹ හිතනවද නුඹට බේරෙන්ට පුළුවන් කියල...``

හැම දෙසිනම මිනිස්සු දිව ආහ. අලිබෙක්ද පැමිණියේය.

``මොකද නුඹ ඒ මිනිහට ගහන්ට හේතුව?``

``ඇත්ත කියපු හන්දා!`` යැයි ජන්තායි කීවේය. ``ඔව්. එයාගෙ මූණටම මම ඇත්ත කී හන්දා. එයා ඇඳන රිය හොරකම් කරගෙන කඳුකරයේ අගලක විසි කළා. දැන් අවංක මිනිස්සු එයාගෙ වැරැද්ද නිවැරදි කරන්ට යනකොට ගහගන්ට එනව. එයාට ලැබෙන්ට තිබුණු කීර්තිය නැතිවුණු හන්දා, ලාබෙත් නැතිව ගියා`` යැයි ඔහු වැඩිදුරටත් කීවේය.

අලිබෙක් මා වෙත ආවේය. නිමිහිම් නැති කෝපය නිසා ඔහු ගොත ගසන්ට විය:

``නුඹ නිවයෙක්!`` යැයි කියමින් මා පසකට තල්ලු කර දැමූ අලිබෙක් මෙසේද කීය: ``නුඹේ වැරදිවලට නුඹ අපෙන් පළිගන්ට හදනවද! නුඹ නැතුවට අපට මේ වැඩේ කරන්ට පුළුවනි. ඔව්, වීරයො නැතුව!..``

මම නිහඬවීමි. යමක් කීමට තරම් ශක්තියක් මා තුළ නොතිබිණි. ජන්තායි කී අමූලික බොරුව නිසා අන්දමන්ද වූ මා ගොළුවිය. රුස්වූ අය මා දෙසරවා බැලූහ.

පැන යා යුතුය. මෙතැනින් ඉක්මනින් පැන යා යුතුය.... මම ලොරියට නැග වේගයෙන් එය පැදවීමි.

අතරමගදී මම මත්පැන් පානය කළෙමි. පාර අයිනේ කඩයකට ඇතුළු වී මත්පැන් වීදුරුවක් පානය කළද, එයින් සෑහීමට පත් නොවූයෙන් ඊළඟ කඩයට ගොස් නැවත වීදුරුවක් පුරා වොඩ්කා බීවෙමි. ඉන් පසු පාලම්, මහා මාර්ග, සංඥා පුවරු සහ මා පසුකර යන මෝටෝ රථ හැර අන් කිසිවක් නොදිටිමි. මා සිත සතුටු වූවාක් මෙනි: ``වෙන දෙයක් වුණාවෙ. ලොරිය පදවන කල් ඔහෙ පදවපන්. කදිචා ගැන... ඈ අනිත් අයට වඩා නරක නැහැ. කදිචා තරුණයි, ලස්සනයි. මට ආදරය කරනව. පණ වුණත් දීමට ඈ සූදානම්... නුඹ හරිම උද්දච්ච මෝඩයෙක්.``

රෑ බෝවී මම ගෙදර පැමිණියෙමි. වෙරිමතින් වැනෙමින් දොර අසලට පැමිණියේ ආයාසයෙනි. දකුණත හිම කබායෙන් නිදහස්ව තිබෙන විට ලොරිය පැදවීම ලෙහෙසි නිසාදෝ , මා එය ඇඳ සිටියේ වම් අත සහ වම් උරය වැසෙන සේ පමණකි.

අසේල් හනික මා වෙත ආවාය.

``ඉල්යාස් ඔයාට මක්වෙලාද?`` මා මත්පැන් බී සිටින බව ඈ දැනගත්තා විය හැක. ``ඇයි ඔයා ඔතන හිටගෙන ඉන්නෙ? මහන්සිද? ශීතලද? ඇඳුම් ලිහා විවේක ගන්නැ``යි අසේල් වැඩිදුරටත් කීවාය.

ඈ මට උදව්වීමට ඉදිරියට ආ විට, මම ඇය තල්ලු කර දැමීමි. මගේ හැසිරීම නිසා ලජ්ජා වූ මම එය සැඟවීම් වස් අශික්ෂිත ලෙස හැසුරුණෙමි. වැනි වැනි කාමරය හරහා ගිය මම හඬක් නගමින් පුටුවක් වැනි යමකට පාත්වුණෙමි.

``මොනව හරි විපැත්තියක් වුණාද, ඉල්යාස්!`` මා දෙස බැලූ අසේල් ඇසුවාය.

``හරියට ඔයා දන්නෙ නැතුව වගෙ`` මෙසේ කී මට ඇගේ මුහුණ දෙස බැලීමට බැරිවූයෙන් මම හිස පහත් කර ගතිමි. ඈ දැන් දැන් මා වෙත තවා පැන මට බැණ වැදෙනු ඇතැයි සිතූ මම එය බලාපොරොත්තුවෙන් සිටියෙමි. ඈ එසේ කලා නම්, මම විරුද්ධ නොවෙමි. අසේල් ගෙදර නොසිටින්නාක් මෙන් නිහඬව සිටියාය. මම ඈ දෙස බැලීමි. ඈ මට පිටු පා ජනේලය අසල සිටගෙන සිටියාය., ඈ කඳුළු වගුරවමින් අඬන බව ඇගේ මුහුණ දෙස නොබලාම වටහා ගැනීමසට මට හැකිවිය. මගේ හදවත වේදනාවෙන් කකියන්නට විය.

``අසේල් ඔයාට මම යමක් කියන්ට කැමතියි`` අස්ථිර ලෙස මා එසේ කතාව පටන් ගත්තද කිවයුතු දේ කීමට නොහැකි විය. ``මම කැමතියි...`` මම නිහඬ වීමි. කල වරද පිළිගැනීමට තරම් ආත්ම ශක්තියක් මට නොතිබිණි. ඇගේ සිත කම්පනය කිරීමට මට බැරිය. නොකල යුතු දෙයක් මම කළෙමි. ``ඔයාගෙ දෙමාපියන් බැලීමට ඉක්මනින් යන්ට අපට ලැබෙන්නෙ නැහැ`` යි කී මම කතාව වෙනත් අතකට හැරවීමි. ``ඒ ගමන තව ටික කලකට පමා කරමු. දැන් එයට සූදානම් වීමට ඉඩ පහසුවක් නැහැ.``

``හදිසියක් නැහැ. අපට පසුව යන්ට පුළුවනි`` අසේල් එකඟ වූවාය. කඳුළු පිසදමා ගනිමින් මා ළඟට පැමිණි අසේල් මෙසේ කීවාය: ``ඒවා ගැන දැන් කලබල වෙන්ට එපා. ඉල්යාස්! හැම දෙයක්ම හොඳට සිදුවේවි. ඔයා, ඔයාගැන බලන්න. ඔයා දැන් හොඳටම වෙනස් වෙලා. ඉල්යාස්, මට ඔයාව හඳුනා ගන්නවත් බැහැ...``

``මදෑ කිව්වා!`` මෙසේ කී මම බියගුළු කම සඟවා ගැනීමට වෑයම් කළෙමි. ``මට මහන්සියි, නිදි මතයි.``

ඊට දෙදවසකට පසු ඩිපෝව බලා ලොරිය පදවමින් සිටි මට දුර්ග මාර්ගයේ එහා පැත්තේදී අලිබෙක් හමුවිය. ඇඳනු ලැබූ රියක් සමග ඔහු ඩොලොන්ස්ක් කඳු තරය හා දුර්ග මාර්ගය ගෙවා තිබිණි.

ඔහු මා දිටිය. තම ලොරිය නැවැත්වීමටත් පෙර දොර හැර මා දෙස බලා අතක් වනමින් ඔහු කෑගැසිය. මම වේගය අඩු කළෙමි. ඔහු පාර මැදට විත් නැවතුණේය. ශේ ප්‍රීතියෙනි, ප්‍රමෝදයෙනි.

``ආයුබෝවන්, ඉල්යාස්. එළියට වරෙන් දුමක් ඇදල කතාකරමු`` යි අලිබෙක් පැවසිය.

මම ලොරිය නැවැත්වීමි. අලිබෙක් අසල තරුණයෙක් වාඩිවී සිටියේය. ඔහු දෙවැනි රියැදුරු තැනය. ඇඳනු ලැබූ රියට රෝධක සහ

එහි පිටුපස රෝදවලට දම්වැල්ද දමා තිබිණි. එය එතරම් දුටු මම රිය නොනැවැත්වීමි. නුඹ ඩොලොන්ස්ක් කඳුකරය පසු කළා. බොහොම හොඳයි! එහෙත් මා අත හැරපන්.

''නැවතියන්, නැවතියන්!'' යැයි කී අලිබෙක් මා ලුහු බඳින්නට විය. ''නුඹ සමග වැදගත් තරුණක් ගැන කතා කරන්ට තියෙනව. නැවතියන් ඉල්යාස්! ලොරිය නවත්වාපන් මිනිහෝ. මේ යන්නෙ කොහිද? හොඳා නවත්වාපන්...''

මම වේගයෙන් ලොරිය පදවමින් ඉවත ගියෙමි. නුඹටයි මටයි පොදුවේ ඇති වැඩක් නැහැ. මගේ වැයම අසාර්ථක වුණා.

එදා මා හැසුරුණු හැටි වැරදියි. මගේ ඉතා හොඳ මිතුරාවූ අලිබෙක් මට නැතිවිය. එදා ඔහු ගත් මග නිවැරදි විය. ඔහු හැම අතින්ම නිවැරදි ලෙස ක්‍රියා කළ බව මට වැටහුණේ පසුවය. මා බොහෝසේ වෙහෙස මහන්සිවී කළ දේ අසාර්ථක වූ අතර අලිබෙක් එය ඉතා ලෙහෙසියෙන් හා වැඩි වෙහෙසක් නැතිව සාර්ථක ලෙස ඉටුකිරීම නිසා මා තුළ අසාධාරණ ඊර්ෂ්‍යාවක් හට ගත්තේය.

අලිබෙක් නොයෙක් දේ ගැන හොඳහැටි කල්පනා කොට බැරෑරුම් ලෙස ක්‍රියා කරන පුද්ගලයෙක් විය. ඵල විපාක ගැන කල්පනා නොකොට හිතු මතය අනුව වහාම ක්‍රියා කරන මා වැන්නකු නොවිය, අලිබෙක්. ඇඳනු ලැබූ රියත් සමග බඩු පටවාගෙන යනවිට තවත් රියැදුරෙක් සමග යාමෙන් ඔහු කළේ නුවණැති වැඩකි. මාරුවෙන් මාරුවට රිය පදවමින්, දුර්ග මාර්ග හා වංක ගිරිවලදී නොවෙහෙසී වැඩ කිරීමට ඔහු මෙලෙස මග පාදා ගත්තේය. අසිරු කඳුකරයේදී හැම දෙයක්ම තීරණය කරන්නේ ඇන්ජිම, රියැදුරාගේ ආත්ම ශක්තිය හා ශරීර ශක්තියයි. අලිබෙක් තවත් රියැදුරෙක් සමග ගමනාරම්භ කිරීම නිසා ධාවන කාලයද දෙගුණයකින් අඩුවිය. මේ හැම දෙයක් ගැනම කල්පනා කළ අලිබෙක් ඇඳන රියට වුවමනා රෝධක හා සම්පීඩකද සවි කළේය. ඇඳන රියේ පිටුපස රෝදවලට සාමාන්‍ය දම්වැල් දැමීමටද ඔහු අමතක නොකළේය. කඳුකරයේ දුර්ග මාර්ගය හා වංක ගිරියට එදිරිව අලිබෙක් සටන් කළේ යුද්ධයෙහි කෙළ පැමිණි සෙනෙවියකු මෙනි.

අලිබෙක් මේ ගමන සාර්ථක ලෙස නිම කළ පසු , තවත් බොහෝ දෙනෙක් ඔහු අනුගමනය කළහ. හැම දෙයකම ප්‍රධාන අසිරුව ආරම්භයයි. මේ අතර බඩු පටවාගෙන යාම සඳහා නව තවත් ලොරි හා රථ අසල්වැසි ඩිපෝවලින් එවන ලදි. දවස් දහයක් තිස්සේ දිවා රෑ නොනතා ත්‍යාන්-ෂාන් කඳුකර මාර්ගයේ වැල නොකැඩී ගිය රථ නිසා ඇතිවූ ඝෝෂාව නොනැවතිණි. අමාරුකම් නොතෙක් තිබුණද, විත කම්කරුවන්ගේ ඉල්ලීම

පරිදි වෙහෙස නොබලා වැඩකළ රියැදුරු පිරිස නියමිත කාලයට සියලු උපකරණ හා යන්ත්‍ර සූත්‍ර විනයට ගෙන ගොස් භාර දීමට සමත් විය. මේ මාර්ගයෙහි මමද වැඩ කළෙමි...

මේ ගැන දැන් මා සන්සුන්ව කියන්නේ එය සිදුවී අවුරුදු කීපයක් ගතවුණු බැවිනි. එහෙත් ඒ දවස්වලදී මම අමනාපයකින් හා කෝපයෙන් සිටියෙමි. තමුන් අශ්වයා හැරුණේ වැරදි පැත්තට. මා පාලනය කරගැනීමට මා අපොහොසත් වූ බැවින් මගේ ජීවිතය වෙනස් විය...

මගේ කතාව මම නැවත පටන් ගන්නෙමි.

අලිබෙත් හමුවීමෙන් පසු මම ඩිපෝවට පැමිණියෙමි. ඇඳිරිවැටී තිබිණි. නේවාසිකාගාරයට යමින් සිටි මට අවන් හලට ගොස් මත්පැන් බීමට සිත්විණි. සිහිසන් නැති වන තෙක් මත්පැන් බීමට ආශාවක් මා තුළ උපණි. හැම දෙයක්ම අමතක කර දමා මළාක් මෙන් නිදාගැනීමට මට උවමනා විය. මා බොහෝසේ වෙහෙසකා බිව්වද මගේ ගත සිත නැලවීමට එය අපොසත් වුයෙන්, මගේ කෝන්තිය තවත් වැඩිවිය. රෑ වන තුරු නගරයේ හැම තැනම ඇවිද නොසිතාම බෙරෝගොවායා වීදියට වින් කදිචාගේ නිවසට ඇතුළු විමි,

ජීවිතයේ නව පිටුවක් පෙරළිණි. යකුටත් නිරයටත් මැදිවූ ජීවිතයක් ගත කරන්නට විමි. දිවා කාලයේදී රිය පදවන මම හවස් වූ විට කදිචා වෙත ගියෙමි. ඇ සමග සිටින විට මට පහසුවක් දැනිණි. මා මගෙන්ද, මිනිසුන්ගෙන්ද, සත්‍යයෙන්ද සැඟවීම පිණිස කදිචාගේ පිහිට පැතුවෙමි. මා තේරුම් ගෙන මට ආලය කරන්නේ කදිචා පමණකැයි මට සිතිණි. ගෙදර නැවතී සිටීමේ කාලය අඩු කළ මම ඉක්මනින් ඉන් පිටව යාමට නිතර උත්සාහ කළෙමි. අසේල් තම පවිත්‍ර බවින් හා අවංක බවින් මා ගෙදරින් පන්නා දමන බව නොදැන සිටියාය. අසේල්, මගේ පෙම්බර අසේල්! ඇය පැතීමට තරම් මා සුදුස්සකු නොවන බව දැනසිටි මම ඇය දෙස බැලීමට පවා බියවිමි. ඇ මට කළ සේවයට මා සුදුස්සකු නොවිමි. තිප වරක්ම මත්පැන් බී වෙරිවූ පසු මම ගෙදර පැමිණියෙමි. ඇ මට මුවින් නොබැන්නාය. ඇගේ හැසිරීම දැනුදු මට ප්‍රහේලිකාවකි. ඇ එසේ හැසුරුණේ ඇ මට අනුකම්පා කළ නිසාද නැතිනම් ඇගේ බියසුලු ගති නිසාද? එසේත් නැති නම් ඇගේ ආත්ම ශක්තිය හා මිනිසකු කෙරෙහි ඇති විශ්වාසය නිසාද? මගේ දුබල කම් මැඩ මා නැගිට පෙර මෙන් යහපත් වනු ඇතැයි අසේල් විශ්වාස කළාය. ඇ මට බැණ වැදී පාපොච්චාරනයක් කරන ලෙස බල කළා නම්, තත්ත්වය යහපත්වීමට ඉඩ තිබිණි. මගේ රැකියාව කිසිදු සම්බන්ධකමක් නැති වෙනත් කරදරවලට මා මුණ පා සිටින බව ඇ නොදැන සිටියා විය හැකිය. ඒ දවස්වල මගේ අධ්‍යාත්මික තත්ත්වය ගැන ඇ නොදැන

සිටියාය. සත්‍යය හෙළි කිරීමට බියවූ මම ඇට දැන්වීම දවසින් දවස කල් දැමීමි. ඇ වෙනුවෙන්, අපේ ආලය වෙනුවෙන්, අපේ පවුල වෙනුවෙන් මවිසින් කළයුතු දෙය ඉටුකිරීමට මට බැරිවිය...

අවසාන දවසේදී දොර ළඟදී මා හමුවූ අසේල් කැලඹීමෙන් හා ප්‍රීතියෙන් සිටියාය. ඇගේ මුහුණ රත් පැහැගෙන තිබිණි. දෙනෙත් දීප්තිමත් ලෙස බැබළිණි. හිම කබාය හා හිම පාවහන් ගලවා දැමීමටත් පෙර ඇ මා ඇදගෙන කාමරය තුළට ගියාය.

``ඉල්යාස්, මේ බලන්න, සමාට් දැන් දෙපා බිම ගසා නැගිට සිටිනවා!``

``ඇත්තද? පුතා කොහෙද?``

``අන්න මේසෙ යටට වෙලා ඉන්නව!``

``පුතා තවම දණගානවා`` මම කීවෙමි.

``ඔන්න බලන්නකෝ! පුතා නැගිටල පෙන්නනන්න තාත්තට කොහොමද පයින් යන්නෙ කියල! සාමට් පුතේ එන්න! එන්න!``

මවගේ ආයාචනය පුතුට තේරුණාක් මෙන් විය. ඔහු දණගාමින් සිනාසෙමින් මේසය යටින් පිටතට වී ඇද කකුලක් අල්ලා ගනිමින් නැගිට සිටියේය. කට පලල් කොට සිනාසෙමින් මඳ වේලාවක් සිටගෙන සිට සාමට් සිනහ මුහුණින්ම බිම ඇද වැටුණේය වහාම ඔහු වෙත ගිය මම ඔහු වඩාගෙන වැළඳ ගතිමි. ඔහු වෙතින් නික්මුණු ළදරු සුවඳ නිසා මට සතුටක් දැනිණි. අසේල් වෙතින් නික්මුණු ප්‍රියමනාප සුවඳට එය බෙහෙවින්ම සමාන විය.

``ඉල්යාස්, ඔයා පුතාව පොඩි කරාවි! ප්‍රවේසමින්!`` යැයි ඇ කීවාය. ``ඉතින් ඔයා මොනවද පුතා ගැන හිතන්නෙ`` මෙසේ ඇසූ ඇ දරුවා වඩා ගත්තාය. ``ඉක්මනින් මගේ පුතා ලොකු වේවි. එතකොට අම්මා රස්සාවට යනවා. හැම දෙයක්ම යසට සිදුවේවි. එහෙම නේද මගේ පුතේ? ආ මයා?..`` අසේල් මා දෙස බලන්නී, දුක්මුසු ලෙස සිනා සුණාය. මම පුටුවේ වාඩි වුණෙමි. ඇ පැවසූ ඒ කෙටි වචනයේ ඇය විසින් කිව යුතු හැම දෙයක්මත්, ඇගේ හදවත තුළ ගොඩගැසුණු හැම හැඟීමක්මත් ගැබ්වී තිබුණු බව මට වැටහිණි. ඒ වචනය ආයාචනයක් හා දොස්පැවරීමක් ද විය. එහි බලාපොරොත්තුව ගැබ්වී තිබිණි. දැන් මවිසින් හැම දෙයක්ම ඇය ඉදිරියේ නොවලහා කිව යුතුය. නැතිනම් ගෙදරින් වහාම පිටවී යා යුතුය. ගෙදරින් පිටවීම වඩාත් හොඳබව මට වැටහිණි. මගේ අමශෝභන චරිතය ගැන මඳකුදු සැක නොකරන අසේල් ප්‍රීතියෙනි, ඇගේ එම චිත්ත සන්තුෂ්ටියට මා බාධා නොකළ යුතුය. මම පුටුවෙන් නැගී සිටියෙමි.

``මම යන්නම්.``

''කොහෙ යනවද?'' යි ඇසූ අසේල් තැති ගත්තාය. ''ඔයා අද රෑට මෙහෙ නවතින්නෙ නැතිද? එහෙනම් තේ කෝප්පයක්වත් බීලා යන්ට.''

''බැහැ. වෙලාවක් නැහැ. ඔයා දන්නව නේද දැන් හදිසි වැඩක් අපට භාරකරල තියෙනව...'' මම පහත් හඬින් කීවෙමි.

මා කීවේ බොරුවකි. එදින රෑ වැඩ නොතිබිණි. මගේ ලොරියට බඩු පැටවිය යුත්තේ උදෑසනය.

ලොරියට නැග රියැදුරු අසුනෙහි වාඩි වූ මම දුකින් තැවෙමින් යතුර ගෙන ඇන්ජිම ක්‍රියාකරවූ නමුදු, බොහෝ වේලාවක් යන තුරු ලොරිය ක්‍රියාකාරී නොවිණි. ආලෝකයෙන් බබළන කවුළු සහිත මගේ නිවෙස නොපෙනී යන තුරු මම වේගයෙන් ලොරිය පදවන්නට වීමි. පාලම අසල තුරු බිලියකි. මහ පාරෙන් ලොරිය ඉවතට ගෙන තුරු බිලිය අසල වූ පඳුරක ලොරිය නැවැත්වූ මම එදින රැය එහි ගත කිරීමට තීරණය කළෙමි. සිගරැට් පැකැට්ටුව අතට ගෙන ගිනි පෙට්ටියද සොයා ගතිමි. ඉතිරිව ඇත්තේ එකම එක ගිනි කූරකි. සිගරැට්ටුවක් දල්වා ගැනීමට පෙර ගිනිකූර නිවී ගියෙන්, සිගරැට් පැකැට්ටුවත්, හිස් ගිනි පෙට්ටියත් දෙකම ජනේලයෙන් පිටතට වීසිකොට, සම්කබාය පොරවාගෙන රියැදුරු අසුන මත වැතිර නිදාගතිමි.

ඈත කඳු වැටිවලට උඩින් සඳ පායා ඇත. ශීතල රැයෙහි සඳ බුම්මාගත්තාක් මෙනි. වේගයෙන් හැමූ ශීත සුළං පහර විලාප ගසන හූ හඩක් නගමින් ලොරියේ දොරක්ද ඇඩවිය. මිනිසුන්ගෙන් හා මිතුරන්ගෙන් කොන්වී, බිරිඳ හා පුතුගෙන් වෙන්වී සිටි මට මෙතරම් දැඩි පාළුව ගතියක් හා කාන්සියක් මින් පෙර නොදැනිණි. මෙවැනි ජීවිතයක් තවත් දුදුර ගතකල නොහැකි බව මට වැටහිණ. පසුදින ඩිපෝවට ගිය විගසම කදිචා හමුවී, සියලු දේ ඇට විස්තර කොට, ඇගෙන් සමාව ලබාගෙන අප අතර ඇතිවූ සබඳකම් නවත්වා දැමීමට මම තීරණය කළෙමි. අවංක හා නිවැරදි මග එයයි.

එහෙත් ඉරණම එසේ නොවීය. මා නොසිතූ විරූ ලෙස ජීවිතය වෙනස් වන සිද්ධීන් ඇති විය. පසුදින මා ගෙදර පැමිණි විට එහි කිසිවෙක් නොවීය. ගෙයි දොර හැර තිබිණි. අසේල් වතුර හෝ දර හෝ ගෙනෙන පිණිස පිටත ගොස් ඇතැයි පළමුව මම සිතිමි. වට පිට පරීක්සිමි. කාමරය තුළ අවුල් ජාලයකි. පාළු, අමිහිරි ශීත ගතියක් දැනිණි. සාමටගේ ඇඳ දෙස බැලීමි. එයද හිස්ය.

''අසේල්!'' යැයි මා හඬගෑවේ බියවූවකු මෙනි. ගෙයි බිත්තිද ''අසේල්!'' යන හඬින් මට පිළිතුරු දුනි.

මම වහාම ගෙවත්ත දෙසට දුවගියෙමි.

``අසේල්!``

කිසිවෙක් පිළිතුරු නොදුන්හ. අසල්වැසියන්ගෙන් ඇසීමි. පසුව බණිජ තෙල් විකුණන ස්ථානයෙන් විපරම් කළෙමි. අසේල් පිළිබඳ තොරතුරු හරිහැටි කීමට ඔවුනු අපොහොසත් වූහ. දරුවා අසල් වැසි ගෙදරක තබා අසේල් කොහේදෝ ගොස් සවස් වී ගෙදර පැමිණි බව සමහරු කීහ. ``මා කළ වරද දැනගත් ඈ මා අතහැර ගොසිනි`` යි අවබෝධ කර ගත් මම බිය වුණෙමි.

තෑාත් ඝාත් කඳු මග ඔස්සේ එතරම් වේගයෙන් රිය පැදවූ දවසක් මට මතක නැත. වංගුවෙන් හැරෙමින් යන අසේල් මේ දැන්,දැන් මට හමුවෙතැයි යන හැඟීමෙන් මම තවත් වේගය වැඩි කළෙමි. දුර්ග මාර්ගය ඔස්සේ ගමන් ගත් ඇය දැන් දැන් මට පෙනෙතියි මම සිතමින් රිය පැදවීමි. මා ඉදිරියෙන් ගිය ලොරි වෙත මා ළඟාවූයේ රාජලියෙකු මෙනි. ඒවාට හොඳටම ළංවී, ඒවා තුළ වාඩි වී සිටියවුන් දෙස මම බැලීමි. අනිකුත් රියැදුරන්ගේ බැණුම් හා සාපකිරීම් නොතකා මම නැවත වේගය වැඩිකරමින් එය පැදවීමි. පැය තුනක් පමණ වේලා මහත් වේගයකින් රිය පැදවූ මම, රේඩියේටරයේ වතුර උතුරන්නට පටන්ගෙන ඇති බව දැන ගත්තෙමි. රිය පැදවීම නතර කළෙමි. හිම කැට රේඩියෙටරයට දමා නැවත රිය පැදවූ මම ජලය සොයා ගියෙමි. රේඩියේටරයෙන් වාෂ්ප පිටවෙන්නට විය. ධාවන අසෙකු හති දමන කලෙක මෙනි. ටික වේලාවක් රිය නවත්වා නැවත රිය පැදවීමට සූදානම් වනවිට, අමතර රියක් ඇදා ගත් අලිබෙක්ගේ ලොරිය එන සැටි දුටිමි. මම සතුටු වුණෙමි. අප දෙදෙනා අතර කතා බහ කිරීම පවා නැවතී ඇතද, අසේල් අලිබෙක්ලාගේ ගෙදර නැවතී සිටිනම්, ඔහු ඒ පුවත මට දන්වනු ඇත. මම පාර මැද සිටගෙන අතක් දිගු කොට සංඥා කළෙමි.

`නැවතියන් අලිබෙක්,නැවතියන්!``

අලිබෙක්ගේ ගෝලයා රිය පදවමින් පැණයත් අසන්නාක් මෙන් ඔහු දෙස බැලීය. බුම්මාගත් අලිබෙක් අතක් වනමින් අහක බැලීය. ඔවුන්ගේ ලොරිය මා පසු කොට ගියේය. මගේ හිස සිට දෙපතුළ දක්වා හිමෙන් හා දූලිවලින් වැසී ගියද, මම අතක් ඔසවාගත් ගමන්, ගල් රුවක් මෙන් එලෙසම සිටියෙමි. දූලි සහිත හිම කැටිවලින් වැසුණු මුහුණ පිස දැමුවෙමි. මා කළ දේ මට පලදී ඇත. අමනාපය ගැන සිතීමට තරම් වෙලාවක් නොවෙයි මේ. අසේල් ඔහුගේ ගෙදර නවාතැන් ගෙන නැත. එය වඩාත් අයහපත්ය. ඈ තම දෙමාපියන් සොයා අයිලයට ගියා විය යුතුය. වෙන කොහේ යන්ටද? ඈ දෙමාපියන් සොයා ගොස් තිබේ මොනවාද? කනගාටුදායක ලෙස ඈ

නැවත ගෙදර පැමිණීම ගැන ඇගේ දෙමාපියෝ මොනවා කීවාහුද? ස්වාමි පුරුෂයා නැතිව අත දරුවාත් සමග ඔවුන් වෙත යාම තින්දාවකි.

වහාම අයිලයට යා යුතුය.

පටවාගෙන ආ බඩු බෑ පසු ලොරිය පාර අයිතේ නවතා කුචිතාන්සි පත් භාර දීමට ඩිපෝවට ගියෙමි. එහිදී මට ජන්තායි හමුවිය. ඔහු මා දෙස බලා නපුරු ලෙස හා උපහාසාත්මක ලෙස සිනාසුණේය.

කුචිතාන්සි හා කඩදාසි කදිචා වෙතට ජනේලයෙන් මා දිගු කරත්ම ඇ මා දෙස අමුතු ලෙස බැලිය.

වරදක් කළ එකියකගේ විලාසයකිනි, ඇ මා දෙස නෙත් යොමු කළේ.

``ඉක්මනින් භාර ගන්න!`` මම කීවෙමි.

``මොනව හරි සිදුවුණාද?

``අසේල් ගෙදර නැහැ. ඇ ගිහිල්ලා!``

``ඔය ඇත්තද?`` මෙසේ ඇසූ කදිචා පුටුවෙන් නැගී සිට යටිතොල සපා ගනිමින් කතා කළාය. ``ඉල්යාස්, මට සමාවෙයන්, සමාවෙයන්. එය කළේ මම, මම...`` ඇ සුසුම්ලිය.

``මම්? මොකද? සිදුවුණු දේ විස්තර කරන්නැ``යි කී මම දොර හැර ගෙන කාර්යාල කාමරයට ඇතුළු වුණෙමි.

``මොනවා වුණාදැයි මම ම දන්නේ නැහැ. ඉල්යාස් මම ඔයාට කියන්නෙ ඇත්ත. ඊයේ මගේ ජනේලයට තට්ටු කළ මුරකාරයා කිව්ව මා හමුවෙන්ට තරුණියක් ඇවිත් ඉන්නවයි කියල. මම දැනගත්තා ඒ අසේල් බව. අසේල් නිහඬව මා දෙස බලා 'ඒක ඇත්තද?' කියල ඇහුවා. මම කියන්නෙ මොනවද කියල මටම අමතක වුණා. 'ඔව්. ඇත්ත. සම්පූර්ණ ඇත්ත. එයා මා සමග තමා!' අසේල් ජනේලයෙන් ඉවතට ගියා. මම මෙිසෙ මත වැතිරගෙන සුසුම්ලමින් අඬන්ට පටන් ගත්තා. වැදගැම්මකට නැති මෝඩ ගැහැනියක් වගෙ. 'ඉල්යාස් මගේ. මගේ!' ඊට පස්සෙ මා ඇයව දැක්කේ නැහැ... ඉල්යාස් මට සමා වෙන්න!``

``අසේල් කොහොමද මේ ගැන දැනගත්තෙ?``

``ඒ වැඩේ කළේ ජන්තායි. එයා මට තර්ජන කළා. ඔයා දන්නේ නැතිද ඌ නීචයෙක් බව. මම මීට පස්සෙ තුඹිලට බාධා කරන්නෙ නැහැ. ඔයා ගිහිල්ලා අසේල්ව සොයා ගන්න. මම වෙනත් පළාතකට යනව...`` යැයි කදිචා කීවාය.

හිම මිදි ස්ටෙප්ස් බිම හරහා මම රිය ධාවනය කළෙමි. අධික ශීතට හසුවූ මහ පොළොව නිල් පැහැති හිමෙන් වැසී ඇත. දැඩි සුළං පහරට අසුවන වියලි හිම පියලි පාවෙන්නට විය. දැඩි හිම පතනයට ඔරොත්තු

දි සිටින මැටි ගෙවල්ද කොල රහිත අතු විදහා ගත් ගස් හා පැළැටිද පෙනිණි.

හවස්වන විට අසේල්ගේ දෙමාපියන් පදිංචිව සිටි අයිලයට පැමිණියෙමි. ඔවුන්ගේ ගෙය අසල ලොරිය නැවැත්වූ මම සන්සුන්වීම් වස් සිගරැට්ටුවක් දල්වා ගෙන කිපවරක්ම එය උරා බී, ලොරියේ තලා හැඩවීමි. ගෙදරින් එලියට ආවේ අසේල් නොව ඇගේ මවය. ඇ හිම කබායක් පොරවා ගෙන සිටියාය. ලොරියේ පා පුවරුව මත නැගී සිටගත් මම නොඋස් හඬකින් ඇට ආචාර කෙළෙමි:

"ආයුබෝවන් ආපා (අම්මා)!"

"ආ නුඹද ආවෙ?" මෙසේ කී අසේල්ගේ මව තර්ජනාත්මක ලෙස මට බැණ වැදුණාය: "ඇ බොල තෝ අපට මෙච්චර හතුරුකම් කරල දැන් මට ආපා කියනවද? මගෙ දැසට නොපෙනී මකබැවෙලා පල! රස්තියාදුකාරයා! කාලකණ්ණියා! තෝ මගෙ අසරණ කෙල්ලව දූෂණය කලා. දැන් එනව නැකම් කියන්ට. ලජ්ජා නැති නිවයා! තෝ අපෙ ජීවිත විනාශ කලා!.."

මැහැල්ල මට කට ඇරීමට පවා ඉඩ නොදෙමින් දොස් පැවරුවාය. ඇ දන්නා තිත්ත කුණුසරුප වලින් මට බැණ වදිමින් බෙරි හත් දෙන්නට වූයෙන් අසල් වැසි ගෙවල්වල මිනිස්සු රැස්වෙන්නට වූහ.

"මම අසල්වසියන්ට අඬ ගහන්ට පෙර තෝ මෙතැනින් පල යන්ට! තෝ යන තැන තොපට තෙණ වදිවි! මගෙ දැසට නොපෙනී මකබැවී පල!" කෝපවූ මැහැල්ල තම හිම කබාය ගළවා බිම දමා ෂා තල්ලු කලාය. ගල් කැට හා කෝටු කැලි මගේ ලොරියට එල්ලවිණි. අසල් වැසි ගෙවල්වල කොල්ලෝ මෙසේ ගල් මුල් වලින් හා කෝටු කැබලි වලින් සංග්‍රහ කරමින් මට ආයුබෝවන් කීහ.

ලොරියට නැග එය පැදවීම හැර අන් කිසිවක් මා ඉදිරියේ නොවීය. අසේල් මා හමුවීමට කැමැත්තක් නොදැක්වූ බැවින් පිටවියාමට මට සිදුවිය.

එදින රැයෙහි මම ඉස්සික්-කුල් වැව අසල ඇවිද්දෙමි. හඳපහනින් අලංකාරවී තිබුණු වැව නැලඹී තිබිණි. නිතර උණුසුම් වැවක්වූ ඉස්සික්-කුල් එදින රැයෙහි සතුරු ලීලාවෙකින් හැසුරුණේය. උඩු යටිකුරු කොට පෙරලා තිබුණු බෝට්ටුවක් මත මම වාඩිවුණෙමි. බුරමින් නැගී සිටි ශීත සුළං මට සහ මගේ පාවහන් වලට පහර දී පසුබැස ගියේය.

... අනතුරුව යම්කිසිවෙක් නිහඬව මා වෙතට ලංවී මුදුලෙස මගේ උරහිසට අත තැබිය. ඕ සාදිවාය.

ඊට දින කීපයකට පසු කදිවාත් මමත් ජරුන්සෙ නගරයට ගියෙමු. අනර්හායි ස්ටෙප්ස් බිම්වල සත්ව වගාව සඳහා තණබිම් ඇතිකිරීම පිරික්සා බලන විද්‍යා සේවක කණ්ඩායමකට එකතුව අපි එහි ගියෙමු. මම රියැදුරකු ලෙස සේවය කළෙමි. කදිවා කම්කරුවකු ලෙස වැඩ කළාය. අපේ නව ජීවිතය පටන් ගැනුණේ ඒ ආකාරයටය.

අපේ විද්‍යාසේවක පිරිස අනර්හායි ස්ටෙප්ස් බිම් ඔස්සේ ඈත යමින් බල්හාෂ් වැවට ළංවූහ. අතීතය අමතක කළ යුතු නම්, එහි බැමි සදහටම කඩා බිඳ දැමිය යුතුය.

මගේ දුක හා කාන්සිය අධික වැඩ තැමැති පර්වතයෙන් යටපත් කිරීමට වැර දැරීමි. මෙහි මා වැඩ කළ අවුරුදු තුනක් පමණ කාලය තුළදී අපි මේ ස්ටෙප්ස් බිම් හරහා යමින් ළිං හෑරුවෙමු, මහා මාර්ග තැනුවෙමු, අන්තර් මාර්ග වල ගබඩා ස්ථාන ඉදි කළෙමු. ඉස්සර අනර්හායි ස්ටෙප්ස් බිමට වැදෙන මිනිසකුට දවල් කාලයේදී වුව වල්මත් විය හැකිව තිබිණි. ඉමක් නැති ගස්, වැල් හා පඳුරුවලට වැදෙන මිනිහෙක් නැවත ගම්මානයක් හමුවන තුරු දවස් කීපයක් හෝ මාසයක් හෝ ඇවිද්ද යුතුය. එහෙත් අද අනර්හායි සතුන් ඇති කරන්නන්ගේ පාරාදීසයකි. එහි නවීන පන්නයට සැදූ ගෙවල් බොහොමයකි. සංස්කෘතික මධ්‍යස්ථාන කීපයකි. දැන් තිරිඟු, ඉරිඟු වැනි ධාන්‍ය වර්ග මෙහි ගොවිතැන් කරනු ලැබේ. පිදුරු ආදිය ගබඩා කරනු ලැබේ. රියැදුරන්ට මෙහි වැඩ බොහෝය. එහෙත් මම අනර්හායි අතහැර ගියෙමි. මෙහි වැඩ කිරීමට අපහසු වුවද, එහි අසතුටුදායක තත්ත්වයන් තිබුණද ඒවාට බිය නොවීමි. අමාරු හා අසීරුකම් වලට කදිවාත් මමත් බිය නොවීමු. අප දෙදෙනා එකිනෙකාට ගරු කළ නිසාත්, ඇලුම් කළ නිසාත් අපේ ජීවිතය අමිහිරි නොවීය. එකිනෙකාට ගරු කිරීමත් ආලය කිරීමත් අතර විශාල වෙනසක් ඇත. එසෙක් අනිකාට ආලය කළද, ඔහු පෙරළා ආලය නොකරන නිසා එම ජීවිතය සාර්ථක විය නොහැක. මිනිසාගේ හැටි එසේය. නැතිනම් මගේ චරිතය හැඩගැසී ඇති සැටි එසේ විය යුතුය. කිසියම් අඩුවක් මට නිතර දැනිණි. අධිකලෙස වැඩ කිරීමෙන් හෝ මිත්‍රත්වය නිසා හෝ ගැහැණියකගේ සැලකිල්ලෙන් හා ආදරයෙන් හෝ එම අඩුව නොපිරීමැසිනි. අසේල් නැවත දිනාගැනීම සඳහා තවත් වෑයමක් නොකර කදිවා සමග මෙහි පැමිණීමෙන් මා කළේ වරදකියි මට සිතිණි. පසුගිය හමස තුළදී අසේල් හා පුතු ගැන සිතමින් දුක්වූ වාර අපමණය. රාත්‍රී නිදාගැනීම අපහසු විය. සාමට්ගේ බෙළඳ ළමා සිනාවද, ඔහු දෙපා බිම ගසා නැගිට සිටින සැටිද මම සිහිනෙන් කීප වරක්ම දුටිමි. සාමට් ගේ සුමිහිරි සුගඳ මට දැනෙන්නාක් මෙනි. එය මට කිසි දිනෙක

අමතක කළ නොහැක. ත්‍යාන් ෂාන් කඳුවැටි දෙසට, මගේ සුන්දර ඉස්සික් කුල් වැව දෙසට, ස්ටෙප්ස් දෙසට යාමට මට සිත්විය. මගේ ජීවිතයේ පළමුවරට හා අන්තිම වරට සැබෑ, නියම ආලය මට මුණගැසුණේ එහිදීය. මගේ හැඟීම් කදිචා දැන සිටියද, ඈ මට විරුද්ධ නොවූවාය. අප දෙදෙනාට එකගෙයි ජීවිතය තවත් දුර ගෙනයාමට නොහැකි බව අපට අවබෝධ විය.

අනර්හායිවලට එම වසරේදී වසන්තය පැමිණියේ වෙනදාට වඩා කලින්. කඳු මුදුන්වල හිම දියවී ගියේය. ගස්වල කොළ දළු ලියලන්නට විය. හිරු රැස් හා තෙතමනය විසින් ස්ටෙප්ස් බිමට නව ජීවයක් ගෙන දුණි. රාත්‍රි කාලයේදී අහස පිරිසිදු වූයෙන් තරු බබලන සැටි දුටිමු.

ළිඳක් හාරන දොඹකරයක් අසල කුඩාරමක අපි නිදා සිටියෙමු. බොහෝ රාත්‍රිවල මෙන් එදිනද මට නින්දක් නොවිය. ඈත, බොහෝ ඈත දුම්රියක් හඬ නගන සැටි අවට නිසලතාවය හා අඳුර බිඳ මට ඇසිනි. ඒ හඬ මට ඇසුණේ කෙසේදැයි මම නොදනිමි. අප නැවතී සිටි කුඩාරමෙන් පැය දොළහක ගමනින් පසු මට දුම්රිය පළට ළඟාවිය හැකිබව දැනගතිමි. මෙය සමහර විට මගේ කල්පිතයක් විය හැක. මගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. වහාම පිටවී යනලෙස මගේ හදවත මට අණ කළේය.

``කදිචා, මම යනවා.''

``ඔව්. ඉල්යාස්, අපි වෙන්විය යුතුයි'' කදිචා කීවාය.

අපි වෙන්වීමු. උතුරු කසක්ස්ථානයේ නැවුම් බිම් බලා කදිචා පිටත්ව ගියාය.

කදිචාගේ අනාගත දිවිය වඩාත් සැපවත් වේවායි මම පැතිමි. ඇයට නොදැන ඇය සොයන මිනිසා කවදා හෝ ඈ හමුවෙතියි මම විශ්වාස කරමි. කදිචාගේ පළමුවැනි විවාහය ඇගේ බලාපොරොත්තු සුන් කළේය. මා නිසා ඇයට ප්‍රීතිමත් දිවියක් නොලැබිණි. නියම ආලය කුමක්ද, ආලය කිරීම හා ආලය කරනු ලැබීම කුමක්ද යන්න නොදැන සිටියේ නම් කදිචා සමග සදහටම ජීවත්වීමට මට ඉඩ තිබිණි. මෙය නොතරම් සංකීර්ණ ගැටළුවක්ද යත්, විස්තර කිරීම පවා අපහසුය.

මම කදිචා සමග දුම්රිය පොළට ගොස් ඇය හැරළුවෙමි. ඈ ගිය දුම්රිය වේගය වැඩි කරන තුරු දුවමින් ගිය මම ඈට සුබ පැතිමි. ``ආයුබෝවන් කදිචා! සුබ ගමන්. සුබ අනාගතයක්! මා ගැන නරක ලෙස හිතන්ට එපා!'' යැයි අවසාන වරට ඇය අමතා කීවෙමි.

වටුවෝ අනර්හායි සිට දකුණු දෙස බලා පියෑඹූහ. මම උතුරේ ත්‍යාන්ෂාන් කඳුකරයට ගියෙමි...

හැමටම පළමුව මා කළේ අසේල්ගේ දෙමාපියන් නැවති සිටි අයිලයට යාමය. අතරමගදී එම අයිලය දෙසට යන ලොරියකට නැග ගතිමි. ලොරියේ බඩු පටවන කොටසේ වාඩිවී සිටි මා තුළ එක්තරා බියක් හා කැලඹීමක්ද ඇතිවිය. පළමුවර මා අසේල් හමුවූ පාර ඔස්සේ ලොරිය ධාවනය විය. දැන් මෙහි පෙර මෙන් ගුරු පාරක් නොවිය. තාර දමා සාදන ලද එම පාරේ කොන්ක්‍රීට් සිමෙන්තියෙන් සෑදූ පාලම්ද, සංඥා පුවරුද විය. එහෙත් මගේ සුන්දර හැඟීම් සමග මුසුවී තිබුණු මහ නැතිවීම කණගාටුවට හේතු විය. වතුර පාර හරහා මා ලොරිය පැදවූ විට, එය පළමුවර එරුණු තැන අද සොයා ගැනීමට පවා බැරිය. මා එනතුරු අසේල් නැවති සිටි තැනද අතුරුදන් වී ඇත.

අයිලයට ළං වන තුරු බලා නොසිට මම රියැදුරු තැනට කතා කමෙලමි.

``මොකද කාරණය?'' රියැදුරා ඇසීය.

``මෙතන නවත්වන්න. මම බහිනව.''

``මෙතැන තණ පිට්යක්. මම එහා කොණට තමුසෙව ගෙනයන්නම්.''

``බොහොම ස්තූතියි! මම පයින් යන්නම්.'' මෙසේ කී මම ලොරියෙන් බැස රියැදුරාට මුදල් දුනිමි.

``සල්ලි තියාගන්නව. අපි රියැදුරන්ගෙන් මුදල් ගන්නෙ නැහැ'' යි කී ඔහු මා දෙස බැලීය.

``තමුසෙ කොහොමද මා රියැදුරෙක් බව දැනගත්තෙ?''

``තමුසෙගෙ මූහුණ දිහා බැලුවම කියන්ට පුළුවනි'' යි රියැදුරා පැවසීය.

``එහෙම වෙන්ට ඕන. සුබ ගමන්!'' යැයි මම ඔහුට කීවෙමි.

ලොරිය ගියද, මම මහ මග සිටගෙන සිතට ධෛර්‍යය උපදවා ගැනීමට තැත් කළෙමි. වෙවුලන අත්වලින් යුතුව සිගරැට්ටුවක් දල්වා ගතිමි. දුම් වැටි කීපයක් උරා සිගරැට් කොට පයකින් පාගා අසේල්ගේ දෙමාපියන් පදිංචි ගෙදර බලා ගියෙමි. මගේ හදවත කොතරම් වේගයකින් ගැහෙන්නට විදයත්, දෙකන්වල සෝෂාවක් ඇතිවිය. හිසට මිටියකින් ගසන්නාක් මෙනි.

අයිලය වෙනස් වෙලාය. උළු සෙවිලි කළ අළුත් ගෙවල් බොහොමයකි. මග දිගට විදුලිය කම්බි ඇද තිබිණි. සමූහ ගොවිපලේ කාර්යාලය අසල ශබ්ද වාහිණී යන්ත්‍රයක් සවිකර ඇත. ළමයි පාසැල් යමින් සිටියහ. ගුරුවරයකු කැටුව යන සිසු පිරිසක් යම්කිසිවක් ගැන උණුසුම් විවාද කරති. මීට කලකට පෙර මට ගල් කැට වලින් ගැසූ අය මොවුන් අතර සිටීත්ද? කාලය වේගයෙන් පියාඹයි. වේලාව නොනවතී.

මම ගමන් වේගය වැඩි කළෙමි. ගෙය වටා ඇති මැටි තාප්පය හා විලෝ ගස් ළං ළංව පෙනේ. මම නැවතී ආශ්වාස කළෙමි. මගේ හදද, ගතද ගැහෙන්නට වී. සැකයෙන් යුතුව මම මැටි තාප්පය දෙසට ගියෙමි. මා දොරට තට්ටු කරත්ම, දොර හැරගෙන කෙල්ලක් පැමිණියාය. ඈ අත පාසල් බෑගයකි. මීට අවුරුදු කීපයකට පෙර මට දිව දිගු කොට විසුළු කළ ජ් පුංචි දැරිය දැන් පාසල් සිසුවියකි. ඈ පාසල් යාම සඳහා සැරසී සූදානම් වූවාය. මා දෙස ඈ පුදුමයෙන් බලන්නී මෙසේ පැවසුවාය:

``ගෙදර කිසිවෙක් නැහැ.``

``කිසිවෙක් නැතිදැ?`` යි මම ඇසීමි.

``නැහැ. අපා (අම්මා) දැව දඩු සමූහ ගොවිපළට ගියා. තාත්තා ට්‍රැක්ටර් වලට වතුර දෙන්ට ගියා.``

``අසේල් කොහිද?`` මගේ තොල කට වේලී ගොසිනි.

``අසේල්ද?`` පුදුමවූ සිසුවිය මෙසේ කිවාය: ``අසේල් ගිහිල්ල, බොහෝ කාලයක් වෙනව.``

``එක දවසක්වත් ගෙදර ආවෙ නැතිද?``

``අවුරුද්දකට වරක් අසේල් ගෙදර එනව ජෙස්මේද් (මස්සිනා) සමග. ආපා කිව්වා එයා හරිම හොඳ මිනිහෙක් කියල!..``

වෙනත් ප්‍රශ්න ඇසීමට මම ඉදිරිපත් නොවීමි. සිසුවිය පාසල් ගියාය. මම ආපසු හැරුණෙමි.

එම පුවත නිසා මා කොතරම් කැළඹීදයත්, ඇගේ ස්වාමි පුරුෂයා කව්ද, ඔවුන් පදිංචිව සිටින්නේ කොහිද යන කරුණු ගැන අසා දැන ගැනීමට කිසිදු වුවමනාවක් නොවිය. දැන ගැනීමෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද? අසේල් වෙනත් පුරුෂයෙකු සමග විවාහ වෙතැයි මට නොසිතුණේ මන්දැයි මම නොදනිමි. එය සිදුවිය හැකි දෙයකි. එවැන්නක් මා බලාපොරොත්තු විය යුතුය. මා එනතුරු අවුරුදු කීපයක් බලා සිටිය යුත්තේ ඇයි.

පාරේ යන ලොරියක් බලාපොරොත්තුවෙන් සිටිනු වෙනුවට මම පා ගමනින් පිටත් වීමි.

මහ මගද වෙනස් වෙලාය. කුඩා ගල් කැට වලින් එය සාදා ඇත. ස්ටෙප්ස් බිම් පමණක් එසේම පවතී. වගා කළ පෙදෙස් දුඹුරු පැහැයක් ගෙන ඇත. වගා නොකළ පෙදෙස්වල කුඩා පඳුරු හා පැළෑටිය. කඳු මුදුන්වලින් පටන් ගන්නා ස්ටෙප්ස් බිම් ක්ෂිතිජය දක්වා පැතිර යයි. යෝධමය කළාල පැඳුරක් වැනි ස්ටෙප්ස් බිම්වල විශාල සිදුරු වශයෙන් ගැනෙන්නේ ඉස්සික්-කුල් වැවේ තීරයන්ය. හිම වැටීම නිසා ස්ටෙප්ස් බිම් තෙතව, තශ්නව ඇත. වසන්ත ගොවිතැන් වාරය අරඹා ඇති බව කියන්නාක් මෙන් ට්‍රැක්ටර් යන්ත්‍ර හඬදෙයි.

දිස්ත්‍රික්ක මධ්‍යස්ථානය දක්වා මා ළඟා වන විට රෑ බෝ වී තිබිණි. මා කළ යුතු දේ ගැන පැහැදිලි තීරණයක් ගැනීමට මට පුළුවන් වූයේ පසුදින උදැසනය. ඉස්සර රැකියාව කළ ඩිපෝවේ නැවත රැකියාවක් ලබාගැනීමට මම තීරණය කළෙමි. හැම දෙයක්ම නිමාවට පත්ව ඇත. හැම දෙයක්ම නැතිවෙලාය . එහෙත් ජීවත්විය යුතුය, වැඩ කළ යුතුය. අනාගතයේදී කුමක් සිදුවේනැයි කාට කිව හැකිද...

ත්‍යාන්-ෂාන් මහ මග ඔස්සේ වැල නොකැඩී රථ වාහන යයි. මා ඉස්සර සේවය කළ ඩිපෝවට අයත් ලොරියක් එන තුරු මම ගමන් කළෙමි. අපේ ඩිපෝවට අයත් ලොරියක් දුටු විගස අතක් ඔසවා සංඥා කළෙමි.

රියැදුරා මා පසුකරමින් රිය පදවාගෙන ගිය නමුදු හදිසියෙන්ම එය නැවැත්විය. මම මගේ සූට්කේසය ඔසවා ගතිමි. රියැදුරා මා හමුවීමට ඉදිරියට ආවේය. ඔහු අනිකකු නොව මා සමග එකම සේනාංකයක සේවය කළ එර්මෙක්ය. රිය පැදවීමට ඔහුට උගන්වන ලද්දේ ම විසිනි. එවකට ඔහු ගැටවරයෙක් විය. ඔහු මා දෙස බලා අවිශ්වාසලෙස සිනහසුණේය.

``අඳුණන්ට බැරිද?``

``සාජන්ට්... ඉල්යාස්! ඉල්යාස් අලිබායෙව්`` ඔහු මා හඳුණාගත්තේය.

``හරියට හරි!`` යැයි කී මා ආයාසයෙන් මඳ සිනහවක් ඔවා ගතිමි. මිනිස්සු අමාරුවෙන් මා හඳුණාගනිත් නම් මා සැහෙන ලෙස වෙනස් වී ඇත. මෙය මගේ කනගාටුවට හේතු විය.

ඔහුගේ රියැදුරු අසුන ළඟින් වාඩිවුණු මම ඔහු සමග නොයෙක් දේ ගැන, යුද සේවයේ යෙදී සිටි දවස්වලදී සිදුවූ දේ ආදිය ගැන කතා කළෙමි. මගේ ජීවිතය ගැන ප්‍රශ්න ඔහු අසතියි මම තරමක් බියවීමි. එර්මෙක් මා ගැන ප්‍රශ්න නොඇසූ බැවින් මම සන්සුන් වීමි.

``ක්වදද ගෙදර ආවේ?`` මම ප්‍රශ්න කළෙමි.

``දැන් දැවුරුද්දක් තිස්සේ වැඩ කරනවා`` යි හේ පිළිතුරු දුන්නේය.

``අලිබෙක් ජන්තුරීන් කොහිද?``

``මම එයාව දැක්කේ නැහැ. මා මෙහි එන විට එයා පාමීර්වල ඩිපෝවක ප්‍රධාන මිකැනික් කෙනෙකු වශයෙන් රස්සාවක් ලබාගෙන ගිහින්...``

``අලිබෙක් හරිම දක්ෂයා! මගෙ හොඳම යාළුවා අලිබෙක්! එයා නියම මිනිහෙක්!`` යැයි මම සිතින් මටම කියා ගතිමි. අලිබෙක් තම පරමාර්ථය මුදුන් පමුණුවා ගත්තා. යුද සේවයේ ඉන්න කාලයේදීම අලිබෙක් මහා මාර්ග තැනීමේ විද්‍යාව පිළිබඳ පාඩම් මාලාවක් හැදෑරුවා. පසුව

උසස් විද්‍යාලයක යාන්ත්‍රික ශිල්ප පාඩම් මාලාවක් තැපැල් මගින් හදාරා සමත් වුණා.

"ඩිපෝවෙ ලොක්කා අමන්ජොලොව්?"

"දැන් අලුත් ලොක්කෙක්. අමන්ජොලොව්ට උසස් පත්වීමක් ලැබී එයා අමාත්‍යාංශයට ගියා."

"මාව රස්සාවට ගනීවි කියල තමුසෙ හිතනවද?"

"ඇයි නැත්තෙ රස්සාවට ගනීවි. තමුසෙ ඉතාම හොඳ ඩ්‍රයිවර් කෙනෙක් නෙව. යුධ හමුදාවෙදි තමුසෙ බොහොම හොඳට වැඩ කළා නෙවැ"යි ඊර්මෙක් පැවසීය.

"ඔව්. ඒ කාලෙදි මා ගැන හොඳ කිව්වා" යැයි සෙමින් කියා ගත් මම, "ජන්තායිට හඳුණනවදැ?" යි ඇසීමි.

"අපේ ඩිපෝවෙ එහෙම කෙනෙක් නැහැ. එහෙම කෙනෙක් ගැන මම අහල නැහැ."

"ඩිපෝවෙ සෑහෙන වෙනස්වීම් ඇතිවෙලා" යැයි මටම කියා ගත් මම, මඳ වේලාවක් කල්පනා කොට මෙසේ ප්‍රශ්න කළෙමි.

"තවමත් ලොරියට තවත් රියක් ඈඳල කඳුකරේ බඩු පටවාගෙන යනවද?"

"දැන් ඒක සාමාන්‍ය, ලේසි වැඩක්. බර ප්‍රමාණය අනුව තමා අපි අමතර රියක් ඈඳන්නෙ. දැන් අපේ ලොරිවල ඇන්ජින් යන්ත්‍ර ඉස්සරට වඩා බලවත්."

ඒ අමතර රිය ඈඳීම නිසා මට වූ දේ ඊර්මෙක් දන්නේ නම්!

පැරණි ඩිපෝවේ රැකියාවක් ලබා ගතිමි. ඊර්මෙක් එදින මා ඔහුගේ නිවසෙට කැඳවා මට කැවිලි, පෙවිලි වලින් සංග්‍රහ කළේය. බොහෝ කාලයක සිට මත්පැන් නොබිව් මම එදිනද මත්පැන් පානය ප්‍රතික්ෂේප කළෙමි.

ඩිපෝවේ කම්කරු පිරිස මා පිළිගත්තේ සුහද භාවයෙකිනි. මා හඳුණන සගයෝ මා ගැන ප්‍රශ්න නොඇසූහ. එසේ නැසිරීම ගැන මම ඔවුන්ට කෘතඥවෙමි. රට පුරා ඇවිද වෙහෙසට පත් මා නැවත පැරණි තැන රැකියාවක් සඳහා පැමිණ ඇත. ඔහු හොඳින් වැඩ කරයි. යටගිය දේ නැවත අවුස්සන්නේ කුමටද? මගේ යටගියාව සදහටම අමතක කර දැමීමට මම දැඩි උත්සාහයක් ගතිමි. ඉස්සර අසේල් හා සාමට් සමග මා පදිංචි වී සිටි ස්ථානය අසලින් මා රිය පදවාගෙන ගියේ, වට පිට පවා නොබලමිනි. ඒ අසල වූ ඛණිජ තෙල් විකුණන ස්ථානයෙන් ඛණිජ තෙල් නොගැනීමට තීරණය කළෙමි. එහෙත් ඒ කිසිවක් අතීතය අමතක කිරීමට මට ආධාර නොවිණි. ස්වයං රැවටීමෙහි යෙදීමට මම අපොහොසත් වීමි.

සෑහෙන කාලයක් මම ඩිපෝවේ වැඩ කළෙමි. මගේ රුකියාව ස්ථිර විය. මගේ ලොරිය මා ඉතා හොඳින් දැන ගතිමි. නොයෙකුත් වේගයන් අනුව ලොරිය ධාවනය කළෙමි. කෙටියෙන් කියතොත්, මගේ වෘත්තිය ගැන නිපුණත්වයක් ලබා ගතිමි...

එදින මම විනයේ සිට ඩිපෝව බලා එමින් සිටියෙමි. සාමාන්‍ය වේගයෙන් රිය පැදවූ මම වට පිට බලන්නට වීමි. වසන්තය, හැම තැනම වසන්තය. තැනින් තැන යූර්ට-- කූඩාරම්ය. සත්ව පාලකයෝ තම සතුන් තණබිම්වලට ගෙන යති. යූර්ට--කූඩාරම් වලට ඉහළින් නිල්වන් දුම් වලා පාවෙන්නට විය. අශ්වයන්ගේ හේසාරව හඬ ඇසිණි. මහ මග අසල ඇති තණබිම්වල බැටළුවෝ තණ කති. මේ සියල්ල මට මගේ ළමා විය සිහි කළේය. ඉස්සික් කුල් හි හංසයින් දුටු මම පුදුමවීමි!

ජීවිතයේ දෙවැනි වරට වසන්තයේදී ඉස්සික්-කුල් වැවේ හංසයින් දිටිමි. නිල්වන් වැවට ඉහළින් සුදෝසුදු හංසයින් පියාඹන සැටි දැකීම ප්‍රීතියකි. මීට බොහෝ කලකට පෙර කළාක් මෙන් මම මගේ ලොරිය මහ මගින් හරවා ගෙන වැව අසලටම එය ගෙන ගියෙමි.

අහෝ, ඉස්සික්-කුල්, ඉස්සික්-කුල්--එය ගයා අවසාන නොකළ සුන්දර ගීතයක් වැන්න!.. අසේල් සමග මෙහි පැමිණි මම ලොරිය නැවැත්වූයේ මෙම කඳු ගැටය මතය. මට සිහියට නැගුනෙණ් ඇයි? හැම දෙයක්ම එදා මෙනි. රන් පැහැති වෙරළ සිප ගන්නා රළ නිල් සහ සුදු පැහැති ලස්සන කුරුල්ලන් මෙනි. ඈත කඳු වැටිවලට එහා බැසයන හිරු වැවේ එහා කොටස් ජලය ලා රත් පැහැ කළේය. කැලඹී ගත් හංසයෝ අහසට නැග හඬ නැගූහ. ඔවුන් විසින් වැවට බැස පිනමින් සුදු පැහැති පෙණ ඇති කරන ලදී. සමහරු ඉහළ නැග පියාපත් විදහාගෙන හඬ නගමින් වැවට බටහ. හැම දෙයක්ම එදා මෙනි. අසේල් පමණකි අඩුවූයේ. රතු ලේන්සුවක් හිස බැඳගත්, මගේ නැතිවුණු වස්තුව, මගේ සුන්දරිය, තී දැන් කොහිද?

වැව අසල බොහෝ වේලාවක් සිටි මම ඩිපෝවට ලොරිය ගෙන ගියෙමි. බොහෝ කාලයක් මත්පැන් නොබී සිටි මම එදින නැවත පානය කළෙමි... මා හදවත තුලින් පැන නැගි වේදනාව තුනී කරනු වස් නැවත අවන් හලට ගොස් වොඩ්කා බීවෙමි. එතැනින් මා පිටවන විට හවස් වී තිබිණි. අහස ඇඳිරි වලාකුළු වලින් පිරුණි. දුර්ග මාර්ගයේ සිට හැමූ ශීත සුලං බටයකින් පිඹින්නාක් මෙන් විය. ගස් වැල් මුලිනුදුරා දමන්නට මෙන් තර්ජනය කළ සුලං පහර විදුලියකම්බි හඬවමින්, කුඩා ගල්කැට මගේ මුහුණට විසි කළේය. ඉස්සික්:කුල් වැව හඬමින් විලාප ගැසුවාය. අමාරුවෙන් මත්වාසිකා ගාරයට ළගාවූ මම ඇඳුම් උනා ඇඳ මත වැතිර ගතිමි.

පසුදා උදෑසන මගේ හිස කකියන්නට විය. ඇඟ අප්‍රාණික විය.

නොනවතින පොද වැස්සක් සහිත කුඩා හිම පියලි වසින්නට විය. එදිනෙදා ශ්‍රමය වැය කිරීම නිසා ලැබූ ප්‍රීතියද පළමුවරට මට නොලැබුණු බව වැටහිණි. වැඩට නොගොස් පැය තුනක් මම ඇඳෙහි වැතිර සිටියෙමි. ඉන්පසු මට මා ගැන ලජ්ජා සිතුණෙන් නැගිට ඇඳගෙන රැකියාව සඳහා පිටත් වීමි.

ලොරිය ඇලි මැලි ගතියක් දැක්විය. එහෙත් ඇත්ත වශයෙන්ම ඇලි මැලි දුබල ගතියකින් පෙළුණේ මගේ සිතය. කාලගුණයද මගේ අප්‍රියජනක හැඟීම් උත්පන්න කළේය. මා ඉදිරියට එන වාහන හිමවලින් පිරී තිබිණි. කඳු සාරයේ හිම වැස්සකි. ඕන දෙයක් වුණාවෙ. හිම වැස්සක් පමණක් නොව, හිම කුණාටුවක් වුවත් කමක් නැත. බියවීමට හේතුවක් නැත. මම තනිකඩයෙක්මි...

මගේ සිත වැහැරී ඇත. රියැදුරු කණ්ණාඩියෙන් මම මා දෙස බැලීමි. මගේ මුහුණ ඉදිමිලාය. ඇස් රත් පැහැ ගෙන ඇත. රැවුල වැවිලාය. රෝගියකුගේ මෙනි. උදේ සිට ආහාරක් නොගත් බැවින් බඩගිනි දැනිණි. එහෙත් යමක් කෑමට තරම් සිත් නොවීය. මත්පැන් විදුරුවක් පානය කිරීමට මා සිත පෙළඹිණි. මත්පැන් පානය කිරීමට පටන් ගතහොත් එක විදුරුවකින් නැවතීමට බැරි බව මම දනිමි. ලොරිය කුඩා කඩයක් අසල නැවැත්වීමි. එක් විදුරුවක් බී ලොරිය පැදවීමි. මගේ සිතට සැනසීමකි. ලොරියද වඩාත් හොඳින් ධාවනය වන සැටියකි. ඊළඟ අවන් හල අසලදී රිය නවතා තවත් මත්පැන් විදුරුවක් බීවෙමි. නැවත වරක් තවත් විදුරුවක් පුරා මත්පැන් බීවෙමි. දැන් මා දෙපස ඇති ගෙවල් සහ ගෙවැටවල් ඉගිලෙන්නාක් මෙනි. රියැදුරු වීදුරු ශුද්ධ කරන යාන්ත්‍රික මෙවලම් ක්‍රියා කාරී විය. මීට බොහෝ වේලාවකට පෙර නිවිගිය සිගරැට් කොටයක් කටේ රඳවාගෙන, සුක්කානම අල්ලාගත් මට මා පසුකර වේගයෙන් දුවන මෝටෝ රථ හා මගේ වීදුරු ජනේලවලට වැදෙන මඩ පාරවල් හැර අන් කිසිවක් නොපෙනිණි. මම වේගය වැඩි කළෙමි. කඳුකරයේදී අඳුරු පැතිරිණි. අහසේ එකද තරුවක්වත් නැත. මා පානය කළ වොඩ්කා මගේ ගත දුර්වල කිරීමට පටන්ගති. මා වෙහෙසට පත් වෙත්ම, දැස ඉදිරියේ කළු පැහැති ලප මතුවිණි. රියැදුරු ආසනයේ වාඩිවී සිටි මට අපහසුවක් දැනුණු අතර ඔක්කාර කිරීමට සිත්විය. මත්පැන් නිසා මෙතරම් දුර්වලවූ දවසක් මට මතක නැති තරම්. දහඩියෙන් මුහුණ තැවිණි. මා ලොරිය පදවන්නෙ නැති බවත්, ඒ වෙනුවට ලොරිය දෙපස ඇති විදුලි බුබුළු වලින් පැන නගින ආලෝක ධාරා මත වාඩිවී යමක් ධාවනය කරන සැටියකි මට දැනුණේ. මම ආලෝක ධාරා මත පාවෙන මම වරෙක අඳුරු වළක වැටෙමි, තවත් වරෙක ආලෝකමත් බිළයකට වැටෙමි. ආලෝකධාරා අනුව යමින් ඒ මේ අත වැනෙන සැටියක්ද මට දැනිණි. විනාඩියක් පාසා මා දුර්වල වන සැටි

දැනුණිද, ලොරිය පැදවීම නොනැවත් වීමි. මන්දයත්, එය නැවතූ විගසම යුක්තානම පාලනය කිරීමට මා අපොහොසත් වන බව දැන සිටි බැවිනි. මා මේවන විට කොතැනක සිටියේද යන්න හරිහැටි කිව නොහැකිය. මා සිතන හැටියට ඩොලොන්ස්ක දූර්ග මාර්ගයේ විය යුතුය. අහෝ ඩොලොන්ස්ක්! ඩොලොන්ස්ක්! නුඹ තයාන්-සාන් කඳුවල යෝධයාය. නුඹ මැඩ ජය ගැනීම ලෙහෙසි නැ. විශේෂයෙන්ම ඇඳිරි වැටුණු පසු, මත්පැන් බිව් රියැදුරකුට නුඹ මැඩ ගැනීම අපහසුය!

ලොරිය යම්කිසි කඳු ගැටයක් නැග කම්පනය වී කඳු බෑවුමක් දිගේ පහතට වැටෙන්නට විය. මා වටා ඇති හැම දෙයක්ම වේගයෙන් බ්‍රමණය විය. ඇඳිරි අහස උඩු යටිකුරු කොට පෙරලුණාක් මෙනි. දැන් පාලනය කිරීමට ශක්තියක් මා තුළ නොතිබිණි. වේගය තවත් වැඩි කළෙමි. බෑවුම දිගේ පහළට ගිය ලොරිය බොල් හඩක් නගමින් යමක හැප්පිණි. මග පෙන්වන විදුලිය පහන් දෙක නිවිගියෙන් ඇඩි අඳුරක් විසින් මා වසා ගැනිණි. මගේ යටි හිත කෑ ගැසීය: ''මා අනතුරකට ගොදුරු වුණා!''

මා එලෙස කොපමණ වේලා වැතිර සිටියේදැයි කිව නොහැක. කිසිවෙක් ඇත සිට කතාකරන සැටි ඇසිණි. දෙකන්වල පුළුන් එබූ කලෙක මෙනි. ''ගිනි කූරක් දල්වාපන්!'' කිසිවෙක් මගේ හිස, පපුව හා උරහිස් අත ගෑහ. ''මිනිහා පණපිටින්. බිල වෙරිවෙලා!'' යැයි එකෙක් කී විට අනිකා ''මහ පාර ශුඩ කරන්න ඕනෑ'' යැයි පැවසීය.

''යාළුවා නැගිටල ඇවිදින්ට උත්සාහ කරපන්. අපි ලොරිය පාරෙන් එහාට ගන්ට බලන්නම්'' යැයි කී මිනිසා මගේ උරහිස යම්තමින් තල්ලු කළේය.

මම සුසුම්ලමින් හිස එසවීමි. නලල පැලී මුහුණ දිගේ ලේ ගලන්නට විය. මගේ පපුව හිර කළ යම්කිසිවක් නිසා මට නැගිට සිටීම අපහසු විය. මිනිසා ගිනිකූරක් දල්වා මා දෙස බැලීය. ඉන්පසු ඔහු තවත් ගිනිකූරක් දල්වා නැවත වරක් මා දෙස බැලීය.

''යාළුවා, තමුසෙට මක්වෙලාද?'' කළුවරේ සිටි මිනිසාගේ කට හඬෙහි බලාපොරොත්තු සුන්වූ ගතියක් තිබිණි.

''ලොරිය සෑහෙන්ට කැඩිලද?'' ලේ සහිත කෙළ ගැසූ මම ප්‍රශ්න කළෙමි.

''නැහැ. විශාල පාඩුවක් වෙලා නැහැ. පාර හරහා පැනල තියෙනව. එච්චරයි.''

''එහෙනම් මම යන්නම්. පාර අවහිර කරන්නට මම කැමති නැහැ.'' මෙසේ කී මම ඇන්ජිම ක්‍රියා කරවීම පිණිස වෙව්ලන ඇඟිලි වලින් යතුර කරකැවීමි.

''ලොරියෙන් බහිනව!'' යැයි කී මිනියා මගේ උරහිස දැඩිලෙස අල්ලා ගත්තේය. ''සෙල්ලම් කලා මදැ' එනව. අද රෑ මගේ ගෙදර නැවතිල, හෙට උදේට බලමු කොහොමද කියල'' ඔහු පැවසීය.

දෙදෙනෙකු විසින් මා ඉවත ඇද ගන්නා ලදි.

''කෙමෙල් ලොරිය පාරෙ එහා පැත්තට ඇද ගන්න. පස්සෙ බලමු ලොරිය ගැන.''

ඔහු මගේ කිහිල්ලකට යටින් හිස තබා මා වත්තම් කර ගෙන අඳුරු පාරක් ඔස්සේ මා ගෙන ගියේය. ගෙදරක ඉස්තෝප්පු කාමරයකට ඇතුළුවීමට ඔහු මට උදව් කලේය.එහි භූමිතෙල් ලම්පුවක් දල්වා තිබිණි ඒ මිනිහා මා කුඩා පුටුවක වාඩි කරවා මගේ හිම කබාය ගැලවීමට මට උදව්වූ කලේය. එවිට මම ඔහු දෙස බැලීමි. ඔහු අනෙකකු නොව මීට අවුරුදු කීපයකට පෙර ත්‍යාන්-ෂාන් කඳුකරයේදී මට හමුවූ මාර්ග පාලක ශිල්පී බයිටෙම්ර්ය. ඔහුගේ අබලන් ලොරිය එදා මගේ ලොරියට ඇදා ගෙනගිය සැටි මට මතක් විය. මම ලජ්ජා වීමි. මගේ තත්ත්වය කනගාටුදායක වුවද, මම ඔහුට කෘතඥතාවය දැක්වීමට සැරසුණෙමි. එහෙත් මා පිටුපසින් දරකෝටු වැනි යමක් බිම වැටීම නිසා ඇතිවූ ශබ්දය දෙසට මා හැරුණේ නිහැතිනි. මා කිසිදිනෙක බලාපොරොත්තු නොවූ යම්කිසි අපූරු දර්ශනයක් මා ඉදිරියේ මැවුණාක් මෙනි. උසුලාගත නොහැකි මහා බරක් මගේ උරහිස් මතවැටුණාක් මෙනි. දොර අසල අසේල් සිටගෙන සිටියි. ඇගේ දෙපා මුල දර කෝටු විසිරීලාය. ඈ අස්වාභාවික ලෙස සෘජුව සිටගෙන මා දෙස බලා සිටියි.

''මේ මොකක්ද?'' ඈ මෙසේ ප්‍රශ්න කලේ සෙමිනි.

''අසේල්!'' යැයි මා කෑ නොගැසුවා පමණකි. ඇගේ දැඩි බැල්ම නිසා මට කට හැරීමට පවා බැරිවිය. සිත කය උතුරා පැන නැගී ලජ්ජාව විසින් මගේ හිස පහත් කරවන ලදි. නිහඬව සිටි ඒ මොහොත මට විද දරාගත නොහැකි විය. ඒවර කාමරයට පැමිණි බයිටෙම්ර් මට වාඩිවීමට සැලැස්විය. ඔහු එසේ නොපැමිණියේ නම් කුමක් වෙත්දැයි මට කිව නොහැක. සන්සුන් ලෙස ඔහු මෙසේ පැවසීය.

''අසේල්. කලබලවීමට කාරණාවක් නැහැ. මේ ලොරි ඩ්‍රයිවර් පොඩි අනතුරකට මුණ පැවා. එයාට විවේකයක් අවශ්‍යයි... අපට අයඩින් පොඩ්ඩක් ගේන්න.''

''අයඩින්ද? අල්ලපු ගෙදර අය ඉල්ලා ගන්නා. මම ගිහින් ගේන්නම්.'' කැලඹුණු ස්වරයකින් මෙසේ කී අසේල් හනික පිටව් ගියාය.

මම තිහඩව වාඩිවී, යටිතොල සපා ගතිමි. වෙරිමත්වූ ගතිය හාස් කමකින් මෙන් අතුරුදහන් විය. මගේ ශංඛක වල ලේ නහර හඩ නගමින් ක්‍රියා කාරී විය.

මගේ නළලේ තුවාලය පිරික්සා බැලූ බයිටෙමීර් ``තුවාලය අයඩින්වලින් හෝදන්නට ඕනෑ`` යැයි කිවේය. ඔහු බඳුනක් අතින් ගෙන පිටව් ගියේය. යාබද කාමරයේ සිට අවුරුදු පහක් පමණ වයසැති දරුවෙක් එබී බැලීය. පාවහන් රහිතව සිටි ඔහු හැඳ සිටියේ දිග කමිසයක් පමණකි. ඔහු මා දෙස කුතුහලයෙන් යුතුව බැලීය. ඔහු සාමට් බව එකවරම මා දැනගත්තේ කෙසේදැයි මම නොදනිමි.

``සාමට්!`` යැයි මම පහත් හඬින් ඔහුට කතා කළෙමි. මා ඔහු වෙත අතක් දිගු කරත්ම දොර හැරගෙන බයිටෙමීර් පැමිණියෙන් මම බියවීමි. හේතුව කුමක්දැයි කිව නොහැක. මම දරුවාගේ නම අමතා කතා කළ සැටි ඔහුට ඇසුණු බව මට සිතේ. සොරකමක් කොට අසුවූ කෙනෙකු මෙන් මා සිත චංචල විය. නළලේ තුවාලය එක අතකින් වසා ගනිමින් ඉබේටම මම බයිටෙමීර්ගෙන් මෙසේ ඇසීමි.

``මේ දරුවා ඔහෙගෙ පුතාද?`` ඒ ප්‍රශ්නය ම විසින් නගන ලද්දේ ඇයි? අද වනතුරු මට සමාව නොදිය හැකි වරදක් මම කළෙමි.

``ඔව්. ඒ මගේ පුතා!`` බයිටෙමීර් එසේ පිළිතුරු දුන්නේ ගෘහ මූලිකයෙකුගේ විශ්වාසයකිනි. ඔහු බඳුන බිම තබා සාමට් වඩා ගත්තේය. ``ඔව්. ඔව්. මගේ පුතා. එහෙම නේද සාමට්?`` මෙසේ ඇසූ බයිටෙමීර් දරුවා සිප ගත්තේය. ඔහුගේ රැවුල දරුවාගේ බෙල්ල කිති කැවීය. ඔහු ඒ වචන පැවසුවේ වංක බවක හෝ සැකයක හෝ සේයාවක් පවා නැතිවය. ``පුතා ඇයි නිදාගන්නෙ නැත්තෙ? හොඳ ළමය වගෙ ගිහින් නිදාගන්න!``

``අම්මා කොහෙද?`` සාමට් ඇසීය.

එවිටම වාගේ ගෙට ඇතුළු වූ අසේල් අප දෙස අවිශ්වාසය මුසු බැල්මක් හෙළා අයඩින් බෝතලය බයිටෙමීර් අතට දී, සාමට් නිදි කරවීම පිණිස ගියාය.

බයිටෙමීර් තුවාල වතුරෙන් තෙමා මගේ තුවාලය පවිත්‍ර කළේය.

``ඉවසනවා!`` යැයි කී ඔහු අයඩින් වලින් මගේ තුවාලය ආලේප කළේය. මෙසේ විහිළු කළ බයිටෙමීර් පසුව තරමක දැඩි ස්වරයකින් කතා කළේය: ``තමුසෙගෙ හැසිරීමට, තමුසෙට මීට වැඩිය තද අඩුවමක් දෙන්ට ඕන. තමුසෙ මගේ අමුත්තෙක් හන්දා අමතක කරනව... අසේල් අපට තේ ටිකක් ලෑස්ති කරන්න.``

``හොඳා.``

පලස මත මෙට්ටයක් අතුරා කොට්ට කිපයක් තැබූ බයිටෙමීර් මට සාතා කළේය.

''මෙතන හාන්සිවෙලා විවේක ගන්න.''

''නැහැ. කමක් නැහැ. බොහොම ස්තූතියි!'' මම කීවෙමි.

''එන්න. හාන්සිවෙන්න. ලජ්ජා වෙන්න එපා.'' බයිටෙමීර් නැවත කීවේය.

මා ඔහුගේ ඉල්ලීම අනුව එහි ගොස් හාන්සිවූයේ සිහිනෙන් මෙනි. මගේ හදවත වේදනාවෙන් මිරිකිණි. බියමුසු කිසියම් බලාපොරොත්තුවක් මා තුළ ඇතිවිය. මා මෙලොව උපන්නේ කවර හේතුවකටදැයි මම මගෙන්ම ප්‍රශ්න කර ගතිමි.

අසේල් කාමරයට විත් මා දෙස නොබලා සමොවාරය රැගෙන ඉස්තෝප්පුව දෙසට ගියාය.

''මම ඔයාට උදව් කරන්නම්'' යැයි කී බයිටෙමීර් ඇ අනුව ඉස්තෝප්පුවට ගියේය. එවිට සාමට් නැවත මා සිටි කාමරයට ආවේය. ඔහු නිදාගැනීමට සූදානම් නැත.

''සාමට් මොනවද ඕන?'' බයිටෙමීර් මද සිනා පාමින් ගිය වනා ප්‍රශ්න කළේය.

''මාමේ! මාමා චිත්‍රපටියෙ ඉඳලද මෙහෙ ආවේ?'' මෙසේ ඇසූ මගේ පුතා මට වඩාත් ලංවිය.

ඔහුගේ ප්‍රශ්නය තේරුම් ගැනීමට මා වැයම් කරත්ම බයිටෙමීර් හඩ නගා සිනාසුණේය.

''අනේ මගේ පුතේ!'' යැයි කී බයිටෙමීර් සාමට් ඉදිරියේ ඇන තබාගෙන වාඩිවෙමින් මෙසේ කීවේය. ''නුඹ හරිම දඟකාර කොල්ලෙක්.'' ඔහු මා දෙස බැලීය: ''ආකරවල චිත්‍රපට පෙන්වන කොට අපි මෙයාවත් ගෙනියනව.''

''ඔව්. මම චිත්‍රපටියක ඉඳල තමා ආවෙ'' යැයි කී මම විහිළුවට එකතුවීමි.

එහෙත් සාමට් බුම්මා ගනිමින් මෙසේ කිය:

''ඒක වෙන්න බැරි වැඩක්.''

''ඇයි එහෙම කියන්නෙ?''

''මාමා සටන් කළ කඩුව කොහිද?'' යි සාමට් ඇසීය.

''ගෙදර තියල ආවා...'' යි මම කීවෙමි.

''මාමා මට පෙන්වනවද? හෙට පෙන්වනවද?''

''හොඳයි. පෙන්වන්නම්. පුතාගෙ නම සාමට් නේද?''

''ඔව්. සාමට් තමා. මාමාගෙ නම?''

``මගේ නමද...`` මම නිහඬවීමි. ``මගේ නම ඉල්යාස් මාමා`` යැයි අමාරුවෙන් පැවසීමි.

``සාමට්, පුතා ගිහින් නිදාගන්න. දැන් හොඳටම රෑ වෙලා`` අපේ කතාවට බාධා කළ බයිටෙමීර් කීවේය.

``තාත්තෙ, මම තව ටිකක් මෙතන ඉන්නම් හොඳද?`` සාමට් ඇසීය.

``හොඳයි. ඉඳපන්! අපි දැන් තේ ගොතෙන්නම්`` යැයි බයිටෙමීර් සාමට්ගේ ඉල්ලීමට එකඟවෙමින් පැවසීය.

සාමට් මා ළඟට ආවේය. මම ඔහුගේ අතක් ගෙන සුරතල් කෙළෙමි. හැඩහුරුකම් අනුව ඔහු මට බෙහෙවින්ම සමානය. ඔහුගේ අත්ද, ඔහු සිනහාවන විටද මට සමානය.

``පුතා ලොකු මිනිහෙක් වුණාම මොනවද කරන්නෙ?`` මම සාමට්ගෙන් ප්‍රශ්න කළෙමි. මගේ පුතු සමග කතා කිරීමට මා පටන් ගත්තේ ඒ ආකාරයෙනි.

``ඩ්‍රයිවර් කෙනෙක් වෙනව.``

``කාර් එළවන්න ආසද?`` යි මම ඔහුගෙන් ඇසීමි.

``හරි ආසයි. මම අන් ඉස්සුවට කිසිම කෙනෙක් මාව ගෙනියන්නෙ නැහැ`` යි ඔහු කීවේය.

``පුතා කැමතිද මම පුතාව හෙට ලොරියෙ රවුමක් අරගෙන යනවට?``

``කැමතියි. මම මාමාට ඉත්තො දෙන්නම්. මා ළඟ ඉත්තො ගොඩක් තියෙනව.`` මෙසේ කී සාමට් තම ඉත්තො පොදිය ගෙනඒම පිණිස යාබද කාමරයට ගියේය.

සමවාරය රත්වී ගිනි දළු නගින සැටිද, ජනේලයෙන් එපිට සිටගෙන බයිටෙමීර් හා අසේල් කතා කරන සැටිද මම දුටිමි.

සාමට් එළු සමින් කරන ලද කුඩා මල්ලක් ගෙනැවිත් මා ඉදිරියේ තබා එයින් විවිධ පාටැති ඉත්තන් රාශියක් එළියට ගත්තේය.

``මාමාට ඕන ඉත්තෙක් තෝරගන්නෑ!`` යි කී සාමට් තම වස්තු සම්භාරය මේ යැයි විදහා පෙන්වීය.

මතක වස්තුවක් ලෙස මම එක ඉත්තෙක් තෝරා ගැනීමට අදහස් කළෙමි. එහෙත් පසුව එම අදහස වෙනස් කළෙමි. දොරහැර ගෙන බයිටෙමීර් ආවේ උතුරා නටන වතුරින් පිරි සමොවාරයත් අතැතිවය. අසේල් ඔහු පිටුපසින් පැමිණියාය. ඇ තේ සෑදීමට පටන් ගත් අතර බයිටෙමීර් වටකුරු මිටි මේසයක් පළස මත තබා එය මත සුදු මේස රෙද්දක් දැම්මේය. සාමට් සහ මම ඉත්තන් නැවත එකතු කොට මල්ලට දැමීමු.

``සාමට් එයාගෙ වස්තුව පෙන්වනව, හරිම පුරසාරම් දොඩවන්නෙක් මගෙ පුතා``යැයි කී බයිටෙමීර් සාමට්ගේ තන කිති කැවීය.

ඉන්පසු අපි මේසය වටා වාඩිවී තේ බීමට පටන් ගතිමු. අසේල්ද මමද එකිනෙකා කිසිදිනෙක හමුනොවූවන් සේ හැසුරුණෙමු. සන්සුන්ව සිටීමට වැර දැරූ අපි දෙදෙනා වැඩි වේලාවක් නිහඬව ගතකළෙමු. බයිටෙමීර්ගේ දණහිස් මත වාඩිවුණු සාමට් ඔහුගේ හිස ප් මේ අත කරකවමින් සුරතල් කරන්නට විය.

``තාත්තගෙ රැවුල හරියට ඉදිකටු වගෙ ඇනෙනවා ඌයි ඌයි`` කී සාමට් නැවත නැවතත් තම කම්මුල් ඔහුගේ රැවුලට ළං කරමින් සිනහසෙන්නට විය.

මගේ පුතු ළඟ වාඩිවී, ඔහුට ``පුතේ!`` යැයි ඇමතීමට අවසර නැතිව, ඔහු පිට මිනිසකුට ``තාත්තේ!`` යැයි අමතන සැටි බලා සිටීම හදවත කකියවන කාර්යයක් විය. අසේල් මගේ පෙම්බර අසේල් මා ළඟින් වාඩිවී සිටියද, ඇට ඇමතීමට හෝ ඈ දෙස බැලීමට හෝ අවසර නැතිවීම නිසා මගේ සිත ශෝකයෙන් පිරිණි. ඈ මෙතැනට ආවේ කොහොමද? ඈ බයිටෙමීර්ට ආලය කොට ඔහු සමග විවාහ විද? ඈ මා නොහඳුනන බවක් අඟවමින් හැසිරෙන්නීය. මා සම්පූර්ණයෙන්ම පිටස්තර පුද්ගලයකු ලෙස ගණන් ගනිමින් මෙසේ ඈ හැසිරෙන විට මා ඇට වුණු දේ දැනගන්නේ කෙසේද? ඇත්තටම ඈ මට මෙතරම් වෛර කරන්නීද? මා සැබැවින්ම කවුදැයි බයිටෙමීර් නොදන්නේද? මගේත් සාමට්ගේත් හැඩහුරුකම් සමාන බව ඔහුට නොපෙනෙන්ද? ඔහුගේ රිය මගේ ලොරියට ඇදා මා ගෙන ගිය සැටි ඔහු මතක් නොකළේ මන්ද? ඔහුට එය සැබැවින්ම අමතක විද?

තේ බීමෙන් පසු නින්දට ගිය විට මගේ සිත්වේදනාව දියුණු තියුණු විය. පලස මත මෙට්ටයක් දමා මට නිදන්නට සලස්වන ලදි. පහන් තිරය තුනී කරනුලැබූ පසු මම බිත්තිය දෙසට මුහුණ ලා නිදන්නට සූදානම් වීමි. අසේල් තේ පෝච්චිය, සමෝවාරය ආදි දේ අස්-පස් කළාය.

``අසේල්!`` යැයි බයිටෙමීර් ඇට සෙමින් කතා කළේය.

ඈ දොර ළඟට ගියාය.

``මෙන්න මේ කමිසය හෝදන්ට`` යැයි ඔහු කීවේය.

ඈ මගේ කමීසය සෝදන්නට වූවාය. තොටු සහිත එය ලෙයින් තෙත්ව ඇත. සේදීම නැවැත්වූ අසේල් බයිටෙමීර් වෙත ගොස් මෙසේ ඇසුවාය:

``ඔයා රේඩියේටර් යන්ත්‍රයේ වතුර ඉවත් කළාද? නැතිනම් රෑ ශීතලට වතුර අයිස් වෙන්ට පුළුවනි...``

``ඉවත් කලා! කෙමෙල් ඉවත් කලා! ලොරියට එතරම් පාවු නැහැ. අපි උදේට ලොරිය ගැන නැවත බලමු.`` යැයි ඔහු පහත් හඬින් කීවේය.

රේඩියේටරය, වතුර, ඇන්ජිම ගැන මට අමතක වී ඇත. ඒවා ගැන සිතීමට මෙය වෙලාවක් නොවේ.

මගේ කමිසය සෝදා ලිප උඩින් එය එල්ලූ අසේල් දිග සුසුමක් හෙළුවාය. පසුව පහන නිවා කාමරයෙන් පිටවූවාය.

අවට ඇඳිරිය. එදින ඒ පියස්ස යට වැතිර සිටි අප නොනිදා පහන් කළ බව සහතිකය. අපි හැම කෙනාම සිතුවිලි සමග හුදකලාව සටන් කළෙමු. බයිටෙමීර් සහ සාමට් එක ඇඳක නිදා ගන්හ. නින්දෙන් දොඩවමින් දඟලන සාමට්ට සෙමින් ආදර බස් කියන බයිටෙමීර් ඔහු නැවත නැවතත් කම්බිලියෙන් පොරවයි. අසේල් ඉඳහිට පිටතට ඇසෙන සේ සුසුම් ලෑවාය. මට ඇගේ ඇස් සිහිනෙන් පෙනිණි. ඒවා කාන්තිමත් ලෙස බැබලිණි. සමහර විට ඒවායේ කඳුළු පිරී තිබුණා වෙන්නට පිළිවන. ඇ සිතුවේ මොනවා ගැනද? කා ගැනද? දැන් ඇය ඉදිරියේ තිදෙනෙකි... ඇද මා මෙන් අපේ ජීවිතයේ සුන්දර සිද්ධි හා දුක් සහිත සිද්ධි ගැන සිතුවා විය හැක. දැන් ඇවෙත සාමට මට බැරිය. ඇගේ සිතුවිලිවලට ළං වීමට පවා මට නොපිළිවන. අසේල් වෙනස් වී ඇත. ඇගේ නෙත්ද වෙනස් වෙලාය... ඉස්සර ඇගේ බැල්ම ප්‍රියංකරය, චාමිය, විශ්වාස දායකය. එහෙත් දැන් එහි දැඩි ගතියක් පෙනේ. එහෙත් මට නම් අසේල් වෙනස් වී නැත. ඇ පෙර මෙන්ම සුන්දරය. රතු සළුවකින් වැසූ ළපටි පොප්ලර් පැළයක් මෙනි. ඇගේ හැම ඉරියව්වක්මත්, අංග ලක්ෂණයක්මත් මගේ සිත සතුටු කළේය. පෙරට වඩා මම දුක්වීමි, පසුතැවිලි වීමි. මගේ හදවත පෙරට වඩා පීඩා විඳින්නට විය. කොට්ටයක කොණක් දතින් සපාගෙන පහන් වන තුරු නොසැලී, නොනිදා සිටියෙමි.

අඳුරු වලාකුළු අතරින් සඳ එබී බලන සැටි කවුළුවෙන් මම දුටිමි.

උදෑසන බයිටෙමීර් සහ අසේල් නැගිට ගෙවත්තට ගොස් තමන්ට නියමිත වැඩවල යෙදුණහ. මම නැගිට සාමට් නිදාසිටි කාමරයට ගොස් ප්‍රවේසමින් ඔහු සිපගෙන හතික පිටතට ගියෙමි. ගමන් ඇරඹිය යුතුය.

ගෙවත්තේ ලොකු ගල්කැට තුනක් මත තැබූ විශාල ලෝහමය බඳුනක අසේල් වතුර උණුකරමින් සිටියාය. බයිටෙමීර් දර පලන්නට විය. මම ඔහු සමග ලොරිය දෙසට නිහඬව, දුම්බොමින් ගමන් කළෙමි.

පාරේ පහත් තණුවලට මගේ ලොරිය හැප්පුණු සැටි මට මතකය. පහන් කණු දෙකක් මුලින් උදුරා වැටුණු සැටි මම දුටිමි. ඉදිරිපස වීදුරු ලිය පහන් දෙකකින් එකක්ද, මඩ ආවරණ පටියක්ද, ඉදිරිපස ආරක්ෂක පටියද

කැඩී ඇත. එක් රෝදයක්ද නැමී තිබිණි. අපට හැකිතරමින් ඒවා අළුත් වැඩියා කළෙමු. ඊළඟට අප විසින් කල යුතු දේ අයිරු විය. ලොරියේ ඇන්ජිම කිසියේත්ම ක්‍රියාකාරී නොවිය. ඇන්ජිම රත් කරණු වස් අපි තුල් සහ පුළුන්වලට ගිනි තැබීමු. දෙදෙන මාරුවෙන් මාරුවට ඇන්ජිම ක්‍රියා කරවීමට උත්සාහ කළෙමු. මෙසේ වැඩකිරීමේදී අපේ උරහිස් එකිනෙක ගැටිණි. ඇන්ජිම ක්‍රියා කරවීම පිණිස මිට කරකැවීම නිසා අපේ අත් ගිනි රත්වී තිබිණි. ලං ලංව මෙලෙස වැඩකිරීම නිසා අප එකිනෙකාගේ මුහුණු වලට වැදෙන සේ අපි ආශ්වාස ප්‍රශ්වාස කළෙමු. අපි එකම කාර්‍යයක් සඳහා වෙහෙසුණෙමු. සමහර විට අප දෙනෙ එකම දෙයක් ගැන කල්පනා කළා විය හැක.

ඇන්ජිම අපට අභිකරු විය. අපි විඩාවට පත්වීමු. අසේල් අපට උණුවතුර බඳුන් දෙකක් ගෙනාවාය. බඳුන් දෙක අප ඉදිරියේ තැබූ ඈ නිහඬවූවාය. බයිටෙමීර් ද මමද එකතුවී නැවත වරක් ඇන්ජිම ක්‍රියා කරවීමු. අවසානයේදී ඇන්ජිම හඬ නැගිය. මම රියැදුරු අසුන මත වාඩිවී යතුර ක්‍රිය කරවීමි. බයිටෙමීර් බොනට්ටුව හැර පුලිඟු පේනු පිරික්සා කරන්නට විය. එවිට ගෙතුලින් පිටත දහඩිය දමමින් දුව ආ සාමට් ලොරිය වටේ දුවන්නට වූයේ එහි නැග රවුමක් යන ආශාවෙනි. අසේල් ඔහු අතකින් අල්ලාගෙන ලොරිය අසලට වී නිහඬව සිටියාය. ඈ මා දෙස බැලුවාය: එහි නින්දාව මුසු අවලාදයක්ද, වේදනාවක් හා අනුකම්පාවක්ද තිබිණි. මා කළ වරද නිවැරදි කරනු වස් ඕනෑම දඬුවමක් විඳීමට මට සිතිණි.

ලොරියේ දොර හැර ඈ වෙත නැඹුරුවූ මම පහත් හඬින් ඇට කතා කොට මෙසේ පැවසීමි.

``අසේල්! පුතාවත් අරගෙන වාඩිවෙන්න. පළමුදවසේ ඔයාව ගෙනගිය විදියට නැවත ගෙනයන්නම්!``

මා කී දේ බයිටෙමීර්ට නොඇසෙන පරිදි ඇන්ජිමේ ශබ්දය වැඩි කළ මම ඇගෙන් ඇයද සිටියෙමි.

අසේල් නිහඬව මා දෙස බලා සිටියා මිස වචනයකුදු කතා නොකළාය. කළුළු පිරි දෙනෙත් ඉවතට ගත් ඈ මගේ යෝජනාවට අකමැත්ත පළ කරමින් හිස වැනුවාය.

``අම්මේ ලොරියට නැගලා රවුමක් යමු`` යි සාමට් කිව්වේය.

නැවත මා දෙස නොබලාම හිස පාත් කරගත් අසේල් පුතාද අතින් අල්ලාගෙන ගේ දෙසට පා තැබුවාය. මටගේ ග්‍රහණයෙන් මිදී පැන යාමට සාමට් තැත් කළත්, එය ඉටු නොවිය.

බොනට්ටුව වසමින් නැගී සිටි බයිටෙමීර් මිට්ය මා අතට දී ''ඔක්කොම හරි'' යැයි කියත්ම මම රිය පදවාගෙන මහ මගට පැමිණියෙමි.

නැවත ලොරියේ සුක්කානම මා අතය. මා ඉදිරියේ මහ මගය, කඳුය. ලොරිය මා ගෙන ගියේය. මගේ සිත් වේදනාව ගැන එය නොසැලකිලිමත් විය.

මා අසේල් සහ පුතු හමුවුයේත් ඔවුන්ගෙන් ඈත් වුයේත් ඔය ආකාරයටය. දේශසීමාවට යනතුරු මම කල්පනා කළෙමි. නැවත එන ගමන්ද එලෙසම කල්පනා කළෙමි. එහෙත් අළුත් යමක් ගැන කල්පනා කළ නොහැකි විය... සීමා රහිත සිතුවිලි නිසා වෙහෙසට පත්වීමි. දැන් ඉතින් පැනයාම හැර අන් මගක් මට නැත. හිස හැරුණු අත බලා යා යුතුය. මෙහි නැවතී සිටීම නුවණට හුරු නැත.

මම ඇඩි ලෙසම තීරණය කළෙමි. දේශ සීමාවේ සිට හැරී ආවේ එවැනි අදිටනයකිනි. අසේල් පදිංචි වී සිටි තැන අසලින් ලොරිය පැදවූ මම මහ මග අසල සාමට් තවත් ළමයින් දෙදෙනෙකු සමග කෙලිමින් සිටින සැටි දුටිමි. තාස්-කාර් ගොත් නැමැති ක්‍රීඩාවෙහි යෙදී සිටි ඔවුහු ගල් ගැට වලින් ගව මඩු සාදමින් සිටියහ. ඔවුන් මෙසේ ක්‍රීඩා කරන සැටි මීට පෙරද මා දැක ඇතැයි මට සිතේ. මගේ පුතු දැකත් දිනපතාම මා එතැන පසුකරමින් ගොස් ඇත. මම රිය නැවැත්වීමි.

''සාමට්!'' යැයි මා ඔහු ඇමතුවේ ඔහු නැවත වරක් බැලීමේ ආශාවෙනි. ළමයි තිදෙනම මා වෙත ආහ.

''මාමා ආවේ අපව රවුමක් ගෙනියන්ටද?'' මෙසේ ඇසූ සාමට් මා දෙසට දුවමින් ආවේය.

''ඔව්. පොඩි රවුමක් ගෙනියන්ට පුළුවනි!'' මම කිව්වෙමි.

ළමයි හැමදෙනම ලොරියට නැග ගත්හ.

''මේ මාමාව අපි හඳුණනව!'' යැයි සාමට් කීවේ ආඩම්බරයෙනි.

මම ඔවුන් කුඩා වට රවුමක් ඔස්සේ ගෙනයමින් රිය පැදවීමි. කුඩා දරුවන් ලැබූ ප්‍රීතියට වඩා වැඩි සතුටක් හා ප්‍රීතියක් මේ ගමනින් මම ලැබීමි. මම ඔවුන් බිමට බැස් වූයෙමි.

''ළමයිනි දැන් ඉතින් ගෙදර පලයල්ලා!'' ළමයි දුව ගියහ. මම පුතු නැවැත්වීමි.

''සාමට්. නවතින්න. මම යමක් කියන්නම්!'' මෙසේ කී මම සාමට් ඇතින් ගෙන ඔහු මගේ හිසට උඩින් ඔසවා ඔහු දෙස බලා, ඔහු සිපගෙන මහත් ආදරයෙන් වැළඳගතිමි.

''මාමා ගේනවයි කී කඩුව ගෙනාවද?'' යි සාමට් මගෙන් ඇසීය.

''අනේ පුතේ මට අමතක වුණා. ළඟන වර ගේන්නම්.''

"අනිත් පාර එනකොට අමතක කරන්ට එපා. හොඳද මාමේ. අපි මෙතැන හෙටත් සෙල්ලම් කරනවා" යි සාමට කීය.

"හොඳයි. දැන් ඉතින් ගෙදර යන්න!"

ඩිපෝවේ වඩුමඩුවට ගොස් සෙල්ලම් අසිපත් තුනක් මම සාදා ගතිමි. ඊළඟ වාරයේදී මම ඒවා ගෙන ගියෙමි.

ළමයි මා එනතුරු බලා සිටියහ. දෙවන දවසේදීද මම ඔවුන් ලොරියට නංවා ගෙන සෙල්ලම් ගමනක් ගියෙමි. මේ විධියට මගේ පුතා සහ ඔහුගේ මිතුරන් සමග මම මිතුරුදම් ඇතිකර ගතිමි. ඔවුහු මට ඉක්මනින් පුරුදු වූහ. මා ලොරිය පදවනු දුටු ඔව්හු ඔට්ටුවට මා වෙත දිවමින් ආහ.

"අපේ ලොරිය එනවා! අපේ ලොරිය එනවා!"

මට අමුතු පණක් ලැබිණි. මම මිනිසෙක් වීමි. බඩු පටවා ගෙන හෝ බඩු බා එන මා තුළ ප්‍රසන්න හැඟීමකි. මගේ පුතා මා එනතුරු බලා සිටින බව දන්නා මා සිත පිනායයි. ඔහු සමග විනාඩි දෙකක් ගතකිරීම පවා මට සැපතක් ගෙන දුන්නේය. දැන් මගේ හැම ක්‍රියාවක්ම වේලාව අතපසු නොකොට පුතු මුණගැසීම මත රඳා පැවතිණි. වසන්තය පැමිණෙත්ම දවස් උණුසුම් විය. ළමයි එළිමහනේ සෙල්ලම් කරන්නට වූහ. එබැවින් නිතර මට ඔවුන් හමුවිය. මා ජීවත් වන්නේත්, වැඩ කරන්නේත් ඒ සඳහා යැයි මට සිතිණි. මම එතරම් ප්‍රීතිවීමි. එහෙත් ඒ අතරම මගේ හදවත බියෙන් සැලිණි. මා ළමයින් ලොරියට නංවා ගෙන සෙල්ලම් ගමන් යන බව අසේල් හා බයිටෙමීර් දනිත්ද? ඔවුන් ඒ බව දැන ගත්තා හෝ නොගත්තා හෝ සාමට්ට ගෙදරින් එළියට යාම තහනම් කරනු ඇත. මහ මග අසල සෙල්ලම් කිරීමට ඔහුට අවසර නොදෙනු ඇත. අසේල් හා බයිටෙමීර් එය නොකරතියි මම සිතාගතිමි. එහෙත් ඔවුන් එසේ කරතියි සිතූ මම බියවීමි. එහෙත් දවසක් දා මා සිතූ පරිදි මගේ සැකය තහවුරු විය...

මැයි දින උත්සවය ළඟාවිය. පුතුට යම්කිසි තෑග්ගක් දීමට මට සිතිණි. සෙල්ලම් ලොරියක් මිළදී ගතිමි. එදින උදෑසන යම්කිසි වැඩක් නිසා ඩිපෝවේ පමාවීමට සිදුවිය. මා ඉක්මනින් රිය පැදවූයේ පමා නොවීම පිණිසය. මගේ ස්නායු කිපුණු කලෙක මෙන් මම නොසන්සුන් වීමි. ලොරිය පදවන අතර මගේ තෑග්ග ලබන සාමට් ප්‍රීතිවන සැටි සිතින් මවා ගෙන සතුටු වුණෙමි. සාමට්ට වටිනා සෙල්ලම් බඩු රාශියක් ඇති බව සැබෑය. එසේ වුවද මෙය විශේෂ තිළිණයකි. හැදී වැඩුණු පසු ලොරි පදවන රියැදුරකු වීමට බලාපොරොත්තු වන කුඩා ළමයකුට වැඩිහිටි රියැදුරකුගෙන් තිළිණයකි. එහෙත් මෙවර සාමට් එතැන සෙල්ලම් කරමින් නොසිටියේය. ඉතිරි ළමයි දෙදෙන මා වෙත දුව ආහ. මම ලොරියෙන් පිටතට බටුයෙමි.

"සාමට් කොහිද?"

''ගෙදර. සාමට් අසනීපවෙලා'' යැයි ළමයෙක් පිළිතුරු දුන්නේය.

''අසනීපවෙලාද?''

''නැහැ. සාමට් අසනීප වෙලා නැහැ''යි හැම දෙයක්ම දන්නා විලාසයක් පාමින් කතා කළ ළදැරිය පැවසුවාය. ''සාමට්ට පාර අයිනෙ සෙල්ලම් කරන්ට තහනම් කළා.''

''ඇයි?'' මම ප්‍රශ්න කළෙමි.

''දන්නෙ නැහැ. එයාගෙ අම්මා එයාට මෙහාට එන්න ඉඩ දෙන්නෙ නැහැ.'' යි ළදැරිය කීවාය.

මගේ සිත, කය දෙකම හැකිළිණි. අවසානය පැමිණ ඇත.

''මෙන්න මේක සාමට්ට දෙන්නැ'' යි මා අත තිබූ සෙල්ලම් ලොරිය සහිත පාර්සලය කොල්ලාට දුනිමි. එහෙත් විගස නැවත එය අතට ගෙන ''නැහැ. ඕක නැහැ. පස්සෙ දෙන්ට පුළුවනි'' යි කී මම ලොරිය දෙසට ගියෙමි.

''අද මාමා අපට රවුමක් ගෙනියන්නෙ නැත්තෙ ඇයි?'' කොල්ලා තම අක්කා ගෙන් ඇසීය.

''මාමා අසනීපවෙලා!''

ඔව්. ළදැරිය සැබැවින්ම මා ලෙඩවුණු බව දැනගත්තාය. මගේ මානසික තත්ත්වය රෝගියකුටත් වඩා අන්ත විය. අසේල් මෙතරම් මා සමග තරහවූයේ මන්දැයි කල්පනා කරමින් මම ලොරිය පැදවීමි. සැමියෙකු වශයෙන් මා අතිශයින් පහත් එකකු බවට තර්කයක් නැත. එහෙත් ඇ තුළ මා කෙරෙහි අනුකම්පාව වැනි ගුණයක් පවා රැඳී නැතිද? නැත එය මට විශ්වාස කළ නොහැක... එය අසේල් සතු ගුණයක් නොවේ. වෙනත් ගුණයකි. එය එසේයැයි මා දන්නේ කොහොමද?.. ඇත්තෙන්ම පුතාට මඳ අසනීපයක් වැළඳී ඇතැයි සිතා ගැනීමට මම වෑයම් කළෙමි. මට ඒ කතාව කී පුංචි කොල්ලා විශ්වාස නොකරන්නේ මන්ද? පුතා අසනීප වී සිටිතියි මා කොතරම් තදින් විශ්වාස කළේදයත්, පුතු උණ විකාරයේ දොඩවන සැටි පවා මට පෙනිණ. සමහර විට ඔහුට උදව් කළ යුතුය. නැතිනම් ඔහුට අවශ්‍ය බෙහෙතක් ලබා දිය යුතුය. එසේත් නැතිනම් සාමට් රෝහලකට ගෙන යා යුතුය. මෙහි මිනිස්සු නගරයක මහ වීදියක නොව කඳුගැට අසල පදිංචි වී සිටිති. මේ හැඟීම් නිසා මම වේදනාවෙන් පෙළුණෙමි. වහාම ලොරිය ආපසු හරවා ගෙන වේගයෙන් ඉදිරියට ගියේ පුතු දකින ආශාවෙන් මිස ස්ථිර යම්කිසි අදහසක් ඇතිව නොවේ... ඔහු මට දකින්නට ලැබෙතියි යන හැඟීමක් ස්ථිරලෙසම ඇතිවිය. වැඟි නැති සෙණ වැදුණාක් මෙන් මගේ පැට්රල් ටැන්කිය හිස්විය. බණිජ තෙල් ලබාගැනීම පිණිස නැවතීමට මට සිදුවිය...

මා සමග දුම්රියේ ගමන් කරමින් මට තම කතාව මෙතෙක් වේලා කියමින් සිටි ඉල්යාස් නිහඬ විය. හේ දැන් පිස දමමින් හඬ නැගෙන සේ ප්‍රශ්වාස කළේය. දුම්රිය මැදිරියේ කවුළුව හැරදමා දුම් බොන්නට පටන් ගත්තේය.

දැන් වේලාව මැදියම් රෑ පසුව් ඇත. අප හැර දුම්රියේ ගමන් කළ හැම කෙනෙක්ම නිදා සිටියහ. දුම්රිය රෝද ගැටෙන හඬ අවසානයක් නැති ගීයක් ගයන්නාක් මෙනි. ගිම්හානයේ ආලෝමත් රැය ගෙවී ගියේය. කුඩා දුම්රිය ස්ථානවල පහන් එළිය පෙනිණ. දුම්රිය යන්ත්‍රය හූ හඬ නගමින් දුවයි.

``හරියට එදා ඔන්න ඔය වෙලාවට තමා අගායි., තමුසෙව මට මූණ ගැසුණේ. ඉතින් මම ඔහෙගෙ ඉල්ලීම එදා ප්‍රතික්ෂේප කළා. දැන් කාරණය ඔහෙට පැහැදිලි නේද?`` මෙසේ ඇසූ ඉල්යාස් කල්පනාකාරී ලෙස මඳ සිනාවක් පෑවේය. ``ඔහෙ පැට්රල් පෙඩ් එක ළඟ නැවතී සිට පස්සෙ 'පොබියෙදා' මොටෝ රථයෙන් මා පසුකර ගෙන ගියා. මම ඒක දැක්කා... ඔව් ඉතින් මම එදා මගේ පුතා\x\xසාමට් බලන්න ගියේ බොහොම කැළඹුණු සිතකින්. මගේ ඉව මට බොරු කළේ නැහැ. සාමට් මා එනතුරු පාර අයිනෙ බලාගෙන හිටිය. මගේ ලොරිය දුටු හැටියේ එයා ඉස්සරහට දුවගෙන ආවා.

``මාමා! ඩැයිවර් මාමා!..``

මගේ පුතා සැපෙනි. මා කොතරම් සතුටු වුණාදයත්, මුළු ලෙවම මගේ සතුටින් පිරවීමට හැකිව තිබිණි.

මම රිය නවත්වා පුතා පිළිගැනීමට ඉදිරියට දුව ගියෙමි.

``පුතාට අසනීප වුණාද?``

``නැහැ. අම්මා කිව්ව යන්ට එපයි කියල. අම්මා කිව්ව මාමාගෙ ලොරියෙ යන්ට එපා කියල. මම ඇඬුවා.`` සාමට් කිව්වේය.

``ඉතින් කොහොමද පුතා දැන් මෙතනට ආවේ?``

``කවුරු හරි කැමති නම් ලොරියෙ ළමයින් නංවාගෙන සෙල්ලම් කරන්න, ඔහෙ සෙල්ලම් කළාවෙ! කියල තාත්තා කිව්වා`` යැයි සාමට් පැවසීය.

``ඒකත් එහෙමද?``

``මම කිව්ව ලොකු වුණාම ඩැයිවර් කෙනෙක් වෙනව කියල...`` සාමට් කිව්වේය.

``ඔව්, ඇත්තටවම පුතා බොහොම දක්ෂ ඩ්‍රයිවර් කෙනෙක් වේවි. පුතා දන්නවද මම ගෙනා තෑග්ග මොකක්ද කියල?`` මෙසේ ඇසූ මම

සෙල්ලම් ලොරිය අතට ගත්තමේ. ``මන්න පුංචි ඩිරයිවර්ලාට හොඳටම ඕන කරන සෙල්ලම් බඩුව තමා මෙය!``

සාමට් සිනාසෙමින් ප්‍රීතිවිය.

``හැමදාම මම මාමත් එක්ක ලොරියෙ රවුම්සාම් ගහනව නේද මාමේ?`` යැයි සාමට් මගෙන් ඇසුවේ ආයාචනා කරන සැටියකිනි.

``ඔව් සත්තකින්ම හැමදාම! පුතා කැමතිද මැයි පළමුවැනිදා උත්සවයට නගරයට යන්න. මම ගිහිං ලොරිය රතු කොඩිවලින් සරසන්නම්. පස්සෙ ලොරියෙ පුතාව නංවාගෙන නගරෙට ගෙන යන්නම්.`` මම කිව්වෙමි.

මා එසේ කිව්වෙ මන්දැයි දැන් මට විස්තර කළ නොහැක. එසේ කීමට ඇති අයිතිය කුමක්ද? මා කී දේ මා විශ්වාස කළේ මන්ද යන්න මම නොදනිමි. එපමණක් නොව මම තවත් දුර ගියෙමි.

``පුතාට හොඳයි කියල හිතෙනවනම් මා ලඟ හැමදාම නවතින්න පුළුවනි`` යි මා කීවේ බැරෑරුම් ගතියකිනි. ``මම පුතාව ලොරියෙ මගේ ආසනය ළඟම වාඩිකරවා ගෙන හැමතැනම ගෙනියනව. කොහෙ ගියත් අපි දෙන්න එකට යමු. හැමදාම එකට එකට් ඉඳිමු. පුතා කැමතිද?``

``කැමතියි!`` සාමට් එකවරම කැමති විය. ``අපි ලොරියෙ ඇතුළෙ ගෙයක් හදාගෙන ඉඳිමු! මාමේ, දැන්ම යමු. දැන්ම යමු!``

වැඩිහිටියන්ද සමහර අවස්ථාවලදී ළමයින් මෙන් හැසිරෙන බව මා අසා ඇත. අපි ලොරියට නැග වාඩිවීමු. අස්ථිර ලෙස එන්ජිමේ යතුර කරකවා මම එය ක්‍රියා කරවීමි. ප්‍රීතියෙන් ප්‍රමෝදයට පත්වී සිටි සාමට් මා අසලට වී උඩ පනිමින් සිනහසුණේය. ලොරිය ඉදිරියට පැදවීමි. සාමට් තව තවත් ප්‍රීතිවෙමින් සුක්කානමත්, රිය පදවන යතුරු පුවරුවේ විවිධ පාටැති ඇණත් පෙන්වමින් නොයෙකුත් දේ ගැන කතා කරන්නට විය. ඔහු නිසා මම ද ප්‍රීති ප්‍රමෝදයට පත්වීමි. මගේ මුහුණ රත් පැහැ ගත්තේය. මා කරන්නේ කුමක්දැයි මට අවබෝධ වුයෙන් මම රිය පදවන වේගය අඩු කළෙමි. සාමට් රිය නැවැත්වීමට මට ඉඩ නොදුන්නේය.

``මාමේ! වේගය වැඩිකරන්න! වේගය වැඩි කරන්නැ!`` යි ඔහු ඉල්ලා සිටියේය. පුතුගේ ප්‍රීතිමත් දෙනෙත් වලින් කරන ආයාචනය ප්‍රතික්ෂේප කිරීමට මම අපොහොසත් වීමි. මම වේගය වැඩි කළෙමි. අප ඉදිරියේ ඇති මහ මගෙහි කොටසක පාර තලන ස්ටීම් රෝලර් යන්ත්‍රයක් ක්‍රියා කරන සැටි මම දුටිමි. එම යන්ත්‍රය හරවන විට එහි පිටුපස සිටි බයිටෙමීර් මවිසින් දක්නා ලදි. ඔහු උණු තාර වත්කරමින් මහ මග අළුත් වැඩියා කළේය. ඔහු දුටු මම විස්මය පත්වුණෙමි. රිය නැවැත්වීමට මට සිත්වුණද එය නොකළ හැකි විය. මා සමග සාමට් බොහෝ දුර ගොසිනි. මම ඉදිරියට නැඹුරු වී වේගය තවත් වැඩි කළෙමි. බයිටෙමීර් අප දෙස නොබලාම තම වැඩෙහි

යෙදුණේය. විනාඩියක් පාසා ඔහු පසු කර යන ලොරි හා අනිකුත් රථ වාහන දෙස බැලීම කාලය අපතේ යවන දෙයක් ලෙස ඔහු සිතති යි මම විශ්වාස කරමි. එසේ වුවද, සාමට ඔහු දිවිය.

``අන්න තාත්තා! මාමේ අපි තාත්තාවත් අඬගහගෙන රවුමක් යමු!`` යි සාමට යෝජනා කළේය.

මම නොනැවැත්වීමි. මා නවත්වන්නේ කෙසේද? මගේ ක්‍රියාව ගැන බයිටෙමීර්ට මොනවා කියන්ටද? සාමට ජනේලයෙන් හිස ඉවතදමා මහ මග දෙස බලත්ම, ඔහුට බිය සිතිණි. ඔහු අඬමින් කෑ ගසන්නට විය:

``මට තාත්තා ළඟට යන්ට ඕන. තාත්තා ළඟට යන්ට ඕන. ලොරිය නවත්වන්ට. අම්මේ!``

කඳු ගැටය අසල වංගුවකට හරවා මම ලොරිය නැවැත්වීමි. සාමට සන්සුන් කිරීමට උත්සාහ කරමින් ඔහුට මෙසේ පැවසීමි:

``අඬන්ට එපා! සාමට අඬන්ට එපා! මම නුඹව ආපහු ගෙන යන්නම්. අඬන්ට විතරක් එපා!``

එහෙත් බියවූ සාමට හැඬීම නතර නොකළේය.

``බැහැ, බැහැ. මම යන්නෙ නැහැ. තාත්තා ළඟට යන්ට ඕන. දොර හරින්න!`` යැයි කී සාමට හඬන්නට විය.

බලාපොරොත්තු නොවූ දෙයක් සිදුවිය.

``නුඹ අඬන්ට එපා! දැන් මම දොර හරින්නම්. මම නුඹව තාත්තා ළඟට ගෙනයන්නම්. හොඳයි එළියට බැහැපන්!``

සාමට බිමට බැස හැඬූ කඳුළෙන්ම ආපසු දුවන්නට ලැහැස්ති විය. මම ඔහු අල්ලා ගතිමි:

``නැවතියන්! කඳුළු පිහදාගනින්. අඬන්ට එපා. අනේ මගේ රත්තරන් පුතේ! අඬන්ට එපා. බලපන් මම නුඹට ගෙනාපු තෑග්ග. හරිම ලස්සන ලොරියක්. බලපන්!`` මෙසේ කී මම සෙල්ලම් ලොරිය වෙව්ලන අත්වලින් ගෙන එය ක්‍රියා කරවනු වස් එහි යතුර කරකැවීමි. ``ඔන්න දැන් මේ ලොරිය මම පුතා ළඟට එවන්නම්. පුතා එය අල්ලන්නට!`` සෙල්ලම් ලොරිය ඉදිරියට ගොස් ගලක හැපී ළඩු යටිකුරුව පෙරළී අගලක වැටිණි.

``මට ඔය ලොරිය එපා!`` යි කී සාමට මහ හඬින් කෑගසමින් පසු නොබලා දුවන්නට විය.

මගේ උගුර හිරවෙන්නාක් මෙන් දැනිණි. මම සාමට පිටුපසින් දුවන්නට වීමි:

``සාමට් නැවතියන් අඬන්ට එපා! මම නුඹේ... මම නුඹේ... නුඹ දන්නවද?..`` මගේ දිව ගොත ගැසුණු නිසාදෝ වුවමනා වචන සොයාගත නොහැකි විය.

පසු නොබලා වේගයෙන් දිවගිය සාමට් වංගුවෙන් හැරුණු පසු මම ඔහු ලුහුබැඳීම නැවැත්වීමි.

මහ මග අළුත් වැඩියා කිරීමෙහි යෙදී සිටි බයිටෙමීර් වෙත දුවගිය සාමට් ඔහු බදා අල්ලාගත් සැටි මම බලා සිටියෙමි. බයිටෙමීර් උත්කුටියෙන් ගිඳ ගෙන සාමට් සිප ගත්තේය. සාමට් බයිටෙමීර්ගේ උරහිසට උඩින් එබී බලන සැටි පෙනිණි. ඔහුලේ ළදරු නෙත් බියෙන් පිරිලාය.

බයිටෙමීර් තම උපකරණය කර තබාගෙන සාමට් අතින් ගෙන ගමන් කළේය. විශාල සිරුරකින් හෙබි මිනිසාද කුඩා ළමයාද මහ මග දිගේ පියවර නැගූහ.

කඳු ගැටය අල්ලා ගෙන බොහෝ වේලාවක් සිටි මම සෙමින් ලොරිය දෙසට ගියෙමි. අහලට වැටී ඇති සෙල්ලම් ලොරිය දෙස බැලූ මට හැඩිණි. කඳුළු ධාරා දෙකොපුල් ඔස්සේ ගලන්නට විය. මා පදවන ලොරියේ බොනට්ටුව අත ගෑ මම ''ඔන්න ඔහොම තමා!'' යැයි කිව්වෙමි. ලොරි ඇන්ජිමේ උණුසුම මට යම්කිසි සහනයක් ගෙන දුන්නේය. මගේ පුතා මම අවාසන වරට මුණ ගැසුණු සැටි දුටු අවේතනික සාක්ෂ්‍ය කරුවකු වන මගේ ලොරිය මට වඩාත් කිට්ටු වස්තුවක් විය...

ඉල්යාස් නැගිට සිට දුම්රියේ කොරිඩෝරය දෙසට ගියේය.

''ප්‍රණීත සුළං ආශ්වාස කරන්න ඕන'' හේ කීවේය.

දුම්රිය මැදිරියේ වාඩිවී සිටියේ මා පමණකි. අරුණෝදය ලංව ඇත. ඈඳිරි අහස යමනමින් එළිය ලබාගෙන එන සැටි මට පෙනේ. විදුලිය කම්බි සවිකර ඇති කණුවල සේයාව දැකිය හැක. මැදිරියේ විදුලිය පහන මම නිවා දැම්මී.

ඉල්යාස් නොදන්නා එහෙත් මා පමණක් දන්නා කිසිවක් මා ඔහුට කිව යුතුදැයි මම කල්පනා කරන්නට වීමි. ඔහු බොහෝ වේලාවක් යන තුරු නොපැමිණියෙන් මම අදහස අතහැර දැම්මී.

අසේල් සහ සාමට් බයිටෙමීර් සමග ජීවත්වන බව ඉල්යාස් දැනගත් සඳය මට මහා මාර්ගය අළුත් වැඩියා කර ශිල්පියා මුණ ගැසුණේ.

කිර්ගීසියාවේ සියලු මහා මාර්ග ශිල්පීන්ගේ නියෝජිත මණ්ඩලයක් පාමිර්වලට යමින් සිටියේය. තජිකිස්ථාන් සෝවියට් සමාජවාදී ජනරජයේ මධ්‍යම පුවත්පතකින් ලැබුණු ආරාධනයක් අනුව මම මේ ශිල්පීන් ගැන ලිපියක් ලියා පළකිරීම පිණිස පාමිර්වලට ගියෙමි.

මේ නියෝජිත මණ්ඩලයේ එක් නියෝජිතයෙකි. බයිටෙමීර් කුලොව්.

ඔහු හමුවීම පිණිස මම වොලොන්ස්ක් කඳුකර පෙදෙසට පැමිණියෙමි.

බලාපොරොත්තු රහිතව, මගේ වාසනාවට මෙන් මම ඔහු හමුවුණෙමි. දුර්ග මාර්ගය අසලදී රතු කොඩියක් අතින් රැගත් මිනිසකු විසින් අපේ බස්රිය නවත්වන ලදි. කඳු වැටියකින් පස් කණ්ඩි කඩා වැටී ඇති බැවින් මහ මග අළුත් වැඩියා කොට පස් ඉවත දමන බව ඔහු අපට කීය. මම බස්රියෙන් බැස පස් කණ්ඩි කඩා වැටී ඇති තැනට ගමන් කළෙමි. පස් කණ්ඩි කඩා වැටී ඇති කඳු වැටිය දිගට, දිගැති ලී කඳන් සවිකොට තාප්පයක් වැනි ආරක්ෂක පටියක් සාදා ඇති බව මට පෙනිණි. බුල්ඩෝසරයක් පස් ඉවත ලන්නට විය. උදළු හා ඉස්කෝප්ප ගත් පිරිසක් බුල් ඩෝසරයට යන්ට බැරි පටු තැන්වල පස් ඉවත දමමින් වැඩ කරමින් සිටියහ. වැඟි කබායකින් හා දණහිස දක්වා උසැති සපත්තු හැඳගත් මිනිසෙක් බුල්ඩෝසරය පදවන රියැදුරාට අණ කරමින් ඉදිරියෙන් ගමන් කළේය.

''තරමක් වමට හරවපන්. තව වරක් ශුද්ධ කරපන්. ලී කඳන්වලට ළං වෙයන්. හොඳයි. නවත්වාපන්. පස්සට පදවපන්!..''

පාර නැවත සාදා බාධා ඉවත් කරන ලදි. දෙපස නවත්වා සිටි රථ වාහනවල රියැදුරෝ නලා ශබ්දකරමින් බැණ වදිමින් තමන්ගේ රියවලට යාමට අවසර ඉල්ලා සිටියහ. ඒ හඬ ගණනකටවත් නොගත් වැඟි කබාකාරයා බුල්ඩෝසරය පදවන්නාට අණදෙමින් තම වැඩවල යෙදුණේය. වංගු වල හැම මුල්ලක්ම නිසි ලෙස තලා අලුත් වැඩියා කරන තුරු ඔහු මිනිසුන්ට අණ දුන්නේය. ''ඔහු අනිකකු නොව බයිටෙමීර් විය යුතුයයි මම නිගමනය කළෙමි!'' මගේ නිගමනය නිවැරදිය. ඔහු බයිටෙමීර් කුලොව්ය. අවසානයේදී මග විවෘත කොට වාහනවලට යාමට අවසර දෙන ලදි.

''ඇයි තමුසෙ පමාවුණේ? තමුසෙගෙ බස්එක ගියා නේවද?''

''මම ඔහෙව හම්බවෙන්ටයි ආවේ!''

බයිටෙමීර් පුදුම නොවිය. තම ගරුත්වය පෙන්වමින් ආචාරශීලි ලෙස අත දුන්නේය.

''මගෙ අපේ අමුත්තකු ලෙස සාදරයෙන් පිළිගන්නව.''

''ඔහෙව හමුවන්ට ආවෙ වැඩකට, බාකේ.'' මා ඔහුට ලොකු උන්නැහෙ යන නමින් ගරු සැලකිලි දැක්වූයේ උවමනාවෙනි. ''අපේ මාර්ග ශිල්පීන්ගෙ නියෝජිත මණ්ඩලයක් තජිකිස්ථානයට යන බව ඔහෙ දන්නව නේවද?''

''ඒ ගැන මම අහල තියෙනව'' යැයි බයිටෙමීර් පිළිතුරු දුන්නේය.

''ඉතින් ඔන්න ඔහෙ යන්න ඉස්සෙල්ලා මම ඒ ගැන කතා කරගන්නයි මේ ආවෙ.''

මගේ පැමිණීමේ හේතුව ගැන මා විස්තර කරන්ම, ඔහු වඩාත් බැරෑරුම් විලාසයක් පෑවේය. කල්පනාකාරී ලෙස ඔහු තම උඩු රැවුල අතගාන්නට විය.

''තමුසෙ මෙහෙ ආ එක නම් හොඳයි. එහෙත් මම පාමීර්වලට යන්නෙ නැහැ. ඒ නිසා මා ගැන ලිවීම එතරම් හොඳ මදි.''

''ඇයි නොයන හේතුව? වැඩ කටයුතුද? ගෙදර කරදරද?''

''වැඩ කටයුතු, පාරේ වැඩ කට යුතු. තමුසෙටම පේනව නෙව. ගෙදර ගැනද? මෙසේ ඇසූ බයිටෙමීර් නිහඬ විය. ඔහු සිගරැට්ටුවක් දල්වා ගත්තේය. ''ගෙදර ... ගෙදරත් වැඩ තියනව. අනිත් පවුල්වලට වගේමයි ... කොහොම වුණත් මම පාමීර් යන්නේ නැහැ.''

ඔහු තරම් දක්ෂ, මාර්ග අළුත් වැඩියා කරන ශිල්පියෙත් එම නියෝජිත මණ්ඩලයේ සිටිය යුතු බව ඔහුට ඒත්තු ගැන්වීමට උත්සාහ කළ මම තර්ක ඉදිරිපත් කළෙමි. ආචාරශීලියකු වූ ඔහු මට සවන්දෙමින් නිහඬව සිටියා මිස ඔහුගේ තීරණය වෙනස් කිරීමට මට බැරිවිය.

කාර්යය නිශ්ඵලවීම නිසා මම මා කෙරෙහි කෝපවීමි. මගේ ඩෘත්තිමය ඉව මේවර මට බාධා කළේය. බයිටෙමීර් කෙරෙහි මා දැක්වූ ආකල්පය වැරදි බව මට වැටහිණි. තර්ජය මණ්ඩලයේ කාර්යය මට ඉටුකිරීමට නොහැකිවී තිබීම නිසා හිස් අතින් යාමට සිදුවී ඇත.

''හොඳයි, බාකෝ, මට එහෙනම් සමාවෙන්න. මී ළඟ බස් එකේ නැගිල මම ගෙදර යන්නම්'' යැයි මම බයිටෙමීර්ට කිව්වෙමි.

බයිටෙමීර් මා දෙස සන්සුන් ලීලාවෙන් බලන්නට විය. ඔහුගේ දෙනෙත් බුද්ධිමත්ය. ඔහු මඳ සිනාවක් සාමින් මට කතා කළේය.

''නගරබද කිර්ගීස්වරු සිරිත් අමතක කරනව. මට ගෙයක් තියනව. පවුලක් ඉන්නව. අමුත්තන් සඳහා වෙන්කළ 'දස්තර්කොන්' මේස රෙද්දක් තියනව. ඒ වගේම අමුත්තෙකුට නිදාගැනීමට ඇඳක් තියෙනව. තමුසෙ මාව හමුවන්නට ආව නම් එන්න අපේ ගෙදරට. හෙට උදේට ගෙදරින් පිටත්වී යන්ට පුළුවනි. මහ පාරෙ ඉඳල සමුගන්ට මම ඉඩ තියන්නෙ නැහැ. මම ඔහෙට මගේ බිරිඳටයි, පුතාටයි හඳුන්වා දෙන්නම්. හවස ඇඳිරි වැටෙන්ට ඉස්සෙල්ලා අනික් තැන් වලට ගිහින් කළ වැඩ හොයා බලන්ටත් තියෙනව. ඔහෙ සමාවෙන්න. මගේ වැඩවල හැටි ඔහොම තමා. මම ඉක්මනින් එන්නම්...''

''බාකෝ, පොඩ්ඩක් නවතින්න, මමත් ඔහෙ සමඟ එන්නම්. ඔහෙ වැඩ ගැන සොයා බලන හැටි දැකගන්ට'' යැයි මම කිව්වෙමි.

බයිටෙමීර් නෙත් හකුළුවා ගනිමින් මගේ නගරබද ඇඳුම් කට්ටලය දෙස බැලීය.

"මෙහෙට මා සමඟ ගමන් කිරීම අපහසුයි. දුර යන්න ඕන. කඳු නගින්න ඕන."

"කමක් නැහැ!"

අපි ගමන් කළෙමු. හැම පාලමක්ම, හැම වංගුවක්,හැම කඳු බෑවුමක්ම සහ මහ පාරට තෙරා ඇති හැම කඳු වැටියක්ම ඔහු පරීක්සා බැලීය. බයිටෙමීර්ගේ විශ්වාසය හා සිත දිනාගැනීමට මා සමත්වූයේ තම ජීවිත කතාවත්, තම විවාහය පිළිබඳ තොරතුරුත් මට කිව්වේය.

<u>බයිටෙමීර්ගේ කතාව</u>

මා පාමීර් නොයන්නේ මන්දැයි ඔබ මගෙන් ඇසුවෙහිය. මම පාමීර්හි උපන් කිර්ගීස් ජාතිකයෙක්මි. දැන් මම තියාන් ෂාන් කඳුවලට පැමිණ සිටිමි. පාමීර් මහ මග සෑදීමේ වැඩට මා සහභාගී වන විට මා යන්තම් ගැටවර වියට පා තැබුවා පමණකි. කොම්සොමෝල් ආයාචනයක් අනුව මම එහි වැඩට ගියෙමි. තරුණයන්වූ අපි මහත් උනන්දුවකින් වැඩ කළෙමු. කිසිවෙකුට යාමට බැරි පාමීර්වලට මහ මගක් කැපීම අපූරු සිද්ධියකි. ශ්‍රම වීරයින්ගේ කණ්ඩායමකට බැඳී වැඩ කර පාරිතෝෂික මුදල් හා පදක්කම්ද දිනා ගත්තෙමි. මෙය මුලපිරීමක් පමණකි.

මා වැඩ කළ තැනම වැඩකළ තරුණියකට මම ආලය කළෙමි. ඕ රූමත්ය. දක්ෂය. ඈ ගම්බද පෙදෙසක එහි වැඩට පැමිණි තරුණියකි. ඒ කාලයේදී කිර්ගීස් තරුණියකට එවැනි වැඩක යෙදීම පහසු දෙයක් නොවීය. අද වුවද කර්මාන්තමය වෘත්තියක යෙදීමට තරුණියකට ලෙහෙසි නැත. අපේ සමහර සිරිත් විරිත් විසින් අප බැඳ ඇති බව ඔබ දන්නෙහිය. අවුරුද්දකින් අප සෑදූ මහ මඟෙහි වැඩ අවසන් විය. මාර්ගය නිතර අළුත් වැඩියා කිරීම සඳහා සේවක පිරිසක් අවශ්‍ය විය. පොදු ජන අත්සාහය නිසා මහ මගක් තැනිය හැකිවුවද, එය නිතර යහපත් තත්ත්වයක තබාගැනීම පිණිස දක්ෂ ශිල්පීන් වුවමනාය. අපට තරුණ ඉංජිනේරු ශිල්පියෙක් සිටියේය. ඔහුගේ නම හුසෙයිනොව්ය. දැන් ඔහු මහා මාර්ග සෑදීමේ නිපුණත්වයක් ලැබූ විශේෂඥයෙකි. අපි දෙදෙනා මිතුරෝ වීමු. දක්ෂතාවය හා දැනීම ලබාගැනීමට විශේෂ කාර්මික අධ්‍යාපනයක් ලබන ලෙස ඔහු මට උපදෙස් දුන්නේය. මා විශේෂ අධ්‍යාපනයක් ලැබීමට ගියහොත් මගේ පෙම්බරිය ගුල්බරා මා එනතුරු නොසිටිනියි මම බියවීමි. ඇගේ දෙමාපියන් ඇය අයිලයට ගෙනයතියි මම බියවිමි. එහෙත් මා විශේෂ අධ්‍යාපනයක්

ලබා එනතුරු ඈ මා පතමින් සිටියාය. පසුව අපි විවාහවීමු. මාර්ග පාලක කාර්යාලය අසල ගෙයක අපි පදිංචිවීමු. අපි සතුටින් ජීවත් වීමු. කඳුකර පෙදෙසේ හා දුර්ග මාර්ගය අසල ජීවත්වන මාර්ග සාදන්නන්ට පවුලක්, විශේෂයෙන්ම ඉතා හොඳ බිරිඳක් සිටීම අතිශයින්ම වැදගත්ය. මේ බව මට අත් දැකීමෙන් ප්‍රත්‍යක්ෂ ලෙස දැනගැනීමට අවස්ථාවක් ලැබිණි. මම මගේ රැකියාවට සදහටම ඇලුම් කළෙමි. මෙහිදී එම ගෞරවය අයත් විය යුත්තේ මගේ ගුල්බරාටය. අපට පළමුව දුවක් ලැබිණි. දෙවැනි වරටද මගේ බිරිඳ දුවක් වැදුවාය. ඉන්පසු පැසිස්ට්වාදී ජර්මනිය සෝවියට් දේශයට කඩා පැන්නේය.

පාමීර් මහ මග ගලාබසින ගඟක් මෙන් විය. දහස් ගණන් මිනිස්සු මේ මහ මග ඔස්සේ යුද හමුදාව වෙත ගියහ.

මගේ වාරයද පැමිණියේය. එක් උදෑසනක අපි මහ මගට බැස ගමන් කළෙමු. පුංචි දූ මම වඩා ගත්තෙමි. ලොකු දූ මගේ කබාය අල්ලගෙන මා සමග ආවාය. මගේ පෙම්බරිය මගේ සුන්දර බිරිඳ ගුල්බරා ගමන් මල්ල අතින් ගෙන කෘත්‍රිම සන්සුන් ගතියක් පෙන්වමින් ගමන් කළාය. එහෙත් කුඩා දරු පැටවුන් දෙදෙනෙකුත් සමග ජන ශූන්‍ය කඳුකර මාර්ග පාලක පෙදෙසක වාසය කිරීම ලෙහෙසි කාර්යයක් නොවන බව ඈ දන්නීය. අපේ ගමේ නෑයින් සමග ඇය වාසය කළ යුතුයැයි මා කී විට ඈ ඊට එකඟ නොවූවාය. කෙසේ හෝ දිවිපෙවෙත රැකගෙන මා එනතුරු දරුවන් රැකබලා ගනිමින් ඉන්නා බව ඈ දැඩිලෙසම කියා සිටියාය. ඇරත් යම් කිසිවෙක් මහ මග රැක බලා ගත යුතුය... මහ මග අයිනක අවසාන වරට සිටගත් මම බිරිඳ හා දරුවන් සිප වැළඳගෙන මවුන් ගෙන් සමු ගත්තෙමි. වයසින් අපි බොහෝ තරුණ වීමු. ජීවත්වීම ඇරඹුවා පමණකි...

ඉංජිනේරු හමුදාවකට මා යවන ලදී. යුද්ධ කාලයේදී අප විසින් ගොඩනගන ලද මාර්ග, පාලම් හා පාරු පාලම් කොපමණද! ඒවා ගණන් කළ නොහැක. ඩොන්, විස්ලා දුනායි වැනි ගංගා හරහා ගමන් කළෙමු. දිය මිදෙන ශීතල ජලයෙන් පිරී ගංගාවලටද හුස්ම ගැනීමට බැරි තරම් ඝනැති දුම් වලාවලටද ගිනිජාලාවලට සහ ෂෙල් වෙඩිවලටද මුහුණ දුන් අපේ හටයින් මැරෙන සැටි බලා අපි සටන් කළෙමු. කල්යත් යත්ම එම නොසන්සුන්තාවය නිසා විඩාපත් වීමු. දැන් දැන් සතුරු වෙඩි පහරකට ගොදුරුවී මියයනියි මම සිතීමි. නැහැ පාමීර් සිට මා මෙතරම් දුර ආවේ පාලමක් යට මියයාමට නොවේ. සතුරු කටු කම්බි දතින් සපා උන්ට පහර දුන්නෙමි. යටත් නොවී සටන් කළෙමි... බර්ලිනය තෙක් යාමට මම ද සමත් වීමි.

මගේ බිරිඳ මට නිතර ලියුම් ලියුවාය. ලියුම් එකතු කිරීමට පැමිණෙන මහල්ලාට ඈ නිතර ලියුම් දුන්නාය. හැම දෙයක් ගැනම සවිස්තර ලෙස ලියූ

ඈ අප විසින් සාදා රැක බලන මහ මග ගැනද සඳහන් කළාය. මා වෙනුවට දැන් මගේ බිරිඳ මහ මග අළුත් වැඩියා කිරීම භාරව වැඩ කළාය. ඈට කොතරම් අමාරුද යන්න මම දැන සිටියෙමි.

1945 වසන්තයේදී ඈ හදිසියෙන්ම ලියුම් ලිවීම නතර කළාය. යුද්ධ පෙරමුණේ සිටින විට හැම දෙයක්ම විය යැකි බව දන්නා මම සන්සුන් වීමට වෑයම් කළෙමි. හිටිහැටියේම දවසක මා ප්‍රධාන යුධ කාර්යාලයට කැඳවා නිර්භය ලෙස සටන්කිරීම ගැන මට ස්තුති කොට පදක්කම් පිරිනමන ලදී. ඉන්පසු මට නිවෙස බලා යන ලෙස දන්වා රටතුළ වැදගත් සේවයක් මගෙන් බලාපොරොත්තු වන බවද පැවසූහ. මා ඉමහත් ලෙස ප්‍රීතියට පත්වී ගෙදරට පුවතක් යැවීමි. නියමිත කාලසීමාව ඉකුත්වීමට පෙර මා සේවයෙන් ඉවත් කොට ගෙදර යැවීමේ හේතුව මා නොසැලකුවේ ප්‍රීතිය නිසාය.

මම පදිංචි පෙදෙසට පැමිණි විගස ප්‍රාදේශීය යුධ කාර්යාලයට පවා පැමිණීලි නොකොට නිවස බලා ගියෙමි. පසුව වුවද පැමිණිලි කළ හැකි බැවිනි. ඉක්මනින් ගෙදර යා යුතුය. අතර මගදී ලොරියක් හමුවූයෙන් පාම්රය බලා පිටත්වීමි.

මට පියැඹීමට සිත්විය. යුද පෙරමුණේ රියවලින් වේගයෙන් ගමන කළ මට මේ වේගය ප්‍රමාණවත් නොවූයෙන් රියැදුරාට මෙසේ පැවසීමි.

''සහෝදරය! පුළුවන් තරම් වේගයෙන් පා ගන්ට. මම ගෙදර යනව. වේගය වැඩිකරන්න.''

නිවසට හොඳටම ළං වීමි. ඊළඟ වංගුවෙන් හැරුණු සැටියේම මගේ ගෙදර දැකිය හැක. ලොරියෙන් බිමට පැන, ගමන් මල්ල කරින් ගෙන වේගයෙන් දුවන්නට වීමි. හැම දෙයක්ම මා කලින් දැක පුරුදු ලෙසම ඇත. කඳු වැටි, මහ මග... එහෙත් මගේ නිවෙස නැත. අවට මිනිස් පණක් නොපෙනේ. ගල් හා පස් ගොඩක් පමණකි. මගේ නිවෙස කඳු පාමුල පිහිටා තිබිණි. මෙතැන මිවියාවත පවුය. මම කඳු මුදුන දෙස බැලීමි. ගිරිහිම නිපාතයක් නිසා පස් හා ගල් කඩා වැටී මහ විපැත්තියක් වී ඇති බව මට අවබෝධ වූයෙන් මම නැති ගතිමි. මහා භූතයෙකු විසින් මහා වළක් හැරූ කලෙක මෙන්ද ගෙය පිහිටා තිබුණු තැන පස් හා ගල් වලින් පිරී ගොස් ඒ අසල මහා අගාධයක් වැනි වළකි. පසුගිය ශීත සමයේදී විශාල වශයෙන් හිම වැටුණු බවත්, පසුව වැසි පටන්ගත් බවත් බිරිඳ ඇගේ අවසාන ලියුමේ සඳහන් කළාය. ගිරිහිම නිපාතය කලින් පුපුරා දමා ගලා බැස්සවීමට කටයුතු කළ යුතු විය. එහෙත් එය ගැහැනියකට කළහැකි වැඩක් නොවිය...

ඔන්න මා පවුල මුණ ගැසුණු හැටි! දහස් වරක් මාරයාට එදිරිව සටන් කොට නිරයේ සිට නිරුපද්‍රිතව ගෙදර පැමිණි මට, ගෙදරක් නැත. බිරිඳ හා දරුවන් නැත. ඔවුන් කිසිදිනක මිහිපිට වාසය නොකළාක් මෙනි...

පා ඊසව්මට පවා බැරිවිණි. කඳු මුදුන් දෙදරා යන ලෙස හැගැසීමට සිත්වුණාද, ගොළු වුණෙමි. මගේ ගත සිත ගල් ගැසිණි. මා ඇවිදින මළ මිණියක් මෙනි. මගේ සෙබළ ගමන් මල්ල උරෙන් පහළට වැටෙන හඬ පමණක් ඇසිණි. දූ වරුන් දෙදෙනාට සහ බිරිඳට ගෙනා තෑගි එතැනම විය. ඒවා අතර දූවරුන්ට ගෙනා සීනි බෝලද විය... කිසියම් හාස්කමක් බලාපොරොත්තු වන්නාක් මෙන් බොහෝ වේලාවක් එතැන සිට මම ආපසු ගියෙමි. උඩ බැලූ විට උස කඳු මා වෙත නැඹුරුවෙන සැටි පෙනිණි. මහ හඬින් කෑගැසූ මම දුවන්නට වීමි. ඉක්මනින් ඒ සාපලත් පෙදෙසින් දිවගියෙමි. මට අඬා වැලපීමට තරම් ශක්තියක් ලැබුණේ ඉන් පසුවය...

මා කොහේ ගියේද, කුමක් කළේද යන්න මම නොදනිමි. තෙවැනි දින දුම්රිය පොළට ළගාවීමි. ජනතාව අතරට වැද අතන-මෙතන ඇවිදිමින් සිටින විට යම්කිසි නිලධාරියෙක් මගේ නම කියා මට කතා කරනවා ඇසිණි. ඔහු හුසෙයිනොව්ය. ඔහුද යුද සේවය අවසන් කොට ගමට යමින් සිටියේය. මා ඔහුට මගේ අභාග්‍යය ගැන කිව්වෙමි. ''දැන් ඉතින් බයිටෙමිර් තමුසෙ යන්නෙ කොහෙද?'' ''මම නොදනිමි.'' ඔහුට පිළිතුරු දුනිමි. ''එහෙම හරි නැහැ. හැම දුකක්ම ඉවසාගෙන කටයුතු කරන්ට ඕන.'' යැයි හුසෙයිනොව් කිව්වේය. ''තමුසෙට තනියම රස්තියාදු වෙන්ට මම ඉඩ හරින්නෙ නැහැ. ත්‍යාන්-ෂාන් කඳුකරයේ මොටෝ රථ මාර්ගයක් හදන්ට යනව. එනව මාත් සමග එහෙ ගිහින් වැඩ කරමු'' යැයි ඔහු මට කිව්වේය...

මම ඔහු සමග ගොස් වැඩ කළෙමි. පළමු අවුරුදුවලදී අපි මහ මඟ හරහා පාලම් කිපයක්ම සෑදුවෙමු. කාලය ගෙවී ගියේය. නිත්‍ය සේවය සහ ස්ථිර පදිංචියක් සොයා ගත යුතු විය. මේ වන විට හුසෙයිනොව් අමාත්‍යාංශයේ සේවය කරන්නට විය. ඔහු මා හමුවීමට කිප වරක්ම වීත් මට මගේ පරණ වෘත්තිය වන මාර්ගය අළුත් වැඩියා කිරීම තෝරා ගන්නා ලෙස කිව්ලේය. එම වෘත්තිය අනුව හුදකලාව ජීවිතයක් ගත කිරීමට සිදුවේ. එය මට තොරිසි වූයේ, මුලදී මම හුසෙයිනොව්ගේ යෝජනාවට එකඟ වීමට මැලිවීමි. මාර්ග සෑදීමේ කර්මාන්තයෙහි බොහෝ දෙනා යෙදී සිටින බැවින් මට පාලු ගතියක් නොදැනිණි. අතීතය මට සම්පූර්ණයෙන්ම අමතක නොවීම නිසා මම බියවීමි. මගේ ජීවිතය අතීතයේ නැවතී තිබුණාක් මෙන් විය. විවාහවීම ගැන සිහිනෙන් පවා නොසිතිමි. මගේ ගුල්බරාට සහ දූ දරුවනට මම බොහෝ සෙයින්ම ආලය කෙළෙමි. ඇගේ සහ දරුවන්ගේ අඩුව පිරිමැසීමට කිසිවකු සමත් වෙතියි මම නොසිතිමි. අසීරු කිරීම සඳහා විවාහවීමට මා සූදානම් නැත. තනිකඩයෙක්ව විසීම වඩාත් මැනවයි මට සිතිණි.

කෙසේ හෝ මාර්ග පාලකයෙකු ලෙස කොටසක වැඩ කිරීමට ඉටාගත් මම එය සිතට නැල්ලුවොත් වෙනත් රැකියාවක් සොයා යමියි සිතා ගතිමි. දුර්ග මාර්ගයට අයත් කොටසක් මට පවරන ලදි. කෙමෙන් මම එයට පුරුදු වීමි. මගේ තත්ත්වය යහපත් විය. කාලය විසින් මගේ තුවාල සුව කරන්නට පටන් ගන්නා ලදි. සමහර දවස්වලදී මම ඔවුන් සිහිනෙන් දුටිමි. මගේ පැරණි නිවෙස අසල සිහිනෙන් සිටගෙන සිටින මගේ උරහිසින් ගමන් මල්ල වැටෙන හඬ පවා ඇසිණි... එවැනි දවස්වලදී උදැසනින් නැගිට වැඩට යන මා ගෙදර එන්නේ රෑ බෝවූ පසුවය. ඔය විධියට මම තනිකඩයෙක් ලෙස ජීවත්වීමි. ``සමහර විට ප්‍රීතිමත් ජීවිතයක් ගතකිරීමට නැවත අවස්ථාවක් ලැබෙනු ඇත`` යි යන සැකයක් මා තුළ ඇතිවිය.

මා කොහෙත්ම බලාපොරොත්තු නොවූ අවස්ථාවකදී ඒ අමාරු, අසීරු, අස්ථිර ප්‍රීතිය මා වෙත ළඟාවිය.

එය සිදුවූයේ මීට අවුරුදු හතරකට පමණ පෙරෙදිය. මගේ අසල්වැසියාගේ මව අසනීප වූවාය. විශාල දරු පවුලක් සිටි ඔහුට වැඩ කටයුතු අතහැර දමා මව රෝහලට ගෙන යාම අපහසු විය. මේ අතර මහලු කතගේ තත්ත්වය නරක අතට හැරුණි. අපට යම්කිසි උපකරණ තොගයක් ගෙනා ලොරියකින් ඇය රෝහලට ගෙනයාමට මම ඉදිරිපත් වීමි. දොස්තරවරු ඇය රෝහලේ නැවැත්විය යුතු යැයි කියා සිටියහ. මහලු කත තමා ගෙදරදී මිය යාමට සූදානම් බව පවසා රෝහලේ නැවතීමට අකැමැති වූවාය. මා ඇය රෝහලේ නැවැත්වුවොත් මට ශාප කරන බවට තර්ජනය කළ ඈ නැවත ගෙදර ගෙනයන ලෙස ඉල්ලා සිටියාය. ඇඳිරි වැතිරිණි. අත්තර් මාර්ගය අසලදී ලොරිය පැදවූ රියදුරා රිය නවතා යම්කිසිවකුගෙන් මෙසේ ඇසීය:

``යන්ට ඕන කොහාටද?`` ගැහැනියක් යමක් කීවාය.

``හොඳයි නගින්න`` යැයි කී රියැදුරා ලොරිය පදවන්නට විය.

අත දරුවකු වඩාගෙන, කුඩා උරයක් අතින් ගත් තරුණ කතක් ලොරියේ බඩු පටවන තැනට නැගීමට තැත් කළාය. එදින හිම තුෂාරය සහිත දැඩි ශීත දවසක් වූයෙන් අසුන මම ඇයට දී, බඩු පටවන තැන මුල්ලකට වීමි.

දැඩි ශීත සුළං සහිත කුණාටුවක් හමන්නට විය. අත දරුවා අඬන්නට වූයෙන් මව ඔහු නැළෙව්වාය. එහෙත් දරුවා හැඬීම නොනැවැත් විය. සුළං පහරින් ආරක්ෂාවීම් වස් අත දරුවා රියැදුරා ළඟ ආසනයට ගෙන යා යුතු වුවද රෝගී මැහැල්ල එතැන සිටි නිසා එයද කළ නොහැකි. මම ඇගේ උරහිසට අත ගසා මෙසේ කීවෙමි:

``ඔය ළමයව මට දෙන්න. මම නලවන්නම්. ඔහෙ සුලං පහරින් බේරෙන්න.``

අත දරුවා මගේ හිම කබායට යටින් තබා ගෙන මම ඔහු උණුසුම් කරමින් නැලෙව්වෙමි. ඔහු සැණෙකින් නිදන්නට විය. ඔහු මාස දහයක් පමණ වයසැති සිගිති කුඩා දරුවෙකි. මම ඔහු මගේ හදවතට ළං කර ගෙන උණුසුම් කළෙමි. මගේ හදවත කුඩා කුරුල්ලෙකු මෙන් ගැහෙන්නට විය. එක්තරා සුන්දර හැඟීමෙකින් මගේ සිත පිරිණි. එහි දුක්සහිත බවක්ද තිබිණි. ``මම නැවත පියෙක් වෙම්ද?`` මගේ හැඟීම් ගැන මඳකුදු නොතකා අත දරුවා නිදන්න විය.

``කොල්ලෙක්ද?``

ඇ හිස වැනුවාය. ඇ ශීතලෙන් ගැහෙන බව පෙනිණි. ඇ හැඳ සිටියේ කාලගුණයට නොගැළපෙන සිහින් සාබායකි. හිම කබායට උඩින් තවත් සනැති වැහි කබායක් ඇඳීම මට පුරුදු වූවකි. මගේ රුකියාව අනුව එවැන්නක් නැතිවම බැරිය. වැහි කබායේ එක් උරයක් ගලවා එක් අතකින් අත දරුවා වඩාගෙන මම ඇයට වැහි කබායේ නිදහස් උරය දුන්නෙමි.

``මේ කබාය ගලවන්න. මේ ගිතලට ඔහෙට උණ හෙම්බිරිස්සාව හැදේවි.``

``නැහැ. එපා. කරදර වෙන්ට එපා`` යැයි ඇ පැවසුවාය.

``මේ කබාය ගලවල ඇඳ ගන්න. හුලං පාර බොහොම සැරයි``. මම නැවතත් කිව්වෙමි.

ඇ මගේ වැහි කබාය ඇඳ ගත්තාය. මම ඇගේ දෙකකුල් වටා වැහි කබාය එතීමි.

``පොඩ්ඩක්වත් උණුහුම් වුණාද?``

``ඔව්. උණුහුම් වුණා.``

``මොකද මේ තරම් රෑ බෝවෙලා මෙහෙම ගමන් යන්නෙ?``

``එහෙම යාමට සිදුවුණා.`` ඇ සෙමින් පිළිතුරු දුන්නාය.

අපේ ලොරිය දෙණිය අතරින් යයි. ආකර කම්කරු ගම්මානය නිදයි. හැම ගෙදරකම පහන් නිවා ඇත. බල්ලෝ බුරමින් ලොරිය පස්සෙන් දිව ආහ. මහ රෑ ඇ කොහෙ යන්නීදැයි මම කල්පනා කරන්නට වීමි. ඇ ආකර ගම්මානය දක්වා යතියි යම්කිසි හේතුවක් නිසා මම සිතීමි. දැන් ඉතිරිව ඇත්තේ මට භාර කොටස පමණකි. මෙගමින් එපිට යාමට ඇට තැනක් නැත.

``ඔහෙට වුවමනා තැනට ඇවිල්ලා!`` යැයි කී මම ලොරියේ පියස්සට මිටින් ගසා රියැදුරුට ඇන්වීමි. ``දුර්ග මාර්ගය මේ ළඟ මෙතැනින් එහාට ලොරිය යන්නෙ නැහැ`` යි මම ඇයට කිව්වෙමි.

''මෙතන මොකක්ද?'' ඇ ප්‍රශ්න කළාය.

''ආසාර කම්කරු ජනපදය. ඔහෙ ආවෙ මෙතනට නොවෙයිද?''

''මමද... මම මෙහාට තමයි ආවෙ.'' ඇ කීවේ අස්ථිර ගතියකිනි. පසුව ඇ ගනිකට නැගිට සිට වැගි කබාය ගලවා මා අතට දී අත දරුවා වඩා ගත්තාය. ඔහු නැවත අඬන්නට විය. ඇගේ අස්ථිර ගතිය මගේ සිත් නොගත්තේය. ඇට යම්කිසි විපතක් වී ඇති බව මට පෙනිණි. මේ මහ රෑ ඇය සහ අත දරුවකු තනිකර යැම නුවනට හුරු නොවිය.

''ඔහෙට යාමට තැනක් නැහැ''යි මම එක එල්ලේම ඇට කීවෙමි. ''තරකට හිතන්න එපා. අත දරුවා මෙහාට දෙන්න.'' මම අත දරුවා බලෙන් මෙන් නැවත ගතිමියි කිවේවොත් එය නිවැරදිය. ''මහ රෑ ඔහෙට යන්ට බැහැ. අද රෑ අපේ ගෙදර නැවතිලා හෙට උදේට යන දිහාවකට යන්න. ඔව්!.. ලොරිය පදවනවා!'' යැයි මම රියැදුරුට කීවෙමි.

ලොරිය දුවන්නට විය. ඇ නිහඬව තම මුහුණ දෑතින් වසාගෙන උන්නාය. සමහර විට ඇ හැඬුවා වෙන්ට පුළුවන.

''බයවෙන්ට එපා. මම මේ කොටසෙ මහ පාර භාරව වැඩකරන බයිටෙම්ර් කුලොව්. මම ඔහෙට යම්කිසි වරදක් කරන්නේ නැහැ. ඔහෙ මාව විශ්වාස කරන්නැ'' යි මම ඇ සැනසීමි.

මම ඔවුන්ට මගේ කාමරය පිළියෙල කොට දී, ගෙවත්තේ කුඩා කාමරයට ගොස් නිදා ගැනීමට උත්සාහ කළෙමි. එහෙත් නින්දක් නොවිය. බොහෝ වේලාවක් මම සිතන්නට වීමි. හාරා අවුස්සා දැනගැනීමට මා තුළ කැමැත්තක් නොවිය. එහෙත් ඇට යම්කිසි ආධාරයක් අවශ්‍යව ඇතැයි සිතූ මම ඇගෙන් ඇසීමි. ඇ අකමැත්තෙන් පිළිතුරු දුන්නාය. ඇ අතහැර දැමූ දේ ගැන අනුමාන වශයෙන් සිතා නිගමනය කිරීමට මට හැකි විය. මිනිසකු විපතකට මුහුණ පෑ විට ඔහු එක් වචනයක් කියා, කිවයුතු තවත් වචන දහයක් ගිලදමයි. ඇ තම සැමියාගෙන් වෙන්වී ගෙදරින් පිටවී ඇවිදියි. ඇ ආඩම්බර කාරියකි. ඇ දුකින් තැවුණද, ආත්ම ගරුත්වය රැක ගත්තාය. හැම කෙනෙක්ම තමන්ට රිසි ලෙස කටයුතු කරති. ඇ කළ යුත්තේ කුමක්ද යන්න ඉතා හොඳින් දන්නේ ඇ පමණකි. කෙසේවුවද, ඇ නිසා මා තුළ අනුකම්පාවක් උපණි. ඕ තරුණියකි පෙනුම අනුව ඇ බොහොසෙයින්ම ලපටිය. සිහින්ය. ඇ තරුණාවත්, හොඳ සිතක් ඇත්තියක් විය යුතුය. මෙවැනි තරුණ කාන්තාවකට ගෙදරින් පිටව යාමට තරම් සාහසික ලෙස ක්‍රියා කළ පුද්ගලයා කවුද? එය ඔවුන්ට අයත් වැඩකි. හෙට උදේට ඇ වෙනත් රියක නංවා ඇට ආයුබෝවන් කියමි. විඩාපත්ව සිටි මම නිදාගතිමි. ඇගේ අත දරුවා හදවතට ළං කර ගෙන මා බස් රියක නැග යන සැටි මම සිහිනෙන් දුටිමි.

මා එදින උදෑසනින් නැගිට මට අයත් කොටසේ මග පිරික්සා බලා ඉක්මනින් ගෙදර ආවේ මගේ අමුත්තන් ගැන සොයා බැලීම පිණිසය. ඔවුන් අවදි නොවන සේ ප්‍රවේසමින් ගෙට ඇතුළු වී ලිපට දර දමා ගිනි මොළවා, සමවාරය රත් කිරීමට මම ඉටාගතිමි. එහෙත් ඈ නැගිට ඇඳ පැළඳගෙන ගමනට සැරසී සිටියාය. මා දුටු ඈ මට ස්තුති කරන්න වූවාය. උදේ තේ බොන ලෙස මම ඇට කියා සිටියෙමි. ටික වේලාවකින් යන්නට පුළුවන් බව මම ඇට කිව්වෙමි. පෙර දවස රැයෙහි මගේ හදවතට ළංවී නිදාගත් අත දරුවා සුරතල් කරන්නට විය. ඔහුගේ සුරතල් බැලීම විනෝදයක් විය... තේ බොන අතර මම ඇය සමග කතා කළෙමි.

''ඔහෙ යන්නෙ කොහෙද?''

ඈ කල්පනා කොට පිළිතුරු දුන්නාය:

''රිබාච්චිය වලට.''

''දෙමාපියො එහෙද?''

''නැහැ. ඒගොල්ල ටොසොර්වලට එහා ගමක ඉන්නව.''

''එහෙනම් ඔහෙට එහෙට යාමට දෙතුන් වරක් රථවලට මාරු වෙන්ට වේවි. ඒක එතරම් පහසු නැහැ''

''මම එහෙට යන්නෙ නැහැ. අපට ගමට යන්ට බැහැ. වරද අප අතේ'' යැයි ඈ තම අත දරුවා සමග කතා කරන්නාක් මෙන් ඔහුට කිව්වාය.

ඇය දෙමාපියන්ගේ කැමැත්තට එදිරිව විවාහ වූ බව මම නිගමනය කළෙමි. මගේ නිගමනය නිවැරදි විය.

ඈ දරුවාත් වඩාගෙන ගෙයින් පිටවීමට යත්ම මම ඇය වැළකීමි. තද කුණාටුවලින් දරුවා බේරාගෙන ගෙදර ඉන්නා ලෙස ඇට දැන්වූ මම මහ මග යන රියක් නවත්වා ඇය කැඳවන තුරු නවතින ලෙස ඉල්ලා සිටියෙමි.

රියක් නැවැත්වීම සඳහා මා ගියේ දුකින් පිරී හදවතකිනි. ඔවුන් දැන් ගෙයින් පිටවී යනු ඇතැයි සිතූ මම දුක්වීමි. මා නැවත තනිවනු ඇත.

පළමුව ඈ යා යුතු පෙදෙසට යන රියක් මුණ නොගැසිණි. පසුව පැමිණි රිය නැවැත්වීමට මම උත්සාහ නොගත්තෙමි. මම යම්කිසි හේතුවක් නිසා බියවීමි. මා මෙසේ හැසිරෙන්නේ මන්ද? මගේ සිත් වේදනාව උග්‍ර වන්නට විය. ඉන්පසු පැමිණි රිය නොනවත්වා ඊළඟට එන රිය නවත්වන්නෙමැයි සිතමින්, ම විසින් කළ යුතු දෙය කල්දැම්මි. මගේ සිරුර උණෙන් පෙළෙන කලෙක මෙන් උණුසුම් විය. ඈ ගෙදර ගමනට සැරසී සිටින්නීය. මගේ හැසිරීම මගේම පිළිකුලට භාජනවූවද, යම්කිසිවක් කිරීමට මම අපොහොසත් වීමි. මගේ හැසිරීම සාධාරණ බව පෙන්වීමට හේතු දැක්විය යුතුය. සමහර රියවල දොරවල් කැඩිලාය. අන් සමහර ජනේල වීදුරු කැඩිලාය. අන් සමහර රියවල රියැදුරන් මත්පැන් බී සිටින බව පෙනේ.

සැබැවින්ම ඉඳ හිට මෙවැනි දර්ශන දුටුවිට මම කොල්ලකු සේ ප්‍රීතිවීමි. බැහැ. දැන්ම නවත්වන්නේ නැහැ. තව විනාඩි පහක් පමණ වේලා ගෙදර නැවතී සිටියාවෙ. ``ඇ යන්නේ කොහෙද? ගමට යා නොහැකි බව ඇය විසින්ම කියන ලදී. රිබාචියෙ වලට ගොස් අන දරුවෙකුත් සමග ඇ කුමක් කරන්නද? ශීත කාලය විසින් ඒ අනදරු සිහින්නා මරා දමනු ඇත. ඇ මෙහි නැවතීම නුවණට හුරුය. මෙහි නැවතී ඇගේ හැසිරීම ගැන ඇ කල්පනා කිරීම හොඳය. ඇගේ සැමියා ඇය සොයා එනු ඇත. එසේත් නැතිනම් සැමියා සොයා ඇ යනු ඇත...``

ඇ සමග මහ පාරට බැස හමුවන පළමුවැනි රියෙහි ඇය නංවා ආයුබෝවන් කිවේ නම් වඩාත් හොඳ බව මට සිතිණි. මෙලෙස, මේ ගැන විවිධ ලෙස කල්පනා කරමින් මම තෙපැයක්ම එක තැන සිටියෙමි. මම මා දැඩිලෙස ගෙලා දුටුවෙමි. ඇය සමග මෙහි විත් ඇ ඉදිරියේම රියක් නවත්වන්නෙමි. අන් විධියකින් මේ ගැටළුව නිරාකරණය කළ නොහැක. මා නිවස දෙසට ළං වෙත්ම ඇ එළියට ආවාය. මා පැමිණෙන තුරු බලාසිටි ඇ විඩාපත්වූවාය. ලජ්ජාවට පත්වූ මා වරදක් කළ කොල්ලකු මෙන් ඇය දෙස බැලීමි.

``බොහෝ වේලාවක් බලාගෙන හිටියද? ඔහෙට මීන පෙදෙසට යන බස්, ලොරි හමුවුණේ නැහැ. ඒවා නැතිවාට නොවේ. සුදුසු එකක් හොයාගන්න බැරිවුණා. ඔහෙ සමාවෙන්න. ඔහෙ මා ගැන නරකක් හිතන්ට එපා... දෙවියන්ගෙ නාමෙට ගෙට ඇතුළු වෙන්ට. කරුණාකරල!`

ඇ විස්මය පත්වූවා මා දෙස කෘතගාවුදායක බැල්මක් හෙළුවාය. නිහඬව ඇ ගෙට ඇතුළු වූවාය.

``ඔහෙ මට අනුකම්පා කරනව නේද?`` ඇ ප්‍රශ්න කළාය.

``නැහැ. ඒ නිසා නොවෙයි. තේරුණාද... මම ඔහෙ ගන්දා බය වුණා. ඔහෙට හොඳටම අමාරු වේවි. කොහොමද ජීවත් වෙන්නෙ?``

``වැඩක් හොයාගන්නව. මට වැඩකරල පුරුදුයි.``

``කොහෙද?``

``කොහෙන් හරි සොයා ගන්නව. ආපහු ගෙදර යන්නෙ නැහැ. ගමට යන්නෙත් නැහැ. රස්සාවක් හොයාගෙන ජීවත්වෙනව.``

මම නිහඬවීමි. ඇගේ අදහසට මට විරුද්ධ විය හැකිද? දැන් ඇ කිසිවක් ගැන නොසිතයි. ඇට කළ වරද නිසා කිපී සිටින ඇ දුකින් තැවෙන්නිය. ඇගේ ආත්මාඩම්බරත්වයද ඉදිරියට විත් ඇත. මේ හැඟීම් විසින් ඇය කුප්පා එළවා ඇත. `රස්සාවක් හොයාගෙන ජීවත් වනවා` යන්න කී පමණින්ම කළ හැකි දෙයක් නොවේ. එහෙත් කෙනෙකුට බල කළ නොහැක.

මේ අතර අත දරුවා මම වඩා ගත්තෙමි. මම ඔහු සිපගෙන මෙසේ සිතන්නට වීමි: ''අනේ! හොඳ පොඩිත්තෝ අපට දැන් වෙන්වීමට සිද්ද වෙනවා. නුඹ හරියට මට පුතෙකු වගේ වුණා. එතරම් ලොකු ආදරයක් නුඹට මා තුළ උපන්නා.''

''හොඳයි එහෙනම් යමු.'' මම සෙමින් පැවසීමි.

අපි නැගිට සිටියෙමු. දරුවා වඩා ගත් මම දොර ළඟදී නැවතුනෙමි.

''ඔහෙට ඕන රස්සාවක් මෙහෙදී ලබා ගන්ට පුළුවනි. මෙහෙ නැවතිලා රස්සාවක් කරගෙන ජීවත් වෙන්න. පුංචි කාමරයකුත් තියෙනවා. අනේ ඇත්තටම නවතින්න. ඉක්මන් වෙන්න එපා. ඕන දිගාවකට යන්න ඕන දවසක වුණත් පුළුවනි. කල්පනා කරන්න...''

පළමුව ඇ අකැමැති වුවද පසුව මගේ අදහස පිළිගත්තාය.

අසේල් සහ ඇගේ පුතු මගේ ගෙදර නැවතුණේ ඔය විදිහටය.

ගෙවත්තේ තිබුණු කුඩා කාමරය ශීත කාලගුණයට ඔරොත්තු නොදෙන්නක් විය. අසේල් සහ සාමට් මගේ නිවසෙහි පදිංචි විය යුතු හයි කියා සිටි මම කුඩා කාමරය මගේ පදිංචියට තෝරා ගතිමි. ඒ කුඩා කාමරයෙහි මම සැතීමට පත්විමි.

එදා සිට මගේ ජීවිතය වෙනස් විය. පෙර මෙන්ම මා තනිකඩයෙක් ලෙස ජීවත් වුණද, මා සිත ප්‍රීතියට පත්විය. යම්කිසි ජීව ප්‍රාණයක් අමුතුවෙන් ඇතුළු වූ කලෙක මෙනි. බොහෝ කලක් හුදකලාව ජීවත්වීම නිසා ඇතිවූ පාළු ගති අතුරු දන් විය. මගේ අධ්‍යාත්මය උණුසුම් විය. මීට පෙරද මම ජනතාව සමග හැසිරෙමින්, උරෙනුර ගැටී ඔවුන් සමග වැඩ කළෙමි. මිතුරු සබඳකම් ඇති කර ගත්තෙමි. පොදු වැඩවල යෙදෙමින් ඔවුන්ට ආධාර කළ අතර ඔවුන්ගෙන් උදවු උපකාර ලබාගතිමි. එහෙත් වෙන කිසිවක් සමග සම නොකළ හැකි, මාරු නොකළ හැකි ජීවිතයක්ද මිනිසකුට ඇත. මගේ කොටසතුට් අයත් මහ මග පිරික්සා බැලීමට යන මම සිහිති සාමට් උණුසුම් ලෙස අන්දවා පොරවා වඩා ගෙන යමි. මහ මග දිගේ ඔහු වඩා ගෙන ගියෙමි. විවේක කාලයේදී ඔහු සමග සෙල්ලම් කළෙමි. නිවාඩු හැම මොහොතක්ම ඔහු සමග ගත කළෙමි. ඔහු නැතිව මා මීට පෙර ජීවත්වූයේ කෙසේදැයි මම ම නොදනිමි. මගේ අසල් වැසියෝ කරුණාවන් අය වූහ. ඔවුහු අසේල්ට හා සාමට්ට දයාවන් වූහ. ළමයිනට ආදරය නොකරන්නෝ කවරහුද? විචාන හදවතකින් හා කඩිසර සිරුරකින් හෙබි අසේල් ඉක්මනින්ම අසල්වැසියන්ගේ සිත් දිනා ගත් අතර තමාට භාර වැඩ කොටසද මැනවින් ඉටු කළාය. අසේල් නිසා මම වඩාත් පුංචි සාමට්ට ඇලුම් කෙළෙමි. අසේල් වෙත මා සිත තුළ උපන් ආලය සඟවා ගැනීමට කොතරම් වෑයම් කළද, බැරිවිය. මම ඇට දැඩි ලෙසම ආලය කළෙමි. ඇය දුටු පළමුවරට මම ඇට

මුළු සිතින්ම ආලය කළෙමි. හුදකලා ජීවිතය, කාන්සිය, දුක් කරදර ආදී සියල්ලක්ම අතුරුදන් විය. එහෙත් ඇට ඒ බව පැවසීමට මට අයිතියක් හෝ බලයක් හෝ නැත. අසේල් තම සැමියා එන තුරු බලාපොරොත්තුවෙන් සිටියාය. ඒ බව නොඅඟවා අසේල් ඔහු බලාපොරොත්තුවෙන් දිගු කලක්ම බලා සිටියාය. මහ මග වැඩ කරන ඈ එහි යන එන හැම මොටෝ රියක් දෙසම බැලුවේ බලාපොරොත්තු සහගතවය. සමහර දවස්වලදී පුතාත් කැටුව මහ මග අසල වාඩිවන අසේල් බොහෝ වේලාවක් එකම ඉරියව්වකින් සිටියාය. එහෙත් ඇගේ සැමියා නොපැමිණියේය. ඔහු කවිද, මොන විධියේ පුද්ගල යෙක්ද ආදී විස්තර මම නොඇසීමි. ඇද ඔහු ගැන මට කිසිවක් නොකීවාය.

කාලය ගෙවිණි. සාමට් හැදී වැඩුනේය. ඔහු සුරතල්, සිත් ඇදගන්නා සුලු ළමයෙක් විය. ඔහු මට තාත්තා කියා ආමන්ත්‍රණය කලේ වෙන කිසිවකුගේ උගැන්වීම් නිසාද යන්න මම නොදනිමි. මා දකිනා සාමට් ``ආටා! ආටා!`` කියමින් මගේ ගෙල බදාගැනීමට පුරුදු විය. අසේල් කල්පනාකාරී ලෙස ඔහු දෙස බලා මඳසිනා පැවාය. මා සිත දුක මුසු සතුටකින් පිරිනි. ඔහුගේ පියාවීමට තරම් මට වාසනාවක් ඇතොත් එය මගේ භාග්‍යයකි. එහෙත් මට කුමක් කළ හැකිද?..

ගිම්හානයේදී අපි මහ මග අළුත් වැඩියා කළෙමු. අසේල් ගිවිහැටියේම ලොරියක් පිටුපසින් දුවමින්කැගැසුවාය.:

``ජ්යි, ජන්තායි, නවත්වපන්!``

ලොරිය බ්රෝධක(බ්රේක්) ගසා ත්‍රීස් යන හඬක් නගමින් නැවැත්විණි. ඈ එහි වූ රියැදුරා සමග කළ සාකච්ඡාව මට නැසිණි. එහෙත් ඈ කෑගසන සැටි ඇසිණි.

`` තුඹ බොරු කාරයෙක්. තුඹව විශ්වාස කරන්නෙ නැහැ! පලයන් යන්ට. වහාම පලයන්!``

රියැදුරා ලොරිය වේගයෙන් පැදවිය. අසේල් පාර හරහා දිවගොස් ගෙට ඇතුළු වූවාය. ඒදින ඈ හැඬුවා විය යුතුය.

මට වැඩ කළ නොහැකි විය. ඔහු කවුද? ඔහු ඇට කිව්වේ මොනවාද? විවිධ සැකයන් හා නිගමනයන් මගේ මොළයට ඇතුළු විය. මට ඉවසාගත නොහැකිවූයෙන් මම ගෙදර ගියෙමි. අසෙල් තම කාමරයෙන් පිටත නොපැමිණියාය. හවස නැවත ඇය හමුවීමට මම ගියෙමි.

``සාමට් කොහිද? එයා නැතිව හරිම පාලු ගතියක් දැනෙනව!``

``මෙන්න මෙතන`` යැයි ඈ කීවේ උදාසීන ගතියෙනි.

``ආටා!`` මෙසේ කී සාමට් මා ළඟට ආවේය. මම ඔහු ඔසවා හුරතල් කරන්නට පටන් ගතිමි. අසේල් නිහඬව සිටියාය.

''අසේල් මොකක්ද සිද්ධ වුණේ?'' මම ප්‍රශ්න කළෙමි.

''බාකෝ, මම යනව යන්ට. මම එහෙම යන්ට අදහස් කළේ මෙතන තරක නිසා නොවේ. මම ඔහෙට හොඳටම ණය ගැතියි. ඒ වුණත් මම යනවා... හිස හැරුණු පැත්තක යනවා...''

සැබැවින්ම අසේල් පිටවියාමට සැරසෙන සැටි මට දැනිණි. මගේ හැඟීම් එළිපිට පැවසීම හැර අන්කිසිවක් මම නොදිටිමි.

''අසේල්ව නවත්වා ගැනීමට මට අයිතියක් නැහැ. මම මින්පසු මෙතැන ඉන්නෙ නැහැ. මමත් යනවා යන්ට. පාලු බිමක් එකවරකදී මම අතහැර ගියා. ඒ ගැන විස්තර කරන්ට ඕන නැහැ. අසේල් ඒ ගැන හොඳට දන්නවා. එදා පාමීර්වලදී මම මුණ පෑ විපතට සමාන විපතකට මට මුණ පෑමට සිදුවනවා, අසේල් මෙතැනින් ගියොත්... අසේල්ගෙ ස්වාමි පුරුෂයා යම් දවසක ඇවිත් අසේල්ට අඬ ගැසුවොත්, හිත කියනවනම් යන්ට කියල, එයා එක්ක නැවත යන්ට. මම බාධා කරන්නෙ නැහැ. ඔයාට ඕන දෙයක් කරන්ට සම්පූර්ණ නිදහස තියෙනව අසේල්.''

මෙසේ කී මම සාමට් වඩාගෙන මහ මගට බැස ගමන් කළෙමි. අපි එදින බොහෝ වේලාවක් ගමන් කළෙමු. එහෙත් මගේ සිහිනි සාමට් කිසිවක් නොදැන සිටියේය.

අසේල් නොගියද ඇ දවස් කීයක් නැවතී සිටීදැයි මම නොදනිමි. ඇ සිතන්නේ මොනවා ගැනද? ඇ ගත් තීරණය මොකක්ද? එසේ සිතූ මම විඩාවට පත්වීමි. මගේ කය වියලි දණ්ඩක් මෙන් විය. මුහුණ කළු පැහැ ගෙන ඇත.

දවසක්දා දහවල් කාලයේදී මම ගෙදර ආවෙමි. සාමට් සැබැවින්ම ඇවිදීමට මහන්සි ගන්නා සැටි මම දුටිමි. ඔහු වැටෙතියි බිය ගත් අසේල් ඔහු අල්ලා ගෙන සිටී. මම නැවතී බැලුවෙමි.

''බාකෝ! බලන්න ඔහෙගෙ පුතා ඇවිදින්න උත්සාහ කරනව'' යැයි අසේල් මා අමතා කිව්වාය.

ඇ කීවේ මොකක්ද? මගෙ පුතයි කිව්ව? මම උදැල්ල බිම තබා සාමට් අසලින් වාඩිවී ඔහුට හුරතල් බස් කිව්වෙමි:

''ඔන්න මගේ සුදු පුතා. මගෙ ලස්සන ඔටු පැටියා. එන්න, එන්න බය නැතුව එන්න. පුංචි කකුල් වලින් එන්න.''

සාමට් දෑත් විදහාගෙන, ''ආටා!'' යැයි කෑගසමින් මා වෙත දුවගෙන ආවේය.

මම ඔහු වඩා ගෙන උඩ දමා නැවත අල්ලාගෙන සිප ගත්තෙමි.

''අසේල් හෙට පුතා ඇවිදීමේ උත්සවය ලැස්ති කරමු'' යි මම ඇට යෝජනා කළෙමි. ''අහළ පහළ ළමයි කැඳවල අපි ඒ ගොල්ලට පොඩි

සංග්‍රහයක් කරමු. ඔයා කළු පාට සුදු පාට වුලන් නූල් පටවල් දෙකක් සොයා ගන්න.''

''හොඳයි, බානේ'' ඈ සිනාසෙමින් කීවාය.

''ඔව්, ඔව්, සුදු පාටයි කළු පාටයි...''

මම අසු පිට නැග ගම්මානයට ගොස් සතුන් බලන එඬේරුන්ගෙන් කුමිස් නැමැති අශ්ව කිරි සොයා ගතිමි. පසුදින පුතාගේ 'ඇවිදින උත්සවය' නිමිත්තෙන් අසල් වැසියනට ආරාධනා කළෙමු.

මම සාමට් බිම වාඩිකරවා ඔහුගේ දෙපය වුලන් නූල් පටින් ලිහිල්ලෙස බැන්දෙමි. ඔහු ළඟින් කතුරක් තබා අසල්වැසි ළමයිනට ගෙවත්තේ එක් කොණක නවතින ලෙස විධාන කළෙමි:

''පළමුවෙන්ම දුවගෙන ඇවිල්ලා සාමට්ගේ බැමි කපා දමන ළමයට විශේෂ තෑග්ගක් දෙනවා. අනිත් ළමයින්ටත් තෑගි බෙදා දෙනවා. බලමු කව්ද දිනන්නෙ කියල!''

ළමයි හෑ හෝ ගසමින් සාමට් වෙත දුව ආහ. එකෙක් ඔහුගේ බැමි කපා දැමීය.

''ඉතින් පුතා නැගිටලා දුවන්නැ'' යි මම සාමට් ට කීවෙමි. ''ළමයිනි සාමට් අල්ලා ගෙන දුවපල්ලා!''

ළමයි සාමට් සමග දිවූහ. පැමිණ සිටි අමුත්තන් දෙස නොබලා මම මෙසේ පැවසීමි:

''සැදැහැවතුනි, මගේ පුංචි අශ්ව පැටියට දුවන්ට පුළුවනි. ඔහු යහනින් හැදී වැඩී බලැති, ශක්තිමත් අශ්වයෙකු මෙන් කඩිසර පුද්ගලයකු වේවා!''

ළමයින් සමග දිවගිය සාමට් මා දෙසට හැරී ''ආටා!'' යැයි කියමින් බිම ඇද වැටෙත්ම, අසේල් සහ මම එතැනට දිවගියෙමු. මම සාමට් වඩාගත්තෙමි. අසේල් පළමුවරට මා අමතා ආදර බස් තෙපලාය:

''මගේ ආදරණීය සැමියාණෙනි!''

එදා සිට අපි අඹු සැමියන් මෙන් ජීවත් වීමට පටන් ගතිමු.

ඊත කාලයේදි සාමට් රැගෙන අපි අසේල්ගේ දෙමාපියන් බැහැ දැකීමට අයිලයට ගියෙමු. ඇගේ දෙමාපියෝ බොහෝ කලක් තිස්සේ අමනාපයෙන් පසුවූහ. මටත් අසේල්ටත් වග උත්තර කීමට සිදුවිය. මා ඔවුන්ට සිදුවූ සියලු දේ විස්තර කොට කීවෙමි. ඔවුහු අසේල්ට සමාව දුන්හ. තම මුනුපුරා වෙනුවෙන්, අපේ අනාගතය වෙනුවෙන් සමාව දුන්හ.

කාලය නොදැනුවත්ම ගෙවී ගියේය. දැන් සාමට්ගේ වයස අවුරුදු පහකි. අසේල්ත් මාත් අතර ඇත්තේ සම්පූර්ණ එකඟතාවයකි. අපි එක දෙයක් ගැන කතා නොකරමු. එක් මිනිසකු මතක් නොකරමු. ඒ ප්‍රශ්නය

ගැන අප අතර ඇත්තේ නිහඬ එකඟතාවයකි. ඒ පුද්ගලයා අප සතු ලොවෙහි ජීවත් නොවේ...

එහෙත් සැබෑ ජීවිතය අපට වුවමනා හැම දෙයක්ම එලෙසින්ම ඉටු නොකරයි. ඒ පුද්ගලයා මේ ළඟදී මෙහි පැමිණියේය...

එක් රැයක මහ මගෙහි අනතුරක් සිදුවිය. මම මගේ ආධාරකරුවා වන අසල් වැසියාත් සමග එතැනට දුව ගියෙමි. ලොරියක් පගන්කණුවක හැපී ඇත. තුවාල ලැබ සිටි රියැදුරා සිහිසන් නැතිව සිටියේය. එපමණක් නොව ඔහු වෙරිමතිනි. මම ඔහු හඳුනා ගතිමි. එහෙත් ඔහුගේ නම මට අමතක විය. ඔහු අපට වරක් සැහෙන උදව්වක් කළේය. අබලන්වුණු අපේ රියක් ඔහුගේ රියට ඈඳා දුර්ග මාර්ගය හරහා පදවමින් අපට උදව් කළේ දැන් අප ඉදිරියේ සිහිසන් නැතිව සිටින රියැදුරාමය. ඩොලොන්ස්හි දුර්ගමාර්ගය හරහා රියක් ඇදාගෙන යාම ලෙහෙසි කාර්යයක් නොවේ. එහෙත් එදා අපට ආධාර පිණිස ඉදිරියට පැමිණි මේ තරුණ රියැදුරා නිර්භය මිනිසෙකි. ඔහුගේ රියට අපේ අබලන් රිය ඇදා ඔහු අප මාර්ග පාලක කාර්යාලය දක්වාගෙන ආවේය. එදා ඔහු මගේ සිත් දිනාගත්තේය. මම ඔහු නිසා මහත්සේ සතුටු වීමි. ඉන් ටික කලකට පසු කිසිවෙක් තවත් රියක් ඇදාගන බොහෝ දුර ගොස් අසීරු මග අවසාන වීමට හොඳටම ළංවූ විට එය අතහැර දමා පැනගිය බව ඇසිණි. ඔහුට යම්කිසි බාධාවක් ඇතිවුණා විය හැක. එදා අපට උදව් කළ අර නිර්ගීත මිනිසාගේ වැඩක් විය හැකියි මම සිතීමි. එහෙත් මේ සිද්ධියට පසු බොහෝ දෙනා ඈඳනු ලැබූ රියක් සමග ලොරි පැදවූහ. මෙලෙස දුර්ග මාර්ගය හරහා යාමට ඔවුන් ඉගෙන ගැනීම දක්ෂතම ක්‍රියාවකි. ඔවුන් ඉටු කළේ අවශ්‍ය දෙයකි.

අසේල්ගේ ස්වාමි පුරුෂයා කවුදැයි මා නොදැන සිටි බව සත්‍යයකි. ඔහු කවුද යන්න කලින් දැනසිටියද මා ඔහුට ආධාර කරනු ඇත. තුවාල ලැබ වෙරිමත්ව සිටි රියැදුරා මම ගෙදර ගෙනාවෙමි. ඔහු අපේ නිවෙසට පා තබත්ම මට කාරණය පැහැදිලි විය. එවෙලාවේදී අසේල් දර ගොඩක් අතින් ගෙන එමින් සිටියාය. ඔහු දුටු අසේල් විස්මය පත්වූවා දර ගොඩ බිම දැමුවාය. දර කෑලි හැමතැනම විසිරිණි. කෙසේවුවද, අපි කාරණය පැහැදිලි වූ බවක් නොඇඟවීමු. පළමුවරට හමුවූවාක් මෙන් හැසුරුණෙමු. මා වඩාත් සුපරීක්ෂාකාරී විය යුතුය. ඔවුන්ට වේදනා නොදෙන පරිදි මා කතා කළ යුතුය, හැසිරිය යුතුය. ඔවුනොවුන් නැවත ළං වීමට බාධා නොකළ යුතුය. මෙහිදී තීරණය ගැනීම ඔවුන් සතුය. අතීතය ඔවුන්ගේය. පුතාද ඔවුන්ගේය. මම පුංචි පුතු සමග ඇඳේ නිදා ගනිමින් ඔහු සුරතල් කරමින් සිප ගතිමි.

එදින රැය අපි නොනිදා පහන් කළෙමු. හැම එකෙක්ම තමා ගැන කල්පනා කළහ. මම මා ගැන සිතීමි.

අසේල් පුතාත් රුගෙන යනු ඇති යි මම සිතීමි. එය ඇ සතු අයිතියකි. ඔවුන්ගේ හදවත් හා ඔවුන්ගේ බුද්ධිය ඔවුන්ට අණ කරණ පරිදි ඔවුන් ක්‍රියා කලාවෙ. මා ගැන...මා ගැන නොවේ තීරණය. ඔවුන් ගත්තා තීරණයට බාධා නොකළ යුතුය...

දැන් ඔහු අප වැඩකරන මහ මගෙහි රිය එලවයි. මෙතෙක් කල් ඔහු සිටියේ කොහිද? ඔහු කළේ මොනවාද? ඒවා සියල්ල වැදගත් නොවේ...එවුන් සතු කාර්‍යය ඔවුන්ම ඉටු කලාවෙ...

බයිටෙමීර් සමග ඔහුගේ මහ මගෙහි වැඩ පරීක්ෂා කල අපි පෙරලා පැමිණියෙමු. සවස් විය. බැස යන වසන්ත හිරු දුම් පටලයක් ඇති කලාක් මෙනි. තයාන්-ෂාන් කඳුවැටි මුදුනේ හිම හිරු රැස් නිසා දිලිසෙන්නට විය. මහ මග දිගේ දිවෙන රිය මහ හඬක් නගයි.

වික වේලාවක් නිහඬව සිටි බයිටෙමීර් නැවත කතා කළේය: ''දැනට මා මුණ පා සිටින තත්ත්වයේ හැටි ඔහොමයි. මෙවැනි වේලාවක පාමීර් වලට යාම සුදුසු නැහැ. අසේල් තීරණය කලොත් මා අතහැර දමා යන්ට ඇගේ හෘදය සාක්ෂය පිරිසුදුව තියෙන්ට ඉඩ දෙන්ට ඕන. ඒ ගැන ඇ මට දැන්වූ විට මම පුතාට ආශිර්වාද කරනව. සාමට් මට පුතෙකුටත් වඩා ආදරණීය වස්තුවක්. ඒ වුණත් එයාගෙ නියම දෙමාපියන්ගෙන් උදුරා ගැනීමට අයිතියක් නැහැ... ඔන්න ඔය හේතු නිසා මට ගෙදරින් පිටවීමට බැහැ. විශේෂයෙන්ම පාමීර් වැනි දුර බැහැර පෙදෙසකට. මා කී කතාව පුවත්පත්වල පළ කිරීම සඳහා නොවේ. මිනිහෙක් තවත් මිනිහෙකුට කියන කතාවක් හැටියට...'' මෙසේ කී බයිමේටර් තම කතාව අවසන් කළේය.

## ඉල්යාස්ගේ තීරණය

තම කටයුත්තක් සඳහා පාමීර් බලා ගිය ඉල්යාස් මගෙන් සමු ගත්තේ ඕස්වලදීය.

'' ගිහිල්ලා අලිබෙක් හමුවෙලා අමුතු ජීවිතයක්, අළුත් ජීවිතයක් නැවත පටන් ගන්නවා. මම සදහටම විනාශ වුණු මිනිහෙක් හැටියට හිතන්න එපා. කල් ගෙවුණාම මම කසාදයක් බැඳ ගන්නව. මට මගේ දූ දරුවන් ඇති වේවි. ගෙයක් හදා ගන්නව. යාළුවෝ, සගයෝ ඇති වේවි. එහෙත් එක පාඩුවක් මට සදහටම ඇති වුණා. එය නැවත ලබා ගන්නට බැහැ. සදහටම නැතිවුණා... මගේ ජීවිතයේ අවසාන මොහොත දක්වා අසේල්

ගැනත් අප දෙදෙනා ගත කළ සුන්දර දවස් කීපය ගැනත් අමතක කරන්නේ නැහැ.``

ඉල්යාස් හිස පහත් කරගෙන නිහඬව කල්පනා කොට යළි මෙසේ පැවසීය:

``මම පිටව් යන දවසේ ඉස්සික් කුල් වැවට ගියා. එදා අප දෙදෙනා නැවතී සිටි තැනටම ගියා. ත්‍යාන්-ෂාන් කඳුවලින් සහ ඉස්සික්-කුල් වැවෙන් සමු ගත්තා. ගයා අවසන නොවූ ගීතයක් බඳු ඉස්සික්-කුල් වැවට ආයුබෝවන්. නුඹෙ නිල්පැහැති ජලයත් රත් පැහැති වෙරළත් ගෙන යාමට මා කැමතිය. එහෙත් මගේ පෙම්බරියගේ හදවත දිනා ගැනීමට බැරිවාක් මෙන්ම, ඉස්සික් කුල් වැවද ගෙන යා නොහැක. අසේල්! මගේ පෙම්බර අසේල් ඔබට ආයුබෝවන්. රතු ලේන්සුවක් බැඳි මගේ නැතිවුණු වස්තුව, මගේ සුකොමල පෙම්බරිය ඔබගේ අනාගතය වාසනාවත් වේවා!``..

# චිංගීස් අයිත්මාතව්

චිංගීස් අයිත්මාතව් සෝවියට් සාහිත්‍යයේ සහ කිර්ගීස් සාහිත්‍යයේ අසහාය ලේඛකයන්ගෙන් කෙනෙක් වශයෙන් සැලකෙයි.

ඔහු විසින් ලියන ලද එක් නවකතාවක් "පළමුවෙනි ගුරුවරයා" සහ "ගුරුගීතය" නමින් සිංහලෙන් පළ වී ඇත.

අයිත්මාතව්ගේ අපූරු ප්‍රේමකාව්‍යයක් මෙන් සැලකෙන "ජමීලා" ද මෙයට පෙර සිංහල බසින් නිකුත් වී ඉතාමත් ජනප්‍රිය විය.

"ජමීලා" නැවත වරක් මෙසේ පළ කෙරෙන්නේ අයිත්මාතව් සිංහල පාඨකයාට හඳුන්වා දුන් දිවංගත, දැදිගම වී. රුද්‍රිගු සහෘදයාට උපහාර වශයෙනි.

කුරුලු පොත්
594/1, නාවල පාර,
රාජගිරිය.

මිල රු. 140/=

මුද්‍රණය : තරංජී ප්‍රින්ට්ස්, 506, හයිලෙවල් පාර, නාවින්න, මහරගම. දුරකථනය : 854773